# කාර්යක්ෂමභාවය
# ප්‍රඥාගෝචරභාවය හා
# ශ්‍රී ලංකාවේ නීතික්‍රමය

# කාර්යක්ෂමභාවය ප්‍රශ්‍රද්ධාගෝචරභාවය හා ශ්‍රී ලංකාවේ නීතික්‍රමය

නීතිඥ බැසිල් ප්‍රනාන්දු

ප්‍රකාශනය

**ශ්‍රී ලංකාවේ වධහිංසාව තුරන්කිරීමේ ජනසන්ධානය**
**ආසියානු මානව හිමිකම් කොමිසම**

**කාර්යක්ෂමභාවය ප්‍රඥාගෝචරභාවය හා**
**ශ්‍රී ලංකාවේ නීතික්‍රමය**

*පළමු මුද්‍රණය 2007*

© *බැසිල් ප්‍රනාන්දු*

*ISBN 978-955-1468-07-1*

*පිටකවරය* : කේ.ඩබ්. ජනරංජන

*පිටු සැකසුම* : රාවය

*මුද්‍රණය* : රාවය මුද්‍රණ හා ප්‍රකාශන
අංකඃ 83, පිලියන්දල පාර, මහරගම

*ප්‍රකාශනය* : ශ්‍රී ලංකාවේ වධහිංසාව තුරන්කිරීමේ ජනසන්ධානය, ආසියානු මානව හිමිකම් කොමිසම

# පටුන

1. තේමා ලිපිය - විනාශකාරී බලපෑම් ගණනාවකට භාජනය වූ ලංකාවේ නීති පද්ධතිය නැතිවෙමින් පවතින ජාතික වස්තුවකි 13

2. පුද්ගලයන් අතුරුදහන්වීම හා නීතික්‍රමයක් අතුරුදහන්වීම **29**

3. කැමැත්ත හා බල කිරීම 37

4. ලංකාවේ අපරාධ නීතිය හා නීතියේ ආධිපත්‍යය මුහුණ පා ඇති ගැටලු 43

5. සංවේදීභාවය හා අපරාධ පරීක්ෂණ රටාව **59**

6. අපරාධ පරීක්ෂණ හැකියාවෙන් හීන සමාජය වලිගය නැති ගොනා වැනිය **67**

7. රටක කාර්යක්ෂමභාවය ඇතිවීමට තුඩුදෙන හේතු පිළිබඳව ලංකාව හා හොංකොං ප්‍රදේශය අරභයා සංසන්දනාත්මක විග්‍රහයක් 77

8. කාර්යක්ෂමව ක්‍රියා කිරීමේ හැකියාව නැති කොමිෂන් සභා පත්කිරීම ලංකාවේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ ගැටලු මගහැරීම සඳහා යොදා ගන්නා උපක්‍රමයකි — 85

9. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ විශ්වසනීයභාවය සහිත අධිකරණයක් පිළිබඳ ලෝක ලක්ෂණ — 91

10. නීති වෘත්තියේ කථාව — 101

11. නීති වෘත්තිය හා නීති අධ්‍යාපනය තත්කාලීන ලංකාවේ මුහුණ දෙන ප්‍රශ්න — 107

12. හරස් ප්‍රශ්න ඇසීම හා හරක් ප්‍රශ්න ඇසීම — 115

13. රජයේ නිලධාරීන් විසින් ලේඛන විකෘති කිරීම, බොරු දිව්රුම් පෙත්සම් දීම හා අධිකරණයට වාර්තා නොකිරීම — 121

14. පුරුදු උණ කරදිය වතුර සාපය — 121

15. නීතියේ රජකම මගින් පාලකයන්ගේ අනුවණකම් ජයගැනීම — 137

16. ජෙරාල්ඩ් පෙරේරා නඩුව — 143


# හැඳින්වීම

මේ පොතින් ඉදිරිපත් කරනු ලබන්නේ ලංකාවේ කොයි කාටත් ඉතාමත් සමීප ප්‍රශ්නයකි. ප්‍රශ්නය සමීප නමුත් පිළිබඳව සාකච්ඡාවක් නම් සිදුවන්නේ නැත. පුද්ගලික කථාබහේදී මෙම පොතෙහි තේමාවට එනම් ලංකාවේ යුක්තිය පසිඳලීමේ ගැටලු යන අංශය සම්බන්ධයෙන් නොයෙක් මැසිවිලි අසන්නට ලැබේ. එහෙත් එම ප්‍රශ්න පිළිබඳව ලියැවෙන ලිපි හෝ කෙරෙන විවාද නම් දුර්ලභය. විශේෂයෙන්ම සිංහල භාෂාවෙන් මෙම විෂය පිළිබඳව කථනයක් සිදු නොවේ යැයි කීම අතිශයෝක්තියක් නොවේ යැයි සිතමි. ඉංග්‍රිසි භාෂාවෙන් යම් ලිපි ඉඳහිට ලියවුණත් ඒ භාෂාවෙන් වුවද මෙම කථනය පළල්ව කෙරෙනවා යැයි කියන්නට බැරිය.

මෙම පොතෙහි අනුගමනය කර ඇති පිළිවෙල වන්නේ එකම තේමාවක විවිධ පැති විවිධාකාරයෙන් මතු කිරීම මගින් අදාළ ප්‍රශ්නය පිළිබඳව සමස්ත තත්වය හැකි පමණට හෙළිදරව් කිරීමය. මගේ අරමුණ යුක්තිය පසිඳලීමේ ඇති සියලු ගැටලු විස්තර කිරීම හෝ එම ගැටලුවලට දිය හැකි සියලු විසඳුම් සාකච්ඡා කිරීම නොවේ. සමාජය තුළ පවතින ඉතා බරපතළ ප්‍රශ්නයක් දෙස පාඨකයාගේ සිත යොමු කිරීමත් ඒ මගින් වැඩි දෙනාගේ කල්පනාවට එම ප්‍රශ්නය යොමු කරවීමත් පමණක් මෙහිදී දරා ඇති ප්‍රයත්නය වේ. මේ ප්‍රශ්නය පිළිබඳ සාකච්ඡාවට අදාළ විශාල දැනුම් සම්භාරය සාමාන්‍ය ජනතාව අතර මෙන්ම වෘත්තියමය වශයෙන් යුක්තිය

පසිඳලීමේ කාර්යයෙහි විවිධ අංශවල යෙදෙන විවිධ අය අතර ද පවතී. එම දැනුම් සම්භාරය සාකච්ඡා මට්ටමට ගැනීමට යම් උනන්දු කිරීමක් අවශ්‍යය. එසේ කිරීමට ආධාරයක් මෙම පොත මගින් සිදුවේ නම් මෙම ප්‍රයත්නය පලදායී යැයි සිතමි.

මෙම පොතෙහි ලිපිවල අනුගමනය කර ඇති තවත් උපක්‍රමයක් නම් රටේ යුක්තිය පසිඳලීමේ පැනනැගී ඇති ගැටලු වෙනත් රටවල යම් අත්දැකීම් සමඟ සංසන්දනාත්මකව සාකච්ඡා කිරීමය. රටේ පවතින තත්වය ඉතාමත් අඳුරු දෙයක් බවට පත්වූ පසු සාමාන්‍ය සිරිතක් වන්නේ මේ පිළිබඳව කථාකිරීමට තරම්වත් වටින්නේ නැතැයි යන මතයක් සිත් තුළ පැලපදියම් වීමය. එවැනි තත්වයකදී සාධනීයව වර්ධනය වුණු යුක්තිය පසිඳලීමේ ක්‍රම පවතින රටවල අත්දැකීම් සාකච්ඡා කිරීම මගින් රට තුළ ඇති අත්දැකීම තේරුම් ගැනීමට පමණක් නොව එයින් එපිටට ඒමට යම් එළියක් ද උදාවන්නටත් පුළුවන.

සියලුම දේ මෙන්ම සමාජ සංස්ථාවල ඇතිවන ප්‍රශ්නද හේතුපල වශයෙන් වර්ධනය වේ. අද ලංකාවේ යුක්තිය පසිඳලීමේදී ඇති ගැටලු විවිධ හේතු පල සම්බන්ධයන් මත පැන නැගිණ. එම හේතු පල සම්බන්ධයන්ගේ ඇතිවිය හැකි වෙනස්වීම් තුළ පමණක් අනාගතයේදී මෙම ප්‍රශ්න පිළිබඳව වඩා නරක අතට හැරීමක් හෝ වඩා සාධනීය වර්ධනයක් ඇතිවීමත් සිදුවනු ඇත. එම නිසා ආසියාව තුළම ඇති වැඩි සාධනීයත්වයක් ඇති අත්දැකීම් මෙම පොතෙහි සාකච්ඡා කොට ඇත.

රටේ අවශ්‍යතාවනට ප්‍රඥාගෝචරවත් කාර්යක්‍ෂමවත් මුහුණ දීමට උපකාරී වන පොලිස් ක්‍රමයක් උදාහරණයට ගෙන බලමු. එවැන්නක් නිර්මාණය කර ගැනීම ඓතිහාසික කර්තව්‍යයකි. ආසියාවේම සමහර රටවල එම කාර්යය දැනටමත් සාක්ෂාත් වී ඇත. එහි පලය නම් රටක් තුළ සුරක්ෂිතභාවය වර්ධනය වීමය. අන් රටවල ජීවත්වන අය මෙන්ම ගැටලුවලට මුහුණ දෙන මෙම රටවල ජනතාවගේ ශක්තිය ඇත්තේ ඔවුන්ගේ ප්‍රශ්නවලට ප්‍රඥාගෝචර හා කාර්යක්ෂ්ම ආකාරයකින් ප්‍රතික්‍රියා කළ හැකි පොලිස්



ක්‍රමයක් පවතින බවට ඔවුන් තුළ ඇති විශ්වාසයේය. එහෙත් ලාංකිකයා තුළ ඇත්තේ පාරේ මාර්ග අනතුරු පවා නිසි ආකාරයකට පාලනය කර ගැනීමකට බැරිවූ පොලිස් ක්‍රමයක් පිළිබඳ අත්දැකීමය. එම නිසාම වඩා බරපතළ හා භයානක ප්‍රශ්න ඇතිවීමට ද පසුබිම සැදී ඇති අතර එම සමස්ත ක්‍රියාදාමයන්ගේ ප්‍රතිපලය වන්නේ ජනතාව තුළ දැඩිව වර්ධනය වී ඇති අනාරක්ෂිතභාවය පිළිබඳව ඉතා ගැඹුරු හැඟීම්ය. මේ ආකාරයෙන්ම ලංකාවේ නීතිපති ක්‍රමය හා අධිකරණ ක්‍රමය ද වඩා සාධනීය අත්දැකීම් සමඟ සංසන්දනය කළ හැකිය. එසේ කිරීම මගින් මෙම සංස්ථා පිළිබඳව අද පවතින කනස්සලු තත්වය අත්‍යාවශ්‍යයෙන්ම සදාකාලිකව පැවතිය යුතුම නැති බව සනාථ කල හැක. ලාංකික සමාජයට ද කාර්යක්‍ෂම හා ප්‍රඥාගෝචර පොලිස්, නීතිපති හා අධිකරණමය ක්‍රමයක් ගොඩනගා ගැනීමට බැරිකමක් නැත.

මෙම පොතෙන් කියවෙන්නේ ලාංකිකයන් මෙන්ම වෙනත් බොහෝ දෙනෙකු සමඟ කාලයක් තිස්සේ කරන ලද සාකච්ඡා තුළින් පැන නැගුණු අදහස්ය. ලංකාව තුළම යුක්තිය පසිඳලීමේ ඇතිවී ඇති ගැටලු විසඳාගැනීමට දැඩි ප්‍රයත්නයක යෙදෙන කණ්ඩායමක් ද සිටී. ඒ අතර යුක්තිය පසිඳලීමේ ක්‍රමය මගින් විශාල වශයෙන් බැටකෑ අයද බොහෝය. තමන්ගේ කටුක අත්දැකීම් තුළින් වැඩි සාධනීය චින්තනයක් බිහි කිරීම කෙරෙහි ඔවුහු උනන්දු වෙති. මෙම සියලු දෙනාම ඉතාම කෘත ගුණ පූර්වකව සිහිපත් කරමි. ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව කදිම උදාහරණයක් ජෙරාඩ් පෙරේරා පිළිබඳව නඩුවෙන් කියැවේ. එම නිසා එම නඩු තීන්දුවෙහි පරිවර්තනයක් මෙම පොතට ඇතුළත් කෙළෙමි. ඉතාම අවාසිදායක තත්වයන් තුළ පවා ඔවුන් දරන ප්‍රයත්නයන් නොතිබෙන්නට මෙම ලිපි නොලිය වෙන්නට තිබිණි. මෙම ලිපිපෙළ සකස් කිරීමේදී සහාය වූ නීතිඥ සංජීව වීරවික්‍රම මහතාගේ සහයෝගය අගය කොට සලකමි.

**නීතිඥ බැසිල් ප්‍රනාන්දු**

**ආසියානු මානව හිමිකම් කොමිසම**

# පිදුම

නිසි යුක්තිය පසිඳලීමේ ක්‍රමයක් තුළ ජීවත්වීමේ වාසනා මහිමය තවම අභිමිකර ලැබ සිටින ලාංකීය ජනතාවට මෙම පොත පුදනු ලබන්නේ ඔවුන්ගේ පරම අභිලාෂයන් ඉටු කළ හැකි යුක්තිය පසිඳලීමේ සංස්ථාවන් උදාවේවාය යන පැතුමත් සමගය.

# තේමා ලිපිය

## විනාශකාරී බලපෑම් ගණනාවකට භාජනය වූ ලංකාවේ නීති පද්ධතිය නැතිවෙමින් පවතින ජාතික වස්තුවකි.

මෙම ලිපියෙහි තේමාව වන්නේ ලංකාවේ නීති පද්ධතිය දැනටමත් බොහෝ දුරට ආරවුලට පත්වී ඇති බවත්, මෙම නීතික්‍රමයේ සම්පූර්ණ ව්‍යසනයක් ඇතිවීමේ අවදානම පවතින බවත්ය. ලංකාවට සුවිශේෂ මෙම තත්වය මෙම ලිපිය තුළ විස්තර කරනු ලබන්නේ වඩා පළල් තේමාවක් යටතේය. එම තේමාව නම් යම් කාල පරිච්ඡේදයන්හිදී මිනිසුන් විසින්ම ගන්නා ක්‍රියා මාර්ගවල ප්‍රතිපල වශයෙන් විශාල ව්‍යසනයන් ස්වාභාවික ලෝකයේ මෙන්ම මානව සමාජයේ ද සිදුවිය හැකි බවය. මේ පිළිබඳව පැහැදිලි කිරීමක් මගින් මෙම ලිපියේ තේමාව වඩාත් හොඳින් හෙළිදරව් කළ හැකිය.

## මානව ක්‍රියා මගින් ස්වභාව ධර්මය විනාශකාරී ලෙස වෙනස් කිරීම

පරිසර විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රයේ නූතන යුගයේ ඇතිවී ඇති විශාල දැනුම් සම්භාරය නිසා අද පොදුවේ පිළිගැනෙන කරුණක් නම් මානව වර්ගයාගේම යම් ක්‍රියාවලීන් නිසා ස්වභාව ධර්මය තුළ විශාල ව්‍යසනයන් දැනටමත් සිදුවී ඇති බවත් ඊටත් වඩා විශාල ව්‍යසන අනාගතයේදී සිදුවීමේ අවදානමක් පවතින බවත්ය.

විශාල වශයෙන් ඉන්ධන පාවිච්චිය හා කැලෑ ආදී ස්වාභාවික සම්පත් අසීමිතව පරිහරණය කිරීම මගින් ඇතිවී ඇති පරිසර විද්‍යාත්මක බලපෑම නිසා ගෝලීය උෂ්ණත්වය වැඩිවීම හා ඒ මගින් ස්වභාව ධර්මයේ හැසිරීම් රටාවම වෙනස්වීමට හැකි බව අද, විශාල වශයෙන් කථනයට භාජනය වන තේමාවකි. පරිසරයේ ඇතිවන යම් වෙනස්කම් නිසා විශාල ස්වාභාවික සම්පත් මුළුමනින්ම පවා නැතිවී යාහැකිය. උදාහරණයක් වශයෙන් "මළ මුහුද" නැතිවී යන සම්පතක් විය හැකියයි දැන් සමහරු කියති. මෙයට විවිධ හේතු ඔවුහු දක්වති. එක් හේතුවක් නම් එම මුහුද අසල රටවල් මැදින් ගලා යන ගංගාවන් මගින් අතීතයේදී මුහුදට ගලා ගිය ජලය දැන් ඒ ඒ රටවල සංවර්ධනයට යොදා ගැනීම නිසා එම වතුර නොලැබී යෑම තුළින් මළ මුහුදේ ජල ප්‍රමාණයේ සැලකිය යුතු අඩුවීමක් දකිත හැකි බවත් එය කාලයාගේ ඇවෑමෙන් ඇතිවිය හැකි විශාල වෙනසක ලකුණක් බවත්ය. මෙසේ මීට සමාන ආකාරයකින් මුළුමනින්ම මෙන් නැතිවූ ස්වාභාවික සම්පතක් ලෙස උස්බෙකිස්ථානය හා කසකස්ථානය අතර ඇති "ඒරල්" ජලාශය සලකනු ලැබේ. 1918 දී පමණ කපු වගාව මගින් අපනයන මාර්ග වැඩි දියුණු කරගැනීම සඳහා වාරිමාර්ග ක්‍රම ඇතිකරන ලද්දේ ඒරල් ජලාසයට එතෙක් ගලා ගිය ජලය අවහිර කරමිනි. වගාව සඳහා යොදාගත් රසායන ද්‍රව්‍යවල ශේෂයන්ද ජලාසයට ගලා ආවේය. එහි ප්‍රතිපලයක් සේ ක්‍රමයෙන් ජලාසය වියළී ගියා පමණක් නොව එහි පතුලේ රැඳී තිබූ රසායන අපද්‍රව්‍ය සුලඟේ ගසාගෙන ගොස් වෙනත් තැන්වලද තැන්පත්වීම නිසා ජලාශයෙන් බොහෝ ඈත රටවල් කෙරෙහි පවා සෘණාත්මක ප්‍රතිපල ඇති විය.

මානව වර්ගයාගේ ක්‍රියා මගින් ස්වභාව ධර්මයාට විශාල විනාශකාරී වෙනස්කම් ඇති කිරීමට හා වඩා විශාලව සමාජ ක්‍රමයක් තුළම එවැනි විනාශකාරීව වෙනස්කම් ඇතිකළ හැකිය. ලංකාවේ නීතික්‍රමයේ මෑත අතීතයේදී සිදුවූ විශාල වෙනස්කම් නිසා රටේ නීතික්‍රමය මුළුමනින්ම ව්‍යසනයකට පත්කළ හැකි තරමේ අවදානමකට මුහුණ දෙමින් පවතී. මෙවැනි දේ සිදුවූ



එකම රට ලංකාව නොවේ. ආසියාවේම රටවල් ගණනාවක් මේ ප්‍රශ්නයට මුහුණ දෙමින් පවතී. මේ ලිපිය මෙම ප්‍රශ්නය ලංකාව තුළ පවතින ආකාරය විස්තර කිරීම සඳහා පමණක් සීමා කෙරෙහි.

ලංකාවේ නීති පද්ධතිය 1970 දශකයේ සිට ඉතා බරපතළ යටපත් කිරීම් ගණනාවකට භාජනය විය. ඉන් සමහරක් මෙසේ දැක්විය හැකිය. ව්‍යවස්ථා නීතියේ ඇතිවූ විශාල වෙනස්කම්, හදිසි නීතිවල බලපෑම යටතේ සියලුම රාජ්‍ය සංස්ථා තුළ විශේෂයෙන්ම යුක්තිය පසිඳලීමේ මූලික සංස්ථාවන් වන පොලිසිය, නීතිපති ක්‍රමය හා අධිකරණය තුළ ඇතිවූ වෙනස්කම්, මර්දන කටයුතු සඳහා රාජ්‍ය තන්ත්‍රයේ නිලධාරීන් යොදාගැනීම නිසා රාජ්‍ය තන්ත්‍රය තුළම අපරාධ පිළිබඳ පවතින දර්ශනයේ මෙන්ම විනයානුකූල පාලනයේ ඇතිවූ වෙනස්කම්, විවිධාකාර හේතූන් මත අපරාධ පරීක්ෂණ පවත්වාගෙන යාමට ඇතිවූ බාධා නිසා අපරාධ පරීක්ෂණ ක්‍රමය තුළ ඇතිවූ විශාල පසුබෑම්, ව්‍යාකූලත්වයන් හා මෙම සමස්ත ක්‍රියාවලිය නිසා රාජ්‍යතන්ත්‍රය පිළිබඳවත්, ව්‍යවස්ථා නීතිය පිළිබඳවත්, යුක්තිය පසිඳලීම පිළිබඳවත්, මහජන විශ්වාසය තුළ ඇතිවූ විශාල කම්පනය හා පසුබෑම සඳහන් කළ හැකිය.

## සම්භාව්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා නීතිය අස්ථාන ගතවීම

ව්‍යවස්ථා නීතිය සම්බන්ධයෙන් විශාල පරිවර්තනයක් රට තුළ ඇතිවූ අතර සාම්ප්‍රදායික හා සම්භාව්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා නීති මූලධර්ම ගණනාවක් ලංකාවේ නීතික්‍රමය තුළින් ඉවතට දමන ලදි. 1972 දී ව්‍යවස්ථාදායකයේ බලය වැඩි කිරීමේ මුවාවෙනුත්, 1978 දී විධායක ජනාධිපති ක්‍රමය ඇති කිරීම සඳහාත් ව්‍යවස්ථා නීතිය පිළිබඳව විශාල සංශෝධනයන් කෙරිණ. 1972 දී මෙය කරන ලද්දේ රටට උචිත රටේම ඇති කරන ලද දේශීය හා ස්වස්ථානික ව්‍යවස්ථාවක් අවශ්‍යය යන ප්‍රචාරක තේමාව යටතේය. මෙයින් අදහස් වූයේ නිදහස ලැබීමේදී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව රටට නුචිත රට තුළින් පැන නොනැගි ව්‍යවස්ථාවක්

බවය. 1972 ව්‍යවස්ථාවට පදනම්වූ දර්ශනයේ එක් අංගයක් වූයේ ඡන්දයෙන් පත්කරනු ලැබූවන්ගේ එනම් ව්‍යවස්ථාදායකයේ බලය රජයේ අනෙත් අංශවල බලයට වඩා වැඩිවිය යුතු බවය. ප්‍රායෝගිකව මෙහි අදහස වූයේ අධිකරණ බලයේ අඩුවීමක් සිදුවිය යුතු බවය. විශේෂයෙන්ම ව්‍යවස්ථාදායකයේ නීති නැවත සලකා බැලීමට අධිකරණයට ඇති බලය අඩුකර දැමීම එහි එක් අංශයක් විය. දාර්ශනික වශයෙන් ගත් කල අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව සම්භාව්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවන්හි පිළිගැනෙන මූලධර්ම රටට අනුචිත එකක් වශයෙන්ද වක්‍රාකාර ඇඟවීමක් 1972 ව්‍යවස්ථාව අනුමත කිරීම සඳහා සිදුවූ ප්‍රචාරය තුළ ගැබ්ව තිබුණි. ලංකාවට සීමාසහිත ඒකාධිපතිත්වයක් අවශ්‍ය බවට 1970 හවුල් ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයකු වූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා විසින් ප්‍රකාශ කොට බොහෝ ප්‍රසිද්ධියට පත්වුණු "සීමාසහිත ඒකාධිපතිත්වය" පිළිබඳ ප්‍රකාශය තුළින්ද ඇඟවුණේ අධිකරණ බලය පිළිබඳ සීමා පැනවීමය.

1978 ව්‍යවස්ථාවේ පදනම වූයේ ව්‍යවස්ථාදායකයේ බලය වැඩි කිරීම හා එම බලය එක් පුද්ගලයකු වටා එනම් විධායක ජනාධිපතිවරයා වටා ඒකාරාශි කිරීමය. මෙම ව්‍යවස්ථාවේ මූලෝපාය වූයේ අධිකරණ බලය විශාල වශයෙන් කප්පාදුකර දැමීම පමණක් නොව ව්‍යවස්ථාදායකයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයද බොහෝ දුරට දුර්වල කර දැමීමය. විධායක ජනාධිපතිවරයා අධිකරණයටවත් ව්‍යවස්ථාදායකයටවත් වගකිව යුතු රාජ්‍ය නායකයකු නොවීය. මෙම විධායක ජනාධිපති ක්‍රමය රටේ ව්‍යවස්ථාදායක නීතිය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳව විශාල පරිමාවක ලේඛන මේවන විට ලියැවී ඇත. එමෙන් ම ජනාධිපති ජයවර්ධන හා අගවිනිසුරු නෙවිල් සමරකෝන් අතර ඇතිවූ විශාල ගැටීමද, ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිරකරණයට විරුද්ධව ගසන ලද ප්‍රහාරයන්, උදාහරණ වශයෙන් නව ව්‍යවස්ථාව මත ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් පත්කිරීමේදී හිටපු විනිසුරුවන් දෙදෙනෙකු පත්නොකිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ ගෙවල්වලට ගල් ගැසීම හා දිවුරුම් පිළිබඳ ප්‍රශ්නයක් මත



ශ්‍රේෂ්ඨාධිකරණයේ දොරවල් වසා දැමීම ආදී විශාල ක්‍රියාවලියක් සම්බන්ධවද බොහෝ දේ ලිය වී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය මෙල්ල කිරීම 1978 ව්‍යවස්ථාවේ අරමුණක් වූ බවට විවාදයක් පවතින්නේ නැත. දශක තුනක පමණ කාලයකදී මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම තුළින් ව්‍යවස්ථාධායකය, විධායකය හා අධිකරණය අතර පවතින සම්බන්ධයේ ඇති බලතුළනයේදී අධිකරණය විශාල වශයෙන් පරාජිත තත්වයකට පත්වූ බව පැහැදිලිය. 1978 න් පසු බලයට පත්වූ සියලුම ජනාධිපතිවරු රජයේ ප්‍රධාන ශාඛා තුන අතර ඇති බලතුළනයේදී අධිකරණයේ ලැබූ පරාජයන්ගේ ප්‍රයෝජනය ලබාගත් අතර අධිකරණය වඩ වඩාත් දුර්වල කිරීම සඳහා විවිධ උපක්‍රම මත ක්‍රියා කලහ. තමන් පුද්ගලිකව කැමැත්තක් දක්වන විනිසුරුවන් ඉහළ තනතුරුවලට පත්කරවා ගැනීම ඒ අතර එකක් විය. අපට මෙහිදී වැදගත් වන්නේ සමස්තයක් වශයෙන් ගත්කල අධිකරණයේ ස්වාධීනත්වය හා බලය සම්බන්ධයෙන් සම්භාව්‍ය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා මූලධර්මයන් මේ කාලය තුළ අස්ථානගත කරන ලද බවය.

## හදිසි නීතිය අපරාධ නීති පද්ධතිය කෙරෙහි බලපෑ විනාශකාරී ආකාරය

1970 දශකයේ සිට හදිසි නීතිය හා ත්‍රස්තවාද විරෝධී නීතින් ක්‍රියාත්මක වීම රටේ ස්වාභාවික සිද්ධියක් බවට පත්විය. හදිසි නීති යටතේ රට පැවතුණු කාලය සමඟ සංසන්දනය කරන කල හදිසි නීති නොපැවැත්වුණු කාලයන් ඉතා අඩු බව පෙනේ. හදිසි නීති පැවතුණා පමණක් නොව එම හදිසි නීති යටතේ රජය සාධාරණය කරගත් මර්දන බලතල විශාල වූවා පමණක් නොව ඒවා ක්‍රියාත්මක කිරීමද විවිධ අවස්ථාවන්වලදී මහා පරිමාන ආකාරයෙන් සිදුවිය. මේ කාල පරිච්ඡේදය තුළ විවිධ ආකාරවලින් රාජ්‍ය ආයතන මගින් හෝ ඒ ආයතනවල අනුබලය ඇතිව හෝ සිදුවූ ඝාතන සංඛ්‍යාව මෙන්ම වදහිංසා ද ලෝකයේ වැඩිම මර්දන තිබූ රටවල ප්‍රමාණයටම හෝ ඊට වඩා වැඩිය. අතුරුදහන්වීම් අතින් ආජන්ටිනාව වැනි වැඩිම අතුරුදහන්වීම් සිදුවූ තැන් අතරට

ශ්‍රී ලංකාවද වැටෙන බව එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට අනුබද්ධ සංස්ථා විසින් මෙන්ම ජාත්‍යන්තර වෙනත් සංවිධාන මගින්ද විවිධ අවස්ථාවන්වලදී පෙන්වා දී ඇත. සංඛ්‍යාත්මකව බලන කල ලෝකයේ බොහෝ අප්‍රසාදයක් ඇති කල චිලියේ "අගොස්ටෝ පිනොචේ" ගේ ආණ්ඩුව යටතේ සිදුවූ ඝාතන හා වදහිංසා ප්‍රමාණය තුන්දහසකට පමණ සීමා වන නමුත් ලංකාව සංඛ්‍යාත්මක වශයෙන් ඊට විශාල වශයෙන් වැඩි ප්‍රමාණයකින් මෙම මර්දනකාරී කටයුතුකර ඇතිබව පෙනීයයි. අපට මෙහිදී වැදගත් වන්නේ මෙම මර්දන ක්‍රියා හෝ ඒවායේ සංඛ්‍යා ලේඛන නොවේ. මෙම ලිපියෙහි අප සලකා බලන්නේ එලෙස විශාල වශයෙන් සිදුවූ ක්‍රියා ලංකාවේ නීති පද්ධතිය කෙරෙහි බලපා ඇති ආකාරය සම්බන්ධයෙනි.

## හදිසි නීති නැති කාලයන්හි පවතින පලපුරුදු අහෝසි වී යෑම

හදිසි නීතිය හෝ ත්‍රස්තවාදය විරෝධී නීතිය කුමක්දැයි සලකා බැලීම මෙම කරුණ වටහා ගැනීම සඳහා අදාළය. මෙවැනි විශේෂ නීති මගින් කරනු ලබන්නේ රටේ සාමාන්‍ය නීතිය තුළ රජයේ බලය පාවිච්චිය පිළිබඳව පනවා ඇති තහංචිවලින් සමහරක් අඩු වශයෙන් හෝ වැඩි වශයෙන් තාවකාලිකව අත්හිටුවීමය. උදාහරණයක් වශයෙන් සාමාන්‍ය නීතියෙහි මිනිසුන් අත්අඩංගුවට ගැනීම පිළිබඳව ඇති බලයට තහංචි ගණනාවක් පනවා ඇත. එම තහංචි නොසලකා හැර කරන අත්අඩංගුවට ගැනීම් නීති විරෝධී වන අතර මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ද වේ. අධිකරණයක් මගින් එවැනි ක්‍රියාවක් කරන රාජ්‍ය නිලධාරියකුට දඬුවම් පැමිණවිය හැකිය. එමෙන් ම ආයතනික විනය ක්‍රියාපටිපාටීන් යටතේද ක්‍රියා කිරීමට ආයතනයේ බලධාරීන්ට හැකිය. කරන ලද ක්‍රියාව බරපතළ වරදක් නම්, උදාහරණයක් වශයෙන් ඝාතනයක් නම් සාමාන්‍ය මිනීමරුම් නීතිය යටතේ එසේ කරන්නන්ට විරුද්ධව ක්‍රියාත්මක වීමට මෙන්ම රජයේ සේවයේ නියැලීමට නුසුදුස්සන් සේ එවැනි අයට විරුද්ධව ක්‍රියා කිරීමටද හැකිය. එහෙත් හදිසි නීති හෝ ත්‍රස්තවාදයට එරෙහි නීතිවල මුවාවෙන් කෙරෙන පැහැරගෙනයෑම්



හා බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම් වැනි ක්‍රියා සම්බන්ධයෙන් සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමක් කල නොහැකි තරමටම අමාරුය. මෙසේ සිදුවූ කල නීතිය ක්‍රියාත්මක කරන සංස්ථා තුළම සාමාන්‍යයෙන් නීතිය මගින් ක්‍රියාකිරීමට තහනම් කොට ඇති ක්‍රියා, වක්‍රාකාරයකින් කරගැනීම පිළිබඳව පලපුරුද්දක් ඇතිවේ. සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා අමාරුවෙන් පුහුණුකර සාදාගන්නා පලපුරුදු නැතිවී නීතිය සමගම සෙල්ලම් කිරීමේ පළපුරුද්දක් ආදේශ වේ. පළපුරුදුකම්වල ඇතිවන වෙනස මානසික තත්වයන්හි ඇතිවන වෙනස කෙරෙහිද බලපෑම ස්වාභාවිකය. මේ අනුව නීතිය ක්‍රියාත්මක කරන සංස්ථාවන්හි පළපුරුදු හා මානසික රටාවන්වල විශාල පරිවර්තනයක් හදිසි නීති ක්‍රියාත්මක කරන කාලයන් තුළදී සිදුවේ.

ආයතනිකව සිදුවන මෙම පරිවර්තනය වඩාත් ගැඹුරු වන්නේ යුද්ධමය මානසික තත්වයක් සමඟ එම ක්‍රියාකලාපය සිදුවන විටය. 1970 මුල්භාගයේ සිටම ලංකාවේ කැරලි මර්දන ක්‍රියා කලාපයන් සිදුව ඇත්තේ මිලිටරිමය ආකාරයන්ගෙන්ය. මෙසේ කිරීමේදී යුද්ධමය මානසික තත්වය හමුදාවන් තුළ මෙන්ම පොලිසිය තුළද ඇතිවේ. සිවිල් පොලිස් ක්‍රමය බොහෝ දුරට බාල්දු කරමින් මිලිටරිය සමඟ කෙලින්ම හෝ වක්‍රව සම්බන්ධවී ක්‍රියාකිරිමේ පලපුරුදු හා මානසික තත්වයන් පොලිසිය තුළට වැදේ. එවැනි මානසික තත්වයක් දශක ගණනාවක් පැවතුණ විට එය තුළින් ඇතිවන්නේ විශාල පරිමාන පරිවර්තනයකි.

## නීතිපති ක්‍රමය තුළ ඇතිවූ විනාශකාරී වෙනස්කම්

හදිසි නීති භාවිතය නිසා විශාල පරිවර්තනයකට භාජනය වූයේ පොලිසිය පමණක් නොවේ. ලංකාවේ නීතිපති ක්‍රමය හා අධිකරණ ක්‍රමය කෙරෙහිද මෙය විශාල බලපෑමක් ඇති කළේය. රටක සිදුවන සියලුම බරපතළ අපරාධ සම්බන්ධයෙන් අධිකරණ ඉදිරියේ නඩු පැවරීමේ කාර්යය භාරවන්නේ නීතිපති සංස්ථාවටය. සමහර රටවල අපරාධ නඩු පවරන්නා හෙවත් "ප්‍රොසිකියුටර්"

යන නිලයේ බලතල නීතිපති ක්‍රමයට පරිබාහිරව පවතී. ප්‍රොසිකියුටර්වරයාගේ සංස්ථාව මුළුමනින්ම ස්වාධීන සංස්ථාවක් සේ පවතී. 1970 ගණන්වල සුළු කාලයකට ක්‍රියාත්මක වූ යුක්තිය පසිඳලීමේ පනත යටතේ අපරාධ නඩු අධ්‍යක්ෂ යනුවෙන් වෙනම අංශයක් ඇති කරන ලදි. එම අංශය නීතිපතිවරයාගේ අධීක්ෂණයට අවසාන වශයෙන් යටත්වූවත් එහි වැඩකටයුතු සම්බන්ධයෙන් විශාල පරිමාන ස්වාධීනත්වයක් පැවති බව වාර්තා වේ.

ලංකාවේ ප්‍රොසිකියුටර් නිලයේ වැඩකටයුතුද කෙරෙන්නේ රජයට නීති උපදේශ දීමේ කාර්යය භාරව තිබෙන නීතිපති දෙපාර්තමේන්තුව තුළින්මය. එම දෙපාර්තමේන්තුව තුළම මේ පිළිබඳව වැඩ වෙන්කර ගැනීමක් පවතින නමුත් අණදීම හා අධීක්ෂණය අතින් එය අවසාන වශයෙන් එකම පාලනයක් යටතේ පවතී. මෙය සාමකාමී සාමාන්‍ය කාලයක් යටතේ එතරම් ප්‍රශ්නයක් විය නොහැකි වුවත් හදිසි නීති පවතින කාල පරිච්ඡේදයක් යටතේ ප්‍රායෝගිකව විශාල ගැටලු ඇති කරයි.

හදිසි නීති සකස් කිරීමේදී හා නීතිගත කරගැනීමේදී රජයට උපදෙස් දීමේ කාර්යයද එම දෙපාර්තමේන්තුවටම පැවරේ. එසේ නීති වෙනස් කිරීමෙන් පසු හදිසි නීති කාලයන් තුළදී කෙරෙන ක්‍රියා පිළිබඳව චෝදනා ලබන රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් කටයුතු කිරීමේ කාර්යයද ඉතා සුවිශේෂ අවස්ථාවල හැර එම දෙපාර්තමේන්තුව පිටම පැවරේ. මෙම නිසා එම සංස්ථාව තුළ ව්‍යාකූලත්වයක් පමණක් නොව දෙබඩි ප්‍රතිපත්තීන් වර්ධනය වීමටද ඇති ඉඩකඩ බොහෝය. උදාහරණයක් වශයෙන් 1980 දශකයේ අගභාගයේදී විශේෂයෙන්ම දකුණේ කැරලි මර්දනය කිරීම සම්බන්ධයෙන් හබයාස්කෝපුස් ආඥා ඉල්ලා නඩු ගණනාවක් අධිකරණ ඉදිරියේ පැවරිණ. උතුර හා නැගෙනහිර පළාත්වලින් ද එවැනිම නඩු ඉල්ලීම් 1978 අගභාගයේ සිටම පැවරිණි. ඉතා විශාල ප්‍රමාණයක නඩු ඉල්ලුම්පත් මේ සම්බන්ධයෙන් ගොනුවුණු පසු බරපතළ චෝදනාවලට ප්‍රතිඋත්තර බැඳිය යුතු වූ පොලීස් නිලධාරීන්ට (බොහෝ විට ඉහළ තනතුරු දරූ පොලිස් නිලධාරීන්ට) නීති උපදේශ දීමේ කාර්යය නීතිපති දෙපාර්තමේන්තුවේ සමහර



නිලධාරීන් මත පැවරිණි. එක්තරා කාලයක එක් නිලධාරීන් කණ්ඩායමක් සමහර පොලිස් නිලධාරීන්ට ඔවුන් විසින් බැඳිය යුතු උත්තර ප්‍රකාශ සම්බන්ධයෙන් සත්‍ය නොවන මෙන්ම වගකීම් මගහැරිය හැකි උත්තර බැඳීම සඳහා උපදෙස් දුන් බව වාර්තා වී ඇත. එක අතකින් සාමාන්‍යයෙන් ප්‍රොසෙකියුටර්වරයාට ඇති රාජකාරී කිරීමේ වගකීමත්, අනෙක් අතින් තම දෙපාර්තමේන්තුවේම මැදිහත්වීම ඇතුව සකස් කරන හදිසි නීති යටතේ චෝදනා ලබන්නන් ආරක්ෂා කිරීමත් අතරට මැදිවූ විට නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුත්ත දෙබිඩි ස්වභාවයක් ගැනීමට ඇති ඉඩකඩ වැඩිය.

1987 අගභාගයේ සිදුවූ අතුරුදහන්වීම් පිළිබඳව විමර්ශනය කල "බලයෙන් අතුරුදහන් කරවීම් පිළිබඳ කොමිෂන් සභා" මගින් අපරාධ නීතිය යටතේ චෝදනා ලැබීමට හා වැඩිදුර අපරාධ පරීක්ෂණයට යටත් කොට නඩු පැවරීමට සුදුසු යැයි නම් කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කල ක්‍රියාමාර්ගය තුළින් මෙම දෙබඩි සහගත තත්වය හෙළිදරව් වේ. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ "බලයෙන් පැහැරගෙන යන්නන් සම්බන්ධ ක්‍රියාකාරී කොමිටුවේ" නිර්දේශ අනුව හා වෙනත් විශාල බලපෑම් යටතේ අතුරුදහන්වීම් පිළිබඳ නඩු පැවරීම් සඳහා ඒකකයක් නීතිපති දෙපාර්තමේන්තුව තුළම ඇති කරන ලදි. එසේ ඇති කිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රචාරයක් දෙන ලද්දේ බලයෙන් අතුරුදහන් කරවීම පිළිබඳව අපරාධ නීතිය ක්‍රියාත්මක කරවීමට ලංකාවේ රජය රටේ ප්‍රොසිකියුටර් කාර්යය කරන නීතිපති දෙපාර්තමේන්තුව වෙත පවරා ඇතිබව අඟවමිනි. එහෙත් අවසානයේදී එම ඒකකය වෙත යොමුකරණ ලද ලිපිගොනු අතරින් නඩු පැවරීම්වලට භාජනය වූයේ අතලොස්සකි. ඒ අතලොස්ස අතරින්වත් දඬුවම් ලැබූ අයකු ගැන දනගන්නට නැත. මෙය හුදෙක් නිලධාරීන්ගේ නොසැලකිල්ල හෝ අකාර්යක්ෂමතාව පිළිබඳ කරුණක් නොවේ. මෙසේ අදාළ නඩු සාර්ථකව කරගැනීමට බැරිවීමට හේතුව පරස්පර විරෝධී කර්යයන් එකම සංස්ථාවක් තුළට පැවරීමෙන් හා එම ක්‍රියාවලීන් නීතිමය පදනම් මත නොව

දේශපාලන වශයෙන් ඇතිවිය හැකි ප්‍රතිපල මත තීරණ කිරීම සඳහා සිදුවීම නිසාය.

ප්‍රජාතන්ත්‍රවාදී නීතිමය රාමුවක් මත ප්‍රොසිකියුටර්වරයාගේ නිල කාර්යභාරය වන්නේ නීතිය හැර අන් කිසිම කරුණක් මත පදනම් නොවී අපරාධ නඩු පවත්වාගෙන යෑමයි. රජයේ ඕනෑම ඉහළ තනතුරක් දරන්නෙකුට විරුද්ධව නොපැකිලව නිත්‍යානුකූලව නඩු පැවරීමේ හා පවත්වාගෙන යෑමේ හැකියාවත්, ශක්තියත් ප්‍රොසිකියුටර්වරයාට පැවතිය යුතුය. එය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක් තුළ පවතින ඉතාමත් ප්‍රබල නිලයකි. එම නිලය ක්‍රියාත්මක කිරීම සඳහා එම කාර්යයේ නියැලෙන රාජ්‍ය නිලධාරීන්ට රාජකාරී කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ ආරක්ෂාවක් ඔවුන්ට පවතින බවට ඉතා දෘඩ විශ්වාසයක් පැවතිය යුතුය. එවැනි විශ්වාසයක් යථාර්ථවාදීව පමණක් ඇතිවිය හැකි වන අතර හුදෙක් මවා පෑ නොහැකිය. මෙය එම නිළධාරීන් නියෝජනය කරන සංස්ථාවේ සැබෑ නීතිමය බලය පිළිබඳ ප්‍රශ්නයකි. කලයුතු කාර්යභාරය කිරීම සඳහා තමන්ගේ නිල බලතල පිළිබඳව විශාල ආත්ම විශ්වාසයක් ඔවුන්ගේ ආයතනය විසින්ම නිර්මාණය කල යුතුය. නීතිය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන කාලයන් තුළ එවැනි ආත්ම විශ්වාසයක් ඇතිකළ හැකි වූවත් හදිසි නීතිය විශාල වශයෙන් ක්‍රියාත්මක වන කාලයන් තුළදී එසේ කිරීමේ හැකියාව මෙන්ම එසේ කිරීමට අනුබල දෙන මානසික තත්වයද පිරිහී යයි. ලංකාවේ නීතිපති ක්‍රමය හදිසි නීතිවල බලපෑම නිසා ඉතා තදබල පරස්පර විරෝධයන්ට මුහුණ පා ඇති සංස්ථාවකි.

## හදිසි නීතිය අධිකරණය කෙරෙහි අගතිගාමීව බලපෑම

දීර්ඝ කාලීනව හදිසි නීතින් හා ත්‍රස්තවාද විරෝධි නීතින් ක්‍රියාත්මක වන කාලයන්හි අධිකරණයේ බලය විශාල වශයෙන් සීමා කිරීමක් සිදුවේ. රාජ්‍ය බලය පාවිච්චි කිරීමේ හේතුවෙන් ඇතිවිය හැකි සිවිල් අයිතිවාසිකම් කඩවීම් නැතිකිරීම සඳහා සාමාන්‍ය නීතියේදී පවරා තිබෙන තහංචි ගණනාවක් ක්‍රියාත්මක



වන්නේ අධිකරණය තුළිනි. උදාහරණයක් වශයෙන් සාමාන්‍යයෙන් යම් පුද්ගලයකු අත්අඩංගුවට ගෙන පැය 24 ක කාලයක් තුළ ඔහු අධිකරණයක් වෙත රැගෙන ආයුතු අතර ඔහු තවදුරටත් බන්ධනාගාර ගත කල යුතුද නැද්ද යන්න තීරණය කරන්නේ අධිකරණය විසිනි. එහෙත් හදිසි නීති මගින් මෙම කාලසීමාව මාසයක් දෙකක් තුනක් ආදී වශයෙන් දික් කළ හැකිය. ඒ පිළිබඳව ක්‍රියා කිරීමට අධිකරණයට ඇති බලතල සීමා සහිතය. සාමාන්‍ය කාලයකදී සැකකටයුතු යැයි සිතන සෑම මරණ පරීක්ෂණයක් සම්බන්ධයෙන්ම අධීක්ෂණය කිරීමේ භාරය අදාළ මහේස්ත්‍රාත්වරුන් වෙත පැවරේ. මෙය මිනීමැරුම් වළක්වාලීම සඳහා අත්‍යාවශ්‍ය මෙන්ම ඉතාමත් ඵලදායී ක්‍රියා පිළිවෙලකි. එහෙත් හදිසි නීති යටතේ මෙම බලය අධිකරණයට අහිමි කළ හැකිය. 1980 ගණන්වල ක්‍රියාත්මක වුණු එක් හදිසි නීතියකට අනුව සහකාර පොලිස් අධිකාරීවරයකුට පහළ නොවන නිලයක් දරන ඕනෑම අයෙකුට මිනියක් ආදාහනය කිරීමට බලය දීමේ අයිතිය පැවරිණ. මේ අනුව සැකකටයුතු මරණයක් පැවති අවස්ථාවක වුවද අධිකරණය වෙත මළ සිරුරක් යොමු නොකොට ආදාහනය කිරීමේ අයිතිය පොලිස් නිලධාරීන්ටම පැවරිණ. එසේ කෙරුණේ විශාල පරිමාන අතුරුදහන් වීම් ඉදිරියේ කිසිදු අධිකරණමය ක්‍රියා මාර්ගයක් ගැනීමට නොහැකිවන සේ නීතිය සකස් කිරීම මගිනි. අධිකරණයේ බලය සීමාකරන ලදි. හිදිසි නීති යටතේ අපරාධයක් කිරීම වැළක්වීම සඳහා ද අත්අඩංගුවට ගැනීම සිදුකිරීමටද හැකිවිය. මෙයින් අදහස් වන්නේ කිසියම් අපරාධයක් කිරීම හෝ කිරීමට තැත්කිරීමක් නැතිව හුදෙක් අපරාධයක් කිරීමට ඉඩ කඩ ඇතැයි යන්න මත කරන අත්අඩංගුවට ගැනීම්ය. මෙය ඉතා ලෙහෙසියෙන් අනිසි ලෙස පාවිච්චි කළ හැකි බලයක් වන අතර එසේ අනිසි ලෙස පාවිච්චිකර ඇති බවද පෙනේ. විජය කුමාරණතුංග 1982 ජනමත විචාරණයෙන් පසු අත්අඩංගුවට ගැනීම මෙහි කැපීපෙනෙන උදාහරණයකි. මෙවැනි අත්අඩංගුවට ගැනීම් හදිසි නීතියෙන් තොර අවස්ථාවලදී නීති විරෝධී වේ. එහෙත් හදිසි නීති අවස්ථාවකදී අධිකරණයට වුවද මේ ගැන කලහැකි දේ අල්පය. පාපෝච්චාරණ පිළිගැනීම

පිළිබඳව සාමාන්‍ය සාක්ෂි නීතියෙහි ඇති තහංචිද හදිසි නීති මගින් ඉවත් කෙරේ. ඒ මගින් සාධාරණ විනිශ්චය පිළිබඳව පිළිගත් මූලධර්ම සංශෝධනය කොට ඇත. සාමාන්‍ය නීතිය යටතේ නීතියානුකූල ආකාරයෙන් රඳවාගත හැකි ස්ථාන නම් කොට ඇත. ඒවා විවිධ නිල ස්ථාන වන අතර එම ස්ථානවල පාලනය සඳහා විවිධ නීති රීතීන් ඇත. එහෙත් හදිසි නීති යටතේ ඕනෑම ස්ථානයක් රඳවා ගැනීමේ ස්ථානයක් බවට පත්කළ හැකිය. ඒවායේ පාලනය සඳහා හෝ අධීක්ෂණය සඳහා වගකීම් භාරයක් දරන්නන් නැත. මෙම ස්ථාන ඉතා ලේසියෙන් වධකාගාර බවටත්, මරණ සිදුකරන හා මළසිරුරු අතුරුදහන් කරන ස්ථාන බවටත් පත් කරගත හැකිය.

රට පුරා මර්දනකාරී ක්‍රියාවලට ගොදුරුවන විශාල පරිමාන ජනකොටස්වලට මෙන්ම එම කොටස් මුහුණ දෙන ප්‍රශ්න දකින සමස්ත සමාජයටද විධායකය විසින් හදිසි නීති බලතල යටතේ පවරාගන්නා බලයන් නිසා අධිකරණය අසරණ වන්නාවූ ආකාරය පෙනේ. රට තුළ බලතුළනයේ වෙනස විධායකයට විශාල වැඩිබරක් ඇතිව තල්ලුවී යන සැටිද ඔවුහු දකිති. එම අත්දැකීම් තුළින් ඔවුන් බැසගන්නා නිගමනවල ප්‍රතිපලය වන්නේ අධිකරණ ක්‍රියාමාර්ග තුළින් සහන ලබාගැනීම පිළිබඳව ආශාව මෙන්ම විශ්වාසයද බොහෝ සේ ජනවිඥානය හා ජීවිතය තුළින් ඈත්වී යෑමය.

## අපරාධ පරීක්ෂණ ක්‍රමය තුළ ඇතිවූ පසුබෑම හා ව්‍යාකූලත්වය

1970 දශකයෙන් පසු කාලය තුළ ඇතිවූ දේශපාලන වෙනස්කම් මෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවුණු වෙනස්කම්වල බරපතළම ඍණාත්මක බලපෑමට යටත් වූයේ ලංකාවේ අපරාධ පරීක්ෂණ ක්‍රමයය. විසිවන ශතවර්ෂයේ මුල් භාගයේත් ඊට පසු දශකයේත් ලංකාවේ අපරාධ පරීක්ෂණ සම්බන්ධයෙන් ඇතිකරගෙන තිබූ නිපුනතාව හා දක්ෂතාව පිළිබඳව උදාහරණ බොහෝය. උදාහරණ වශයෙන් "ජෝන් සිල්වා ඝාතනය" "ඇඩ්ලින් විතාරණ ඝාතනය" ආදී විශාල මිණීමැරම් ගණනාවක්



සම්බන්ධයෙන් පමණක් නොව දේශපාලනය පසුබිම් කරගෙන ඇතිවූ අපරාධ එනම් "අගමැති බණ්ඩාරනායක ඝාතනය, "1962 රජය පෙරලා දැමීමේ කුමන්ත්‍රනය" ආදී ක්‍රියා සම්බන්ධයෙන්ද අපරාධ පරික්ෂණ ඉතිහාසයේ ජත්‍යන්තර පිලිගැනීමට සුදුසු දියුණුවක් ඇතිවී තිබුණි. එම දියුණුව දක්ෂ ඉහළ නිලධාරීන්ගේ මග පෙන්වීම යටතේ හා ඉතා පැහැදිලිව වර්ධනය කරගෙන තිබූ අපරාධ පරීක්ෂණ මූල ධර්ම හා උපක්‍රම ග්‍රහනය කරගැනීම මගින් සිදුවිය. එවැනි අපරාධ පරීක්ෂණ ව්‍යුහයක් පවත්වාගෙන යෑම සඳහා පොලිස් ආයතනය තුළම උඩ සිට පහළට ක්‍රියාත්මක වන කාර්යක්ෂම අණදීමේ ක්‍රියාමාර්ගයක් පැවතිය යුතුය. එමෙන් ම තොරතුරු හුවමාරුව හා සාක්ෂි තක්සේරුව පිළිබඳව හොඳින් අදහස් හුවමාරුව කරගැනීමට හැකි වාතාවරණයක්ද පැවතිය යුතුය. සංස්ථාව තුළ රහස් රැකගැනීමේ හැකියාව හා එකිනෙකා පිළිබඳව ගරුත්වය හා විශ්වාසයද පැවතිය යුතුය. සෑහීමට පත්විය හැකි ආකාරයකට එවැනි තත්වයක් අතීතයේ දී රට තුළ පැවතිණ. එහෙත් 1971 කැරලි මර්දනකාරී කටයුතු සම්බන්ධයෙන් පටන්ගෙන පසු දශකයන් තුළ වර්ධනය වූයේ අපරාධ පරීක්ෂණ සම්ප්‍රදාය නොව බොහෝ දුරට මිලිටරිමය මර්දනකාරී කටයුතු සඳහා පොලිසිය තුළම සමහර නිලධාරීන් යොදගැනීමය. මේ මගින් පොලිසිය තුළද විශාල දෙබඩි තත්වයක් ඇතිවූයේය. සියලුම අපරාධ එක සේ පරීක්ෂණය කිරීමට පැවරී ඇති ඔවුන්ගේ රාජකාරියත්, පවතින මර්දනකාරී තත්වය යටතේ තම සංස්ථාවෙන්ම නිලධාරීන් මේ සඳහා විශාල වශයෙන් යොදාගැනීමේ දී ඇතිවන ප්‍රායෝගිය මෙන්ම දාර්ශනික ගැටලුත් අතරට ඔවුහු මැදිවූහ.

අපරාධ මර්දනය අද ජාත්‍යන්තරව දියුණුවී ඇති නීතිමය ප්‍රමිතීන් මත පදනම්වී ඇත. පරීක්ෂණ සඳහා ගන්නා සියලුම උපක්‍රම පිටුපස බැරෑරුම් දර්ශනවාදී අදහස් පිහිටා ඇත. සත්‍යය සොයාගැනීමේ අරමුණ එක අතකත්, එසේ සත්‍ය සෙවීමට ගන්නා පියවර තුළ මානව නිදහසට හා මානව ශිෂ්ටාචාරයට අගතිගාමී වන ක්‍රියා වැලැක්වීම අපරාධ පරීක්ෂණ ශිල්පයේ අත්‍යාවශ්‍ය අංගයෝ වෙති. සත්‍ය සෙවීම හා සත්‍ය වසංකිරීම වනාහී

එකිනෙකට පරස්පර ක්‍රියාදාමයෝය. දාර්ශනිකව හා මානසිකව මෙම ක්‍රියාදාමයන් දෙකට එකට පැවතිය නොහැකිය. පසුගිය දශකයන්වල දී අපරාධ පරීක්ෂකයන් මුහුණ දුන් විශාල ගැටලුව මෙය වේ. ඔවුන්ගේ රාජකාරියේ හරය වන්නේ සෑම අපරාධයක් පිළිබඳව එකාකාර බැරෑරුම්කමකින් හා එකාකාර මූලධර්මයන් මත පිහිටා කටයුතු කිරීමය. එහෙත් මෙම දශකයන්හි සිදුවූ ඉතා විශාල පරිමාන ක්‍රියාදාමයන් ඉදිරියේ එම දාර්ශනික හා ශිල්පීය පුහුණුව අනුව කටයුතු කිරීම ඉතාම ගැටලු සහගත තත්වයක් බවට පත්විය.

වෘත්තියක දර්ශනය හා ශිල්පය පිළිබඳව ඇතිවන්නාවූ ගැටලු එම වෘත්තිය තුළ ඇති මානසික ධෛර්යය කෙරෙහිද බලපායි. ආයතනය තුළම සමහරු තමන්ගේ වෘත්තිය යුතුකම්වලින් ඈත්ව අලුතෙන් සමාජය තුළ ඇතිවී ඇති තත්වයන්ගෙන් ලාභ ප්‍රයෝජන ගත හැකිසේ තමන්ගේ මානසික තත්වය හා පලපුරුදු ගොඩනගා ගැනීම සිදුකිරීමට පටන්ගනිති. මුලින් එය ටික දෙනෙක් පමණක් කරන දෙයක් විය හැකිය. එහෙත් වෘත්තිය කෙරෙහි ඇති බැඳීම යම් ආකාරයෙන් අතහැර දමන අයට ලැබෙන විශාල වාසීන් දකින අනිත් අය අතරද සැලකිය යුතු ප්‍රමාණයක මතවාදී හා මානසික වෙනස්කම් ස්වාභාවිකවම ඇතිවේ. ආයතනය තුළ වැඩිබර හොඳ වෘත්තිය ධර්මයන් රකින්නන්ගේ පැත්තේ නොව, ඒවා අඩු වැඩි ප්‍රමාණයෙන් බිඳීම මගින් අවස්ථාවාදී ලාභ ප්‍රයෝජන ගන්නා අයගේ පැත්තට හැරේ. මේ නිසා ඇතිවන්නේ හුදු පුද්ගලික මානසික තත්වයන්ගේ වෙනසක් නොවේ. ආයතනික මානසික තත්වයම වෙනස්වේ. මෙයින් අදහස් කරන්නේ ආයතනය තුළ සියල්ලන්ම එහි මූලධර්ම අතහැර දමන්නන් වන බව නොවේ. ආයතනය තුළ මූලධර්ම රැකීමට පවතින්නා වූ වැඩිබර, නැතිවීයෑමක් සිදුවන බවය. මෙය සිදුවූ විට නිලධාරීන් එකිනෙකා පිළිබඳව පවතින සැකයද පහළ නිලධාරීන්ට ඉහළ නිලධාරීන් පිළිබඳ ඇතිවන සැකයද වෙනත් විවිධාකාර අභ්‍යන්තර තරඟකාරීත්වයක් ද ඇතිවේ. වෘත්තිය ධර්ම රකින දක්ෂ නිලධාරියා මෝඩයකු වශයෙන්ද, අවස්ථාවෝචිතව ප්‍රයෝජන ගත හැක්කා දක්ෂ අදක්ෂබව නොතකා



අනුගමනය කල යුක්තෙක් සේද පෙනෙන්නට පටන්ගනී. ආයතනය තුළ ආයතනයේම හරය හා වෘත්තිය පදනම පිළිබඳ සැකයක් පමණක් නොව උපහාසයක්ද ඇතිවෙන්නට පටන්ගනී.

පසුගිය කාලයේදී ලංකාවේ අපරාධ පරීක්ෂණවල ඇතිවී ඇති පසුබෑම පිළිබඳව දෝෂාරෝපණ රටේ මහජන මතය විසින්මත්, විවිධ රජයන් විසින්මත්, පොලිස් ආයතනයේම ඉහළ නිලධාරීන් විසින්මත්, ජාත්‍යන්තර සංවිධාන මගිනුත් නොකඩවා සිදුවී ඇත. එහෙත් මෙහිදී බොහෝ විට කෙරෙන්නේ යම් අවලාද කියා ගැනීමක් පමණය. ආයතනය තුළම වර්ධනය වී ඇති විශාල ගැටලුත්, එම ගැටලු පවතින තුරු නිසි අපරාධ පරීක්ෂණ ශක්තිය ආයතනයට අහිමිවීමත්, වටහා ගෙන කටයුතු කිරීමට උත්සාහ කරන කිසියම්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකුත් දකින්නට නැත.

## සමස්ත යුක්තිය පසිඳලීමේ ක්‍රමය කෙරෙහි ඉහත තත්වයන්ගේ ඇති බලපෑම

යුක්තිය පසිඳලීම වනාහී යම් මූලධර්ම මත පිහිටා කෙරෙන හරඹයකි. අපරාධයට මුහුණ දෙන්නාත්, අපරාධය කල අයත්, අපරාධය පරීක්ෂා කරන පරීක්ෂකයෝත්, ඒ පිළිබඳව නඩු පැවරීමේ කාර්ය භාරය පැවරී ඇති නීතිපති ක්‍රමයේ නිලධාරීනුත්, මේ පිළිබඳව නඩු අසා විසඳීමේ කාර්ය භාරය ඇති අධිකරණයේ විනිසුරුවරුනුත් මෙම හරඹයේ ක්‍රියාකාරීවන්නෝ වෙති. ඔවුන්ගේ එම ක්‍රියාකාරිත්වයන් බලා සිටින්නේ රටක සමස්ත ජනතාවය. යුක්තිය පසිඳලීමේ රාජකාරී කටයුතුවල යෙදෙන්නන් විසින් ඔවුන්ගේ කටයුතු පිළිගත් මූලධර්ම හා සම්මත පළපුරුදු අනුව කෙරෙන බව දැක ගතහැකි වූවොත් ජනතාව තුළ යුක්තිය පසිඳලීම පිළිබඳව විශ්වාසයක් පමණක් නොව තමන්ගේම සුරක්ෂිතභාවය පිළිබඳව සාධනීය හැඟීමකුත් ඇතිවේ. එහෙත් ජනතාවකට දැකගන්නට හැකිවන්නේ සෘණාත්මකව ක්‍රියාත්මක වන යුක්තිය පසිඳලීමේ ක්‍රමයක් නම් ඒ තුළින් ජනතාව තුළ ඇතිවන්නේ දැඩි අවිශ්වාසය හා අධෛර්යමත්වීම පමණක් නොව තමන්ගේම ජීවිත

අස්ථානගතවීම පිළිබඳව හැඟීමකි. යුක්තිය පසිඳලීමේ සංස්ථා එහි මූලික නීතිමය රාමුවෙන් ඇත්වී අස්ථාන ගතවන අවස්ථාවේ ඇත්තෙන්ම මුළුමනින්ම අස්ථාන ගතවන්නේ සමස්ත සමාජයකි.

ලංකාවේ නීති පද්ධතිය තුළින් දැනටමත් බොහෝ සේ ව්‍යසනයට පත්ව ඇති අනාගතයේදී නැතිවී යා හැකි අංග නම්, ලංකාවේ ව්‍යවස්ථා නීතිය හා ඊට අදාළ රාජ්‍ය ආයතන පිළිබඳ නීතිය (Public Law), අපරාධ නීතියේ ප්‍රධාන අංගයන් හා ක්‍රියාපටිපාටීන්ය. සිවිල් නීතිය සම්බන්ධයෙන් අධිකරණයෙන් පිට කෙරෙන බේරුම්කරණ ආදිය වැඩි වීමට ඉඩ ඇති අතර අධිකරණය මැදිහත්වීමෙන් කෙරෙන සිවිල් කටයුතු බොහෝ සේ නැතිවී යෑමට ඉඩ ඇත. ණය ආපසු ලබාගැනීම, ගෙවල්වල කුලීකරුවන් ඉවත් කිරීම, මෙන්ම දේපල ප්‍රශ්නද විවිධාකාර බලකිරීම් මගින් කෙරෙන්නන් අතට පත්විය හැකිය. මැරවරයනට පවා ඇති ඉඩ කඩ විශාල වශයෙන් පළල් විය හැකිය. රටේ සාමාන්‍ය ජනයාට පමණක් නොව වැඩි ධනවත් කණ්ඩායම්වලට පවා තමන්ගේ ආරක්ෂාව සඳහා විවිධ කණ්ඩායම් හා පුද්ගලයන්ගේ සහාය සෙවීමට සිදුවනු ඇත. පැහැරගැනීම් හා අතුරුදහන්වීම් දේශපාලන කරුණු මත හැර හුදෙක්ම මූල්‍ය ප්‍රතිලාභ අරමුණු කොට ගෙනද සිදුවීමට ඇති ඉඩකඩ බොහෝය.

# පුද්ගලයන් අතුරුදහන්වීම හා නීති ක්‍රමයක් අතුරුදහන් වීම

(මෙය 1998 දී ලියා 'සන්ඩේ ඔබ්සර්වර්' පුවත්පතේ 'Disappearances of persons and the disappearance of a system' යන මුලින් පළ කල ලිපියක පරිවර්තනයකි. ඉන් පසු විවිධ ප්‍රකාශනවල එය නැවත නැවත මුද්‍රණය වී ඇත.)

බටහිර පළාත, දකුණු පළාත හා සබරගමුව පළාත යන පළාත්වල සිදුවූ ස්වකැමැත්තෙන් තොරව පුද්ගලයන් පැහැරගෙනයෑම් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳ පරීක්ෂණ කොමිසම. එහි අවසාන වාර්තාව ඉදිරිපත් කරමින් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කල අතර එම නිර්දේශවල එකක් වන්නේ සියලුම පොලිස් නිලධාරීන්ට අපරාධ පරීක්ෂණ සඳහා පුහුණුවක් දීමේ වැඩ පිළිවෙලක් තිබිය යුතු බවය (80 සහ 174 පිටු). මේ හැර පොලීසිය හා පොලිස් නිලධාරීන් නොවන සාමාන්‍ය පුරවැසියන්ගෙන් සමන්විත කණ්ඩායමක් සෑම පොලිස් ස්ථානයකටම අදාළව පිහිට වියයුතු බවත්, සෑම දිස්ත්‍රික්කයකම රටවැසියන්ගේ උපදේශක ශාඛාවක් පිහිටු විය යුතු බවත්, කොමිෂන් වාර්තාව තවදුරටත් නිර්දේශ කරයි (80 හා 104 වන පිටු). ඉතා පැහැදිලිව පෙනෙන්නේ මෙම නිර්දේශ යෝජනාකර ඇත්තේ ලංකාව තුළ විශාල පරිමාන අතුරුදහන් කිරීම් සිදුකිරීමට පසුබිම සකස් කල ක්‍රියාදාමයන් මගින්, නීතිය ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණයට සිදුවූ හානිය නැති කිරීමට බවය. (සැලකිල්ලට ගතයුතු කරුණක් වන්නේ දේශපාලනයට

සම්බන්ධ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් අතීත සිදුවීමක් නොවන බවත් සිය ගණනක අතුරුදහන්වීම් මෑත අතීතයේදී වාර්තා වී ඇති බවත්ය). *මේ ලිපිය පරිවර්තනය කරන අවස්ථාව වන විට ඇති වාර්තාවලට අනුව 2006 වර්ෂයේදී බලහත්කාර අතුරුදහන් කිරීම් 1000 පමණද 2007 තේ අප්‍රේල් මාසය වන විට එය 300 පමණද වන බව වාර්තා වී ඇත.*

ඇත්තෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය කඩා වැටී ඇත. අධිකරණයේ බලය විරහිතව කරන මිනීමැරුම්, මේ වන විට කැරලි මර්දනයට සම්බන්ධ පරීක්ෂණවලට අදාළ සිදුවීම් මාලාවක් පමණක් නොව සමස්ත අපරාධ පරීක්ෂණ ක්‍රමය තුළටම සූක්ෂ්මව ඇතුළු වූවකි. රටේ බොහෝ ප්‍රදේශවලින් ආත්ම ආරක්ෂාව පිළිබඳ කරන මිනීමැරීම් හා පැනයන සැකකරුවන්ට කරන වෙඩි තැබීම් ගැන නිතරම පැමිණිලි ලැබේ. බරපතළ අපරාධ ගැන පරීක්ෂණ නොමැති වීම හෝ ප්‍රමාණවත් වන පරීක්ෂණ නොමැති බව පිළිබඳ පැමිණිලි නිතරම ඇසෙන පැමිණිලි බවට පත්ව ඇත. අපරාධ පරීක්ෂණ සම්බන්ධයෙන් අල්ලස් දූෂණ පිළිබඳ පැමිණිලිද වසංගතයක් සේ පැතිර ඇතැයි කීමද අතිශයෝක්තියක් නොවේ.

වර්තමාන තත්වය විශාල පරිමාන බලහත්කාර අතුරුදහන් කිරීම් සිදුකල ක්‍රියාදාමයේ අතුරු නිෂ්පාදනයකි. එසේ බලහත්කාර අතුරුදහන් කිරීම් කරවීමට හැකිවන සේ අපරාධ පරීක්ෂණය, නීතියේ ආධිපත්‍යයට හා සැබි පැවැත්ම පිළිබඳ මානව ප්‍රමිතීන්වලට බැඳතබන බරපතළ ගැටගැසීම් ලිහිල් කරන ලදි. එනම් අපරාධ පරීක්ෂකයන් යනු, අපරාධ අනාවරණය කර ගැනීමට, අපරාධ පරීක්ෂණ පැවැත්වීමට, අපරාධ වළක්වා ගැනීමට හා අවශ්‍ය නිපුන තාවයක් පවතින අතරම නීතිය මුළුමනින්ම පිළිපැදීමට කැපවුණු ඉහතා ඉහළ ප්‍රමාණයකින් පරිස්සම් සහගත නුවණක්කාරකමක් ඇති නිලධාරීන් කණ්ඩායමකි. අතීතයේදී එවැනි වෘත්තීයමය නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් කණ්ඩායමක් වගාකර ගැනීම සම්බන්ධයෙන් යම් අඩුපාඩු තිබුණා වූවත් ඉතා විශාල ජයග්‍රහණයන් ලංකාවේ සිදුවිය. මෙසේ ඉතා අමාරුවෙන් උපයාගත්



වෘත්තීය හැසිරීම් පිළිබඳ පළපුරුදු, නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්, නීතිවිරෝධි අත්තඩංගුවට ගැනීම් හා රඳවාගැනීම් ද, වදහිංසා කිරීම් හා මරණ සිදුකිරීම් ද සඳහා උනන්දු කරවීම නිසා යටපත් විය. සාමාන්‍යයෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ හැසිරීම පාලනය කිරීම ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ කෙරෙන විවිධාකාර අධීක්ෂණ මගින් සිදුවන අතර අවසාන වශයෙන් ඔවුන් පිළිබඳ පාලනය අධිකරණ මගින් සිදුවේ. බලහත්කාර අතුරුදහන් කිරීම් සිදුවූ කාලවලදී ප්‍රකාශයට පත් හදිසි නීති හා රෙගුලාසි මගින් මෙම පාලනයන්, ඉවත් කර හෝ ලිහිල් කර දමන ලදි. එසේ නැතිකල එක් පාලනයක් නම්, 'පශ්චාත් මරණ පරීක්ෂණ' අධිකරණයේ අධීක්ෂණයට යටත් වීමය. මෙය කරන ලද්දේ ඉතා ලේසියෙන් මළ මිනී වළලා දැමීමට හැකිවන සේ හදිසි නීති සකස් කිරීමෙනි. මෙහි තාර්කික ප්‍රතිපලය වූයේ අධිකරණයේ නඩු විමසීම්වලින් තොරව මරණ සිදු කිරීමය. මෙයින් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට තමන්ට කැමති ආකාරයට 'අපරාධවලට' ප්‍රතික්‍රියා කිරීමේ 'නිදහස' ලැබිණ. හදිසි නීතිය මගින් නීති ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය නීති රාමුව යටතේ පවත්වාගෙන යෑමට අවශ්‍ය මූලික සීමාවන් මගින් ඉවත් කෙරිණ.

මෙසේ අදාළ පාලනය ඉවත් කිරීම ලෙහෙසි වූවත් එය නැවත ඇති කිරීම ලෙහෙසි නොවේ. හදිසි නීති ඉවත් කිරීම ලෙහෙසිය. ප්‍රධාන විධායකයා හෝ ව්‍යවස්ථාදායකයට මෙය හුදු ප්‍රකාශනයක් මගින් කළ හැකිය. එහෙත් පාලනයෙන් තොරව තමන්ගේ ක්‍රියාවන් කිරීමට පටන් ගත් නිලධාරීන් නැවත එම පාලනය යටතට ගැනීම එතරම් ලෙහෙසි කාර්යයක් නොවේ. ලේ රස බැලීමට ඇති ඉඩ කඩ අසුරා පුරුදු කරගන්නා ලද මුර බල්ලෙකු යම් විධියකින් ලෙයෙහි රසවින්ද හොත් එම සතාගේ හැසිරීම නැවත මුල් පැවති තත්වයට ගෙනා නොහැකිය. විශේෂයෙන්ම මානව සම්පත් පුහුණුකර ගැනීම හා ආකර්ශනීය වෘත්තීය පහසුකම් සැලැස්වීමට මුල් තැනක් නොදෙන රටක් තුළ අපරාධ පරීක්ෂණ නිලධාරීන්ගේ නැති වූ පළපුරුදු නැවත ඇතිකර ගැනීම සඳහා කරන ප්‍රයත්නය ඉතාම අමාරු කාර්යයක් වනු ඇත. මේ අතර

මෙම පරිවර්තනය ඇතිකර ගැනීමේ පමාව සමාජයට අඛණ්ඩව පවතින අවදානමක් ඇති කරයි.

වඩාත් විශාල අවදානම වන්නේ බුද්ධිගෝචර නීති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමයක් පිළිබඳ මතකය පවා අතුරුදහන්වී යා හැකි බවය. අපරාධ පිළිබඳව චෝදනා ලබන්නෝ නීති ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ගේ සම්පූර්ණ ග්‍රහනයට යටත්වී ඔවුන්ගේ අනුකම්පාවෙන් ලබාගත හැකි සහනයක් හැර අන් සහනයක් ලබාගත නොහැකි තත්වයක් බවට පත්වනු ඇත. ‘කොන්ත්‍රාත් මත කරන මිනීමැරීම්’ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ විවිධ මට්ටම්වල එකඟතාව අනුව සිදුවීමට ඉඩ කඩ වැඩිය. නීතිය යටතට පත්වන පුද්ගලයන්ට සලකන ආකාරය සම්බන්ධයෙන් තීරණාත්මක සාධාකය, අල්ලස් හා දූෂණ වීම විය හැකිය. දේශපාලඥයන් මෙම තත්වයෙන් ප්‍රයෝජන ගත හැකි අතර ඔවුන්ම මෙම තත්වය නිසා අමාරුවේ වැටීමටද ඉඩ ඇත. මේ තත්වය තුළ පොලිස් නිලධාරීන් අපරාධ පරීක්ෂණ සම්බන්ධයෙන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් පිළිබඳව කොමිසම කර ඇති නිර්දේශය යෝග්‍ය පමණක් නොව ප්‍රසංසනීය යයිද කිව හැක. එහෙත් එම ක්‍රියාමාර්ගය නීති ක්‍රියාත්මක කරන යන්ත්‍රණයේ දැනට ඇතිවී ඇති ගැටලු නිරාකාරණය කිරීමටත් විශේෂයෙන්ම නීති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටිය නැවත ගොඩනැගීමටත් සෑහෙන්නේ නැත. ප්‍රශ්නයට විසඳුම් සෙවීම ප්‍රශ්නයේ සුවිශාල බව හා බරපතළ බව පිළිබඳව පිළිගැනීමකින්ද අපරාධ පරීක්ෂණ යන්ත්‍රණය තුළ ඇති ව්‍යුහාත්මක ගැටලු අවබෝධ කරගැනීම මතද පදනම් විය යුතුය.

## බලහත්කාර අතුරුදහන් කිරීම් කරවීම උනන්දු කරවීමට යොදාගන්නා ලද සමාජ දර්ශනයඃ නීතිය ඇතුව හෝ නැතුව සමාජ ස්ථාවර භාවය පවත්වාගෙන යා යුතු බව.

පසුගිය දශක තුන ඇතුළත, විශේෂයෙන්ම පසුගිය දශකය ඇතුළත රට තුළ පැවතී ඇති අස්ථාවරභාවය හා අනාරක්ෂිතභාවය නිසා නීතිය ඇතිව හෝ නැතිව පාලනය හා පිළිවෙල පවත්වාගෙන



යාමේ ‘සම්මතයක්’ ඇතිවී ඇත. මෙය පසුපස තිබෙන පූර්ව නිගමනය නම් ‘නීතියම’, සමාජ ස්ථාවරභාවයේ සතුරෙකු විය හැකි බවය. මෙම සිතුම් රටාවට අනුව නීතියේ සමහර අංශ කලහකාරී පුද්ගලයන් හා කණ්ඩායම්වලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට අනවශ්‍ය සීමාවන් පනවයි. මෙයින් ඇඟවෙන්නේ එසේ සීමා යැයි පෙනෙන නීති අයින් කල යුතු බවත් එම සීමාවන් ගෙන් ඉවතට ඒමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට හැකිවූ විට පිළිවෙල හා සමාජ ස්ථාවරත්වය නැවත ඇතිවෙනු ඇතිවෙන බවත්ය.

එම සිතුම් රටාව ‘යතාර්ථවාදී’ යැයි සාමාන්‍යයෙන් සලකනු ලබයි. නීතිය මත පදනම්වී ස්ථාවරත්වය රැකීම යථාර්ථවාදී නොවන බවට පහත සඳහන් හේතු දක්වනු ලැබේ.

m රටට හොඳින් ක්‍රියාත්මක වන නීති ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් පවත්වාගෙන යාමට තරම් වත්කම් නැත. එම නිසා අඩුපාඩු සහිතව නීති ක්‍රියාත්මක කරන යන්ත්‍රණයක් යටතේ ජීවත්වීමට සිත හදාගත යුතුය.

m නීතිය පිළිබඳව උවමනා පමණට වඩා කරුණු දැක්වීමෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ඔවුන් දැන් කරන පමණටවත් රාජකාරී කරගෙන යෑමෙන් අධෛර්යයට පත්විය හැකිය.

m අල්ලස් මෙන්ම දූෂණද, බලය අනිසි ලෙස පාවිච්චි කිරීමද මෙම රටේ සාමාන්‍ය නීතියේ කොටසක් වන හෙයින් ඒවාට විරුද්ධව තදින් සටන් කිරීම බුද්ධිගෝචර නොවන ක්‍රියාවක් විය හැකිය.

m නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව තදින් කියාපෑම ගැටුම්වලට තුඩුදිය හැකි හෙයින් නීතියේ ආධිපත්‍යය ගැන අවදානය යොමුකරන සංස්ථා එනම් අධිකරණය වැනි සංස්ථාවන්ගේ ක්‍රියාකාරීත්වය සීමා කිරීමද අවශ්‍ය විය හැකිය.

ඉහත සඳහන් හා ඊට සමාන අදහස් යම් තත්වයන් යටතේ මිනීමැරුම් සිදුකිරීමේ ක්‍රියාවන් උනන්දු කරවයි.

මෙම සමාජ දර්ශනයේ මාර්ගෝපදේශකත්වය යටතේ කරන ලද ක්‍රියාවලින් ලබාගත් පාඩම් නැවත සලකා බැලීමේ අවස්ථාවක් දැන් උදාවී ඇත. ස්ථාවරත්වය නැවත ගෙන ඒම වෙනුවට මෙම ක්‍රියා මගින් කර ඇත්තේ තත්වය දහස් වාරයක් තවත් අවුල් කිරීමය. එහෙත් අභාග්‍යමත් උත්ප්‍රාසය නම් වඩාත් නරක අතට හැරෙන අස්ථාවරත්වය නිසා ඉහත සඳහන් දර්ශනය නැවත පණ ලැබීමය. මෙය ණය හිමියෙකු ඔහුගේ ණය ගෙවාගන්නට බැරි ණයකරුවෙකුගෙන් ණය ආපහු ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් තවත් ණය දෙන්නා වැනි ක්‍රියාවකි.

## නීති ක්‍රමය සුවපත් කරගැනීම

සංස්කෘතික විප්ලවයෙන් පසු චීන ජාතීන්ට වැටහී ගියේ තමන්ගේ සමාජයේ පැවැත්මම දැන් අවදානමට ලක්වී ඇති බවය. 'මිනිසුන් විසින් සිදුකරන පාලනය වෙනුවට නීතියේ අධිපතිත්වය' යන සටන් පාඨය ජාතික සටන් පාඨයක් වූයේ මේ කාලයේදීය. එතැන් සිට අවුරුදු 20 කට වැඩි කාලයක් තිස්සේ චීනය ඔවුන්ගේ සමාජය, 'නීතියේ ආධිපතිත්වය මත' නැවත ගොඩනගා ගැනීමේ ප්‍රයත්නයක යෙදෙයි. බොහෝ පසුබෑම් මැද්දේ වුවත් 'ටියනාන්මන් චතුරශ්‍රයේ මිනීමැරුම්' ආදී කෲර සිදුවීම් අතරේ වුවත් ඔවුන් මෙම අංශය තුළ විශාල ජයග්‍රහණයන් අත්පත් කොට ගෙන ඇත. ටියනාන්මන් චතුරශ්‍රයේ සිදුවුණු 400 පමණ දෙනාගේ මරණ පිළිබඳව සුවිශාල විරෝධත්ව ප්‍රකාශයක් පැන නැගුණු අතර ලංකාවේ දස දහස් ගණන් බලයෙන් අතුරුදහන්කරවීම් පිළිබඳව පවා ඒ හා සමාන සුවිශාල විරෝධත්වයක් ඇතිවූයේ නැත. චීනය තුළ නීතිය මත පදනම් වුණු පද්ධතියක් ගොඩනැගීම සඳහා ඉතා ආකර්ශනීය උත්සාහයක් සිදුවෙමින් පවතින්නේ එහි රටේ සුවිශාලභාවය හා බිලියනයකට වැඩි ජනතාවක් ජීවත්වීම නිසා ඇතිවන ගැටලු සහගත තත්වයන් නිසා පසු නොබසිමිනි. මහා විශාල වැටීමකට



මුහුණ දීම නිසා විශාල වශයෙන් තුවාල ලබා තිබෙන නීති පද්ධතිය තුළ නැවත නීතියේ ආධිපත්‍යය ගොඩනැගීමත් අතීතයේ ඇතිවුණු වැරදි පුරුදු නැති කර ගැනීමත් මෙම තත්වය නැති කිරීමට උනන්දුවන කාට වුවද බලවත් අභියෝගයක් සේ පවතී. ඉතා බරපතළ අර්බුදයකට මුණදෙන නීති ක්‍රමයක් ප්‍රතිසංස්කරණය කිරීමට උත්සාහ කිරීමේදී කඩා වැටුණු නීතියෙන් ලාභ ලබන අයගේ මානසික තත්වය නිසාද ගැටලු ඇතිවිය හැකිය. සාර්ථක ප්‍රතිපල ලබාදීමට නොහැකි වන ක්‍රමයක් පිළිබඳව පැවතුණු හිතවත් භාවය බොහෝ අය අතුරින් තුරන්වී තිබීමටද ඉඩ ඇත. අභාග්‍ය සම්පන්න පවතින තත්වය යටතේ ජීවත් වීමට ඔවුන් හිත හදාගෙන සිටිනවා විය හැකිය.

සමාජයේ සාධනීය වෙනස්කම් ඇති කිරීමට උනන්දු වෙමින් සිටින සියලු දෙනාගේම සහයෝගීතාවලින් කෙරෙන ක්‍රියා තුළින් පමණක් පවතින තත්වය වෙනස් කළ හැකිවේ. දේශපාලන චින්තකයන්, සමාජ විවේචකයන්, නීතිවේදීන්, විනිශ්චකාරවරුන්, පුවත් පත් කලාවේදීන් මෙන්ම සදාචාරාත්මක සහ අචාරවිධි පිළිබඳව උනන්දුවක් දක්වන්නන් මෙන්ම සියලුම සංවිධානයන්ගේ ආධාරයෙන් මෙම සමාජයේ හරයාත්මක ව්‍යුහය නැවත පුනරුත්ථානය කළ හැකිය.

බටහිර පළාත, දකුණු පළාත හා සබරගමුව පළාත යන පළාත්වල සිදුවූ ස්වකැමැත්තෙන් තොරව පුද්ගලයන් පැහැරගෙන යෑම් හෝ අතුරුදහන් කිරීම් පිළිබඳව පරීක්ෂණ කොමිසමේ අතුරු වාර්තාවේ පහත සඳහන් නිර්දේශද අඩංගුවේ: 'අවසාන වශයෙන් නැවත සමාදාන වීමේ පවුරක් නිර්මාණය කරන ලෙසක් එහි අපේ රටේ ඉතිහාසයේ මේ අභාග්‍යමත් කාලයේ අතුරුදහන් වූ සියලු දෙනාගේ නම් ලියා තබන ලෙසත් අපි යෝජනා කරමු.

ඔබගේ කොමසාරිස්වරුන් සිතන්නේ මෙම නිර්දේශය ජාතික සමාදානය සම්බන්ධයෙන් ඉතා වැදගත් අංශයක් නියෝජනය කරන බවය. මෙම සිහිවටන පවුරෙහි ලාංකීය සමාජයෙහි සියලුම කණ්ඩායම්වලට ඇතුළු වූවන්ගේ නම් සඳහන් වනු ඇති අතර අපගේ හරයාත්මක එකමුතු බවේ සංකේතයක් වශයෙන් එය

අනාගත පරම්පරාවන් උදෙසා පවතිනු ඇත. එය මේ රටේ සෑම දෙනෙකුටම අපට නැතිවුණු අය සම්බන්ධයෙන් ගරු කිරීම සඳහා පවතින ස්ථානයක් වනු ඇත,

මෙය කාම්බෝජයේ ජනඝාතන කෞතුකාගාරය (එය පිහිටා ඇත්තේ කෙමරූජ් සංවිධානය මගින් වදකාගාරයක් බවට පරිවර්තනය කර ගනු ලැබූ පාසැලකය) හා මරණ භූමියේ (මෙය පිහිටුවා තිබුනේ සිරකරුවන් විශාල වශයෙන් අල්වාගෙන ගොස් මරා වළලා දැමූ ස්ථානයකය) මෙන් ප්‍රයෝජනවත් ස්ථානයක් විය හැකිය. මියගිය අයට ගරු කිරීමට හා ඔවුන්ගේ මතකය පවත්වාගෙන යෑමට උදව්වෙනවා මෙන්ම එවැනි සංකේතයක් අප සමාජයක් වශයෙන් මුහුණ දෙන විශාල අර්බුදය අප මතකයට නගනු ලබනු ඇති අතර එම තත්වයෙන් ගොඩ ඒම සඳහා අප ගතයුතු ශිෂ්ට සම්පන්න ක්‍රියාමාර්ගයන් පිළිබඳව ද අපට සිහිගන්වන ස්ථානයක් වනු ඇත.

# කැමැත්ත හා බල කිරීම

**නීති ක්‍රියාත්මක කිරීම කැමැත්ත හා බල කිරීම යන ක්‍රියාවන් අතර ඇතිකර ගනු ලබන්නා වූ සංවේදී හා අවස්ථාවෝචිත සම්බන්ධතාව ගණනාවක් මත සිදුවේ. බල කිරීම මත පමණක් නීති ක්‍රියාත්මක කිරීමට කරන උත්සාහයන්හි දී නීතිය ක්‍රියාකරවන්නා වන රජයත් එම නීති ක්‍රියාවලියනට භාජනවන්නන් වන රටවැසියනුත් අතර බෙදීමක් ඇතිවේ. බලකිරීම් උග්‍ර වුවහොත් සමාජය විසින් රජයේ අණට අකීකරු වීම ද සමහර විට ප්‍රචණ්ඩ ක්‍රියා මගින් ප්‍රතික්‍රියා කිරීමට ද සිදුවිය හැක.**

රජයක් විසින් පාලනයක් ගෙනයෑම හුදෙක් ම හැම දෙනාගේම කැමැත්ත මත ම සිදු නොවේ. යමෙකුගේ විරුද්ධතා නොතකාද නීති ක්‍රියාත්මක කිරීමට රජයකට සිදුවේ. එසේ නොහැකිව විධායක බලය පාවිච්චි කල නොහැක. අණදීම හා අණට අනුව ක්‍රියා කිරීම හුදු කැමැත්ත මත පමණක්ම සිදුවන්නේ නම් අණ නොපිළිපදින විට නීතියක් ක්‍රියාත්මක වීම නතර වේ. මේ අනුව නීති ක්‍රියාත්මක කිරීමේදී බලය පාවිච්චි කිරීමක් සිදුවන බව ඉතා සරල සත්‍යයකි. එමෙන් ම මෙහි අනිත් පැත්ත ද සත්‍යය. එනම් සමාජයක කැමැත්තෙන් තොරව හුදු බලය මත පමණක් නීති ක්‍රියාත්මක කල නොහැක. එසේ බලයෙන් පමණක් නීති ක්‍රියාත්මක කිරීමට ගියහොත් එයින් ඇතිවන්නේ පුද්ගලික නිදහසින් තොර සමාජයකි. එවිට සිදුවන්නේ පාලන කරන ටික දෙනෙකුගේ කැමැත්ත වැඩි දෙනෙකු මත බලයෙන් පැවරීමකි. එවැනි සමාජයක්

තුළ ප්‍රකාශන නිදහස, සංවිධානයවීමේ නිදහස, ආණ්ඩු බලයට පත්කිරීමේ හා පහකිරීමේ නිදහස ආදී කිසිදු නිදහසක් පැවතිය නොහැකිය. විවිධ වර්ගයේ ඒකාධිපති ක්‍රමයන්ගේ ක්‍රියා කලාපය වන්නේ ජනතාවගේ කැමැත්තෙන් තොරව පාලනය ගෙනයෑමේ උත්සාහයයි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් යනු බලය යෙදවීම අවම ප්‍රමාණයෙන් කිරීමට උත්සාහ කරන්නාවූ සමාජයකි. මෙයින් අදහස් වන්නේ නීති නිර්මාණය කිරීමේ දී මෙන්ම නීති ක්‍රියාත්මක කිරීමේදී ද රජයක් විසින් ඇතිකර ගන්නාවූ මතය හා රටවැසියන් ඇතිකර ගන්නා වූ මතය අතර ඉතා  කට්ටු සම්බන්ධයක් ඇතිවන බවය. මේ අනුව නීතියක අඩංගුවන කරුණු පිළිබඳව කැමැත්තක් ජනතාව ප්‍රකාශයට පත්කරයි. එපමණක් නොව නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවද කැමැත්තක් ජනතාව ප්‍රකාශයට පත්කරයි. මේ අනුව සමාජයක වෙසෙන විවිධ පුද්ගලයන් ඔවුන් කෙරෙහි බල පවත්වන්නාවූ නීතින් මූලිකව පිළිගන්නා අතර ඒ ඒ අවස්ථාවලදී නීතියේ ක්‍රියාදාමයට අසුවන වෙන් වෙන් පුද්ගලයෝද නීතියේ සාධාරණභාවය පිළිගනිති. නීතියට අදාළ සියලුම කටයුතු සිදුවන්නේ මෙම කැමැත්තේ පසුබිම තුළය. එසේ සාධාරණ ලෙස පිලිගැනුණු නීතින් එකිනෙකා වෙනුවෙන් ක්‍රියාත්මක කිරිමේදී යම් ගැටීම් ඇතිවීමට පුළුවන. එම අවස්ථාවල දී නීති ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් යම් බලයක් පාවිච්චි කරනු ලබයි.

මෙසේ කැමැත්ත හා බලය අතර ඇති සම්බන්ධය ගෙන බලන කල බලයේ පාවිච්චිය පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ ඇතිකර ඇති සීමා තේරුම් ගත හැකිය. බලයේ පාවිච්චිය පිළිබඳව තහංචි පැනවීමත් එම තහංචි නිරන්තරයෙන්ම ක්‍රියාත්මක කර ගැනීමත් ජනතාවගේ කැමැත්ත මත සිදුවන පාලනයක අත්‍යාවශ්‍යම අංගයක් වේ. මේ පිළිබඳව විශාල වශයෙන් පිළිගත් මතය නම් බලය දූෂණයට තුඩු දෙන බවත් සර්ව සම්පූර්ණ බලය සර්ව සම්පූර්ණ දූෂණයට හේතුවන බවත්ය. යකුන් බැඳ තබා ගැනීම පිළිබඳව මිථ්‍යා කථාවල කියවෙන දේ බලය බැඳ තබාගැනීම



පිළිබඳ දේශපාලන දර්ශනය හා ව්‍යවස්ථා සම්බන්ධ නීතිය තුළින් කියවේ.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ රාජ්‍ය ව්‍යවස්ථාවක් මාර්ගයෙන් කෙරෙන්නේ යම් රාජ්‍යයක් තුළ බලය පාවිච්චියේ දී එම බලය යටත් විය යුතු සීමාවන් නිර්ණයකර ලියා තැබීමය. එනම් එම සමාජය තුළ මහජන කැමැත්ත හා බල පාවිච්චිය අතර සම්බන්ධය පවත්වන්නේ මොන ආකාරයෙන් ද යන්න පිළිබඳව සීමා පැහැදිලිව සටහන් කිරීමය. රාජ්‍ය බලය මෙයින් එපිටට නොයා යුතු බවට ඉරි ඇඳ සලකුණු කිරීමක් මේ මගින් කෙරේ. ප්‍රංශ විප්ලවය මෙන්ම බ්‍රිතාන්‍ය හා ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදී විප්ලව මගින් කෙරුණේ මෙම ඉරි ඇඳීම ඉතා පැහැදිලිව කිරීමය.

ඒකාධිපති පාලනයක් ස්ථාවර කිරීමට උත්සාහ කරන්නන් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව'  යන වචනය පාවිච්චි කරන විට එයින් කරන්නේ ඒකාධිපති ක්‍රියාවලියකට ප්‍රජාතන්ත්‍රවාදී නාම පුවරුවක් ඇලවීම පමණය. ඒකාධිපති පාලනයක හරය වන්නේ බලය පාවිච්චි කිරීමට හැකි සීමා ප්‍රදේශය පුළුවන් තරම් පළල් කරගැනීමත් මහජන කැමැත්තට ඇති ඉඩකඩ පුළුවන් තරම් සීමා කිරීමත්ය. ප්‍රජාතන්ත්‍රවාදයේ ඉරි අඳින්නේ රජයේ බලයේ පාවිච්චිය බැඳ තැබීමටය. ඒකාධිපතින් කරන්නේ මහජනයාගේ කැමැත්ත බැඳතබා එම කැමැත්ත පාවිච්චි කිරීමට ඇති සීමාව අවම කිරීමය. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හා ඒකාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එකිනෙකට හාත්පසින්ම වෙනස් ක්‍රියාවලියක යෙදේ. 1948 හා 1972 ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙක මූලික වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ලියවුණු අතර 1978 ව්‍යවස්ථාව ඒකාධිපති වර්ගයේ ව්‍යවස්ථාවකි.

බලය හා කැමැත්ත අතර සම්බන්ධය සලකා බැලීමේ දී හදිසි නීති යනුවෙන් හෝ ත්‍රස්ත්‍රවාදී විරෝධී නීති යනුවෙන් හඳුන්වා ඉදිරිපත් කරන නීතින්වල අර්ථය හඳුනාගත හැකිය. මෙම නීතින් පිළිබඳ දේශපාලන හරය මෙසේ විස්තර කළ හැකියථ අපි දැන් සාමාන්‍යයෙන් අපි රටේ ජීවත් වන තත්වයට වඩා වෙනස්

තත්වයකට මූණ දෙනවා, සාමාන්‍යයෙන් අපි ජීවත්වුණු සාමාජය තුළදී රජයත් ජනතාවත් අතර ඇති කරගත් කැමැත්ත හා බලය අතර සම්බන්ධය වෙනස් කිරීමට අපට දැන් සිදුවී තිබෙන අලුත් තත්වය නිසා වෙනස් කිරීමට සිදුවී තිබෙනවා, එම නිසා රජය දැන් තමන්ට ඇති බලතල වැඩිකර ගන්නවා, ජනතාවගේ කැමැත්තට ඇති ඉඩකඩ අඩුකර දමනවා, සාමාන්‍යයෙන් සමාජය තුළ පවතින බලය හා කැමැත්ත අතර  ඇඳ ඇති ඉරි අප දැන් වෙනස් කරනවා යන්නය. මේ අනුව හදිසි නීති නමින් හෝ ත්‍රස්තවාදයට එරෙහි නීති නමින් හෝ කෙරෙන්නේ විශාල සමාජ පරිවර්තනයකි. එය ඉතා සුළුකොට දැක්වීමට බලයේ සිටින ආණ්ඩුවක් උත්සාහ කරන නමුත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතා කැමැත්ත පිළිබඳ උනන්දුවක් ඇති කවුරුන් වූවත් හදිසි නීති පනවන අවස්ථාවල ඇතිවන මහා සමාජ පරිවර්තනය තේරුම් ගත යුතුව ඇත.

හදිසි නීති හෝ ත්‍රස්තවාද විරෝධීයයි යන නාමය මත පනවන නීති සාධාරණ වන්නේ කොපමණ ප්‍රමාණයකට ද? ජනතාවගේ කැමැත්ත අනුව ඇති කරන ලද නීති හා සමාජ පැවැත්ම මෙවැනි නීති මගින් වෙනස් කිරීමට ඉඩ දිය යුත්තේ කොපමණ ප්‍රමාණයකට ද? බලය පාවිච්චි කිරීම පිළිබඳව ඇති සීමාව ඉක්මවා යෑම නිසා ඇතිවිය හැකි සෘණාත්මක ප්‍රතිපල වලක්වා ගැනීම සඳහා පනවා ගතයුතු සීමා මොනවාද? යන ප්‍රශ්න මෙහිදී වැදගත් වේ. මෙයින් අදහස් වෙන්නේ හදිසි නීතිය හෝ ත්‍රස්තවාදය පිළිබඳ නීතිය මගින් ප්‍රජාතන්ත්‍රවාදය අවලංගු කල නොහැකි බවය. සමාජයක ඇතිවන සුවිශේෂ අවදානම්කාරී තත්වයක් මගහරවා ගැනීමට ගන්නා පියවර ද එක්තරා සීමා යටතේ සිදුවිය යුතු අතර එසේ නොවුව හොත් සමාජය මුහුණ දෙන අවදානම මුලින් ඇතිවූ ප්‍රශ්නයටත් වඩා ගැඹුරු එකක් වනු ඇත. 'එකක් කඩ තොලු සදාගන්නට ගොහින් සිදුවූ කාරියා, දෙකක් කඩ තොළු හදා දුන්නයි ඉඳුරුවේ ආචාරියා'  යන කියමන මෙහිදී සිහිපත් වේ. රටේ ආරක්ෂාව යන නාමය යටතේ වැඩි බලයක් පාවිච්චි කිරීමට රජයක් ප්‍රයත්න දරන විට එහි යුතුකමක්ව පවතින්නේ ඇති සමාජ ව්‍යසන අවම කිරීම මිස පවතින සමාජ



ගැටලුවක් ප්‍රයෝජනයට ගෙන රජයේ බල පාවිච්චිය වැඩිකර ගැනීම මගින් සමාජය තුළ ව්‍යසනය වඩාත් උග්‍ර කිරීම නොවේ.

බලය හා කැමැත්ත අතර සම්බන්ධය සාකච්ඡා කිරීමේදී ඉතාමත්ම වැදගත් වන කරුණක් නම් නිදහසේ සිතීමට හා නිදහසේ කථා කිරීමට රටවැසියනට ඇති අයිතීන්ය. ජනතාවක් තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන්නේ කථා කිරීම මගිනි. සමාජය තුළ කථාබහ කිරීමට ඇති ඉඩකඩ ඉහළම මට්ටම් තුළින් පවතින තුරු සමාජයේ කැමති අකමැති දේ මොනවාදැයි පැහැදිලිව ප්‍රකාශයට පත්වේ. මෙසේ කථා බහ කිරීම සමාජයකට හානිකර ක්‍රියාවක් විය නොහැකිය. කථාබහට හැකි පමණ ඉඩ තිබෙන තාක් දුරට විවිධ මත දරන කාට වුවත් තමන්ගේ අදහස් වෙනත් අයට දන්වා සිටීමේ හැකියාව ඇත. මේ නිසා සාමාන්‍ය පුරවැසියාගේ බුද්ධිගෝචර විවේචනයට කාගෙ කාගේත් අදහස් අසුවේ. මේවා තෝරා බේරා ගැනීමේ හැකියාව මහජනතාවට ස්වභාවයෙන්ම ඇත. මානව පැවැත්ම සඳහා වඩාත්ම උපයෝගී වන මානව හැකියාව වනාහී කථා බහ කරගැනීමේ හැකියාවයි.

සමාජයට ඇතිවන අවදානමක් නැති කරවා ගැනීම සඳහා කථාබහ කරගැනීම පිළිබඳ සීමාවක් පැනවිය යුතුය යන්න බුද්ධිගෝචර නොවේ. සමාජය වන්නේ ද එසේ කථා බහ කරගන්නා මිනිසුන්ගේම එකතුවකි. යම් අවස්ථාවක දී ඉතා විශේෂිත රහස් පිළිබඳව රජය පමණක් දැනගැනීම සාධාරණ විය හැකිය. එහෙත් එවැනි අවස්ථා ඇතිවිය හැක්කේ ඉතාමත්ම සුළු වශයෙන් පමණකි. අවදානම් තත්වයක්, නැති ගැන්වීමක් ඇති කොට සමාජයේ කථා බහ කිරීමේ නිදහස සීමා කිරීම බලයේ රැ දෙන්නන්ගේ බල සීමාව වැඩි කරගනිමින් ජනතා කැමැත්තට ඇති ඉඩ කඩ අඩු කරන සමාජ විරෝධී ක්‍රියාවලියකි.

වත්මන් සමාජය තුළ කථා බහ කරගැනීමේ නිදහස මාධ්‍ය නිදහස හා බැඳී ඇත. විවිධ අය තමන්ගේ මතයන් විවිධ මාධ්‍යයන් තුළින් ප්‍රකාශයට පත්කරති. එසේ මාධ්‍යයෙන් කෙරෙන වැඩ කටයුතු කාටත් ප්‍රයෝජනවත් වන සේ හසුරුවා ගැනීමට සමාජය

තුළින්ම පොදු කථා බහ මගින්ම ශිෂ්ට සම්පන්න ප්‍රමිතීන් වර්ධනය කරගත හැක. මානව වර්ගයා තමන් කරන සෑම කටයුතු පිළිබඳවම සංයමයක් වර්ධනය කරගැනීමේ ඔවුන් සතු හැකියාවන් අතීත ඉතිහාසය පුරාම පෙන්වා ඇත. එම නිසා මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් හදිසි නීතිය හෝ ත්‍රස්තවාදයට එරෙහි නීතින්ගේ නාමයෙන් තහංචි පැනවීම සාධාරණීකරණය කල නොහැක. ප්‍රජාතන්ත්‍රවාදය හා ඒකාධිපතිත්වය අතර ප්‍රධාන වෙනස පෙන්නුම් කරන්නේ මාධ්‍ය පිළිබඳ පවතින නිදහස තුළින් යැයි කිවහැක්කේ මේ නිසාය.

යම් සමජයක් විසින් තමන්ගේම නිදහස නිර්වචනය කරගන්නවාය යන්නෙන් අදහස් වන්නේ බලය හා කැමැත්ත අතර ඇති සම්බන්ධය එම සමාජය තුළම ඇතිවන ඉතාම ප්‍රබල සාකච්ඡා තුළින් සිදුකර ගන්නවාය යන්නය. එසේ කර ගැනීමේ හැකියාව ලාංකික ජනතාවට ඇත. අතීතයේ පැවති ඇති ප්‍රජාතන්ත්‍රවාදී නොවන පාලන රටාවන් මගින් ජනතා කැමැත්තට එරෙහිව යන බලය පාවිච්චියට ඉඩ කඩ ඇති කරන සීමා මෙම සමාජය මත පටවා ඇත. එහෙත් මෙම සමාජය තුළ ඇතිවී ඇති අධ්‍යාපනික හා වෙනත් පරිවර්තන පදනම් කොට ගෙන ජනතා කැමැත්තට වැඩි ඉඩ කඩ සලස් වන පරිදි රජයේ බලය පාවිච්චිය වඩාත් බුද්ධගෝචර සීමාවන් යටතේ සිදු කෙරෙන පාලන ක්‍රමයක් ගොඩනගා ගැනීමට ලාංකිකයිනට බැරි වීමේ හේතුවක් නැත.

# ලංකාවේ අපරාධ නීතිය හා නීතියේ ආධිපත්‍යය මුහුණපා ඇති ගැටලු

නීතියෙහි ගරුත්වය බොහෝ දුරට රැකෙන්නේ අපරාධ පිළිබඳව නීතිය ක්‍රියාත්මක වන ආකාරයෙනි. මෙම ක්‍ෂේත්‍රයේ දී සාර්ථක අපරාධ නීතියක් ක්‍රියාත්මක වන ආකාරය බලන විට පෙනෙන්නේ ඉතා සූක්ෂ්ම සම්බන්ධතාව හා ක්‍රියාකාරීත්වයන් ගණනාවකි. එක් අතකින් අපරාධ නැති කිරීමට හෝ අඩුම වශයෙන් ඒවා අවම කිරීමට ගන්නා ක්‍රියා මාර්ග ද, තවත් අතකින් සමාජය තුළ වඩා හොඳ හා පහසු සමාජ සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා කෙරෙන විශාල සේවයක්ද මෙම ක්‍රියාදාමයෙහි අඩංගුවේ. මෙම ක්‍රියාදාමය මීයන් ඇල්ලීමේ නියැලෙන පූසන්ගේ ක්‍රියාදාමය වැනි එකක් නොවේ. මානව සමාජ පැවැත්මත් මිනිසුන්ගේ චර්යාවනුත් පිළිබඳ පරිණත අවබෝධයකින් කෙරෙන සමාජමය ප්‍රයත්නයක් වශයෙනි, වැඩි දියුණු අපරාධ නීති ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ.

සමාජය තුළ අපරාධ වශයෙන් සලකන ක්‍රියා නිර්වචනය කරන ආකාරය තුළින් එම සමාජයේ අරමුණු මොනවාදැයි ලේසියෙන් තේරුම් ගත හැකිය. උදාහරණයක් වශයෙන් සමහර සමාජ අධිකරණ නියෝගයකින් පිටස්තරව කෙරෙන සියලුම ජීවිත හානි කිරීම් මිනී මැරීම් යන අපරාධය යටතට වැටෙනසේ සලකණු ලබයි. තවත් සමාජ ක්‍රමයක් තුළ හොරෙකුට හෝ ස්ත්‍රී දූෂකයෙකුට අල්ලා පහර දී මරා දැමීම මිනී මැරුම් යන වරද යටතේ ලා සලකනු

නොලබයි. සමහර සමාජ තුළ පොලිස් අත්තඩංගුවට ගත් පුද්ගලයෙකු රජයේ ආරක්‍ෂාව යටතට පත්වූවෙකු සේ සලකා කටයුතු කරනු ලබන අතර වෙනත් සමජයන් තුළ අත්තඩංගුවට ගැනීමෙන් පසුව වුවද කෙනෙකු මරා දැමීම සාධාරණයැයි සලකනු ලබයි. සමහර සමාජ තුළ සියලුම වර්ගයේ වංචා කිරීම් අපරාධ හැටියට සලකනු ලබන අතර එසේ කරන්නාගේ තරාතිරම ඒ පිළිබඳව වැදගත් කරුනක් සේ සලකනු නොලබයි. එහෙත් වෙනත් සමාජ තුළ වංචාව පිළිබඳ නිර්වචනය පහල සමාජ ස්ථරයන්ට අයත් වූවන්ට පමණක් අදාළ වනසේ නීති සකස් වන අතර සමාජයේ ඉහළ තරා තිරම් දරන්නෝ එවැනි අපරාධවලට අසු නොවනසේ නීතිය ක්‍රියාත්මක කරති. මෙයින් පෙනී යන්නේ අපරාධ යනු මොනවාදැයි එක් එක් සමජය තුළ ඇති එකඟතාව මත අපරාධ නීතිය නිර්මාණය වන බවය.

යම් සමාජයන්හි අපරාධ නීතිය නිර්මාණය කෙරී ඇත්තේ ඔවුන් යටත් විජිතයන් සේ පවතින කාලයන්හි දීය. බොහෝ දුරට රට යටත් කරගත් බලවතාගේ රට තුළ පවතින අපරාධ නීති පද්ධතීන් යටත් විජිතය තුළට ගෙන එනු ලබයි. මේ ආකාරයෙන් නීති පොතට එකතුවන අපරාධ පිළිබඳව යටත් විජිත වාසීන්ගේ අභ්‍යන්තර එකඟතාව හෝ නොඑකඟතාව වැදගත් නොවේ. නීති පොතට නීතියක් ඇතුළත් කිරීමට එම අභ්‍යන්තර මතවාද අදාළ නොවූවත් නීතිය ක්‍රියාත්මක කිරීමේදී එම කරුණු ඉතා බලවත් සේ ක්‍රියාත්මක වේ. බොහෝ විට ඇසීමට ලැබෙන අවලාදයක් නම් පොතේ නීති තිබෙන නමුත් ඒවා ක්‍රියාත්මක නොවන බවය. මේ අවලාදය කරන්නන් බොහෝ විට සිතන්නේ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ අඩුපාඩුවක් තිබෙන බවය. එහෙත් ක්‍රියාත්මක නොවන්නාවූ නීතින් එසේ නොවීමට එක් හේතුවක් නම් එම නීතින් පිළිබඳවම අභ්‍යන්තර එගතාවක් නොමැතිකම වියහැකි බව ඔවුහු සැලකිල්ලට නොගනිති.

නීතිය ක්‍රියාත්මක කිරීමේදී නීතියක් පිළිබඳව අභ්‍යන්තර එකඟතාව හා නොඑකඟතාව බලපාන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කළ හැකිය. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති රාමුවක්



තුළ අධිකරණයක් නිසි නඩු විධිවිධාන ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමෙන් පසු යම් අයෙකු ගැන නිගමනය කරන මරණීය දණ්ඩන තීන්දුවක් පමණක්, නීතිමය වශයෙන් මිනීමැරීමක් සේ සලකනු නොලබයි. අන් සියලුම වර්ගයේ ඝාතන මිනීමරුම් සේ සලකනු ලබන අතර මිනී මැරමක් යන්නෙන් අදහස් වන්නේ දැනුවත් කමක් ඇතුව කරන සියලුම මිනිස් ඝාතනය. එහෙත් තවත් සමහර රටවල රජයේ අනුමැතිය ඇතිව කරනු ලබන මිනිස් ඝාතන මිනීමැරුම් සේ සලකණු නොලබයි. යම් හදිසි නීති තත්වයක් තුළ එම හදිසි නීතියට අදාළ යයි සිතා අත්තඩංගුවට ගන්නා අය මරා දමන්නට රජයක් විසින් කෙලින්ම හෝ වක්‍රාකාරයකින් නියෝගයක් දුන් පසු එම නියෝගය ක්‍රියාත්මක කිරීම මත කෙරෙන මිනිස් ඝාතන අපරාධ නීතිය යටතේ මිනීමැරීම් ලෙස සලකනු නොලබයි. මේ අනුව මිනීමැරීමේ අපරාධය කල අවස්ථාවල දී නීතිය ක්‍රියාත්මක කරන රජයේ බලධාරීන් (උදාහරණයක් වශයෙන් පොලීසිය) විසින් කලයුතු වූ පරීක්‍ෂණ හා නීතිපති ක්‍රමය මගින් කලයුතු නඩු පැවරීම් ඉහත සඳහන් රජයේ අනුමැතිය ඇතිව කරන ලද මිනීමැරුම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු නොලබයි. රටේ දණ්ඩ නීති සංග්‍රහය අනුව දැනුවත්ව කරන සියලුම මිනිස් ඝාතන (අධිකරණයක නඩු තීන්දු ක්‍රියා මාර්ගයකින් පරිබාහිරව) මිනීමැරීමේ අපරාධය යටතට වැටේ. එහෙත් රජයේ අවසරය යටතේ ඝාතන කෙරෙහි එම නීතිය බලනොපාන බවට යම් අභ්‍යන්තර එකඟතාවක් පවතින අවස්ථාවල දී පොතේ ඇති නීතිය ක්‍රියාත්මක නොවේ. එම ක්‍රියාවලියෙහි වගකීම පවතින්නේ අපරාධ පරීක්‍ෂණ කරන නිලධාරීන්ට හා ඒ පිළිබඳව නඩු පැවරීමේ කාර්ය පැවරී ඇති නීතිපති අංශයේ නිලධාරීන්ටද? පොතේ ඇති නීතිය වටහා ගැනීම සම්බන්ධයෙන් රට තුළ අභ්‍යන්තරයේම පවතින ගැටලු නිසා නීතිය ක්‍රියාත්මක කිරීමට පරීක්ෂකයිනට හා නීතිපති දෙපාර්තමේන්තුවට ඇති ගැටලු නොතකා හැරිය හැකිද?

ලංකාවේ අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීම ගැන සලකා බලන විට ඉහත සඳහන් ගැටලුව එනම් නීති පොතෙහි ඇති අපරාධ නිර්වචනය කිරීම හා රට තුළ එම අපරාධ තේරුම් ගන්නා

ආකාරය අතර බොහෝ දුරට වෙනස් වූ අදහස් පවතින බව පෙනීයයි. එම එකිනෙකට වෙනස් අදහස් නීතිය ක්‍රියාත්මක කිරීමෙහිලා බලපා ඇති බව පෙනීයයි.

1971 ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල මර්දනය කිරීමේ දී විශාල සංඛ්‍යාවක් මරා දමන ලද බවත් බොහෝ විට එසේ කරන ලද්දේ ඔවුන් නිල වශයෙන් අත්තඩංගුවට ගැනීමෙන් පසුව බවත් පෙනී යයි. මෙයින් අදහස් වන්නේ එම ඝාතන සටන් වලදී සිදුවූ මරණ නොවන බවයි. මේ අනුව දණ්ඩ නීති සංග්‍රහයේ මිනීමැරුම් යන ගණයට අයිතිවන ඒවා ලෙස සැලකිය යුතුව පැවතිණ. එසේම 1987 සිට 1991 අතර කාලය දක්වා සිදුවී ඇති බවට වාර්තා වී ඇති විශාල ප්‍රමාණයක අතුරුදහන්වීම් ද (බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව කොමිෂන් සභා වාර්තාවලට අනුව තිස්දහසක් පමණ) බොහෝ දුරට නිල වශයෙන් අත්තඩංගුවට ගැනීමෙන් හෝ පැහැර ගෙනයෑම්වලින් පසු කරන ලද ඝාතන වේ. මෙවැනිම අතුරුදහන්වීම් උතුරු හා නැගෙනහිර පළාත්වල 1970 දශකයේ අගභාගයේ සිට මේ දක්වා නොකඩවා කෙරීගෙන ගොස් ඇති බවද වාර්තා වී ඇත. එහෙත් මේ සිද්ධීන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ ක්‍රියා මාර්ග හෝ නඩු දැමීමේ ක්‍රියා මාර්ගයක් සිදුවී ඇත්නම් එය අල්පමාත්‍ර සිද්ධීන් ගණනාවක් සම්බන්ධයෙන් පමණය. එසේ පොතේ ඇති දණ්ඩ නීතිය ක්‍රියාත්මක නොකිරීමට ඇති හේතු වශයෙන් පවතින්නේ අදාළ නිලධාරීන් තමන්ගේ වගකීම් පැහැර හැරීම පමණක් නොව, එම ඝාතන නොතකා හැරීම සඳහා කෙලින්ම හෝ වක්‍රව රජයෙන් ලැබී ඇති අනුමැතිය බව පෙනී යයි. එම අනුමැතිය වැරදි නොවන බවටද සමාජය තුළම යම් මතයක් පවතින බවද පෙනී යයි (මෙහි සමාජය වශයෙන් සඳහන් කලත් සමාජයේ සියල්ලන් මේ පිළිබඳව එකම මතයේ සිටින බවක් නොඇඟවේ. එහෙත් පොතේ ඇති නීතිය ක්‍රියාත්මක වීමට බාධා කලහැකි පමණට රටේ අභ්‍යන්තර මතවාදය බලපාන බව පමණක් මෙයින් ඇඟවේ).

නීති පොතෙහි ඇති නීති හා සමාජයේ අභ්‍යන්තර නොඑකඟතා නිසා වන ගැටලු තවත් එක් අපරාධයක් උදාහරණයට



ගෙන විස්තර කළ හැකිය. එනම් දූෂණය යන අපරාධය පිළිබඳවය. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති ක්‍රමයක් පවතින සමාජයක් තුළ දූෂණය පිළිබඳව නීතිය මෙන්ම සමාජයේ එඟතාවයේ ද දැඩි සමබරතාවක් පවතී. දූෂණය යන අපරාධය නිර්වචනය කිරීමේදී ඒ අපරාධය කරනු ලබනවායයි සැකකරන්නෙකුගේ සමාජ තරා තිරම හෝ රජයක් තුළ දරන නිලතල හෝ බලය ඒ පිළිබඳව බල නොපායි. දූෂණය නැමති අපරාධය සියල්ලන්ටම සම සේ ක්‍රියාත්මක කල යුතු බවට නීති පොත්වල පමණක් නොව සමාජ මතය තුළද වැඩි බරකින් සම්මතවී ඇත. එම නිසා දූෂණය යන අපරාධය යටතට වැටෙන ක්‍රියා කරන ඕනෑම කෙනෙකුට විරුද්ධව අපරාධ පරීක්ෂණ පවත්වා, නඩු පවරා ඒවා ඔප්පු වුව හොත් දඬුවම් කිරීම කෙරේ.

ලංකාව වැනි රටක් ගෙන බලන විට මෙය සිදුවන්නේ ඒ අකාරයෙන් නොවේ. අදාළ නීති අඩංගු පනත්වලට අනුව දූෂණය පිළිබඳ අපරාධය නිර්වචනය කර ඇත. එහෙත් එය ක්‍රියාත්මක වන්නේ ඉතාමත් පටු ක්ෂේත්‍රයක් තුළ පමණය. එසේ වීමට හේතුව වී ඇත්තේ දූෂණයට අදාළ අපරාධ පරීක්ෂණ කරන හා ඒ සම්බන්ධව නඩු පැවරීමේ කටයුතු කරන කොමිෂන් සභාව හා ඊට අදාළ නිලධාරීන්ගේ වගකීම් පැහැර හැරීම නිසාම නොවේ. දූෂණය පිළිබඳ අපරාධය එක්තරා සීමා සහිත ප්‍රමාණයකට පමණක් ක්‍රියාත්මක විය යුතු බවට සමාජය තුළම වැඩි බරක් ඇති මතයක් පවතී. එම වැඩි බර ඇති මතය නිර්මාණය කරන්නේ හා පවත්වාගෙන යන්නේ කුමන ආකාරයකින් වූවත් මෙහිදී වැදගත් කරුණ වන්නේ දූෂණය පිළිබඳ අපරාධය ඉතාමත් සීමිත ක්ෂේත්‍රයක් තුළ ක්‍රියාත්මක විය යුතු බවට සමාජය තුළ ඇති එකඟතාවයය.

සමහර සමාජ තුළ, දූෂණය පිළිබඳ අපරාධය සුළු ක්ෂේත්‍රයකට සීමා කොට ක්‍රියාත්මක කල කාලයන් අභිබවා, එය සියලු දෙනා පිළිබඳවම එක සේ බල පැවැත්වෙන හා ක්‍රියාත්මක වන නීතියක් බවට පත්වී තිබෙන බවද පෙනීයයි. ඇත්තෙන්ම සෑම දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති ක්‍රමයක් වැඩි දියුණු වීමේදීම මෙම වෙනස සිදුවේ. ආසියාවෙන්ම උදාහරණයක් ගෙන මෙය පැහැදිලි කළ හැකිය. එක්දහස් නවසිය හැට ගණන්වලට පෙර හොංකොං

ප්‍රදේශය තුළ දූෂණය පිළිබඳ අපරාධයට විරුද්ධ ක්‍රියා මාර්ගය එක්තරා සීමාසහිත ආකාරයකට පමණක් ක්‍රියාත්මක විය. එහෙත් එම කාලයේ අගදී ඇතිකරන ලද වෙනස්කම් මෙන්ම සමාජය තුළ ඇති එකඟතාව සියල්ලන්ටම සමසේ දූෂණ නීතිය ක්‍රියාත්මක විය යුතු බවට පළල්ව පිළිගැනීමක් සිදුවිය. මෙම එකඟතාවට සරිලන පරිපාලන තීන්දු ගන්නා ලදි. මේ අනුව දැන් දූෂණය පිළිබඳව අපරාධය සියල්ලන්ටම විරුද්ධව එක සේ ක්‍රියාත්මක වන හෙයින් හොංකොං ප්‍රදේශය ලෝකයේ දූෂණ අවම ප්‍රදේශයන්ගේ ගණයෙහි ලා වර්ගීකරණයකර ඇත.

මේ අනුව ලංකාවේ අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඇති විශාල ගැටලු සලකා බැලීමේ දී, ඒ සම්බන්ධයෙන් රටේ නීති හා සමාජය තුළ වැඩි බරක් ඇති අදහස් හා මතවාද පිළිබඳව සලකා බැලිය යුතුව ඇත. අපරාධ පරීක්ෂණ ක්‍රමය හා නීතිපති ක්‍රමය රටේ දණ්ඩ නීතිය ක්‍රියාත්මක කළ හැකි තත්වයට පත්කල හැක්කේ ඔවුන් එම දණ්ඩ නීති පිළිබඳ ඇති පක්ෂපාතීත්වයන් හා පිළිගැනීම ස්ථාවර වූවොත් පමණය. දෙබඩි මානසික තත්වයකින් අපරාධ නීතිය හා එය ක්‍රියාත්මක කිරීමට ඇති සමාජමය බාධා අතර මැදිවී සිටින අපරාධ පරීක්ෂකයන් හා නීතිපති ක්‍රමයේ නිලධාරීන්ට පමණක් ලංකාවේ අපරාධ පරීක්ෂණ පිළිබඳව ඇතිවී ඇති ගැටලු විසඳිය නොහැකිය. එය විසඳිය හැක්කේ දේශපාලන ක්ෂේත්‍රය තුළත්, සමාජ ක්ෂේත්‍ර තුළත්, අපරාධ නීතින් හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව එකඟතාව ඉතා පැහැදිලිව ප්‍රකාශයට පත්වන තත්වයක් නිර්මාණය කිරීමෙන් පසුය. දේශපාලන ක්ෂේත්‍රය තුළ එම එකඟතාව ගොඩනැගීම සියලුම දේශපාලන පක්ෂයන්ගේ යුතුකම වේ. එහෙත් විවිධ දේශපාලන පක්ෂ මෙම යුතුකම ක්‍රියාත්මක කළ හැකි සේ තමන්ගේ මතවාද නිරාකරණයකර තිබේද? මේ ගැන පැහැදිලි අදහස් ප්‍රකාශයට පත්කර තිබේද? යන්න ඒ ඒ පක්ෂ විසිනුත් පොදුවේ සමාජය විසිනුත්, සලකා බැලිය යුතුව ඇත. දේශපාලන පක්ෂ දූෂණය පිළිබඳ ප්‍රශ්නය පිළිබඳව, ඔවුන්ගේ මතවාදයන්ගේද සැලකිය යුතු වෙනසක් කරා ගෙන ආ හැක්කේ එක් එක් පක්ෂයන් තුළම ඇතිවන අභ්‍යන්තර විවාදයන් මෙන්ම



සමාජය තුළ මෙම පක්ෂ ස්ථාවරයන් පිළිබඳව කෙරිය යුතු විවාදය තුළින් පමණය. මෙය දූෂණය පමණක් නොව මිනිස් ඝාතනය හා අන් සියලු බරපතළ අපරාධයන් කෙරෙහිද පොදුවේ බලපායි. මේ සියල්ල සම්බන්ධයෙන් ලාංකීය නීති පොත්වල ඇති නීතීනුත් සැබෑ සමාජ ජීවිතයේ දී ප්‍රකාශයට පත්වන වැඩි බර ඇති මතවාදයනුත් අතර ඇති පරතරය නැති කල යුතුව ඇත.

## මිනීමැරීම යන අපරාධය ගැන ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂවල ස්ථාවරයන්

### ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

දැනට බලයේ සිටින ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂය වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. 1971 ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල මර්දනය කරන ලද හවුල් ආණ්ඩුවේ ද ප්‍රධාන පක්ෂය හැටියට තිබුනේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එම කැරැල්ල මර්දනය කිරීමේදී එදා රජය විසින් අනුගමනය කරන ලද්දේ කැරළිකරුවන් අල්ලා මරා දැමීමේ ප්‍රතිපත්තියකි. මේ අනුව මරණ ලද සංඛ්‍යාව දස දහසක් හෝ ඊට වැඩි යැයි පොදුවේ තක්සේරු වේ. සංඛ්‍යාව කුමක් වූවත් වැදගත් ප්‍රශ්නය වන්නේ මේ සියල්ලන් ඝාතනය කිරීම ලංකාවේ දණ්ඩ නීතිය යටතේ සාධාරණීකරණය කළ හැකිද යන්නය. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති රාමුවක් තුළ කෙරෙන ආකාරයකින් මිනීමැරුම යන අපරාධය අර්ථකතනය කලහොත් මේ ඝාතනවලින් වැඩි ගණනක් මිනිමරුම් සංඛ්‍යාවට වැටෙන බවට සැකයක් නැත. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එම රාජ්‍ය කාලයේ දී මෙන්ම පසුව වුවද මෙම කරුන පිළිගෙන නැත. කැරැල්ල මර්දන කිරීම සඳහා එම ක්‍රියා මාර්ගය ගැනීම සාධාරණය යන ස්ථාවරය එම පක්ෂයේ ස්ථාවරය වේ. මින් කියවෙන අනිත් පැත්ත නම් එම ඝාතන එසේ සිදුවීමේ වගකීම පැවරිය යුත්තේ කැරැල්ල ප්‍රකාශයට පත්කල ජනතා විමුක්ති පෙරමුණට බවය. එහෙත් එම විවාදය හුදෙක් දේශපාලන විවාදයක් පමණය. එම දේශපාලන විවාදය

නම් 'හතුරන් අපව මැරීමට පෙර අපි හතුරන් මරා දැමීම වැරදි වන්නේ කෙසේද' යන්නය. යම් විවාදයක් හුදෙක් ප්‍රචාරක හේතූන් සඳහා යොදා ගන්නා විට මතුපිටින් 'ඒකත් හරි වෙන්නට පුළුවන්' යයි යන අදහසක් මවා පෑ හැකිය. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පසුබිමක් යටතේ සාධාරණ හා අසාධාරණකම් පිළිබඳ විවාද, නීතිය පිළිබඳ විවාදයෙන් පරිබාහිරව කල නොහැක. එසේ හෙයින් 1971 රාජ්‍ය අංශය වෙතින් කෙරුණාය කියනු ලබන ඝාතන තුළින් ලංකාවේ දණ්ඩ නීතිය තුළ අර්ථකතනය කර ඇති ආකාරයට මිනිමැරීම් යන අපරාධය විශාල පරිමාණ අවස්ථා ගණනක දීම උල්ලංඝනයකර ඇති බව පෙනේ. එහෙත් නීතිය එසේ උල්ලංඝනය කිරීම දේශපාලන වශයෙන් සාධාරණීකරණය කිරීම මෙම පක්ෂය වෙතින් කෙරී ඇත.

1987 හා 1991 ගණන් වලදී සිදුවූ ඝාතන අතරට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර අය ද අයත් වූහ. මෙහිදී මෙම පක්ෂ සාමාජිකයෝ අපරාධයට ගොදුරු වූවන් බවට පත්වූහ. මෙම කාලයේ දී තමන්ට මෙන්ම වෙනත් අයටද සිදුවූ ඝාතන, වැරදි ක්‍රියා බවට එම පක්ෂය ස්ථාවරයක් ගෙන ඒ පිළිබඳව විශාල දේශපාලන උද්ඝෝෂණයක ද යෙදිණ. එම උද්ඝෝෂණයේ ප්‍රතිපල වශයෙන් 1994 දී නැවත පිහිටුවා ගත් ආණ්ඩුවක ප්‍රධාන පක්ෂය වීමටද එයට හැකිවිය. එසේ බලයට පත්වීමෙන් පසු තමන් හෙළා දුටු අතුරුදහන්වීම් ඇතුළු ඝාතන පිළිබඳව අපරාධ නීතිය යටතේ ක්‍රියාත්මක වීමට එම ආණ්ඩුව උත්සුක වූයේ නැත. මෙයින් පෙනී යන්නේ දේශපාලන වශයෙන් එම ඝාතන වැරදි බව පිළිගෙන ප්‍රකාශ කරන අතරම නීතිමය වශයෙන් එම නිගමන මත අපරාධ නීතිය ක්‍රියාත්මක නොකිරීමේ එකඟතාවක් එම පක්ෂය මෙම කාලයේදී ද අනුගමනය කල ප්‍රතිපත්තිය බවය. නැවත වරක් 2005 නොවැම්බර් මාසයේ දි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණුඩුවක් පිහිටුවන ලදි. නැවත වරක් එම පිහිටුවන ලද කාලයෙන් පසුද ඝාතන හා අතුරුදහන්වීම් පිළිබඳ පැමිණිලි බොහෝමයක් ප්‍රසිද්ධ වී ඇත. එහෙත් මේ පිළිබඳව රජයේ ප්‍රකාශකයන්ගේ ස්ථාවරය වන්නේ එල් ටී ටී ඊ සංවිධානය කරන මිනීමරුම් ඇතුළු



අපරාධවලට ප්‍රති ප්‍රහාර ලෙස මෙසේ ක්‍රියා කරන බවය. විශේෂයෙන්ම උතුරේ සහ නැගෙනහිර සිදුවී ඇති ඝාතන සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බොහෝ සේ අවහිර කෙරී ඇත්තේ හතුරා මර්දනය කිරීමේදී මෙවැනි ක්‍රියා වැළැක්විය නොහැකිය යන මතයේම පිහිටාය. මේ අනුව යම් දේශපාලන තත්වයන් තුළ මිනීමැරුම් පිළිබඳ අපරාධ නීතිය ක්‍රියාත්මක නොවිය යුතුය යන මතය මත පිහිටා කරන ක්‍රියාවන් දකිත හැකිය.

1971 සිට පවතින මෙම ප්‍රතිපත්තිය පිළිබඳව දැඩි විවේචනයක් එම පක්ෂය තුළ කෙරී ඇති බවට සාක්ෂි පෙනෙන්නට නැත.

## එක්සත් ජාතික පක්ෂය

රටේ ආණ්ඩු බොහෝ වාරයක් පිහිටුවා ඇති එක්සත් ජාතික පක්ෂය මේ පිළිබඳව දරන අදහස් සලකා බලමු.

1971 ඝාතන පිළිබඳ ක්‍රියා කලාපයට සම්පූර්ණ සහයෝගය එකල එක්සත් ජාතික පක්ෂයේ නායකාව සිටි ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවේදීත් වෙනත් අවස්ථාවලදිත් ඉතා නග්නව ප්‍රකාශ කළේය. එවැනි අවස්ථාවල දී එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීම රජයේ යුතුකමය යන්න එම පක්ෂයේ නිල මතය විය. කැරැල්ල මර්දනයෙන් පසු කාලයේදී එම කැරැල්ල මර්දනය කිරීම පසුබිම් කොට ගෙන ඇතිවූ මහජන කලකිරීම ප්‍රයෝජනයට ගැනීම සඳහා එම කාලයේ හදිසි නීතිය අනිසි ලෙස පාවිච්චි කිරීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂය හවුල් ආණ්ඩුවට එරෙහිව දැඩි උද්ඝෝෂණයක යෙදුණේය. එම උද්ඝෝෂණ, හවුල් ආණ්ඩුවේ පරාජයටත්, එක්සත් ජාතික පක්ෂයේ 1977 දී ලැබූ විශාල ජයග්‍රහණයටත් හේතුවූ එක් විශාල කරුණක් විය. එහෙත් බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව නීතිමය වශයෙන් හවුල් ආණ්ඩුව විසින් කරන ලද කටයුතු වැරදිය යන ස්ථාවරය මත කිසිම පියවරක් නොගත්තේය. සිරිමාවෝ බණ්ඩාරනායක ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයිනට සමහර චෝදනා මත විශේෂ කොමිෂන් සභා ඉදිරියේ පරීක්ෂණ පැවැත් වූවත් එම පරීක්ෂණ වලදී 1971 කැරැල්ල මර්දන කිරීම

සම්බන්ධයෙන් නිත්‍යානුකූල නොවන ඝාතන සිදුකලාය යන චෝදනාවක් අඩංගු වූයේ නැත.

බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දකුණේ දි මෙන්ම උතුර හා නැගෙනහිරදී ද අඛණ්ඩව අනුගමනය කල ප්‍රතිපත්තිය වූයේ ත්‍රස්තවාදී යන වර්ගීකරණය යටතට වැටිය හැකි ඕනෑම අයෙකු ඝාතනය කිරීම නිවැරදි බවය. මේ අනුව විශේෂයෙන්ම දකුණු පළාතේ වැඩි දෙනෙකු ඇතුළත් තිස් දහසක් පමණ යැයි සඳහන් වී ඇති අතුරුදහන්වීම් සිදුවිය. තවත් විශාල ප්‍රමාණයක් සාමාන්‍ය නීතියේ දී මිනිමරුම් යටතේ සැලකිය හැකි ඝාතන ද උතුරේ හා නැගෙනහිර සිදුවිය. මේ සියල්ල පිළිබඳ දර්ශනවාදය 'ත්‍රස්තවාදීන් මිනිසුන් නොව මුරුගයන් බවත් ඔවුන්ට එසේ මුරුගයන් ලෙස සැලකිය යුතු බවටත්' ජේ. ආර්. ජයවර්ධන විසින් කරන ලද ප්‍රකාශයෙහි ගැබ්වී ඇත. විසෙන් විස මැරීම යන අදහසත් එකල ප්‍රචලිත අදහසක් විය. ඝාතන ඇතුළු මර්දනකාරී ක්‍රියා සම්බන්ධයෙන් රංජන් විජේරත්න උප ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේ 'මේවා නීතිය මගින් කල නොහැකි බවය' මෙම දර්ශනවාදය එක්සත් ජාතික පක්ෂයේ මූලික දර්ශනවාදයේ කොටසක් ලෙස පවතී.

මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන්ද එක්සත් ජාතික පක්ෂය තුළ කිසියම් ආකාරයක විවේචනයක්වත්, ඇත්ත සොයා කිරීමේ ප්‍රයත්නයක්වත්, පාපෝච්චාරණයක්වත්, කෙදිනකවත් කෙරී නැත.

## ලංකාවේ සම සමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය

කලෙක මේ පක්ෂ ප්‍රබලව පැවතියේය. 1971 හවුල් ආණ්ඩුව තුළ මෙම පක්ෂ දෙක ද සාමාජිකයෝ වූහ. එහිදී දියත්වූ ඉහත සඳහන් මර්දනයේ දී ඔවුහු ද එම රජයේ ක්‍රියා කලාපය අනුමත කලහ. ඊට පසු කුමන කාලයක දීවත් තමන් එහිදී ගත් ක්‍රියා කලාපය වැරදි බවක් පිළිබඳව පිලිගැනීමක් නිල වශයෙන් කර



නැත. සමහරු මෙම ක්‍රියාකලාපය ගැන පුද්ගලිකව පසුතැවුණු නමුත් ප්‍රසිද්ධියේ මේ පිළිබඳව නිල ස්ථාවරයක් කිසි දිනකත් වර්ධනය නොකලහ. ඊට පසු කාලීනව රටේ ඇතිවූ මර්දන සම්බන්ධයෙන් ද දේශපාලන වශයෙන් විරුද්ධතාව ප්‍රකාශකර ඇතත්, ඒ කාලවල සිදුවූ ක්‍රියා පිළිබඳව රටේ අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ප්‍රබල ක්‍රියා මාර්ගයක් ගැනීමට ඔවුනට නොහැකි විය. දේශපාලන වශයෙන් එම මර්දන හෙළාදකින අතරම ඒවා අතීතයේ සිදුවීම් ලෙස අමතක කිරීමේ ක්‍රියා පටිපාටිය ද මෙම පක්ෂ දෙකේ ක්‍රියා කලාපය තුළ තිබේ.

## දෙමළ විමුක්ති කොටි සංවිධානය (එල් ටී ටී ඊ)

තමන්ගේ දේශපාලන දර්ශනයට විරුද්ධවාදී වන්නන් මරාදැමීම යුක්තිහගතය යන ස්ථාවරය එල් ටී ටී ඊ සංවිධානයේ ස්ථාවරයයි. මේ අනුව දෙමළ ජාතිකයන් මෙන්ම සිංහල ඇතුළු වෙනත් ජාතිකයන් ද විශාල ප්‍රමාණයකින් ඝාතනය කොට ඇත. ඝාතනයට ලක් කොට ඇති දෙමළ ජාතිකයන් අතර දෙමළ දේශපාලන පක්ෂ නායකයින් හා වෙනත් දෙමළ දේශපාලන කණ්ඩායම්වලට අයත් අයද අයිති වෙති. සතුරන් පැහැදිලිව වෙන්කර ගැනීම කරනු ලබන්නේත් ඔවුන්ගේ ක්‍රියාවන් ක්‍රියාවට යොදවන්නේත් තමන්ට විරුද්ධ වන කිසිවකු හෝ මරා දැමීමට අයිතියක් ඇත යන පදනම මතය. මේ අනුව දේශපාලන අරමුණු අරභයා කරනු ලබන ඝාතන දණ්ඩ නීතිය යටතේ සැලකෙන මිනී මැරුම් ගණයේ ලා නොසැලකිය යුතුය යන දර්ශනය අඩංගු වී ඇත. තමන්ටම විරුද්ධව දියත් වන මර්දනය ඇතුළු ඝාතන පිළිබඳව නීතිමය විසඳුමක් එනම් මිනිමැරුම් පිළිබඳ සාමාන්‍ය අපරාධ නීතිය යටතේ පරීක්ෂණ පවත්වා නඩු පවරා විසඳිය යුතුය යන අදහසක් ගැන ඔවුහු විශ්වාස නොකරති. ඝාතන ඇතුළු මර්දනයට ප්‍රහාර මිලිටරිමය වශයෙන්ම පමණක් සිදුකිරීමේ ප්‍රතිපත්තිය මත ඔවුහු ක්‍රියා කරති.

## වෙනත් සන්නද්ධ දෙමළ කණ්ඩායම්

මෙම කණ්ඩායම් තමන්ගේ ප්‍රධාන හතුරා එල් ටී ටී ඊ සංවිධානය ලෙස සලකන අතර ඒ අරභයා කෙරෙන ඝාතන පිළිබඳව ප්‍රකාශ කෙරෙන ඔවුන්ගේ මතය ද එල් ටී ටී ඊ යේ මතයට සමානය. එකම වෙනස මෙහිදී සතුරා ලෙස සලකනු ලබන්නේ එල් ටී ටී ඊ ය වීමය.

## ජනතා විමුක්ති පෙරමුණ

1971 කැරැල්ල සම්බන්ධයෙන් ජනාතා විමුක්ති පෙරමුණේ දේශපාලන දර්ශනය වූයේ අවි ආයුධ මගින් බලය පැහැර ගැනීමය. ඒ සඳහා කෙරෙන ඝාතන සාමාන්‍ය අපරාධ නීතිය යටතේ කෙරෙන මිනී මැරුම් ලෙස ඔවුන් පිලිගත්තේ නැත. 1987 අගභාගයේදී ඇතිවූ දෙවන සමයේදී ද තමන්ගේ සතුරන් මරා දැමීම නිවැරදි ක්‍රියාවක් සේ පිලිගෙන කටයුතු කෙරිණ. එම කාලය තුළ පක්ෂය විසින් 6000 ක් පමණ ඝාතන සිදුකරන ලදැයි පක්ෂ නායකයෙකු විසින් පසු කලකදී ප්‍රකාශ කරන ලදි. මෙම ප්‍රතිපත්තිය පසු කලක දී ඔවුන් අතහැර දමා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට ඇතුළු වී ඇත. එහෙත් 1971 සහ 80 අගභාගයේ දී ඔවුන් මෙම කරුන පිළිබඳව ගන්නා ලද ස්ථාවරයන් පිළිබඳව විවේචනාත්මකව නැවත හැරී බැලීමක් හෝ පාපෝච්චාරනයක් දැකගත නොහැකිය. මේ පිළිබඳව පක්ෂයේ අභ්‍යන්තර සාකච්ඡාවට ඉඩ දී ඇති බවක් ද පෙනෙන්නට නැත. ඔවුන් ද කොටස්කරුවන් වූ 2005 නොවැම්බර් මස පත්වූ ආණ්ඩුව තුළ ගෙනයන ලද ඝාතන ඇතුළු මර්දනකාරී ක්‍රියා සම්බන්ධයෙන් ද ඔවුන් ගෙන ඇති දර්ශනය ඒ සම්බන්ධයෙන් ජේ. ආර්. ජයවර්ධන අනුගමනය කල ප්‍රතිපත්තියට වෙනස් නැත.

## වෙනත් කුඩා පක්ෂ

මේ පක්ෂ මගින්ද ලංකාවේ මිනි මැරුම් පිළිබඳ අපරාධ නීතිය දේශපාලන අර්ථකතනයනට යටත් නොකොට ක්‍රියාත්මක



කල යුතු බවට ස්ථාවරයක් පවතින්නේ නැත. ආගම් පවා පදනම් කොටගත් පක්ෂ ඇතත් එම ආගම්වල මූලික සදාචාරාත්මක හරයන් වුවද, දේශපාලන ක්‍රියාදාමයනට අනුබද්ධ ඝාතන වලදී, නොසලකා හරින තත්වයක් පවතී.

## පගාව හා දූෂණ නැමති අපරාධ පිළිබඳ දේශපාලන මත

නිදහස ලබාගැනීමෙන් පසු මුල් කාලයේ ඇතිවූ ආණ්ඩු විසින් බොහෝ දුරට දූෂණ සම්බන්ධයෙන් යටත් විජිත සමයේ බ්‍රිතාන්‍යය විසින් අනුගමනය කල ප්‍රතිපත්තිම වත්වාගෙන යන ලදි. සිවිල් සේවය සහ පාලන ක්ෂේත්‍රය තුළ දූෂණය නැති කිරීමට හෝ අවම කිරීමට කටයුතු කිරීම බ්‍රිතාන්‍යයේම අභ්‍යන්තර සමප්‍රදායන් අනුව වර්ධනය වී තිබුණි. රටේ පලකයන් බවට පත්වූවන් මෙන්ම සිවිල් සේවයේ නියුතු වූවන් ද බොහෝ දුරට බ්‍රිතාන්‍ය පරිපාලන රටාවේම පුහුණු වූ අය වූහ.

1978 වන තෙක් යම් සීමාවන්ට යටත්වී හෝ මූලික වශයෙන් ඉහත සඳහන් ප්‍රතිපත්ති පැවතුණා යැයි කීම අතිශයෝක්තියක් නොවේ යැයි සිතිය හැකිය. එතෙක් පැවති දූෂණ එරෙහි ප්‍රතිපත්ති මුලුමනින්ම නොතකා හරිමින් විශාල පරිමානව දූෂණයට දොරහැරීම සිදුවූයේ 1978 න් පසුය. එක් අතකින් විධායක ජනාධිපති සියලු විධායක බලය තමන් අතට ගත් අතර ඔහුගේ සහායට සිටිය යුතු සියලු දෙනාටම යම් යම් ආකාරවලින් ලාභ ලබාගැනීමට ඉඩ සැලස්වීමද 1978 දී ඉදිරිපත් කරන ලද ආණ්ඩු ක්‍රමය පවත්වාගෙන යාමට අවශ්‍ය කොන්දේසියක් විය. පසු කාලයක ඇමතිවරුන්ගේ සංඛ්‍යාව 105 දක්වා පළල් වීමටත් හේතු වූයේ එම චින්තන රටාවමය. පාර්ලිමේන්තුවේදී විධායක ජානාධිපතිට අවශ්‍ය වූ සහාය ලබාගැනීම සඳහාත් වෙනත් ක්‍රියාවලියන්හි දී ජනාධිපතිවරයාගේ හා රජයේ ප්‍රතිපත්තිවලට පක්ෂපාතීත්වය ලබාගැනීම සඳහාත් දූෂණවලට ඉඩ කඩ දීම වැඩි කරන ලදි. දූෂණ මර්දනය දේශපාලන වශයෙන් අධෛර්යමත් කරන ලදි. 1977 ට පෙර පැවති හවුල්

ආණ්ඩුව දූෂණ මර්දනය කිරීමේ දී කරන ලද යම් වැරදි ක්‍රියා පිළිබඳව දැඩි විරෝධතා ප්‍රචාරයක් ගෙනයමින්ද, ඒවා අතිශෝක්තියට පවා නගමින්ද, දූෂණයට එරෙහි ක්‍රියා කිරීම අධෛර්යමත් කරන ක්‍රියා කලාපයක් අනුගමනය කරන ලදි. 1994 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක් ඇති වූවත් එහි පාලන සමයේ ද අනුගමනය කරන ලද්දේ පළමු විධායක ජනාධිපතිවරයාගේ කාලයේ පැවති ප්‍රතිපත්තීන්මය. මේ කාලය වන විට දූෂණයට එරෙහිව ක්‍රියා කිරීමේ මාවත් ඇහිරී පැවති හෙයින් වඩාත් උග්‍රව දූෂණයේ යෙදීමට මේ කාලය තුළදී හැකි විය. වික්ටර් අයිවන්ගේ 'චෞර රැජිණ' වැනි කෘති මගින් මෙම කාලයේ දූෂණය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මවා ඇත.

ලංකාවේ වාමාංශය වශයෙන් මුල් කාලයේදී පැවති සම සමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂයවත් පසු කාලයේ ඇතිවූ ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන පක්ෂ තුළ වූවත් ලංකාව තුළ ඉතා කාර්යක්ෂම දූෂණය නැති කිරීමේ නීතිමය රාමුවක් ඇති සක්‍රීය යන්ත්‍රණයක් ඇති කිරීමේ ලා උනන්දුවක් තිබූ බවක් පෙනෙන්නට නැත. දේශපාලන වශයෙන් පාලක පංතියේ දූෂණ පෙන්වාදීම වාමාංශික පක්ෂවලින් කෙරිණ. එහෙත් එම විවේචනයේ මූලික අරමුණ වූයේ පවතින ආණ්ඩුවක් බලයෙන් පහකිරීම හා තමන්ද බලයෙහි පංගුකාරයන් වීම මිස රට තුළ මොනම ආණ්ඩුවක් යටතේ වූවත්, දූෂණය මර්දනය කිරීමට හැකි කාර්යක්ෂම සංස්ථාවක් ගොඩනගා ගැනිම නොවේ.

මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙන්ම එක්සත් ජාතික පක්ෂය ද 1978 ඇති කරන ලද ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම සඳහා කිසිදු ඉදිරි දර්ශනයක් හෝ උපාය මාර්ගයක් ඉදිරිපත් කොට නොමැත. ලෝකයේ දූෂණ මර්දන කිරීමේ ප්‍රයත්නය සාර්ථකව ඉටු කල සංස්ථා අනුගමනය කරමින් එවැනි නව ක්‍රියාමාර්ග තුළින් මෙම ප්‍රශ්නය විසඳීමට ඉදිරිපත් වන බවට කිසිම ප්‍රතිඥාවක් ඔවුන් විසින් දී නැත. ඇත්තෙන්ම මෙම පක්ෂ දෙක තුළම දූෂණය සාර්ථකව මර්දනය කිරීමේ අභිලාශයක් පවතින බවට සාක්ෂියක් නොමැත.



වර්තමානයේදීත් ලංකාවේ වාමාංශික පක්ෂ අතීතයේ දී මෙන්ම දූෂණ හෙළාදකින නමුත් එම දූෂණ සාර්ථකව නැති කිරීමට හැකි නිතිමය හා සංස්ථාමය පදනම ඇති කිරීම සඳහා කිසිම හෝ කථනයක් රට තුළට ඉදිරිපත් කොට නැත.

ලංකාවේ සිවිල් සමාජයේ සංස්ථා අතර සමහර කණ්ඩායම් දූෂණය නැති කිරීම පිළිබඳව ප්‍රශ්නය මතුකර ඇත. 'ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැශනල්' සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව මේ පිළිබඳව යම් කථනයක් ඇති කිරීමට උත්සාහ කොට ඇත. එහෙත් වෙනත් සිවිල් සමාජයේ සංවිධාන තුළ මේ පිළිබඳව සැලකිය යුතු මතවාදයක් මේ වන තුරුත් දකින්නට නැත. දූෂණය නැති කිරීමේ සැබෑ හැකියාව ඇති ප්‍රබල සංස්ථාවක් ඇති කිරීම සඳහා රටේ ඉදිරි දර්ශනයක් ගොඩනැගීමට උනන්දුවන කිසිදු පාර්ශ්වයක් මේ දක්වා දකින්නට නැත.

දූෂණය නැති කිරීමේ ක්‍රියා කලාපයන් පිළිබඳව මහජන බලාපොරොත්තුවක් හා විශ්වාසයක් ඇති කිරීමට හැකිවන්නේ දූෂණය මර්දනය කළ හැකි ප්‍රායෝගික ක්‍රියා කලාපයක් ජනතාව ඉදිරියේ තබා, ඊට ජනතාවගේ කැමැත්ත ලාබාගැනීමෙන් පසුය. මෙය ලංකාවේ අනාගතය පිළිබඳව අතිශයින් වැදගත් වන ඉදිරි දර්ශන ගොඩනැගීමක් තුළ පමණක් කළ හැකි ක්‍රියාවකි.

# සංවේදී භාවය හා අපරාධ පරීක්ෂණ රටාව

සංවේදීභාවය හා අපරාධ පරීක්ෂණ රටාවට බැලු බැල්මට එකිනෙකට කිසි සේත් සම්බන්ධයක් නැති අදහස් දෙකක් සේ පෙනෙන්නට පුළුවන. එහෙත් වඩා කිට්ටුවෙන් බැලීමේදී පෙනීයන්නේ මේ වචනවලින් කියවෙන අදහස් අතර පවතින ඉතා සමීප සම්බන්ධතාවයි. සමහර රටවල සාමාන්‍ය පුරවැසියා තුළ පගාව හා දූෂණයට විරුද්ධව දැඩි මතවාදයක් පමණක් නොව ප්‍රතික්‍රියා කිරීමේ හැකියාවක් ද ඇත. තවත් සමහර සමාජ තුළ සාමාන්‍ය ජනතාව ඔවුන් ඉතා අමාරුවෙන් උපයාගත් සම්පත්වලින් කොටසක් පවා පගාදීම සඳහා යොදවන්නේ කිසිදු බාහිර තරහවක් හෝ වෙනත් ප්‍රතික්‍රියාවක් ප්‍රදර්ශනය නොකරමිනි. සමහර සමාජයන් හි පොලිස් නිලධාරීන් යමෙක් පගාවක් පිළිබඳ චෝදනාවක් ඔවුන්ට විරුද්ධව ඉදිරිපත් කලහොත් එය සලකන්නේ උපරිම නින්දාවක් ලෙසය. තවත් සමාජයක පොලිස් නිලධාරීන් පගාගැනීම සලකන්නේ තමන්ගේම දක්ෂතාවයේ ලක්ෂණයක් හැටියටය. සමහර සමාජවල නායකත්වයක් දරන්නන්ට සුළු චෝදනාවක් හෝ එල්ල වුවහොත් ඒ පිළිබඳව වහා පරීක්ෂණ පැවැත්වෙන අතර එම චෝදනාවල සැබෑවක් තිබේ නම් ඔවුන් තම නිලයෙන් ඉල්ලා අස්වේ. එසේ ඉල්ලා අස් නොවුව හොත් ඉල්ලා අස්වීමට බල කෙරෙනවා පමණක් නොව, ඒ කිරීම සඳහා ප්‍රායෝගික මාර්ගයන්ද ඇත. එහෙත් සමහර සමාජවල විශාලතම

අපරාධ හෝ දූෂණ පිළිබඳව චෝදනා කරනු ලැබුවත් ඒ පිළිබඳව පරීක්ෂණ නොපැවෙත් වෙනවා පමණක් නොව එවැන්නන් බලයෙන් පහ කිරීමට පුළුවන් කමක් ද නැත. සමහර සමාජවල එක් මිනීමරුමක් හෝ ස්ත්‍රී දූෂණයක් වැනි කරුණක් පිළිබඳව හෝ පැහැරගෙනයෑමක් හෝ අතුරුදහන්වීමක් වැනි සිද්ධියක් ඉමහත් සමාජ ප්‍රතික්‍රියාවන්ට තුඩුදේ. එහෙත් සමහර සමාජයන්හි එවැනි අපරාධ දහසක් වාරයක් කෙරුණත්, දස දහස් ගණන් පැහැරගෙනයෑම් හා අතුරුදහන්වීම් කෙරුණත්, ඒ පිළිබඳව සාමජය තුළින් පැන නගින්නේ යාම්තම් කෙඳිරියක් මිස ඊට වැඩි දෙයක් නොවේ. සමහර විට එවැනි අපරාධවලට අනුබල දෙන්නන්ගේ හඬ, ඒවාට විරුද්ධ අයගේ හඬට වඩා මහත් හඬකින් පැතිරේ. මෙවැනි වෙනස්කම් ඇති වන්නේ කෙසේද?

බොහෝ විට ඉතා සරල ආකාරයකින් මෙම ප්‍රශ්නයට දෙන පිළිතුරක් වන්නේ මෙවැනි ප්‍රතික්‍රියාවන්හි ඇති වෙනස ඒ ඒ රටවල සංස්කෘතිය පිළිබඳ ඇති වෙනසක් බවය. මෙම මතය ඉතා සුලභව ප්‍රකාශ කරන මතයකි. එහෙත් එසේ ප්‍රකාශ කිරීම, වඩා ගැඹුරකින් මෙම ප්‍රශ්නය දෙස බැලීමකින් කෙරුණක් බව නොපෙනේ.

එකම රටක් තුළ දශක සුළු ගණනක් ඇතුළත එකිනෙකට හාත්පසින් වෙනස් ප්‍රතික්‍රියා කරන්නට එකම සමාජයකම මිනිසුන් පුරුදුවෙන ආකාරය උදාහරණ මගින් දක්විය හැකිය. හොංකොං ප්‍රදේශයේ මිනිස්සු 1960 ගණන්වල අගභාගය දක්වාම පගා දීමේ හා ගැනීමේ පුරුද්දෙහි ගැලී සිටියෝය. පගාව කොතරම් දුරට පැතිරී ගියේද යත් රෝහලක රෝගියෙකු වතුර ටිකක් ඉල්ලා ගැනීමට පවා පගා දිය යුතු විය. ගිණි නිවන රථ ගින්නක් නිවීමට කැඳවූ විට මුලින් කරන්නේ එම ක්‍රියාව කිරීම සඳහා පගා එකතු කරගැනීමය. ගිනි නිවීම පටන් ගන්නේ ඉන් පසුය. පොලිස් නිලධාරීන් දෛනිකව වෙළඳුන්ගෙන් හා වාහන පදිකයන්ගෙන් පගා එකතු කරගැනීමට පුරුදුව සිටියහ. එහෙත් 1970 ව කාලය තුළ, වසර පහ හයක කාලය තුළ, මේ පුරුද්ද විශාල වශයෙන් නැති කිරීමට එහි පාලකයන්ට හැකි විය. අද සාමාන්‍ය හොංකොං වැසියෙකු ගෙන්



පගාවක් ඉල්ලීමට නිලධාරීන් ඉදිරිපත් නොවෙති. පගා පිළිබඳ කිසියම්ම හෝ චෝදනාවලට විශාල සමාජ ප්‍රතික්‍රියාවක් ඇතිවේ. ඉතා සූක්ෂ්ම ආකාරයන්ගෙන් හෝ පගා ගැනීමේ නිරතවන නිලධාරීන් දැඩි දඬුවම්වලට යටත් වෙති. මේ ආකාරයට ඉතා කෙටි කාලයක් තුළ එකම ජනතාවක් තුළ ප්‍රතික්‍රියා කිරීමේ හැකියාව හාත්පසින්ම වෙනස් වන්නාවූ වෙනත් ආකාරවලින් සිදුවීමෙන් පෙනීයන්නේ එම වෙනස සංස්කෘතිය මත පදනම් වූවක් නොවන බවය.

දකුණු කොරියාව 1990 මුල් භාගය වන තෙක් දීර්ඝ කාලයක් පැවතියේ හමුදා ආණ්ඩු යටතේය. එසේ හමුදා ආණ්ඩු යටතේ පවතින කාලය තුළ ඉතා විශාල වශයෙන් මර්දන ක්‍රියා සිදුවිය. කැරළි මර්දනයේ මුවාවෙන් ප්‍රජාතන්ත්‍රවාදීව කෙරුණු විරෝධතා ව්‍යාපාරවලට වෙඩි තබා විශාල පරිමාන මරණ සිදුකෙරිණි. දේශපාලන විරුද්ධවාදීන් අත්තඩංගුවට ගැනීම මහා පරිමාණයෙන් කෙරිණ. භාෂණයේ නිදහස මුළුමනින්ම මෙන් නැති කෙරිණි. වදහිංසාව විශාල වශයෙන් කෙරිණි. සංවිධානවීමේ අයිතිය හා හැකියාව නැති කරන ලදි. එහෙත් 1990 මුල් භාගයේ පටන්ගෙන මේ දක්වා කාලය තුළ මේ සියල්ල නැති කිරීමට හැකිවී තිබෙනවා පමණක් නොව රජය විසින් සිදුකරන සිවිල් නීති උල්ලංඝනය කිරීමට විරුද්ධව ඉතා දැඩි ප්‍රතික්‍රියාවන් මහජනතාව තුළින් පැන නැගේ. මිලිටිරි යුගයේ කෙරුණු වැරදි හරිගස්සා ඇතිවා පමණක් නොව එවැනි වැරදි නැවත නොකිරීමේ දැඩි මානසික තත්වයක්ද රට පුරා පවතී. මෙහිදී ද පෙනෙන්නේ ඉතා කෙටි කාලයක් අතුළතදී එකම ජනතාවක් තුළ පළපුරුදු හා ප්‍රතික්‍රියා කිරීමේ හැකියාවන් පිළිබඳව ඇතිවී ඇති විශාල වෙනස්කම්ය. තීරණාත්මක සාධකය 'සංස්කෘතිය' නම් මේ වෙනස්කම් විස්තර කරන්නේ කුමන පදනමක් යටතේද? සංස්කෘතිය පිළිබඳ මතවාදයක් යටතේ මේ හැසිරීම් රටාවේ ඇතිවී ඇති වෙනස විස්තර කල නොහැකි බව පෙනේ.

තමන්ටම හානිකර වන්නාවූ ක්‍රියා පිළිබඳව ප්‍රතික්‍රියා කිරීමට ඇති වුවමනාව හා කැමැත්ත මිනිසුන් තුළ අඩු වැඩි වශයෙන්

පවතී. බොහෝ දුරට අතීත මර්දන මත ඇතිවන හෝ නැතිවන මානසික තත්වයන් ගැන බැලූ කල එකම සමාජයක් තුළ ඇතිවන මෙවැනි වෙනස්කම් පිළිබඳව වඩා බුද්ධිගෝචර පැහැදිලි කිරීමක් කරා ළඟාවිය හැකිය. යම් රටවල් තුළ පගාව පිළිබඳ පුරුදු හා දූෂණය පිළිබඳ පුරුදු එක්තරා කාලයක් තුළ එම සමාජයේ පාලනයේ ඇතිවන වෙනස්කම් සමාජය තුළට කාවැදීමේ දී ඇතිවන මානසික තත්වයන්ගේ වෙනසක් සේ පෙනේ. වෙනත් ආකාරවලින් මිනිසුන් තමන්ටම හානිකර වන්නාවූ ක්‍රියා කලාපයන් පිළිගෙන ඒවාට යටත්ව ක්‍රියා කිරීම ද යම් කාලයකදී ඇතිවූ මර්දන කිරීම් ඉදිරියේ ලැබූ පරාජයන් නිසා ඇතිවූ මානසික තත්වයන් බව පෙනීයයි. කිසියම් ස්ථිරසාර ක්‍රියා මාර්ගයක් මගින් මෙම පරාජිත තත්වය අවසන් කරනු ලැබුව හොත් ඉතා කෙටි කාලයක් තුළ එම ක්‍රියාවලට විරුද්ධව විශාල ප්‍රතික්‍රියා පැන නැගෙන හැටි දැකගත හැකිය.

සමාජයේ සිදුවන යම් සාරදර්ශී වර්ධනයන් හෝ මර්දනය නිසා ඇතිවන පරාජිත තත්වයන් නිසා ඇතිවන මානසික තත්වයන් අතර ඇති වෙනස ඉහත සඳහන් සමාජවල පවතින වෙනස්කම්වලට හේතුව බව පෙනීයයි. මිනිසුන් තමන්ගේ පැවැත්මටම හානි කරවන්නා වූ බලවේගවලට විරුද්ධව සටන්කොට ඒ පිළිබඳව අතීතයේ දී ජයග්‍රහණ අත්පත් කරගෙන එම ජයග්‍රහණ අඛණ්ඩවම පවත්වාගෙන ගියහොත් එම සමාජය තුළ මිනිසුනට හානි කරවන ක්‍රියාවලට එරෙහිව ප්‍රතික්‍රියා කිරීමට විශාල හැකියාවක් ඇතිවේ. අතීතයේ සිදුවූ එම වර්ධනය ගැන නොදැන එම සමාජය දෙස බලන්නෙකු සමහර විට සිතනු ඇත්තේ මෙය හුදෙක්ම සංස්කෘතික ලක්ෂණයක් ලෙසය. එය එම සමාජයට ආවේනික හා ස්වභාවික දෙයක් සේ පෙනෙන්නට පුළුවන. එහෙත් එම සාධනීය භාවයේ ප්‍රතික්‍රියා තුළ ඇත්තේ අතීතයේ ලබාගත් ජයග්‍රහණ නිසා මතුවුණු මානසික තත්වයන් වඩ වඩා ස්ථාවර වෙමින් මිනිස් මනස හා මතකය තුළටද කාවැදී ඔවුන්ගේ සිතුම් හා හැඟීම් රටාව තුළටම කිඳා බැස තිබීමය. එවැනි ප්‍රතික්‍රියා කිරීමේ හැකියාවක් නැතිවී යන්නේ විශාල බාහිර බලපෑම්වලට



යටත්ව විශාල පරාජයන්ට යටපත් වී සමාජයේ විශාල කොටසක් තුළ එම සාධනීය මානසික පළපුරුදු නැතිවී ගියහොත් පමණය.

අනෙක් අතට ප්‍රතික්‍රියා කිරීම අඩුවී හෝ නැතිවී බෙලහීන තත්වයට පත්වූ සමාජයන් දෙස බැලීමේදී පෙනියන්නේ යම් කාල පරිච්ඡේදයන් තුළ එම සමාජ කිසියම්ම හෝ විශාල පරාජිත තත්වයනට මුහුණ දුන් බවය. පරාජිත භාවයේ දැඩි මානසික පළපුරුදු හා හැඟීම් රටාවක් යම් සමාජයක් තුළට කිඳා බැසගත් පසු එම සමාජය තමන්ටම හානිකර වන්නාවූ ක්‍රියාවන් පවා වැඩි විරෝධතාවකින් තොරව පිළිගනී. බාහිර වශයෙන් බලන කල පෙනියන්නේ ඔවුන් ස්වභාවයෙන්ම පරාජිතයන් වූ මිනිසුන් කණ්ඩායමක් ලෙසය. පරාජිතභාවය ස්වාභාවික ලක්ෂණයක් සේ පෙනෙන තරමට ගැඹුරුවූ පසු එය සංස්කෘතික ලක්ෂණයක් සේ පෙනේ. එය අදාළ මිනිස් කණ්ඩායමේ ආගම් හා වෙනත් දර්ශනවාද නිසා ඇති වූයේ යයිද සමහරු කියන්නට පටන්ගනිති. එහෙත් අතීතය දෙස සුපරීක්ෂාකාරීව සොයා බැලුවහොත් පෙනියන්නේ අතීතයේ දී ලබන ලද සමහර පරාජ තුළින් මතුවුණු මානසික තත්වයන්, අඛණ්ඩව පැවතීගෙන යෑම නිසා වර්තමානයේදී ඇති වන තමන්ටම හානි කරවන්නා වූ ක්‍රියා විඳදරා ගැනීමට එම සමාජය තුළ වැඩි දෙනෙක් පුරුදුව සිටින බවය.

මිනිසුන්ටම වන හානි වලක්වා ගැනීමට කරන උත්සාහයේදී, ලබන පරාජ හෝ ජයග්‍රහණ නිසා ඇතිවන මානසික තත්වයන් තුළින් යුක්තිය හා අයුක්තිය පිලිබඳ දර්ශනයන් ඉස්මතු වී එයි. පරාජිත සමාජ තුළ අයුක්තිය පිළිබඳ දැඩි සංකල්පයන් නැත. සමහර විට එම සමාජයම තුළ ටික දෙනෙකු තුළ එවැනි සංකල්ප තිබෙන්නට පුළුවන. එසේ වන්නේ මිනිසුන්ට වන හානිකර ක්‍රියා ඉදිරියේ ස්වභාවිකවම ඇතිවන ප්‍රතික්‍රියා මුළුමනින්ම වළලා දැමීමට, ඉතාමත්ම විශාල වශයෙන් සිදුවන මර්දන ක්‍රියාවලට ද බැරි නිසා විය යුතුය. මෙයින් අදහස් වන්නේ තමන්ටම වන්නාවු හානි පිළිබඳව ප්‍රතික්‍රියා කිරීමේ උවමනාව හා හැකියාව කිසියම් හෝ සමාජයකින් මුළුමනින් නැති කල නොහැකි බවය. එහෙත් පරාජිත සමාජයක වැඩි දුරින් ඉස්මතු වන්නේ ප්‍රතික්‍රියා කිරීමේ නොහැකියාව වන

අතර අතීත ජයග්‍රහණයන් අඛණ්ඩව පවත්වාගෙන යන හෝ අතීත පසු බැසීම් සාර්ථකව පරාජය කර ඇති සමාජ තුළ වැඩි වශයෙන් ප්‍රකාශවන්නේ ඉතා ප්‍රබල ආකාරයෙන් තමන්ට හානිකර වන්නා වූ ක්‍රියා සම්බන්ධයෙන් ප්‍රතික්‍රියා කිරීමේ හැකියාවයි.

ප්‍රතික්‍රියා කිරීමේ හැකියාව පිළිබඳව වත්මන් සමාජය දෙස වඩාත් කිට්ටුවෙන් පරීක්ෂාකරන විට පෙනීයන්නේ එය බොහෝ දුරට එම සමාජයන්හි පවතින යුක්තිය පසිඳලීමේ විධි ක්‍රමයන්හී ඇති සාධනීය ලක්ෂණ මත පදනම් වන බවය. වර්තමාන ලෝකය මිනිසුන් අතරින්ම එකිනෙකා කෙරෙහි හානිකර වන ක්‍රියා අපරාධ වශයෙන් නම් කරයි. එසේ අපරාධ වශයෙන් නම් කිරීමෙන් පසු ඒවා නැති කිරීම සඳහා තමන්ගේ යුක්තිය පසිඳලීමේ විධික්‍රමයන් වර්ධනය කර ගනිති. වර්තමාන ලෝකය තුළ මෙම විධික්‍රමයන් පදනම් වන්නේ අපරාධ නැමති මිනිසුන් විසින් එකිනෙකාට හානිකරගත හැකි ක්‍රියා වලක්වාලීම සඳාහා දියුණුකර ගත්තාවූ ප්‍රඥාගෝචර ක්‍රියා මාර්ගයන්ය. මෙම ප්‍රඥාගෝචර ක්‍රියා මාර්ගයන් ඉබේ ඇති නොවේ. ඒවා ඇති වන්නේ සමාජයේම මිනිසුන් තමන් අතර ඇතිකර ගන්නාවූ ගැඹුරු මතවාදයන් හා සාකච්ඡා මගිනි. එසේ එල්බගත් ප්‍රඥාගෝචර යැයි සැලකෙන ප්‍රායෝගික ක්‍රියා මාර්ගයන් ක්‍රියාවට දැමීම තුළින් අපරාධ මර්දන කිරීමේ සාර්ථක ප්‍රතිපල ලබාගත් විට එම සමාජය තුළ අපරාධ මැඩගැනීමට තමන්ට ඇති ශක්තිය පිළිබඳව විශ්වාසයක් ඇතිවේ. එම විශ්වාසය මතින් අපරාධයැයි සැලකෙන ක්‍රියාවලට විරුද්ධව ප්‍රතික්‍රියා කිරීමේ හැකියාව වැඩිවේ. එසේ වැඩි වුණු විට එයමද ස්වාභාවික දෙයක් ලෙස පෙනෙන්නට පුළුවන. සමහරුන් එය සංස්කෘතික ලක්ෂණයක් සේ දකින්නටද පුළුවන. එහෙත් ඇත්තෙන්ම මෙහි ඇත්තේ ප්‍රඥාගෝචරව වැඩි දියුණු කරගත් ප්‍රායෝගික විධික්‍රම ගණනාවක් ජනතාවකගේ සිත් තුළ කාවැදී ඔවුන්ගේ සිතීම් හා හැඟීම් රටාව කෙරෙහි බලපාන ආකාරයයි. පරාජිත සමාජයක් තුළ පවතින්නේ මෙහි අනෙක් පැත්තයි.

වර්තමන් ලෝකයෙහි අපරාධ මැඩගැනීමට වර්ධනය කරගෙන ඇති විධික්‍රම අතර ඉතාමත්ම වැඩි ශක්තියක් ඇති විධික්‍රමය



වන්නේ සමාජයක් තුළ අපරාධ පරීක්ෂණය පිළිබඳව වැඩි දියුණු කරගන්නා වූ දර්ශනවාද හා පළපුරුදුය. සමාජය තුළම කෙරෙන කථා බහ මගින් හා වාද විවාද මගින් නිසි ලෙස අපරාධ හඳුනාගැනීමටත් අපරාධකරුවන් සොයා ගැනීමටත් විධික්‍රම වර්ධනය කරගත් විට අපරාධ තමන්ගේ ග්‍රහණයට හසු නොවන ක්‍රියාවන් නොවන බව සමාජයක් ඒත්තු ගනී. එසේ අපරාධ පරීක්ෂණය පිළිබඳව හැකියාවන් මගින් තමන්ට හානි කරවන්නා වු ක්‍රියා වළක්වා ගැනීමට හැකි බව ඉතා තදින් ඒත්තු යැමෙන් පසු මිනිස්සු ඊට තුඩුදුන් දර්ශනවාද හා පළපුරුදු වඩ වඩාත් පළල්ව තම සමාජයේ විඥානයට ඇතුළුකර ගැනීමට වෙහෙසෙති. එසේ කිරීම මගින් අපරාධ පරීක්ෂණ කිරීමේ මෙන්ම එම පරීක්ෂණයට සහයෝගය දීමේ මානසික තත්ත්වයක් ද ජනතාව තුළ ඇතිවේ. මෙම මානසික තත්වය පළල්ව පැතුරුණු පසු සමාජයකට හානිකර වන්නා වු ක්‍රියා ඇතිවන මුල් අවධීන් තුළදීම ඒවාට ප්‍රතික්‍රියා කර ඒවා වළක්වා ගැනීමේ හැකියාව ඇතිවේ. සමාජය තුළ එකිනෙකාට වන වැරදි වළක්වා ගැනීම සඳහා ජීවමාන සහයෝගයක් ඇති වන්නේත් ප්‍රායෝගික ක්‍රියා මගින් උපන් එවැනි සංවේදී භාවයක් එම සමාජ තුළ ඇතිවීමෙනි.

**නීතිඥ බැසිල් ප්‍රනාන්දු**

**ආසියානු මානව හිමිකම් කොමිසම**

# අපරාධ පරීක්ෂණ හැකියාවෙන් හීන සමාජය වලිගය නැති ගොනා වැනිය

වලිගය ඇති ගොනා මැස්සන්ට බැට දෙයි. අපරාධ පරීක්ෂණ ශක්තියෙන් යුතු සමාජ එම සමාජයන්හි ඇතිවන අපරාධ ඉතා සාර්ථකව පරීක්ෂා කොට අපරාධකරුවන් නීතිය ඉදිරියට පැමිණවීම මගින් තම සමාජයේ ස්ථාවරභාවය පවත්වා ගෙන යයි. එවැනි තත්වයක් තුළ සාමාන්‍ය ජනතාව අතර තමන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව දැඩි බියක් හා චකිතයක් ඇති වන්නේ නැත. එහෙත් වලිගය නැති ගොනා මැස්සන්ගේ අතවරය ඉදිරියේ අසරණ වෙන්නාක් මෙන් අපරාධ පරීක්ෂණ ශක්තිය නැති සමාජයක ජනතාව අපරාධකරුවන් හා නීති විරෝධීව ධනය උපයන්නන් ඉදිරියේ අසරණ වෙයි.

අපරාධ පරීක්ෂණ ශක්තියක් ඇති සමාජ තුළ අපරාධ ඇති නොවන බවක් මෙයින් අදහස් නොකෙරෙයි. වෛද්‍ය පහසුකම් ඉතා වැඩි දියුණු සමාජයක් තුළ ලෙඩ රෝගවලට මුහුණ දෙන ආකාරයෙන් අපරාධ පරීක්ෂණ ක්‍රම වැඩි දියුණු වුණු රටක ජනතාව අපරාධකරුවන්ගෙන් ඇතිවන තර්ජනවලට මුහුණ දෙති. ජනතාව අතර තමන්ට ඇතිවන අතවර පිළිබඳව වහා පැමිණිලි කිරීමේ පුරුද්ද ඇතිවන අතර එම පැමිණිලිවලට වහා ප්‍රතිචාර කිරීමේ හැකියාව අපරාධ පරීක්ෂණ ආයතන තුළ ඇතිවේ. ජන විශ්වාසයත් අපරාධ පරීක්ෂණයේ ඇති නිපුනතාවත් මත ඇතිවන අපරාධ විසඳා ගැනීමේ හැකියාව එම සමාජ තුළ ස්ථාවර වේ. තමන්ට

අපරාධ විසඳාගත හැකිය යන විශ්වාසය සමාජය තුළ පැතිර පවතින විට ඒ මගින් ඇති වන්නේ දිරිමත් මෙන්ම ප්‍රබෝධමත් සමාජයකි. සුළු ප්‍රශ්න මුල් අවධියේම නිරාකරණය කරගැනීමට අපරාධ පරීක්‍ෂණ ක්‍රමයට හැකිවන විට එම ප්‍රශ්න දිග්ගැස්සී ඊට වඩා වැඩි ප්‍රශ්න ඇතිවීම වළක්වා ගැනීමට ඇති ඉඩ කඩ වැඩිය.

වැඩි දියුණු අපරාධ පරීක්‍ෂණ ක්‍රමයක් නැති කල අපරාධ මර්දනය සඳහා සාර්ථක ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් ගොඩනගාගත නොහැක. ප්‍රායෝගික උපායමාර්ග මගින් අපරාධ සොයා බැලීම තුළින් අපරාධ නිරාකරණය කරගැනීමට බැරි අවස්ථාවලදී සමාජ තුළ අපරාධ මර්දනය පිළිබඳව බොහෝ මනෝවිකාරයන් පැන නගී. සමහරු එල්ලුම් ගස නැවත ඇති කිරිමේ මාර්ගයෙන් අපරාධ මර්දනය කරන ලෙස විවිධ මතවාදයන් ප්‍රකාශ කිරීමට පටන් ගනිති. බොහෝ විට විවේචනශීලී බුද්ධියක් නැති නිසා හෝ වෙනත් ආකාරයකින් පටු අදහස් මත පදනම් වන්නා වූ හෝ මාධ්‍යවේදීහු පවා මරණීය දණ්ඩනය පිළිබඳව උනන්දු සහගත ප්‍රචාරකවාදීන් බවට පත්වෙති.

නිපුන අපරාධ මර්දන යන්ත්‍රණයක් යම් රටක් තුළ නැතිකමින් ඇතිවිය හැකි තවත් මානසික තත්වයක් නම් එකිනෙකා තමන්ගේ ආරක්‍ෂාව පතා යම් බලවතුන් වටා ගොනුවීමය. නීතිය තුළින් අපරාධ වළක්වා ගැනීමට බැරිකම නිසා විවිධ බලවතුන් වෙත මෙසේ යොමුවීම මගින් සමාජය තුළ අපරාධයට නැඹුරු වූවන්ගේ බලය වැඩි වීමට පටන් ගනී. මැතිවරණයකට පවා මුහුණ දී ඡන්ද දිනා ගැනීමේ ශක්තිය මැරවර ලෝකයත් සමඟ ඇති සම්බන්ධකම් තුළින් පමණක් කරගත හැකිය යන මතයක් සමාජය තුළ පැතිරයෑම නිසා මැරවර ශක්තියක් ඇත්තෝ දේශපාලන තලයෙහි වැඩි බලයක් අත්පත් කර ගනිති. මෙසේ සිදුවුණු කල මුළු දේශපාලන ක්‍රියා දාමයම විශාල පරිවර්තනයකට ලක්වේ. එම පරිවර්තනයේ උත්ප්‍රාසජනක ප්‍රතිපලය වන්නේ අපරාධ තවදුරටත් වැඩි වීමය. මත්ද්‍රව්‍ය ජාවාරම් හා සමාජයේ සෑම අංශකටම බලපාන විවිධ නීති විරෝධී ක්‍රියා මාර්ග ආදිය



මේ නිසා සෑම තැනකම සිදුවන්නට පටන් ගනී. මේ සියල්ලේම ප්‍රතිපලය ද වලිගය නැති ගොනාගේ තත්වය සියලුම පුරවැසියන් අතර පැතිරී යෑමය.

අපරාධ පරීක්‍ෂණය බුද්ධිගෝචර ක්‍රියාවලියක් සේ කරගැනීමට නම් විවිධ දක්‍ෂතාව හා උපාය මාර්ග අපරාධ පරීක්‍ෂණය කරන්නන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ. අපරාධ පරීක්‍ෂණයෙහි ලා ඉතාමත් වැදගත් අංග දෙක නම් සාක්ෂි පිළිබඳ මූලාශ්‍ර වන සිද්ධීන් හා තොරතුරු එනම් දත්තයන් එකතු කිරීමේ හැකියාවත්, ඒවා පිළිබඳව කල්පනා කිරීමට ඇති තාර්කික බුද්ධියත්ය. මේ පිළිබඳව විස්තරයක් කරන ඩේනිෂ් ජාතිකයෙකු කියා සිටියේ අතීතයේදී ඔවුන්ගේ රටේ පොලිස් නිලධාරීන් තෝරා ගැනීමේ දී උස මහත රළු පෙනීමක් ඇති මිනිස්සු තෝරාගත් බවත් ඔවුන් මාර්ගවල මුර සංචාර කරන විට ඔවුන්ට ලොකු පොලු ආදිය දී තිබුණ බවත් එහෙත් දැන් කාලයේ එවැනි ශාරීරික ලක්‍ෂණ අවශ්‍ය අංගයක් නොවන අතර ඔවුන් සොයන්නේ දක්‍ෂ ආකාරයකින් රටවැසියන් සමඟ කථා කිරීමේ හැකියාව ඇත්තන් බවත්ය. මෙයින් පෙනී යන්නේ ජනතාව තුළ බිය වැද්දීමෙන් බියගුළු මානසික තත්වයක් සෑදීම මත අපරාධ වැළැක්වීම හෝ අපරාධ පිළිබඳව සාක්ෂි සෙවීම නුසුදුසු පිළිවෙතක් මෙන්ම උපාය මාර්ගයක්ද ලෙස සලකා එය බැහැර කොට ඇති බවත්, බුද්ධිමත්ව කථා කිරීමට ඇති හැකියාව මත දත්තයන් එකතු කිරීමත්, එම දත්තයන් මත පදනම් වන ක්‍රියා මාර්ගයන් මත තාර්කිකව කල්පනා කොට නඩු පිළිබඳව සාක්ෂි පමණක් නොව අපරාධ වැළැක්වීම සඳහා පොදු ක්‍රියා පිළිවෙත්ද වර්ධනය කරගැනීමටත් ඔවුන් යොමුවී තිබෙන බවත්ය.

ලංකාවේ තවමත් පවතින්නේ පොලිසිය ඇතුළු නීතිය ක්‍රියාවේ යොදවන්නන් විසින් සමාජය තුළ භීතිය ඇති කරන ආකාරයෙන් ක්‍රියා කොට අපරාධ නැතිකළ හැකිය යන මතය උඩ ක්‍රියාත්මක වීමකි. සාක්ෂි සඳහා දත්ත එකතු කිරීම පිළිබඳව ද ඇත්තේ සැකකරුවන් බියවද්දා කරුණු එකතු කිරීමේ පිළිවෙතකි. වදහිංසාව ලාංකීය නීති ක්‍රමය තුළ ගැබ්ගත් පරම අදහසක් සේ තවමත් පවතින්නේ මේ නිසාය. මෙම සම්ප්‍රදාය නුසුදුසු බව

පෙන්වාදී ඇති කලක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ක්‍රියා කල ටිරල් ගුණතිලක වැනි ඉහළ පොලිස් නිලධාරීන් සිටි නමුත් ඔවුන්ගේ බුද්ධිගෝචර අදහස්වලට වඩා වර්තමානයේ පොලිස් සංස්ථාව තුළ මුල් බැස ඇති ප්‍රමුඛ අදහස වන්නේ වදහිංසාවෙන් හා විවිධාකාර බලකිරීම් තුළින් සාක්ෂි එකතු කිරීමේ සම්ප්‍රදායය. මේ පිළිබඳව පොලිසිය තුළම දැඩි කලකිරීමක් ඇත. දැනට පොලිසියේ නීති අංශයේ නියෝජ්‍ය පොලිස්පති ධුරය දරන ජෙයකුමාර් තංගවේළු මහතා මේ පිළිබඳව විවිධ අවස්ථාවල කථාකොට ඇත. එක් කථාවක් රේඩියෝ වඩසටහනක දී සාරාංශ ගත කෙරුණේ මෙසේය.

## වදහිංසා කිරීම වැඩක් නැතැයි මා අවබෝධකර ගත්තේ කෙසේද?

**නියෝජ්‍ය පොලිස්පතිවරයකු විසින් කියන ලද සැබෑ කථාවක් මත සකස්වී ඇත.**

මෙහි චරිත නම් පොලිස් අධිකාරීවරයකු, මූලස්ථාන භාර පොලිස් පරීක්ෂකවරයකු හා මෙය සිදුවන අවස්ථාවේ දී අලුත පොලිසියට බැඳුණු සහකාර පොලිස් පරීක්ෂකවරයෙකි. එම සහකාර පොලිස් පරීක්ෂක වරයා පසු කලෙක නියෝජ්‍ය පොලිස් පතිවරයකු බවට පත්විය.

### මූලස්ථාන භාර පොලිස් පරීක්ෂකः

මට එක දවසක් මගේ පොලිස් අධිකාරීවරයා කථාකලා. ඔහු මට කිව්වා ඔහුට නිර්නාමික ලිපියක් ලැබී තිබෙනව කියල ළඟදී සිදුවුණු බරපතළ ස්ත්‍රී දූෂණයක් හා මරණයක් පිළිබඳ. එම ස්ත්‍රී දූෂණයට හා මරණයට ලක්වී තිබුණේ අප වැඩකරණ බල ප්‍රදේශයේ තරුණ ගුරුවරියක්. ඒ නිසා ඒ සිද්ධිය ගැන ලොකු ආන්දෝලනයකුත් පැවතුණා. පොලිස් අධිකාරීවරයා මට මෙසේ කිව්වා.



### පොලිස් අධිකාරීः

මේ ලිපිය කියවල බලන්න. මේකෙ අපරාධකාරයන් පස් දෙනෙකුගේ නම් තියෙනවා. මම දන්න හැටියට ඔවුන් මීට ඉහත අපරාධවලට චෝදනා ලබල තියෙන අය. මේ සිද්ධිය පරීක්ෂාකර වාර්තාවක් දෙන්න. මේක ලොකු ප්‍රසිද්ධියකට පත්වෙලා තියෙන අපරාධයක්. මේක අපි ඉක්මනින් විසඳන්න ඕන.

### මූලස්ථාන පොලිස් පරීක්ෂකः

මේ අනුව මම මෙම නිර්නාමික ලියුම අරගෙන කියෙව්වා. ඊට පස්සෙ ඒ ප්‍රදේශයට ගිහින් මේ පස්දෙනාවම අල්ලල පොලිසියට කැඳවගෙන ආවා. ඊට පස්සෙ මම ඔවුන් එක එක්කෙනාගෙන් දිගට ප්‍රශ්න කලා. එසේ ප්‍රශ්න කලාම මට වැටහුණා මේ මිනිස්සු මේ අපරාධයට සම්බන්ධ නැහැය කියල. මම මේ පිළිබඳව වාර්තාවක් ලියා පොලිස් අධිකාරීතුමාට දන්වා ඒ පිළිබඳව ඔහුට කථා කලා. පොලිස් අධිකාරීතුමා එතරම්ම සතුටට පත්වූයේ නැහැ. මේ අපරාධය ඉක්මනින් විසඳන්න අවශ්‍යය කියා ඔහුගේ සිතේ තිබුණා. මේගැන පොලිස් අධිකාරීතුමා කළේ තවත් පොලිස් අධිකාරීවරයකු කැඳවා මේ පස් දෙනාගෙන් ප්‍රශ්න ඇසීම ඔහුට භාරදීමයි.

### සහකාර පොලිස් නිලධාරීවරයාः

අලුතෙන් පරීක්ෂණය භාරගත් නිලධාරීවරයා මේ අයව කාමරයකට ගෙනිච්චා. ඉන්පසු ඒ කාමරය පැත්තෙන් ලතෝනි සද්දයකුත් ඇසුණා. ඉතා ටික වේලාවකින් අලුත් පොලිස් පරීක්ෂකවරයා ඉතා ජයග්‍රාහී ලීලාවෙන් පොලිස් අධිකාරීතුමාත් මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාත් මාත් සිටි තැනට ආවා. ප්‍රශ්නය විසඳූ බවත් සියලු දෙනාම වරද පිළිගත් බවත් මේ පොලිස් පරීක්ෂකවරයා කියා සිටියා. පොලිස් අධිකාරීතුමා සතුටට පත්වුණා. මේ වේලාවේ මූලස්ථාන පොලිස් පරීක්ෂකවාරයා පොලිස් අධිකාරී වරයාට කිව්වා "මේක මේ විදියට පිළිගන්න අමාරුයි. මොවුන්ගෙන්

වෙන් වෙන්ව ප්‍රශ්න කලයුතුයි" කියලා. පොලිස් අධිකාරීතුමාට මේ ගැන ටිකක් තරහා ගියා. ඔහු මෙහෙම කිව්වා.

### පොලිස් අධිකාරීඃ

"තමුසේ මේ ප්‍රශ්නෙ විසඳුවෙත් නැහැ. කව්රුහරි විසඳුවාම ඒක පිළිගන්න කැමතිත් නැහැ".

### සහකාර පොලිස් පරීක්ෂකවරයාඃ

මමත් මේ ගැන මගේ ඉහළ නිලධාරියාවුණු මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාගෙන් ප්‍රශ්න කලා. 'මේ මිනිස්සු වරද පිළිගන්නවානේ. ඉතින් ඇයි අපි ඒක පිළිගන්නෙ නැත්තෙ" කියලා. මෙවිට මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා මා පැත්තකට අඬගසාගෙන ගොස් මට මෙහෙම කථාවක් කිව්වා.

### මූලස්ථාන පොලිස් නිලධාරීඃ

මම මුල් කාලේ පොලිස් පරීක්ෂකවරයකු ලෙස වැඩකරන කාලෙ ඒ ප්‍රදේශයේ සමූපාකාරෙක ලොකු කොල්ල කෑමක් සිදුවුණා. ටික දිනකට පස්සෙ මට නිර්නාමික ලියුමක් ලැබුණා. ඒකෙ සඳහන් කරල තිබුණා මේක කරල තිබුණේ ඒ ප්‍රදේශයේ ප්‍රසිද්ධියක් දරන හොරෙක් කියල. ඔහුගේ නමත් සඳහන් කරල තිබුණා. මම ගිහින් ඔහු අත්අඩංගුවට ගෙන පොලිසියට ගෙනාවා. මම මේ හොරකම ගැන ඔහුගෙන් ඇහුවා. ඔහු මේ පිළිබඳව කිසිම දෙයක් දන්නෙ නැතැයි කියා කිව්වා. පස්සෙ මම ඒකාලෙ පුරුද්දට බලය ටිකක් පාවිච්චි කලා. එවිට ඔහු වහාම වරද පිළිගත්ත. මම කිව්වා ඔහුට දූන් ඒ හොරාගත්ත බඩු තියෙන තැන පෙන්නන්න කියල. ඔහු කිව්වා ඒක එක තැනක වළලල තියෙනව කියල. මම ඔහුව ඒ කියපු තැනට ගෙනිච්චා. ඔහුට උදැල්ලක් දීල ඒ කියපු තැන හෑරෙව්වා. එතන කිසිම දෙයක් තිබුනෙ නැහැ. පසුව මම ඔහුට නැවතත් හිරිහැර කලා. එවිට ඔහු කිව්වා මේ බඩු හංගල තියෙන්නෙ ටිකක් කන්දක් උඩ ගුහාවක කියල. එතනටත් මම ඔහු



ගෙනිච්චා. එතනත් මුකුත් තිබුණෙ නැහැ. මට හොඳටම තරහා ගියා. මම ඔහුට කොකා කෝලා බෝතලයක් බොන්න දීලා ගුහාවෙ බිත්ති අතගාල හොයන්න කිව්වා. පසුව මම ගුහාවෙ ඔහුගේ ඇඟිලි සලකුනු ලබාගන්න සලස්සල ඔහුට විරුද්ධව නඩුවක් දාල ඔහු රිමාන්ඩ් ගතකලා. මම හිතුවෙ මම ඇත්තටම ප්‍රශ්නෙ විසඳුවා කියලා.

ඊට සුමානෙකට පස්සෙ අසල පොලිස් ස්ථානයක පොලිස් ස්ථානාධිපතිවරයකු මට ටෙලිපෝන් කෝල් එකක් දුන්නා. ඔහු ඇහුවා ඔබේ බල ප්‍රදේශයේ සමූපාකාරයක ලොකු සොරකමක් උනාද කියල. මම කිව්වා ඔව් කියල. එවිට ඒ ස්ථානාධිපතිවරයා මට කිව්වා ඒ හොරත් මා ළඟ ඉන්නවා ඔහු ගත්ත සියලු බඩුත් අපි හොයාගත්ත කියල. පසුව එම හොරාත් බඩුත් අපට භාරදුන්නා.

මේ සිද්ධියෙන් පසුවයි මම ඉගන ගත්තේ වදහිංසා කරල ගන්න පාපෝච්චාරණවලින් වැඩැක් නැති බව.

### සහකාර පොලිස් පරීක්ෂකඃ

එතකොට මාත් මගේ පාඩම ඉගන ගත්තේ මගේ මුල් ඉහල නිලධාරීයා කියපු අත්දැකීමෙන්. ස්ත්‍රී දූෂණය ගැන අල්ලගත්ත මිනිස්සුන්ට ඔවුන් කල පාපෝච්චාරණ මත නඩු පවරල තිබුණා. ඔවුන් උසාවියට ගොස් තමුන්ට වදහිංසා කල බවට අධිකරණයට දැනුම් දුන්නා. පස්සෙ නඩුවෙනුත් ඔවුන් නිදොස්කොට නිදහස් කරනු ලැබුවා.

මීට පස්සෙ කාලෙ මම නොයෙක් තනතුරු දරන ලද අතර ඉතා ප්‍රධාන පෙළේ පරීක්ෂණත් කලා. වදහිංසාව ගැන මා එදා ඉගනගත් පාඩම අමතක කළේ නෑ. ටිකක් මොළේ පාවිච්චිකළාම අතපය පාවිච්චිකලාට වඩා හොඳින් අපරාධ විසඳිය හැකි බව මගේ දීර්ඝ අත්දැකීම්වලින් මට කියන්න පුළුවන්.

## බුද්ධිගෝචර අපරාධ පරීක්ෂණ සම්ප්‍රදාය ඇති කිරීම

අපරාධ පරීක්ෂණය පිළිබඳව තාර්කික බුද්ධිය මත පදනම් වුණු පරීක්ෂණ රටාවක් ඇති කිරීමට අත්‍යාවශ්‍යම කොන්දේසිය වන්නේ එම සංස්ථාව තුළ ඉහළ සිට පහළට කාර්යක්ෂමව ක්‍රියාත්මක වන අණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති කිරීමය. පොලිස් සංවිධානය උඩ සිට පහළට ක්‍රියාත්මක වන අනුක්‍රමාධිපත්‍යයක් මත පදනම් වූ සංස්ථාවකි. එවැනි සංස්ථාවක් තුළ බුද්ධිගෝචර ඒකාග්‍රතාවක් පවත්වාගෙන යා හැක්කේ ඉහළින්ම බුද්ධිගෝචරව අණදීමේ ක්‍රියාවලිය සිදු කිරීම මගිනි. අණදීම යනු හුදෙක් ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රචාරක කටයුතු කිරීමක් නොවේ. පොලිස්පතිගෙන් පටන්ගෙන නියෝජ්‍ය පොලිස්පතිවරුන් තුළින් දිවෙන නායකත්වයේ නිලධාරීන් තම ආයතනය කටයුතු කරන ප්‍රතිපත්ති ඉතාමත් දීර්ඝව හා පැහැදිලිව සංස්ථාවේ සියලුම නිලධාරීන් වෙත යොමුකල යුතුවා පමණක් නොව ඒවා ක්‍රියාත්මක වීම අධීක්ෂණය කල යුතුය. මෙසේ ක්‍රියාකාරී නායකත්වයක් බවට පත්වීමේ දී පොලිස් සංස්ථාවේ රාජකාරී කිරීමට අදාළව අවශ්‍ය ද්‍රව්‍යමය හා මානව සම්පත් අත්පත් කරගෙන බෙදාදීමේත්, අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා ගත යුතු පියවර ගැනීමේත් වගකීම පැවරෙන්නේද මෙම ඉහළ නිලධාරී මතමය. ඒ අනුව ලංකාවේ පොලිසියට තවමත් වැඩි දියුණු පොලිස් පරීක්ෂණ ක්‍රමයක් වර්ධනය කිරීමේ හැකියාව නොතිබීමේ වගකීම භාරගත යුතු වන්නේ මෙම සංස්ථාවේ අතීතයේ හා දැන් සිටින ඉහළ නිලධාරීන් විසිනි.

ඉහත සඳහන් ඉහළ නිලධාරීන්ගෙන් සමහර දෙනෙක් පොලිසියේ දැනට ඇති ඉතාමත් අසතුටු දායක තත්වය ප්‍රසිද්ධියේ පිළිගෙන ඇත. ඇත්තෙන්ම මෙයද අලුත් පිලිගැනීමක් නොවේ. 1946 දී වාර්තාවක් ඉදිරිපත් කල විනිසුරු සූට්සි කොමිසමේ වාර්තා වේද, එක්දහස් නමසිය හැත්තෑ ගණන්වල දී පොලිසිය පිළිබඳව විනිසුරු බස්නායක කොමිසම ඉදිරිපත් කල වාර්තාවේදීත්, 1995 දී විනිසුරු ජයලත් කොමිටි වාර්තා වේද, 2004 දී නඩු පමාව පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද වාර්තාවේද



පොලිසිය තුළ ඇති බරපතළ සංවිධානාත්මක ප්‍රශ්න අව්‍යාජව සාකච්ඡා කොට ඇත.

2001 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා ගෙනෙනු ලැබූ දාහත් වන සංශෝධනය පිළිබඳ සාකච්ඡාවේදී ද ලංකාවේ පොලිසිය පිළිබඳ ප්‍රශ්න දීර්ඝව සාකච්ඡා විය. එම සාකච්ඡාවේ දී වැඩිමනත් අවධානය යොමුවූයේ පොලිසිය දේශපාලනමය බලපෑම්වලට යටත්වී පැවතීමය. මෙම දේශපාලන බලපෑම් නිසා හුදෙක් වෘත්තියමය පදනම් මත හා මූලධර්ම මත ක්‍රියාත්මක වන නීතිය ක්‍රියාත්මක කරන සංස්ථාවක් ලෙස එයට ඇතිවී ඇති ගැටලු පිළිගැනිණ. එම ගැටලු නිරාකාරණය කරගැනීම සඳහා මුල් පියවරක් ලෙස පොලිසිය තුළ බුද්ධිගෝචර පාලනයක් ඇති කිරීමේ අරමුණින් දේශපාලන බලපෑම්වලින් තොරව පත්කරණ කොමිසමක භාරයට පොලිස් සංස්ථාව පත් කිරීමට ව්‍යවස්ථාදායකය මගින් තීන්දු කරනු ලැබූ අතර එම තීන්දුව දාහත්වෙනි ව්‍යවස්ථා සංශෝධනය තුළ අඩංගු කරන ලදි. පසුව 2003 පමණ මුල් ජාතික පොලිස් කොමිසම එම දේශපාලනය තුරන් කිරීමේ පදනම මත පත්කරණ ලදි. එසේ මුල් වරට පත්වූ කොමසාරිස්වරු ක්‍රමයෙන් යම් ස්වාධීන පාලන රටාවක් ඇති කිරීමේ ප්‍රයත්නයක යෙදින. එම ප්‍රයත්නයට එකල පොලිස්පති වරයා ඇතුළු සමහර උසස් නිලධාරීන් සහයෝගයක් නොදක්වූවත් යම් ප්‍රමාණයකට හෝ සංස්ථාව තුළ දේශපාලන බලපෑම් අඩු කිරීමේ හැකියාවක් මුල් වසර තුන තුළ ප්‍රදර්ශනය විය. එහෙත් මෙම සුළු වැඩි දියුණුව පවා නැවතී යෑමට හේතුව වූයේ දාහත්වෙනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වීම නතරවී යාම මගිනි. ඉන් පසු ජාතික පොලිස් කොමිසමට කොමසාරිස් වරුන් පත්කිරීම පවා එක් දේශපාලන පක්ෂයක හිතුමතය මත පමණක් සිදුවිය.

ජාතික පොලිස් කොමිසම ඇති කිරීම පමණක්ම ලංකාවේ පොලිසිය මුහුණ දෙන විශාල ගැටලු නිරාකරණය කිරීමට ප්‍රමාණවත් නොවේ. එහෙත් එම ගැටලු නිරාකාරණය කිරීම සඳහා පසුබිම සකස් කිරීමේ හැකියාව ස්වාධීන පොලිස් කොමිෂන් සභාවට ඇත. එවැනි ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් විසින්

සපයනු ලබන සාධනීය පසුබිමක් යටතේ අපරාධ පරීක්ෂණ රටාව වැඩි දියුණු තත්වයකට ගෙන ඒම සඳහා වගකීම පොලිස්පති ඇතිලු පොලිසියේම නායකත්වය තුළින් සිදුවිය යුතුව ඇත.

ලංකාවේ ජනතාව අපරාධ මර්දනය සම්බන්ධයෙන් වලිගය නැති ගොනාගේ තත්වයට පත්වීමට වූ හේතු ඉහත සාකච්ඡාවෙන් පැහැදිලි වේ. තමන් මුහුණ දී ඇති මෙම විශාල ප්‍රශ්නයෙන් ගොඩ ඒම සඳහා බුද්ධිමත් උපාය මාර්ගයක් වර්ධනය කරගැනීමේ වගකීම ද ඇත්තේ ලාංකීය ජනතාව තුළමය.

# රටක කාර්යක්ෂමභාවය ඇතිවීමට තුඩුදෙන හේතු පිළිබඳව ලංකාව හොංකොං ප්‍රදේශය අරභයා සංසන්දනාත්මක විග්‍රහයක්

වත්මන් සමාජය තුළ ජීවත්වන්නන්ට තමන්ගේ යහපත උදාකරගත හැක්කේ තමන් ජීවත්වන සමාජයේ කාර්යක්ෂමතාව මතය. සමහර සමාජ තුළ මිනිස්සු තමන්ගේ සුරක්ෂිතභාවය මෙන්ම තම ජීවිතය සතුටින් ගෙවීමට අවශ්‍යවන මූලික සම්පත් හා සේවාවන්ද තම සමාජයේ ඇති කාර්ක්ෂමභාවය නිසා ලෙහෙසියෙන් ළඟාකර ගනිති. තවත් සමහර සමාජ තුළ මිනිස්සු තම සුරක්ෂිතභාවය මෙන්ම තමන්ගේ ජීවිත සතුටු කරගැනීමට අවශ්‍ය ද්‍රව්‍යමය සම්පත් මෙන්ම සේවාවන්ද අත්පත්කර ගැනීමට නොහැකිව බොහෝ සේ ගැටලුවලට මුහුණ පාමින් ජීවත්වෙති. නවීන ලෝකයේ ලබා ඇති වැඩි දියුණුවුණු පහසුකම් සමහර සමාජ තුළ සෑම දෙනෙකු මෙන්ම භුක්ති විඳින අතර තවත් සමාජ තුළ එවැනි පහසුකම් භුක්ති විඳිය හැකිවන්නේ ඉතාම ටික දෙනෙකුට පමණි. මෙසේ සමාජ අතර පවතින යම් යම් වෙනස්කම්වලට හේතු මොනවාදැයි සොයා බැලීම වටී. සමාජයක කාර්යක්ෂමතාව රැඳෙන්නේ එහි මිනිස්සුගේ ස්වාභාවික ගතිගුණ නිසා යැයි යන මතයක් කලෙක පැවතිණි. මෙයින් කියවෙන්නේ සමහර මිනිස්සු ස්වභාවයෙන්ම කඩිසර මෙන්ම තවත් සමහර මිනිස්සු ස්වභාවයෙන්ම කම්මැලි බවය. සමහරුන් දක්ෂ මෙන්ම තවත් සමහරුන් අදක්ෂ බවය. එහෙත් එකම සමජයක් තුළ යම් කාල පරිච්ඡේදයක් ඇතුළත අඩු

කාර්යක්ෂ්මතාවක සිට වැඩි කාර්යක්ෂ්මතාවක් කරා ගමන් කර ඇති ආකාරයත් හෝ වැඩි කාර්යක්ෂ්ම තත්වයක සිට ඊට වඩා අඩු කාර්යක්ෂ්මතාවක් කරා ගමන් කර ඇති ආකාරයත් දෙස බලන විට පෙනී යන්නේ එකම මිනිස්සු කණ්ඩායමක් තුළ ඇතිවී ඇති මෙම වෙනස්කම හුදෙක්ම ස්වාභාවික ගති පැවතුම් නිසා ඇති වූවක් නොවන බවය.

මෙය උදාහරණයක් මගින් වඩා පැහැදිලි කරගත හැක. ලංකාව එහි එක්දහස් නමසිය හතළිහ හා පනහ වැනි දශකයන් ගෙන බලන විට, විසිවන ශතවර්ෂයේ අගභාගයේ දශකයනට වඩා කාර්යක්ෂමභාවයක් තිබූ සමාජයක් බව පෙනීයයි. එය සාපේක්ෂව වැඩි කාර්යක්ෂ්ම සමාජයක සිට අඩු කාර්යක්ෂ්ම සමාජයක් කරා ගමන් කොට ඇත. හොංකොං වැනි ප්‍රදේශයක් දෙස බලන විට පෙනීයන්නේ මෙහි අනික් පැත්තය. එක් දහස් නමසිය හතළිහ හා පනහ දශකවල කාලය හොංකොං ප්‍රදේශයේ ඉතා පසුගාමී කාලයක් විය. එහෙත් විසිවන ශතවර්ෂයේ අග දශකයන් වන විට එය ලෝකයේ දියුණුම රටවල පවතින කාර්යක්ෂ්මතාව දක්වා විශාල දියුණුවක් ළඟාකරගෙන ඇති බව පැහැදිලිව පෙනේ. අවුරුදු පනහක පමණ සුළු කාලයක් තුළ මේ දෙරටේම මිනිස්සුගේ සවභාවයේ වෙනසක් වූවා යැයි කිව නොහැකිය. මෙම සමාජ දෙකේම වැඩි අඩු කාර්යක්ෂ්මතාව කෙරෙහි බලපෑ ඇත්තේ වෙනත් කරුණු බව මෙයින් පැහැදිලිවේ.

කාර්යක්ෂ්මතාවයේ අඩු වැඩිවීම පිළිබඳව ඇති තවත් මතයක් නම් එය බොහෝ දුරට තාක්‍ෂණය හා කාර්මීකරණය මත රැඳෙන බවය. එහෙත් එක රටකට එකම කාලයක් තුළ වැඩි තාක්‍ෂණ ශක්තියක් ඇතිකර ගැනීමටත් තවත් රටකට එසේ කර ගැනීමට නොහැකි වීමටත් හේතුවන්නේ කුමක්ද? තාක්‍ෂණය තම සමාජය තුළට උකහා ගැනීම හිතාමතා සැලසුම්කර කලයුතු එකක්වේ. වෙන වචනයෙන් කිවහොත් එය ඉබේ සිදු නොවේ. එක් සමාජයක් එකම කාලයක් තුළදීම එසේ හිතාමතා සැලසුම්කොට තමන්ගේ තාක්‍ෂණ ශක්තිය වැඩි දියුණු කර ගනී. තවත් සමාජයක් එම කාලය තුළදීම එසේ හිතාමතා ගතයුතු තීන්දුවලට නොඑලඹී පෙර සිටි



තත්වයේම පවතී. මෙසේ හිතාමතා අවශ්‍ය සංවිධානාත්මක ප්‍රශ්නවලට මුහුණදී තාක්‍ෂණ ශක්තිය වැඩිකර ගැනීමට එක රටකට හැකි වන්නේත් තවත් රටකට නොහැකි වන්නේත් කුමන හේතු නිසාද?

සමහර විට ඉහත සඳහන් ප්‍රශ්නයට දෙනු ලබන පිළිතුර වන්නේ එය හුදෙක් ප්‍රග්ධනය පිළිබඳව ප්‍රශ්නයක් බවයි. මෙයින් ඇඟවෙන්නේ එක් සමාජයක් එකම කාලයක් තුළ වැඩි කාර්යක්‍ෂමතාවකින් යුතු සමාජයක් බවට පත්වීමට ගතයුතු තීන්දු ගනු ලබන්නේ ඒ රටෙහි ප්‍රාග්ධනයේ වැඩි දියුණුවක් ඇතිවී තිබීම නිසාය යන්නය. අනිත් අතට තවත් සමාජයක් එම කාලය තුළදීම වැඩි කාර්යක්‍ෂමතාවයෙන් යුතු සමාජයක් බවට පත්නොවන්නේ එම රට තුළ අවශ්‍ය ප්‍රාග්ධනයේ වැඩිවීමක් සිදුවී නොමැති නිසාය යන්නය. මෙහිදී මතුවන්නේ මුලින් ඇති වන්නේ බිත්තරයද? කිකිලියද? යන ආකාරයේ ප්‍රශ්නයකි. වැඩි දියුණුවකට ඉඩකඩ තිබූ සමාජයකට එසේ වැඩි දියුණුවීමට ප්‍රාග්ධනය නැතිවීමටත් ඊට වඩා අඩුවෙන් අඩු දියුණු තත්වයක තිබූ රටකට වැඩි ප්‍රාග්ධනයක් ළඟාකර ගැනීමට හැකිවීමටත් හේතුවන කරුණු මොනවාදැයි මෙයින් විස්තර නොකෙරෙහි.

මේ අනුව බලන කල සමාජයක වැඩි කාර්යක්‍ෂමතාවක් ඇතිවීම කෙරෙහි ජනයාගේ ස්වභාවය, තාක්‍ෂණයේ වැඩි දියුණුව හෝ ප්‍රාග්ධනය වැඩි වශයෙන් පැවතීම වැනි කරුණුවලට අමතරව වෙනත් කරුණු ද පැවතිය යුතු බව ඉහත සඳහන් කරුණු මත පෙනීයයි. මෙම කරුණු දෙස සොයාබැලීම සඳහා පසුගිය අවුරුදු පනහක හැටක කාලය දෙස ලංකාව හා හොං කොං ප්‍රදේශය දෙස වඩාත් කිට්ටුවෙන් සලකා බලමු.

මේ රටවල් දෙකම බ්‍රිතාන්‍යයේ පැවති යටත් විජිතයන් වේ. ලංකාව 1949 දී මෙම යටත් විජිතභාවයෙන් මිදුණේය. හොංකොං ප්‍රදේශය යටත් විජිතභාවයෙන් මිදුණේ 1997 දීය. දෙරටටම බලපාන මූලික පරිපාලන රටාව ගොඩනැගුණේ බ්‍රිතාන්‍ය යටත් විජිතයන් වශයෙන් පැවති කාලයන්හි දීය. දෙරටටම බලපාන මූලික නීතිය

"කොමන් ලෝ" (Common Law) යනුවෙන් හැඳින්වෙන බ්‍රිතාන්‍ය නීති ක්‍රමයයි. ඒත් මෙම ක්‍රමය තුළ මෙම කාල පරිච්ඡේදය තුළදී ලංකාව අඩු කාර්යක්ෂමතාවකින් යුතු රටක් බවට පත්වූ අතර හොංකොං ප්‍රදේශය ඉතා අවුල්සහගත තත්වයක සිට වැඩි කාර්යක්‍ෂමතාවක් ඇති රටක් බවට පත්විය. මෙසේ වීමට මෙම ප්‍රදේශ දෙක තුළ අභ්‍යන්තරයෙන් ඇතිවූ වෙනස්කම් මොනවාද?

මෙවැනි වෙනස්කම් බොහොමයක් තිබෙන්නට පුළුවන් වූවත් ඉතා පැහැදිලිව පෙනීයන සමහර වෙනස්කම් කැපී පෙනේ. හොංකොං ප්‍රදේශය තුළ ඉතාමත්ම අවුල් සහගත හා දූෂිත තත්වයක සිට වඩාත් ස්ථාවර තත්වයක් කරා ගමන් කිරීමට මාවතක් ලෙස රටේ නීතිය වඩාත් ස්ථාවර කිරීමත්, නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වැඩි උවමනාවක් ඇතිව තීන්දු ගැනීමකුත් සිදුවී තිබෙන බව පෙනීයයි. රට තුළ පොලිසියත්, නීතිපති ක්‍රමයත්, අධිකරණ ක්‍රමයත් වැඩි දියුණු කරගැනීම සඳහා හිතාමතා වැඩිපුර මුදල් වියදම් කිරීමක් මෙන්ම වෙනත් ආකාරවලින් කටයුතු කිරීමක්ද පසුගිය දශකයන් තුළදී තිබූ බව ඉතා පැහැදිලිව පෙනියයි. ඉහතකී පොලිසිය, නීතිපති ක්‍රමය හා අධිකරණ ක්‍රමය පමණක් නොව දූෂණය නැති කිරීම සඳහා නීතිය හා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද වැඩි මුදලක් වැයකිරීම පමණක් නොව ආයතනික වශයෙන් නව සංවිධාන ක්‍රමයක් ඇති කිරීමක්ද ඇතිවිය. 'දූෂණයට එරෙහි ස්වාධීන කොමිසම' යන සංවිධානය අලුතෙන්ම ගොඩනගන ලද අතර එය සමාන්‍ය පොලිසියෙන් බැහැරකර වෙනම ස්වාධීන සංවිධානයක් බවට පත්කරන ලදි. සියලුම ආකාරයෙන් නවීකරණය කරන ලද දූෂණයට විරුද්ධ මෙම කොමිෂන් සභාව වෙනුවෙන් වාර්ෂිකව වැයකරණ මුදල සාමාන්‍ය පොලිසිය වෙනුවෙන් වැය කරන මුදලට වඩා වැඩිය. පොලිසියේ ඉහළ නිලධාරීන්ගේ කිසියම් හෝ ක්‍රියාවක් මගින් දූෂණට එරෙහි ස්වාධීන කොමිසම කෙරෙහි බලපෑමක් කිරීමට කොහෙත්ම ඉඩ කඩක් නැතුවා පමණක් නොව එසේ කිරීමට ගන්නා ප්‍රයත්නයක් ද බරපතළ අපරාධයක් සේ සලකා ක්‍රියා කරනු ලබයි. රටේ සියලුම නිලධාරී තන්ත්‍රයන් කෙරෙහි



මෙන්ම පුද්ගලික ආයතන කෙරෙහි ද නීතියේ සම්පූර්ණ බලපෑම මෙසේ විසිරී ශක්තිමත්ව ක්‍රියාත්මක වේ.

මෙයින් ඉතා පැහිදිලිව පෙනියන්නේ හොංකොං ප්‍රදේශයේ කාර්යක්‍ෂමතාව කෙරෙහි බලපාන ඉතාම ප්‍රධාන සාධකය නම් රටේ නීතිය, සියල්ලන් කෙරෙහිම ඉතාමත් දක්‍ෂ ආකාරයකින් ක්‍රියාත්මක වීමය. රටේ සංස්ථාවන්ගේ අකාර්යක්‍ෂමතාවය නීතියේ ග්‍රහණයට අසුවන අතර නීතිය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන්ම සිදුවන හෙයින් සමාජය තුළ සංස්ථාවන්ගේ අකාර්යක්‍ෂමතාවන් පවත්වාගෙන යාමට ඇති ඉඩ කඩ ඒ මගින් ඇහිරී ගොස් ඇත.

මෙයින් අදහස් කරන්නේ හොංකොං ප්‍රදේශය නීතිය මගින් දරදඬු ප්‍රදේශයක් බව නොවේ. එදිනෙදා ජීවිතයේ දී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හා සමාජය අතර සම්බන්ධය පවතින්නේ බොහෝ දුරට ලිහිල් ආකාරයකිනි. නිල ඇඳුම් අඳගත් නිලධාරීන් හෝ මුර සෙබළුන් දැකීම රටේ සුලභ ලක්‍ෂණයක් නොවේ. සාමාන්‍යයෙන් ගත් කල පොලිස් නිලධාරීන් ඇතුළුව වෙනත් නිලධාරීන් මහජනතාව සමඟ පවත්වන්නේ ආචාරශීලී සුහද සම්බන්ධයකි. පොලිස් ස්ථාන තුළ වදහිංසාව හෝ පොලිස් නිලධාරින් මගින් මිනිස්සු මැරීම හෝ රජයේ නිලධාරීන්ගේ කෙලින් හෝ වක්‍ර සම්බන්ධයක් ඇතිව පැහැරගෙන යෑම ආදී ක්‍රියා සිදුවන්නේ නැත. කලාතුරකින් හෝ සුළු ආකාරයකින් හෝ කිසියම් දෝෂාරෝපනයක් මෙම නිලධාරීන්ට විරුද්ධව නැගුණහොත් ඊට විරුද්ධව පියවර ගැනීමට ද බොහෝ ඉඩ කඩ මෙම සමාජ ක්‍රමය තුළ ඇත. අපරාධකාරයින් මගින් සිදුවිය හැකි අපරාධ වළක්වාලීම හා ඒවා සිදුවුණු අවස්ථාවල්වලදී ඉතාමත් ඉක්මනින් ක්‍රියාත්මක වීම ද මෙම නිලධාරීන් විසින් කරනු ලබනවාය යන බලාපොරොත්තුවක් රට වැසියන් තුළ ඇත.

එහෙත් එම දශකයන් තුළම ලංකාව දෙස බලන විට මැවී පෙනෙන්නේ වෙනම පින්තුරයකි. රටේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පවතින සංස්ථා වෙනුවෙන් මුදල් වැයකිරීම සම්බන්ධයෙන් විශේෂ උනන්දුවකින් ක්‍රියාත්මක වී ඇති බවක් මෙහි පෙනෙන්නට

නැත. ඇත්තෙන්ම පොලිසිය නීතිපති දෙපාර්ථමේන්තුව මෙන්ම අධිකරණයද බොහෝ දුරට නොසැලකිල්ලට භාජනය කරන ලද සංවිධාන ලෙස පෙනීයයි. මෙයින් අදහස් කරන්නේ මෙම සංවිධාන තුළ පඩි වැඩිකිරීම් ආදියක් මෙම කාලය තුළ සිදුවී නැතැයි කියා නොවේ. සංවිධානයන් ශක්තිමත් කිරීමට ගන්නා පියවර වනාහී හුදු පඩි වැඩිකිරීම්වලට සීමා නොවේ. මෙම සංවිධාන වැඩි කාර්යක්‍ෂමතාවක් ඇති කිරීම සඳහා අදාළ නීති රීති වැඩිදියුණු කිරීමත්, පාලන හා අධීක්‍ෂණ කටයුතු වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීමත්, එක් එක් ආයතනය විසින් පවත්වාගෙන යන මහජන සම්බන්ධතා වඩාත් සාර්ථකව කරගැනීම සඳහා සංවිධාන රටාව වැඩි දියුණු කරගැනීමත් මෙයින් අදහස් වේ. එවැනි දියුණුවක් ඇතිකර ගැනීම සඳහා කිසිදු හෝ ප්‍රයත්නයක් මෙම කාල පරිච්ඡේදය නැති බව ඉතා පැහැදිලිව පෙනීයයි.

හොංකොං ප්‍රදේශයේ කාර්යක්‍ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා දූෂණයට එරෙහි ස්වාධීන කොමිසමේ ක්‍රියාකාරිත්වයේ බලපෑම සිදුවූ ආකාරය ඉහත සඳන් කරන ලදි. ඊට සමාන බලසහිත සංවිධානයක් ගොඩනැගීමේ කිසිදු උත්සාහයක් ලංකාවෙහි සිදුවූයේ නැත. අල්ලස් හා දූෂණ මර්දන කොමිසම වනාහී වත්මන් ලෝකයේ දූෂණ නැති කිරීම සඳහා ඇති කරගෙන ඇති වැඩි දියුණු කිසියම්ම හෝ සංස්ථාවකට සංසන්දනය කළ හැකි එකක් නොවේ. එය ඉතාමත් නවීන වාහන ගමන් කරන මාර්ගයක තවමත් ඉතිරිවුණු කබල් වාහනයක් වශයෙන් පමණක් හැඳින්විය හැක. සංවිධානයේ දාර්ශනික මට්ටමවත්, එය සංවිධානය කර ඇති ආකාරයවත්, එම කටයුතු කරගැනීම සඳහා වැයවන සම්පත්වත්, සංවිධාන රටාවවත්, දියුණුවේ අංශු මාත්‍රයකවත් ලක්‍ෂණ ගැබ්කරගෙන නැත. හිතාමතාම දූෂණයට ඉඩ හැරීම සඳහා සැලසුම් කෙරුණු ඉතාමත් අකාර්යක්‍ෂම සංවිධානයක් සේ මෙම කොමිෂන් සභාව පවතී.

මේ හැර එක්දහස් නවසිය හැත්තෑව දශකයේ සිට මේ දක්වා ලංකාවේ නීතියත්, නීතිය ක්‍රියාත්මක කිරීමත්, හිතාමතා කඩාකප්පල් කර දැමීමක් දකින හැකිය. 1972 හා 1978 ව්‍යවස්ථා මගින් ක්‍රමවත්ව සිදුකෙරුණේ ව්‍යවස්ථා පිළිබඳව ජාත්‍යන්තරව



පිළිගැනෙන මූලධර්ම ක්‍රියාත්මක වීම අඩු කරලීම සඳහා හිතාමතා ගන්නා ලද පියවර ගණනාවකි. සම්භාව්‍ය ව්‍යවස්ථානුකූල නීතියට අනුව ප්‍රධාන වන සිද්ධාන්ත තුනක් ඇතථ ආණ්ඩුවක පාලනය පාර්ලිමේන්තුවක් තුළදී බුද්ධිගෝචරව ප්‍රශ්න කිරීමට ඇති ඉඩ කඩ පවත්වාගෙන යාමත අධිකරණ ක්‍රියා මාර්ග තුළින් පාලකයන් විසින් ගන්නා තීන්දු නීතිමය වශයෙන් නැවත සලකා බැලීමට ඇති ඉඩ කඩ පුළුල්ව පවත්වාගෙන යාම; අව්‍යාජ මැතිවරණ මගින් ආණ්ඩු මාරු කිරීමට ඇති ඉඩ කඩ පවත්වාගෙන යෑම ආදිය මෙම කරුණු වේ. මෙම සෑම කරුණක්ම ඉහත සඳහන් ව්‍යවස්ථා මගින් බාල්දු කරනු ලැබුවා පමණක් නොව බොහෝ දුරට එම මූලධර්ම ක්‍රියාත්මක වීමට ඇති ඉඩ කඩද වසා දමන ලදි. මේ හැර අධිකරණයේ බලය බිඳ දැමීමද මේ කාලය තුළ වර්ධනය වූ පාලන උපාය මාර්ගයක් වේ. අධිකරණයේ ස්වාධීන භාවය, නීතියෙහි ආධිපත්‍යය කෙරෙහි බලපවත් වන එක් ප්‍රධාන කරුණක් බව අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. ව්‍යවස්ථාමය ලෙස හා වෙනත් දේශපාලන බලපෑම් මගින් අධිකරණයේ ස්වාධීනත්වයට පහර ගැසීම නීතියේ ආධිපත්‍යයට ගසන ලද මරු පහරක් විය. මේ හැර පොලිසිය තුළ අභ්‍යන්තර වශයෙන් තිබූ ඉහළ නිලධාරීන්ගේ සිට පහළට අණ ක්‍රියාත්මක කිරීමේ පිළිවෙත බිඳී යෑමට ඉඩ දෙන ලදි. හදිසි නිති කාලයන් තුළ අතුරුදහන්වීම් ආදිය පවා පොලිසි මගින් කරවා ගැනීම මගින් එම සංස්ථාව තුළ තිබූ අභ්‍යන්තර විනයද විනාශ වී යෑමට මග පාදන ලදි. පොලිස් සංස්ථාව තුළම අපරාධකාරයන් සමඟ සම්බන්ධකම් වැඩිවී ඇති බව පොලිසියේ ඉහළ නිලධාරීන් විසින්ම ප්‍රසිද්ධියේ පිළිගෙන ඇත. නීතිය ක්‍රියාත්මක කිරීම අතින් පොලිසිය කොතරම් පිරිහී ගොස් ඇත්ද යන්න රජය විසින්ම පත්කරණ ලද කොමිෂන් සභා විසින් විස්තර කොට ඇත. අධිකරණය හා පොලිසිය අතර පවතින සම්බන්ධය පවා නිසි ලෙස පවත්වාගෙන යාමට බැරි තරමට පොලිසිය අධිකරණ ඉදිරියේ කෙරෙන පෙනී සිටීම් නිසි ලෙස නොකිරීම් හේතුවක් වී ඇති බව, එක් රජයක් විසින් පත් කල එක් කොමිසමක් පෙන්නුම් කරදී ඇත. නිතිය ක්‍රියාත්මක වීම අතින් ලංකාව එහි මෑත ඉතිහාසයේ

පහළම අවධියේ සිටින බව අද පොලිස් සංවිධානය තුළ මෙන්ම නීතිවේදීන් අතරද පොදුවේ පිළිගැනෙන කරුණකි.

මේ අනුව බලන කල ලංකාව වැඩි කාර්යක්‍ෂම තත්වයක සිට ඉතා අඩු කාර්යක්‍ෂම තත්වයකට පහළ වැටීමටත්, හොංකොං ප්‍රදේශය අඩු කාර්යක්‍ෂම තත්වයක සිට ඉතා වැඩිදියුණු කාර්යක්‍ෂම තත්වයකට ළඟාවීමටත් හේතුවූ කරුණු සලකා බැලීමේදී නීතියේ ආධිපත්‍ය පවත්වාගෙන යෑම සඳහා හිතාමතා තීන්දු ගෙන ඒ අනුව ක්‍රියාත්මක වීම හෝ එසේ කල නොහැකිවීම බලපා ඇති බව ඉතා පැහැදිලිව පෙනීයයි. ලංකාව නීතියේ ආධිපත්‍යය පරමාදර්ශයක් සේ සලකා එහි සංවිධාන රටා ගොඩනගා ගන්නා රටක් නොවන තත්වයට වැටුණේය. හොංකොං ප්‍රදේශය නීතියේ ආධිපත්‍යය තමන්ගේ පරමාදර්ශය කර ගනිමින් ඒ සඳහා ගතයුතු තීන්දු ගැනීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමද තීරණාත්මකව කරගත්තේ ය. දෙරට ජනතාව නීතියේ අධිපත්‍ය පිළිබඳව තම රට තුළ ඇතිවූ වෙනස්කම්වල එල විපාක දැන් භුක්ති විඳී.

# කාර්යක්‍ෂමව ක්‍රියා කිරීමේ හැකියාව නැති කොමිෂන් සභා පත්කිරීම ලංකාවේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ ගැටලු මගහැරීම සඳහා යොදා ගන්නා උපක්‍රමයකි

## කොමිෂන් සභා හා නීතියේ ආධිපත්‍යය

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති රාමුවක් පවතින රටක පැන නැගෙන ගැටලු නිරාකාරණය කර ගනු ලබන්නේ එම රටෙහි පවතින සාමාන්‍ය නීතිමය සංස්ථා මගිනි. බොහෝ දුරට මෙම සංස්ථා වන්නේ අපරාධ පරීක්‍ෂණයේ යෙදෙන පොලිසියත්, අපරාධ පිළිබඳ නඩු දැමීමේ යෙදෙන නීතිපති ක්‍රමයේ නියැලුණු නිලධාරීනුත්, අධිකරණයත්ය.

ලංකාවේ අප බොහෝ දුරට දකින්නේ යම් ප්‍රශ්නයන් පිළිබඳව දැඩි මහජන කලකිරීමක් ප්‍රකාශයට පත්වීමට පටන්ගත් වීට ඒවා නිරාකරණය කිරීමට යයි කියා යම් කොමිෂන් සභා පත්කරන බවය. මෙසේ කොමිෂන් සභා පත්කල විට කෙටි කාලයක් තුළ එම කොමිෂන් සභාවලට විශාල ප්‍රසිද්ධියක් ලැබේ. මහජන කලකිරීමට තුඩුදුන් ප්‍රශ්නය පිළිබඳව දැඩි අවධානයක් රජය විසින් දී ඇති බවක් බාහිරව පෙනෙන්නට පටන් ගනී. එහෙත් කොමිෂන් සභා වැඩ කටයුතු පිළිබඳව ඉතා ඉක්මනින් මහජන කලකිරීමක් ඇතිවන අතර ඉන් පසු මේ කොමිෂන් සභා පිළිබඳ තිබෙන අවදානය ද මහජනතාව තුළින් අඩුවී යයි. එසේ අඩුවී යාම

මගින් මුලින් ඇතිවූ මහජන කලකිරීම් තුළින් ඇතිවිය හැකිව තිබූ දේශපාලන හා වෙනත් ප්‍රතිපල මගහැරී යයි. අදාළ ප්‍රශ්න කිසිදු ආකාරයකින් විසඳීමකට පත් නොවූවත් එම තත්වයන් පිළිබඳව මුලින් ඇතිවූ මහජන අසහනය ව්‍යාකූල කර දැමීම නම් සිදුවේ.

උදාහරණයන් මගින් මෙය විස්තර කළ හැකිය. රටක පැහැරගෙන යෑම් හෝ බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම් කෙරෙන්නේ නම් ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමේ සියලු බලතල මෙන්ම ද්‍රව්‍යමය සම්පත් ද පවතින්නේ පොලිසියටය. ඔවුහු අපරාධ පරීක්ෂණ පැවැත්විමේ සුවිශේෂ කාර්යය සඳහා බලතල ඇති නීතිමය සංස්ථාව වන්නේය. එමෙන් ම එම සංස්ථාවේ නිලධාරීන්ගේ වෘත්තිය පුහුණුව ද අපරාධ විමර්ෂණ ශිල්පයේ තක්සලාවන් තුළ සිදුකෙරෙහි. අපරාධ පරීක්ෂණයක දී කලයුතු වන කටඋත්තර ගැනීම්, අධිකරණ වෛද්‍ය විද්‍යාත්මක විමර්ශන සිදුකරවා ගැනීම්, අත්අඩංගුවට ගැනීම්, ස්ථාන පරීක්ෂා කිරීම්, නිසි ආකාර විද්‍යාත්මක පරීක්ෂණ කරවා ගැනීම්, ලේඛන හා භාණ්ඩ තමන් භාරයට ගෙන ආරක්ෂා කිරීම්, උසාවිවලට අපරාධ නඩු විධි විධාන සංග්‍රහය යටතේ අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරිම් යන සියල්ල පිළිබඳවම නිපුනතාවක් තිබිය යුත්තේ පොලිස් සංස්ථාව තුළය. එම නිසා පැහැර ගැනීමක් හෝ අතුරුදහන්වීමක් පිළිබඳව නිසි ආකාර පරීක්ෂණයක් පැවැත්වීමේ සැබෑ භෞතික හැකියාව පවතින්නේ එම සංස්ථාව තුළය. දියුණු ප්‍රජාතන්ත්‍රීය නීතික්‍රමයක් ඇති රටක් තුළ එවැනි පැහැර ගැනීමක් හෝ අතුරුදහන්වීමක් සිදුවූව හොත් මේ පිළිබඳව පරීක්ෂණ හා ආරක්ෂක කටයුතු සියල්ල කිරීම බලාපොරොත්තු වන්නේ පොලිස් සංස්ථාව තුළිනි.

එහෙත් අතීතයේ සිදුවී ඇති පැහැරගෙනයෑම් හා අතුරුදහන්වීම් පිළිබඳව පැමිණිලි ගැන සොයා බැලීමේ දී ඒවා ගැන ක්‍රියා කිරීමේ කාර්යය බොහෝ විට සිදු නොවී ඇති බව පෙනේ. එසේ සිදුනොවීම පිළිබඳ මහජන කලකිරීම් ඇතිවේ. මෙම කලකිරීම් විවිධ උද්ඝෝෂණ මෙන්ම මාධ්‍ය හෙළිදරව් කිරීම්



මගින් ප්‍රකාශයට පත්වේ. එසේ ප්‍රකාශයට පත්වන විට අදාළ පාලකයන්ගේ හා ඉහළ නිලධාරීන්ගේ යුතුකම වන්නේ පොලිසියට අදාළ සිදුවීම් පිළිබඳව නිසි ලෙස පරීක්ෂා කිරීමට බැරිවී ඇත්තේ කුමන කරුණු නිසාද කියා සොයා බලා ඒවාට පිළියම් යෙදීමය. එසේ කෙරෙන්නේ නම් පොලිසියේ කාර්යක්ෂමතාව පිළිබඳව නිතරම සුපරීක්ෂාකාරිත්වයක් වර්ධනය වේ. ඇතිවන සෑම පැහැර ගැනීමක් හා බලයෙන් අතුරුදහන්කරවීමක්ම නිසි ලෙස පරීක්ෂා කිරීමට යොමුවීම මගින් එම අපරාධ වඩා සාර්ථකව නැති කිරීමට හෝ අඩුකිරීමට මාවත ද පෑදේ.

එහෙත් ලංකාවේ කෙරෙන්නේ එසේ ඇතිවන පැහැරගෙනයෑම් හා බලයෙන් අතුරුදහන්කරවීම් පිළිබඳව ඇතිවන මහජන කලකිරීම සංසිඳවීම සඳහා කිසියම් කොමිසමක් පිහිටුවීමය. මෙම කොමිසමේ සභිකයන් වශයෙන් අධිකරණයේ හිටපු නිලධාරීන් හා වෙනත් අය තෝරා පත්කරති. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ මේ සිදුවීම් පිළිබඳව පැමිණිලි භාරගැනීමත් ඉන් පසු ඒ ගැන පරීක්ෂණ කිරීමත්ය.

මෙම කොමිෂන් සභා "පරීෂක්ෂණ" යනුවෙන් හඳුන්වන්නේ මොනවාද? සාමාන්‍යයෙන් එසේ හඳුන්වන්නේ පැමිණිලිකරුවන්ගෙන් පැමිණිලි ප්‍රකාශ ලියා ගැනීමත් ඉන් පසු ඔවුන්ගෙන් හා වරද කලායැයි සැකකරණ අයගෙන් ප්‍රශ්න කිරීමත්ය. මෙසේ ප්‍රශ්න කිරීම පොලිසියක් විසින් අපරාධ පරීක්ෂණ පවත්වන ආකාරයට බොහෝ සෙයින් වෙනස් වේ. එය බොහෝ දුරට සමාන වන්නේ ගෙවල් කුලී මණ්ඩලවල හෝ කම්කරු ආරවුල් බේරීමේ සභාවල ප්‍රශ්න කරනු ලබන ආකාරයටය. එම නිසා මෙවැනි කොමිෂන් සභා පරීක්ෂණ, අපරාධ නඩු විධාන සංග්‍රහයේ පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රමයටවත්, නීතිපති ක්‍රමය තුළ නඩු පවරණ ක්‍රමයටවත්, අධිකරණයක් තුළ නඩු අසන ක්‍රමයටවත් සිදු නොවේ. එම ක්‍රියාවලීන්හි ඇති බැරෑරුම් භාවය කොමිෂන් සභා ක්‍රියාවලියෙහි නැත.

මෙහිදී යමෙක් තර්ක කලහැක්කේ කොමිෂන් සභාවකට අවශ්‍ය නම් ඔවුන්ට පොලිසියේ සහාය ලබාගෙන පොලිසිය මගින්

පරීක්ෂණ පැවැත්විය හැකි බවය. එහෙත් මෙහිදී ප්‍රශ්නයක් මතුවේ. එනම් පොලිසියට ඔවුන්ගේ සාමාන්‍ය ක්‍රියා භාරයට අනුවම මෙම පරීක්ෂණ පැවැත්වීමට බලය හා යුතුකම පවතී නම් එම ක්‍රියාව කිරීමට කොමිෂන් සභාවක් අවශ්‍ය වන්නේ ඇයිද යන්නය. කොමිෂන් සභා තුළ වැඩි වශයෙන් පවත්වන "පරීක්ෂණ"වල ගුණාත්මක භාවය ගත් කල එම පරීක්ෂණ කිසියම්ම ආකාරයක බැරෑරුම් බුද්ධිමය හා නීතිමය සම්ප්‍රදායකට නොවැටෙන බැව් පෙනීයයි.

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති ක්‍රමයක් පවතින රටවල පොලිස් පරීක්ෂණ පද්ධතියට, නීතිපති ක්‍රමයට හා අධිකරණවලට අමතරව සමහර විට "ඔම්බුඩ්ස්මන්" යන සංස්ථාව ද පවතී. මෙම ඔම්බුඩ්ස්මන් වර්ගයට අයිතිවන නිලයක් නිර්මාණය කල විට එම තනතුර දරන්නාගේ කාර්යය වන්නේ පොලිසියේ හෝ නීතිපති ක්‍රමයේ හෝ අධිකරණයේ බලතල තමන් වෙත පවරාගෙන ඒ අනුව නිගමන දීම නොවේ. ඔම්බුඩ්ස්මන්ගෙන් කෙරෙන්නේ ඉහත සඳහන් නීතිමය සංස්ථාවල පවතින යම් අඩු පාඩුවක් නිසා යම් අසාධාරණයක් ඇති බව පෙනෙන්නට ඇත්නම් ඊට හේතු සොයා බලා එයට පිළියම් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමය. එම යෝජනා ක්‍රියාත්මක කිරීම නැවත වරක් සිදුවන්නේ ද ඉහතකී පොලිස් පරීක්ෂණ, නීතිපති ක්‍රියා හා අධිකරණ ක්‍රමය තුළින්මය.

දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති ක්‍රමයන් තුළ ඔම්බුඩ්ස්මන් ක්‍රමය ඇති වූයේ මෑත කාලයන්හිදීය. නීති පද්ධතියක් ක්‍රියාත්මක වීමේදී එක් එක් කාලයක ඇතිකර ගන්නා ලද නීති හා පිළිවෙත් පසු කාලයක දී වඩා වැඩි දියුණු කිරීම්වලට ලක් කරති. ඒ සඳහා නිතරම නීති පද්ධතියේ ක්‍රියා කාරිත්වය පිළිබඳව සුපරීක්ෂාකාරී සොයා බැලීම් තිබිය යුතුය. එම සොයා බැලීම්වලින් හෙළිදරව් වන අඩුපාඩු මත පාර්ලිමේන්තු මගින් නීති වර්ධනය කිරීම සිදුවන අතර පොලිසිය, නීතිපති ක්‍රමය හා අධිකරණය පදනම් කොට ගෙන නීති ක්‍රියාත්මක කිරීම සිදුවේ. එම නිසා වැඩි දියුණු ප්‍රජාතන්ත්‍රවාදී නීති ක්‍රමයක් තුළ පොලිස් පරීක්ෂණ ක්‍රමයට, නීතිපති ක්‍රමයට හා අධිකරණ ක්‍රමයට විකල්පයක් වශයෙන් ඔම්බුඩ්ස්මන් ක්‍රමය භාවිතා කල නොහැක.



එහෙත් ලංකාවේ යම් අවස්ථාවල හැර වැඩි වශයෙන් සිදුවන්නේ ඔම්බුඩ්ස්මන් ක්‍රමය රටේ නීති පද්ධතියේ මූලික සංස්ථාවන්ට විකල්පයක් සේ යොදා ගැනීම හෝ යොදා ගන්නා බව පෙන්වීමට උත්සාහ කිරීමයි. මෙම උත්සාහයට සාර්ථක වීමට කිසිම ඉඩක් නැත. එවැනි ප්‍රයත්නයන් අසාර්ථක වන ආකාරය ලංකාවේ මානව හිමිකම් කොමිසම පිළිබඳව හැදෑරීමෙන් දැක ගත හැකිය. මෙම මානව හිමිකම් කොමිසම ඉදිරියට එන වදහිංසා කිරීම්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් හා පැහැරගෙනයෑම් පිළිබඳව නිසි ආකාර පරීක්ෂණ පැවැත්වීමේ ශක්තිය මෙම සංස්ථාවට නැත. එහෙත් එසේ පරීක්ෂණ පැවැත්වීමට හැකිය යන මිත්‍යාවක් ඇතිකර ඇත. එම නිසා ඒ මතය අනුව මෙම ප්‍රශ්න පිළිබඳව චෝදනා ඇතිවූ කල ඒවා විසඳා ගැනීම සඳහා මෙම කොමිසම කරා යොමු කරනු ලබයි. එහෙත් එසේ යොමුකරණ මහජනතාවගේ පැමිණිලි විමර්ශනය කිරීම නිසි ආකාරයකින් ඉටුකිරීමේ හැකියාව මෙම සංස්ථාවට එහි ස්වභාවය නිසාම තිබිය නොහැකිය. මේ නිසා බොහෝ දුරට සිදු වන්නේ ඉතා බරපතළ අපරාධ සම්බන්ධයෙන් සිදුවිය යුතු අපරාධ පරීක්ෂණ සිදුනොවී පැවතීමය. එමෙන් ම "පරීක්ෂණ" යැයි කියා පවත්වන සම්මුඛ සාකච්ඡා මගින් ඇත්තෙන්ම වැරදි කලායැයි චෝදනා ලබන්නන්ට ලෙහෙසියෙන් එම චෝදනාවලින් පැනයාමට මාවත පෑදේ.

සමාජයේ සිදුවන අපරාධ හා අසාධාරණ පිළිබඳව ඇතිවන මහජන කලකිරීම් පිළිබඳව දිය හැකි නිසි ප්‍රතිචාරය වන්නේ පොලිස් පරීක්ෂණ ක්‍රමය, නිතිපති ක්‍රමය හා අධිකරණය තුළ ඇතිවන්නාවූ ප්‍රතිසංස්කරණයන්ගේ මාර්ගයෙන් ඒවා ශක්තිමත් කොට සෑහීමකට පත්විය හැකි කාර්යක්ෂමතාවක් කරා එම ආයතන ගෙන ඒමය. ඒ වෙනුවට කොමිෂන් සභා පත්කිරීම, පත්කිරීමේ ඇති විකාරරූපී භාවය පිළිබඳව ජනවිඥානය වැඩි දියුණු කලයුතුය. ප්‍රශ්නය ඇති කරන සංස්ථා තුළ සිදුකරනු ලබන ප්‍රතිසංස්කරණ මගින් ප්‍රශ්නය නිරාකරණය කරනවා විනා ඒ වෙනුවට කොමිෂන් සභා පත්කිරීමෙන්, මහජන මනස අවුල් කිරීම සදාචාරාත්මක නොවන

වැඩ පිළිවෙලක් බව තේරුම් ගැනීමට ජනවිඥානය දියුණු වුවහොත් නීති පද්ධතියෙහි ප්‍රධාන සංස්ථා ප්‍රතිසංවිධානය කර ගැනීම සඳහා වන මහජන සහභාගිත්වය වැඩි වර්ධනය වනු ඇත.

# ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ විශ්වසනීයභාවය සහිත අධිකරණයක් පිළිබඳ ලෝක ලක්‍ෂණ

අධිකරණයක විශ්වසනීයභාවය පදනම් වන මුල්ම ලක්‍ෂණය බුද්ධිගෝචර භාවයයි. බුද්ධිගෝචර භාවය මතම පමණක් විශ්වසනීයභාවය රැඳෙන බල ක්‍ෂේත්‍රය අධිකරණ බල ක්‍ෂේත්‍රයයි. මෙම බල ක්‍ෂේත්‍රය තුළ මුදල් බලය, බාහු බලය, සමාජ තරාතිරම් බලය පමණක් නොව ඡන්ද මගින් අත්පත් කරගත හැකි ජනතා බලයද අදාළ කරුණු නොවේ. එයින් එක් හෝ වැඩි කරුණක් යම් කාලයක දී හෝ අවස්ථාවකදී අධිකරණයේ බල ක්‍ෂේත්‍රය කෙරෙහි යම් හෝ බලකිරීමක් ඇතිකල හොත් ඒ පමණට අධිරකරණයේ බුද්ධිගෝචර භාවය නැතිවී යයි. මහජනයා මෙම බුද්ධිගෝචර භාවයේ කිසියම්ම හෝ අඩුවක් දකින තරමට අධිකරණ ක්‍රමය පිළිබඳව පවතින විශ්වාසයද පළුදුවේ. බුද්ධිගෝචර භාවයේ වැඩිපළුදු වීමක් ඇතිවුව හොත් අධිරකරණය ගැන විශ්වාසය නැතුව යනවා පමණක් නොව එය මහා විකාරයක් සේ පෙනීමද ඉතා ඉක්මනින් සිදුවේ. ව්‍යවස්ථාදායකය හෝ විධායකය තුළ සිදුවන බුද්ධිගෝචර නොවන ක්‍රියා පිළිබඳ යම් ඉවසීමක් හා උපහාසාත්මකව හෝ විඳදරා ගැනීමක් පැවතිය හැකි නමුත් අධිකරණයක් සම්බන්ධයෙන් එය එසේ විය හැකි නොවේ. අධිකරණයකින් බලාපොරොත්තු වන්නේ සක්සුදක් සේ පෙනෙන බුද්ධිගෝචර භාවයකි.

ව්‍යවස්ථාදායකය හා විධායකය සම්බන්ධ කටයුතුවලදී ඇත්ත හා බොරුව පිළිබඳවත්, පොරොන්දු හා පොරොන්දු ඉටු කිරීම් පිළිබඳවත්, පරමාදර්ශ හා සැබෑ ක්‍රියාකාරිත්වය පිළිබඳවත්, එක් එක් ප්‍රමාණයන්ගේ පරතරයන් මෙන්ම පරස්පරවිරෝධයන්ද දරා ගැනීම විවිධ සමාජයන්හි අඩු වැඩි සේ විවිධාකාරයෙන් සිදුවේ. මෙම සංස්ථා දෙක හා මහජනතාව අතර පවතින සම්බන්ධතා මුළුමනින්ම බුද්ධිගෝචර විය හැකි යයි ඉතාමත්ම දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ වුවද බලාපොරොත්තු නොවේ. දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ බලාපොරොත්තු වන්නේ ඉතාමත්ම ඉහළ මට්ටමක බුද්ධිගෝචර භාවයක් මෙම සංස්ථා තුළද පැවතිය යුතු බවය. එහෙත් මෙහිදී ඇතිවිය හැකි පරස්පර විරෝධයන් පිළිබඳ වැටහීමක් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළම ඇති නිසාම, දැරිය හැකි ප්‍රමාණයකට වඩා බුද්ධිගෝචර භාවයෙන් ඉවත්වන ව්‍යවස්ථාදායකයන් හෝ විධායකයන් සමස්තයක් හැටියට හෝ එක් එක් නිලධාරීන් හැටියට ගෙන එම බුද්ධිගෝචර නොවන ක්‍රියාවලීන් මැඩපවත්වා ගැනීමේ හා අවශ්‍ය වුවහොත් දඬුවම් දීමේ ක්‍රම ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළම එම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයන් විසින්ම නිර්මාණය කරගනී. විශේෂයෙන්ම ආණ්ඩුවක බලය දරන කාලසීමා නිර්ණය කිරීම මගින් බුද්ධිගෝචර ක්‍රියාවලීන්ගෙන් බාහිරව කටයුතු කරන ව්‍යවස්ථාදායකයක් හෝ විධායකයක් ඉවත් කිරීමේ හැකියාවද ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක් තුළ ඇත.

අධිකරණයක් සම්බන්ධයෙන් විවිධ බලපෑම් මගින් අධිකරණයක වැරදි හදාගැනීමේ ක්‍රමයන් ව්‍යවස්ථාධායකයේ හා විධායකයේ පවතිනවා සේ නොපවතී. ඇත්තෙන්ම සියලුම බලපෑම්වලින් අධිකරණය ආරක්ෂා කිරීම සඳහා විවිධාකාර පිළිවෙත් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ පවතී. ඉතාම සුවිශේෂිත අවස්ථාවලදී ඉතාම සුවිශේෂිත ක්‍රියාවලීන් මගින් පමණක් අධිකරණයේ ඉහළ නිලධාරීන් ඉවත් කළ හැකිය. අධිකරණයට වෙනත් ආකාරයෙන් බලපෑම් කරන්නන්ට විරුද්ධව නීති ප්‍රකාර දඬුවම් කිරීමේ හැකියාවද ඇත. මෙසේ ලබාදී ඇති සුවිශේෂ තත්වය හා බලය යටත්වන එකම සාධකය නීතිය මත ක්‍රියාත්මක වන බුද්ධිගෝචර භාවයයි.



අධිකරණයකට බුද්ධිගෝචරව ක්‍රියාකල හැක්කේ අධිකරණමය වශයෙන් කරන සෑම ක්‍රියාවක්ම නීතිය මත පදනම් වන හේතුමය තර්ක රාමුවක් තුළ සාධාරණීකරණ කරගත හැකි ආකාරයෙන් කිරීමටය. විනිසුරුවරු ඔවුන්ගේ සෑම ක්‍රියාවක්ම සාධාරණ යැයි පිළිගැනෙන හේතූන් හා තර්ක පද්ධතීන් මත සාධාරණීය කර ගැනීමට බැඳී සිටිති.

නීතිමය ක්‍රියාදාමයක් තුළ තාර්කීය බුද්ධිය ගොඩනගා ගැනීම සඳහා විවිධ උපක්‍රම අධිකරණ ඉතිහාසය තුළ වර්ධනය වී ඇති අතර ඒවායින් බොහෝමයක් පිළිබඳවම ලෝකය පුරාම පිළිගැනීමක් ඇත. බුද්ධිගෝචරභාවය පිළිබඳව එසේ පිළිගැනුණු සමහර ලෝක ලක්ෂණ මේවාය.

## කිසිදු තෝරා ගැනීමකින් තොරව තමන් ඉදිරියට පැමිණිමට ඉඩ සැලැස්වීම

ඕනෑම අයෙකුට අධිකරණයක් ඉදිරියට ගොස් සහන ඉල්ලීමේ අවස්ථාව පැවතිය යුතුය. මේ සඳහා සීමා හුදෙක්ම බුද්ධිගෝචර වන සීමා වේ. කාගේ හෝ තරාතිරම, මුදල් බලය, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිකත්වයන් පිළිබඳ විවිධ කරුණු කිසිවක් මීට අදාළ නොවේ. අධිකරණයට පැමිණීම පිළිබඳව විවිධ ක්‍රම හා පිළිවෙත් පැවතීමට පුළුවන. එහෙත් ඒ කිසිම සීමාවක් විනිසුරුවන්ගේ සුවිශේෂ කැමැති අකමැති මත හෝ මති මතාන්තර මත තීන්දු නොවිය යුතු බව අධිකරණ ක්‍රමයකට අදාළ එක් මූලධර්මයකි. දේශපාලන පක්ෂ මත හෝ ආගමික මතිමතාන්තර මත හෝ ජාතිවාදය පිළිබඳ වෙනස්කම් මත, ලිංගිකත්වය මත වන සුවිශේෂතා මත හෝ ත්‍රස්තවාදය හෝ වෙනත් සමාජ විරෝධීයයි සලකනු ලබන අදහස් මත හෝ පුද්ගලිකව විවිධ පුද්ගලයන් අධිකරණය පිළිබඳවම හෝ යම් අධිකරණ නිලධාරියෙක් පිළිබඳ කරන විවේචන මත හෝ අධිකරණයක් ඉදිරියට පැමිණීමට කිසිවෙකුට බාධා පැමිණවීම අධිකරණයේ බුද්ධිගෝචර භාවය ප්‍රශ්නයට භාජන කරයි.

අධිකරණයක් ඉදිරියට පැමිණීමේ අයිතිය මෙන්ම එසේ පැමිණි කල තමන්ට අධිකරණයෙන් ලැබෙන සැලකිල්ල මෙසේ යැයි බලාපොරොත්තුවක් ඇතිකර ගැනීමේ අයිතියක් තිබීමට අධිකරණයක් ඉදිරියට එන සෑම පුද්ගලයකුටම ඇත. තමාට සලකනු ලබන්නේ එක්තරා බුද්ධිමය ආකාරයක ශිෂ්ට විධීන්ට අනුව බවත්, අංග සම්පූර්ණ බුද්ධිගෝචර භාවයක් විනිසුරුවරයාගෙන් බලාපොරොත්තු විය හැකි බවත්, යන විශ්වාසය තබාගැනීමේ අයිතිය අධිකරණයක් ඉදිරියට යන කාටත් ඇත. සාමාන්‍ය මිනිසුන් මෙන් විනිසුරුවරුන්ද විවිධ ස්වාභාවික වෙනස්කම් හා ගතිගුණ ඇති අය වුවත් අධිකරණයකදී තමන් ඉදිරියට එන සියල්ලන් සමාන සැලකිල්ලකින් පිළිගනු ලැබීමේ වගකීම ඔවුන් සතුව ඇත.

අධිකරණයක් ඉදිරියට යෑමේ අයිතියට අනුබද්ධවන තවත් කරුණක් වන්නේ තමන් කැමති නිතිඥයෙකුගේ සහාය ඇතිව අධිකරණයට ඉදිරිපත් වීමට කෙනෙකු සතු අයිතියයි. බලපෑමෙන් තොරව තමන් කැමැති නීතිඥයෙකු තෝරාගැනීම මෙම අයිතියේ එක් අංශයක් වන අතර එම පුද්ගලයා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට බුද්ධිගෝචර ආකාරයක ඉඩකඩක් නීතඥවරයාට සැලසීමටද අධිකරණය බැඳී සිටී. මෙසේ නොවන අවස්ථවල්වලදී තර්ජණයට භාජනය වන්නේ අධිකරණයේ බුද්ධිගෝචර භාවයයි.

## අධිකරණමය වශයෙන් සිදුවන සියලුම ක්‍රියා පිළිබඳව වාර්තා ලිඛිතව පවත්වා ගැනීම

අධිකරණමය ක්‍රියා වනාහී නිල ක්‍රියාවෝය. එම සිදුවීම් පිළිබඳව පසුව නිවැරදි අදහසක් ඇතිකරගත හැකිවන්නේ වාර්තා පවත්වාගෙන යෑමෙන් වන අතර එය අධිකරණයක් බුද්ධිගෝචරව පවත්වා ගෙන යෑමේදී අත්‍යාවශ්‍ය ලක්ෂණයකි. විනිසුරුවරු තමන්ගේ පහසු අපහසුකම් නොතකා නිසි වාර්තාවක් පවත්වා ගෙනයෑමට බැඳී සිටිති. හිතාමතා යම් වාර්තාවක් විකෘති කිරීම අධිකරණයක බුද්ධිගෝචර භාවයට තර්ජනයකි. එය රාජ්‍ය තන්ත්‍රයේ



අනිකුත් ශාඛාවක දී සිදුවීමට වඩා අධිකරණයක දී සිදුවුව හොත් එය අධිකරණ සංස්ථාවට කරන විශාල ආපදාවකි.

අධිකරණයක සිදුවන සිදුවීම් මෙන්ම ගනු ලබන තීන්දු ද නිසි ලෙස වාර්තා ගත විය යුතුය. අධිකරණයක ගන්නා තීන්දු එම තීන්දුවට අදාළ වන පුද්ගලයන්ට මෙන්ම රජය කෙරෙහිද බලපායි. මේ පිළිබඳව අනාගත ක්‍රියාමාර්ග ගත හැක්කේ එම තීන්දු පිළිබඳ පැහැදිලි ලිඛිත වාර්තාවක් පැවතුණ හොත් පමණය. අවශ්‍ය තීන්දු අවශ්‍ය අවස්ථාවේ දී දීමත් දෙන ලද තීන්දු පැහැදිලිව ලියා තැබීමත් මෙයින් බලාපොරොත්තුවේ.

## තීන්දු පිළිබඳව හේතු දැක්වීම

ඕනෑම බුද්ධිගෝචර ක්‍රියාවක ලක්ෂණය වන්නේ එය එසේ කිරීමට තීන්දු කළේ කුමන හේතුන් නිසා දැයි පෙන්වීමට හැකිවීමත්, එසේ දෙන ලද තීන්දු බලා අදාළ කරුණු මත තාර්කිකව සාධාරණ නිගමනයකට එළඹී තිබෙනවාද යන්න තවත් කෙනෙකුට සලකා බැලීමට හැකිවීම නිසාත්ය. එසේ ලියා තැබීම පසුකාලීනව එම තීන්දු වෙනස් කිරීමට අභියාචන අධිකරණයකට ඇති ඉඩකඩ ද සලස්වාලයි. එසේ හේතු නොදක්වීමම අදාළ අධිකරණ ක්‍රියාමාර්ගය තේරුම් විරහිත දෙයක් බවට පත්කරයි.

## තමන් සතු බලය අනිසි ලෙස පාවිච්චි නොකිරීම

රාජ්‍යය සතු බලය අනිසි ලෙස භාවිතා නොකිරීම සියලුම රාජ්‍ය නිලධාරීන්ගෙන් බලාපොරොත්තුවේ. එසේ වුවත් එය ඊටත් වැඩි ආකාරයකින් බලාපොරොත්තු වන්නේ අධිකරණයෙනි. මන්දයත් පුද්ගලයන්ගේ නිදහස මෙන්ම සමාජයට බලපෑ හැකි සමහර සුවිශේෂ කරුණු සම්බන්ධයෙන්ද තීන්දු ගැනීමට විධායකයේ හෝ ව්‍යවස්ථාදායකයේ කිසිදු අයෙකුට නැති බලයක් අධිකරණයට අයිතිවන නිසාය. යමෙකුගේ නිදහස නැති කොට අත්අඩංගුවට ගෙන සිරගත කිරීමේ බලය වෙන කාටවත් නැත. මරණ දඬුවම පවා දීමේ අයිතිය අදාළ නඩුවලදී අධිකරණයට

ඇත. මෙවැනි සමහර අවස්ථාවල දී යමෙකුට පාර්ලිමේන්තු අසුනක් නැති කිරීමට මෙන්ම පාර්ලිමේන්තුවක් විසුරුවා හැරීමට පවා සිදුවන තීන්දු ගැනීම් පිළිබඳ බලයක් අධිකරණයට ඇත. රටේ පාලනය සම්බන්ධයෙන් විශාල ප්‍රතිඵල සහිත තීන්දු ගැනීමේ බලය ද අධිකරණයට ඇත. මෙම බලය පැවතීම මගින්ම බුද්ධිගෝචරව පැන නගින නිගමනය වන්නේ උපරිම මට්ටමේ වගකීමකින් හා ඍජු භවින් මෙන්ම, අවංක බවින්ද, උපරිම තර්ක ඥානයකින් යුතුවද, එවැනි තීන්දු ගත යුතු බවය. සියලුම ආකාරයේ අත්තනෝමතික භාවයන්, මති මතාන්තරවලට ගැතිවීම්, දේශපාලන පක්ෂපාතීත්වයන් හෝ ජාතිවාදී ඉදිරි දර්ශනයන් හෝ ලිංගික සුවිශේෂතාව එම තීන්දු ගැනීමේ ක්‍රියාවලියට අඩංගු නොවේය යන්න මෙයින් කියවේ. කිසිදු මනුෂ්‍යයෙක් අධිකරණයකට ඇති මෙම උපරිම බල දැරීමට ස්වාභාවයෙන් සුදුස්සෙක් නොවේ. එහෙත් මිනිස්සු අතින්ම පමණක් මෙවැනි තීන්දු ගතයුතු හෙයින් එම තීන්දු ගැනීමේ අයිතිය විනිසුරුවරුන් වෙත පමණක්ම පවරා ඇත. මෙම පැවරීමෙහිම සටහන්ව ඇත්තේ උපරිම බුද්ධිමය වගකීමකින් එම කටයුතු කෙරෙනවාය යන බලාපොරොත්තුවය.

## ඒ ඒ කාලවල සමාජය තුළ ඇතිවන බුද්ධිගෝචර භාවයේ වැඩි දියුණුවට අධිකරණය සංවේදීව ප්‍රතික්‍රියා කලයුතුය

සමාජයක බුද්ධිගෝචර භාවය වැඩි දියුණුවීම සඳහා බොහෝ කරුණු හේතුවේ. ජනතාව තුළ අධ්‍යාපනයේ ඇතිවන වෙනස්කම්, සමාජය තුළ තාක්ෂණයේ ඇතිවන වෙනස්කම්, සංනිවේදනයේ ඇතිවන වෙනස්කම්, විවිධාකාර සංවිධාන රටාවන් විසින් රටේ බුද්ධිම ක්ෂේත්‍රය කෙරෙහි ඇතිකරන වැඩි දියුණු කිරීම් හා ගමනා ගමන ආදියෙහි ඇතිවන වෙනස් වීම් මීට අයිති වේ. එමෙන් ම සමාජය තුළ තමන්ගේම ගතිගුණ පිළිබඳ ඇතිවන විවේචනය මගින් අතීත කාලයක පැවති අසමානතාවට තුඩුදෙන සම්බන්ධකම් ඉවත් කරමින් සමතාවන් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියද මීට අයත්වේ. මෙසේ වෙනස් වන මානව වර්ගයාගේ බුද්ධිමය හා හැඟීම් රටාව පිළිබඳ දැඩි අවබෝධයක් හා සැලකිල්ලක් නැතිවූ කල අධිකරණයකට එසේ වෙනස් වූ සමාජය තුළ බුද්ධිගෝචරව හැසිරීමට බැරිය.



මෙය හුවා දක්වන එක් විශේෂ කරුණක් නම් කාලය පිළිබඳව සමාජය තුළ ඇතිවන වෙනස් අදහස්ය. බොහෝ කලකට පෙර හුදෙක්ම කෘෂිකාර්මික සමාජයක් තුළ කාලය පිළිබඳව පැවති අදහස්වලට වඩා හාත්පසින්ම වෙනස් අදහසක් දැන් ජීවත්වන්නන් අතර පවතී. වේගවත්ව දේවල් කිරීම කාර්යක්ෂමභාවයේ ලකුණක් කොට සලකන අතර එසේ නොවීම අකාර්යක්ෂමතාවක් සේ සැලකේ. වත්මන් සමාජය තුළ කාර්යක්ෂම නොවීම සලකනු ලබන්නේ බුද්ධිගෝචර නොවීමට සමානවය. පමාව සුළු වැරැද්දක් නොව මහා කරදරයකි. පමාවීමෙන් කටයුතු කරන සංස්ථාවකට සමාජයේ ගෞරවය දිනා ගැනීමට බැරිය. මෙසේ හෙයින් නඩු විසඳීම සම්බන්ධයෙන් අධිකරණයක් ක්‍රියාකරන ආකාරයේ වේගය සමාජයේ අන් කටයුතුවල වේගයට සමාන්තරව සිදුවිය යුතුව ඇත. වේගයෙන් රිය ගමන් කරන මාවතක බරකරත්තයක් මෙන් අධිකරණය ගමන් කලහොත් එය සමාජයේ සමච්චලයට කරුණක් වේ. පමාව නිසාම විශාල ගැටලු ඇතිවිය හැකිය. එම ගැටලු මගින් අධිකරණ ක්‍රියාමාර්ගය මුළුමනින්ම නිෂ්පල කළ හැකිය. උදාහරණයක් වශයෙන් කල් යෑම් නිසා සාක්ෂිකරුවන් නැතිවීමක් සිදුවේ නම් අධිකරණ ක්‍රියා කලාපය එයින්ම නිෂ්පල වේ. එසේ නිෂ්පල වනවා පමණක් නොව අධිකරණ ක්‍රියා කලාපයට අදාළ වුණු කරුණු නීතිය හා යුක්තිය මත නොව වෙනත් ආකාරවලින් කර ගැනීමටද අදාළ පාර්ශ්වයන් නැඹුරුවේ. අධිකරණයකින් කරගත යුතු ක්‍රියා, මැරවර කණ්ඩායම්වලට පැවරීම දක්වා මේ ක්‍රියාකලාපය පළල් විය හැකිය. බොහෝ විට අධිකරණයේ ක්‍රියාකලාපය නිශ්පල කිරීමට උත්සාහ කරන්නේ නීතිය ඉදිරියේ වැරදි යේ සිටින පාර්ෂ්වයන්ය. මෙසේ යුක්තියෙන් බුද්ධිගෝචරව ලාභ ලැබිය යුත්තන් පරාජය වන විටත්, අන්පාර්ශ්වය අවසානයේදී ප්‍රායෝගිකව ජයගන්නා විටත්, යුක්තිය පසිඳලීම පිළිබඳව විශ්වාසය සමාජය තුළ පවත්වාගෙන යා නොහැක.

## සාක්ෂිකරුවන් ආරක්ෂා කරදීමේ හැකියාව

අධිකරණ ක්‍රියාවලියක බුද්ධිගෝචර භාවය රැකෙන්නේ එය ඉදිරියට ඉදිරිපත් වන සාක්ෂි මතය. සාධාරණ විනිශ්චය වනාහී සාක්ෂි තක්සේරු කිරීම මත පදනම් වන ක්‍රියාවලියකි. එහෙත් අදාළ කරුණට සම්බන්ධව සාක්ෂි දීමේ හැකියාව එසේ දියහැකි අයෙකුට අහිමි වුවහොත් විනිශ්චකාරවරයාට බුද්ධිගෝචරව තමන්ගේ කාර්ය භාරය කල නොහැකිය. තිබෙන සාක්ෂිවලට අනුව මගේ කාර්යය කලායැයි යමෙකුට අතසෝදාගැනිමට හැකි වූවත් අදාළ ක්‍රියාදාමය සමස්තයක් වශයෙන් ගෙන බලන කල එය බුද්ධිගෝචර ක්‍රියාදාමයක් නොවන බව පෙනීයයි. තමන්ගේ කාර්යභාරය නිසි ලෙස ඉටුකිරීමෙහි නියැලෙන අධිකරණයක යුතුකම වන්නේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ගතයුතු සියලු පියවර ගැනීමය. මෙම පියවර ක්‍රියාත්මක කිරීම වෙනත් නිලධාරීන් අතින් කෙරෙන්නට පුළුවන. එහෙත් එම ආරක්ෂාව සැලසීමේ වගකීම අධිකරණය විසින් දැරිය යුතුව ඇත. මෙය අදාළ වන්නේ එක් එක් නඩුවල සාක්ෂිකරුවන් ගැන පමණක් නොවේ. සමස්ත අධිකරණ ක්‍රියාවලිය තුළම සාක්ෂිකාරයින්ගේ සුව පහසු සහභාගිත්වය ළඟාකර ගැනීමට බාධාවන කරුණු ඇත්තනම් ඒවා වටහාගෙන ඒ පිළිබඳව අවශ්‍ය වෙනස්කම් කරවා ගැනීමේ පියවර ගැනීමද අධිකරණය මගින් කෙරිය යුතුවේ.

## අධිකරණයේ බුද්ධිගෝචර භාවය හා විශ්වසනීය භාවය රැකගැනීමේ භාරකාරත්වය අවසාන වශයෙන් තමන් පිට පැවරෙන බව භාර ගැනීම

අධිකරණ ක්‍රියාවලියක් නිසි ලෙස පැවැත්වීමේ වගකීම ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන කොටස් තුන වෙතම පැවරේ. අදාළ  පහසුකම් සැලසීම සම්පත් සැලසීම ආදිය රජයේ වෙනත් අංශයන්ගෙන් සිදුවිය යුතුය. එසේ සිදුනොවුව හොත් අධිකරණ ක්‍රියාවලිය බුද්ධිගෝචර භාවයෙන් හා විශ්වසනීය භාවයෙන් තොර බවට පත්වේ. එය එසේ වන්නේ අප නිසා



නොවේ යැයි අතසෝදා ගැනීමට අධිකරණයකට ඉඩ නැත. තමන් කරන කාර්යභාරය එසේ කිරීමට අවශ්‍ය තත්වයන් ළඟාකර ගැනීමේ අවසාන වගකීම අධිකරණයම සතුවේ. බුද්ධිගෝචර නොවන ආකාරයකින් අධිකරණමය කටයුතු කෙරෙන තත්වයක්වලක්වා ගැනීමට බැරි නම් අධිකරණයට එහි කාර්යභාරය කිරීමට බැරිය. තමන්ගේ කාර්යභාරය සිදු කිරීමට බැරි තත්වයක් නිර්මාණය වී ඇතැයි රජයට පෙන්වා දීමත්, තමන්ගේ ම අධිකරණ බලය පාවිච්චි කොට අවශ්‍ය වෙනස්කම් කරවා ගැනීමත් අධිකරණයේම යුතුකමය. කරන්නට බැරිදෙයක් කෙරෙනවා යැයි කියා පෙන්වීම බුද්ධිගෝචර ක්‍රියා කලාපයක් නොවේ. විශේෂයෙන්ම ශ්‍රෙෂ්ඨාධිකරණයක සවයංක්‍රියාකාරී බලය පවතින්නේ එවැනි තත්වයන් නැති කර ගැනීමට ඇති ඉඩකඩ සාදාදීමටය.

# නීති වෘත්තියේ කථාව

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳව 1986 දී පොතක් ලියූ, පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයකු බවට පත්වූ ඒ. ආර්. බී. අමරසිංහ එම පොත පටන් ගන්නේ මෙසේය.

1986 දී යාපනයේ ප්‍රථමික උසාවියේ විනිසුරුවරයකු හා ත්‍රිකුණාමලයේ මහේස්ත්‍රාත්වරයකු මෙම පොත ලියන වසරේම මරණයට පත්කර තිබීම කණගාටුදායකය.

සමහර විට කතුවරයා මෙම සිද්ධිය ගැන ලියන්නට ඇත්තේ එය එම පොත ප්‍රසිද්ධියට පත්වන වර්ෂයේ දීම සිදුවූ නිසා විය හැකිය. එහෙත් ඊට දශක දෙකකට පමණ පසු දැන් මෙම සිද්ධිය දෙස බලන විට පෙනී යන්නේ එම කණගාටුදායක සිද්ධිය ලංකාවේ සිදුවෙමින් පවතින මහා පරිමාන පරිවර්තනයක සංකේතයක් වූ බවය. දැනට අවුරුදු 206 ක පමණ ඉතිහාසයක් ඇති ලංකාවේ අධිකරණ ක්‍රමය පසුගිය දශකයන්හි දී මුහුණ දුන් පරිවර්තනය හුදෙක්ම අධිකරණමය ක්‍රියාවලියේ හුදෙකලා පරිවර්තනයක් නොව සමස්ත රට තුළම පැතිරී පවතින දේශපාලන හා සමාජීය පරිවර්තනයක් අධිකරණ ක්‍රමය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳව තත්වයක්ම බව පෙනීයයි.

ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳව ඉහත සඳහන් පොතෙහි නීති ක්ෂේත්‍රය තුළ එහි දීර්ඝ ඉතිහාස කාලයේදී කැපීපෙනුණු පුද්ගලයන් ගණනාවකගේ ඡායාරූප අඩංගු කොට ඇත. ඡායාරූප අඩංගු එම කොටසෙහි තේමාව ‘තෝරාගත් ටික දෙනා’ යනුවෙන් දක්වා

ඇත. එම ඡායාරූප අතර අඩංගු අවසාන ඡායාරූප දෙක ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරු මාක් ප්‍රනාන්දු හා කලක් ඇමතිවරයකුව සිටි ලලිත් අතුළත්මුදලි යන දෙදෙනාගේය. කතුවරයා අරමුණු නොකලත් මෙම ඡායාරූප දෙකෙන්ද ජනමතකයට නැගෙන්නේ ලංකාවේ තත්කාලීනව පවතින ඛේදාන්තයමය. මාක් ප්‍රනාන්දු විනිසුරුවරයා තම සේවා කාලය අවසන්වීමට ප්‍රථම සේවයෙන් ඉල්ලා අස්වූයේ යම් ආකාරයක විරුද්ධත්වය ප්‍රකාශය කිරීමක් වශයෙනැයි පොදු පිළිගැනීමක් ඇත. එම විනිසුරුවරයාගේ ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් නීතිඥ වෘත්තිය තුළ පමණක් නොව රටේ වෙනත් අංශවලින්ද සැලකිය යුතු ආන්දෝලනයක් පැන නැගිණ. අධිකරණ ක්‍රමය තුළ ඇතිවී ඇති පරිවර්තනයේ කණගාටුදායක තත්වය පිළිබඳව සංකේතයක් සේ එම ඉල්ලා අස්වීම නීති ක්ෂේත්‍රය පිළිබඳව දැනුවත් කමක් ඇති බොහෝ දෙනෙකු විසින් සලකනු ලබයි. එමෙන් ම ජනාධිපති නීතිඥවරයකු හා දක්ෂිණාංශික දේශපාලඥයෙකු වූ ලලිත් අතුලත්මුදලි මහතා දේශපාලන රැස්වීමකදී ඝාතනයට ලක්විය. එම ඝාතනය පසුගිය දශකයන් තුළ ලංකාවේ සිදුවූ දේශපාලන ඝාතන අතර එකක් වෙයි. එම ඝාතන සංඛ්‍යාව විශාල ප්‍රමාණයක් වෙනවා පමණක් නොව ඒ අතර දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ තැන් හෙබ වූ අයද සැලකිය යුතු ප්‍රමාණයක් සිටියහ. එසේ හෙයින් ලලිත් ඇතුලත්මුදලි මහතාගේ ඡායාරූපය ද මතකයට ගෙන එන්නේ එක්තරා ඛේදාත්මක කාලයකි. එය හුදෙක් පුද්ගලික ඛේදාන්තයක් නොව අවුරුදු දෙසීයකට වැඩි අධිකරණ ක්‍රියාවලියක් තුළම පවතින ගැඹුරු ප්‍රශ්න පිළිබිඹු කිරීමකි.

ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය යන ඉහත සඳහන් පොතෙහි සඳහන් වන විවිධ විස්තර සලකා බලන විට පෙනීයන්නේ ලංකාව තුළ බුද්ධිගෝචර අධිකරණ ක්‍රමයක් පමණක් නොව යුක්තිය පසිඳලීම පිළිබඳ සමස්ත ක්‍රියාදාමයක් ඇති කිරීමට ගන්නා ලද ප්‍රයත්නයක් පැවති බවය. බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයන් විසින් ප්‍රකාශයට පත්කරණ ලද ප්‍රඥප්තීන් ද, එංගලන්තයේ පාර්ලිමේන්තුවේ සම්මතය මත ලංකාවට බලපාන ආකාරයෙන් වර්ධනය වූ නීති ද, පමණක්



නොව එම නීතින් ක්‍රියාත්මක කිරීමේ නියැලුණු විනිසුරුවරුන් මෙන්ම නීතිඥයින් පිළිබඳව ද තොරතුරු එහි අඩංගුවේ. මෙම නීතිඥවරුන් රජය වෙනුවෙන් කටයුතු කල අය මෙන්ම ස්වාධීනව නීති වෘත්තියේ යෙදෙන්නන් ගෙන්ද සමන්විතය. අපරාධ නීතිය මෙන්ම සිවිල් නීතියත් පිළිබඳව නඩු විභාගවලදී මෙන්ම අභියාචනවලදී සහභාගී වූ නීතිවේදීන්ගේ කථාව තරමක් දුරටවත් මෙම පොත මගින් කියවේ.

එම පොතෙහි අඩංගුවන ලංකාවේ අධිකරණය තුළ හා නීතිඥ වෘත්තිය තුළ විශාල බලපෑමක් තිබූ නීතිවේදීන් ගැන බලන කල පෙනී යන්නේ ඔවුන් බොහෝ දෙනෙකු එංගලන්තයේ නීති අධ්‍යාපනය ලබාගෙන ඇති බවය. එසේ වැඩි දියුණු නීති පද්ධතියක් තුළින් රටට විනිසුරුවරුන් හා නීතිඥවරුන් බිහි කිරීම එකල බ්‍රිතාන්‍ය පාලකයන් විසින් අනුගමනය කල ප්‍රතිපත්තියකි. එහි පල නෙළාගැනීමට ලංකාවේ එවකට ප්‍රමුඛව පැවති පවුල්වල උනන්දුවක් ද පැවති බව පෙනේ. මෙසේ රටෙහිම පුරවැසියන් නීතිය පිළිබඳවත්, අධිකරණය ක්‍රියාකාරි වන ආකාරය පිළිබඳවත් දැනුවත් කිරීම මගින් ලංකාවේ යුක්තිය පසිඳලීමේ සම්ප්‍රදාය බුද්ධිමය පසුබිමක් මත පිහිටුවීමේ ප්‍රයත්නයක් පැවති බව පැහැදිලිය.

ඉහත සඳහන් විනිසුරුවරුන් හා නීතිඥයින් විසින් ඉටුකර ඇති කාර්යභාරය පිළිබඳව මෙම පොතෙහි ලියා ඇති කරුණුවලින් මෙන්ම ඔවුන්ගේ ක්‍රියාවලියේ අමතක නොවන සටහනක් වන නව නීති වාර්තා දෙස බලන විටද පෙනීයන්නේ නීතිය නිසි ලෙස තේරුම් ගැනීමටත්, එය පැහැදිලි කිරීමටත්, ඒ අනුව තීන්දු දීමටත්, එය තාර්කික ආකාරයකින් ලියා තැබීමටත්, දරන ලද අඛණ්ඩව කෙරුණු විශාල ප්‍රයත්නයකි. නීති වෘත්තිය පිළිබඳව උපරිමතම දක්ෂතාවන්ගෙන් හෙබි එච්. වී. පෙරේරා නීතිවේදියා වැනි අය පවා රට තුළ වැඩි දියුණු වූ මෙම නීති සම්ප්‍රදාය තුළින් ඇති වූහ.

මෙසේ අවුරුදු දෙසීයකට වැඩි කාලයක් තුළ අඛණ්ඩ ප්‍රයත්නයක් තිබියදීත් ලාංකීය සමාජයත් එහි නීතිය පසිඳලීමේ

සංස්ථාවනුත් අද මුහුණ දෙන ආකාරයේ විශාල අර්බුදයකට පත්ව ඇත්තේ කෙසේද යන්න විවේචනශීලීව කල්පනා කරන කා තුළ වුව ද ඇති විය හැකි සාධාරණ සැකයකි. එක අතකින් නීතිය පිළිබඳව බැරෑරුම් බුද්ධිමය ව්‍යායාමයක් දීර්ඝ කාලයක් තුළ පමණක් නොව ඉතා බැරෑරුම් ආකාරයකින්ද කෙරී ඇත. එම ප්‍රයත්නය අංග සම්පූර්ණ ද යන්න පිළිබඳව මැන ගත හැකි සාධකය එම ව්‍යායාමයට පසුබිම වූ සමාජයේ ස්ථාවර භාවයය. තත්කාලීන ලාංකීය සමාජය අස්ථාවර එකක් බව කවුරුත් පිළිගනිති. නීති ක්‍රමයක් ගොඩනැගීමට ගත් ප්‍රයත්නයත්, රටේ දැන් පවතින අස්ථාවර භාවයත් අතර එකිනෙක සම්බන්ධයක් නැතැයි සැලකීම තාර්කිය පදනමක් නැති දෙයකි. ලංකාවේ නීති පද්ධතිය ගොඩනැගීමට ගෙන ගිය ක්‍රියා මාර්ගයේත්, ඒ මත යුක්තිය පසිඳලීමේ සංස්ථාවන් වන පොලිස් අපරාධ පරීක්ෂණ ක්‍රමය, නීතිපති ක්‍රමය හා අධිකරණ ක්‍රමය හැඩ ගැස්වීමට ගන්නා ලද ක්‍රියා මාර්ගයන්ගේත් සාධනීය පැත්ත මෙන්ම එහි පැවතී ඇති අඩු පාඩු සොයා බැලීමද, තත්කාලීන ශ්‍රී ලාංකීය සමාජය අවබෝධ කරගැනීමට යත්න දරන හා එහි ඇති ගැටලු නිරාකරණය කරගැනීමට වෙහෙසෙන්නා වූ කොටසකගේ අනිවාර්ය අවධානයට ලක් විය යුතුය. මේ ප්‍රශ්න සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ නොවේ. එහි අරමුණ ලංකාවේ නීතිය පිළිබඳ ඉතිහාසය විවේචනශීලීව අධ්‍යයනය නොකර ලංකාවේ තත්කාලීන ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය බුද්ධිමය ආලෝකය පමණක් නොව ප්‍රායෝගික ක්‍රියා මාර්ගයන්ද වර්ධනය කරගත නොහැකි බව පෙන්වා දීමය.

මේ සම්බන්ධයෙන් එක් කරුණක් කැපී පෙනේ. ඉතාම නුදුරු කාලයක් වන තුරු නීතිඥ වෘත්තිය තුළ නායකත්වය දැරූ ප්‍රමුඛ පුද්ගලයන් එක්තරා සමාජ තරාතිරමකින් පැවත එන අය බව පෙනීයයි. බුද්ධිමය වශයෙන් ගත් කල ඔවුන් බොහෝ දුරට එකම වර්ගයේ කණ්ඩායමකි. එම කණ්ඩායමේම ප්‍රමුඛ නීතිඥවරයකු වරක් කීවේ කලෙක නීතිවේදීන් අතර සම්බන්ධය "ක්ලබ් එකක" ස්වභාවය ගත් බවය. සියල්ලෝ එකිනෙකා ඉතා හොඳින් දැන සිටියහ. එක සමාන සමාජ අපේක්ෂාවන් හා ගති



පැවතුම් රටාවක් මෙන්ම සිතුම් පැතුම් රටාවක් ද ඔවුන් අතර විය.

විසිවන සියවසේ අගභාගයේ සිට ලංකාවේ සමස්ත ජනගහනය තුළ විශාල බුද්ධිමය පරිවර්තනයක් සිදුවිය. අධ්‍යාපනය රට පුරාම පැතිර ගියේය. රට තුළම විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද පළල්ව පැතිර ගියේය. මේහැර මාධ්‍ය හා සංනිවේදනය මෙන්ම රටවැසියන් අතර ගමනා ගමනය ද බහුල වූ හෙයින් ඒ නිසා ඇතිවූ බුද්ධිය ද බොහෝ සෙයින් පළල් විය. ගැමියන් හා නාගරික උගතුන් ආකාරයට වෙන්වුණු සමාජය වෙනස්වී වඩා බුද්ධිමය පදනමක් ඇති සමාජයක් බවට එය පරිවර්තනය විය.

ඉහත සඳහන් පොතෙහි සටහන් වන බුද්ධිමය පරම්පරාව රටේ ප්‍රමුඛයන් වශයෙන් රට තුළ ඇතිවූ මේ විශාල බුද්ධිමය පරිවර්තනය තුළින් බිහිවූ සම්පත් යොදා ගනිමින් රටේ නීති ක්ෂේත්‍රයත්, යුක්තිය පසිඳලීමේ සියලුම ආයතනත්, විශේෂයෙන්ම අධිකරණ ක්‍රියාවලියත් පෝෂණය කරවා ගැනීමට උත්සාහ දැරිය යුතුව තිබිණි. ඕනෑම සමාජයක බුද්ධිමය ප්‍රමුඛතාව දරන්නන් අතින් පමණක් එවැනි අන්තර් පෝෂණ ක්‍රියාවලියක් ඇතිකර ගැනීමේ පියවර ගතහැකි වේ. එහෙත් ඉහත සඳහන් ප්‍රමුඛයෝ රට තුළ පැන නැගුණු මෙම තත්වය තේරුම් නොගත්තා පමණක් නොව එසේ තේරුම් ගත් ටික දෙනා වුවද එම වෙනස දෙස සාධනීයව බැලුවේ නැත. මෙම හේතුවෙන් අන්තර් පෝෂිත ක්‍රියා මාර්ගයක් ලංකාවේ නීති ක්ෂේත්‍රය තුළ සිදුවූයේ නැත. මෙය ලංකාව දැනට මුහුණ දෙන අස්ථාවර තත්වයට අනුබල දුන් හේතුවක් වේ.

# නීති වෘත්තිය හා නීති අධ්‍යාපනය තත්කාලීන ලංකාවේ මුහුණ දෙන ප්‍රශ්න

ඕස්ට්‍රේලියානු ජාතික නීති ශිෂ්‍යාවක මානව හිමිකම් පිළිබඳව ලංකාවේ කෙරෙන නීති ආධාර පිළිබඳ අධ්‍යයනයක යෙදෙමින් හය මසක් පමණ ලංකාවේ ගතකළාය. මේ කාලය තුළ දී පොලිසියේ වදහිංසාවට භාජනය වූ තරුණ තරුණියන් ගණනාවකට අදාළව තිබූ නඩු ගණනක දී සහාය වීමට ඇය ඉදිරිපත් වූවාය. මෙම නඩුවල එක් ලක්ෂණයක් වූයේ එක් අතකින් වදහිංසා කිරීම පිළිබඳව මෙම තරුණ තරුණියන් කර තිබූ චෝදනා මත පොලිස් නිලධාරීන්ට විරුද්ධව සමහර නඩු මහාධිකරණය ඉදිරියේ එක් අතකින් තිබීමත් අනිත් අතට පොලිසිය විසින් එම අයටම විරුද්ධව පවරා තිබූ විවිධ නඩු මහේස්ත්‍රාත් අධිකරණ ඉදිරියේ පැවතීමත්ය. මෙම නිසා මහේස්ත්‍රාත් අධිකරණවලටත් සමහර මහාධිකරණවලටත් මෙම තරුණ තරුණියන්ගේ සහායකයෙකු ලෙස ඔවුන්ගේ නඩු තිබූ දිනවල ඇයද ගියාය. මේ පිළිබඳව ඇය පසුව විස්තර කළේ මෙසේය.

"මම තරුණ තරුණියන් ගණනාවක් සමඟ ඔවුන්ට සහයෝගය දැක්වීම සඳහා අධිකරණ ගණනාවකටම ගියා. මහේස්ත්‍රාත් උසාවිවලටම පනස් වතාවක් පමණ ගියා. මා මෙසේ ගියේ හුදෙක්ම නිරීක්ෂකයෙකු වශයෙන් පමණයි. මහේස්ත්‍රාත් උසාවියට ගිය හැම නඩුවක්ම කල් දමනු ලැබූවා මිස එකක් වත්

විභාගයකට ගත්තේ නෑ. මේ නඩු බොහෝ කල් සිට පවතින ඒවා බව මම මේ තරුණ තරුණියන්ගෙන් දැනගත්තා. සමහර අය අවුරුදු තුන හතරක් තිස්සේ නිතර නිතර උසාවියට යනවා. ඊට පසු නඩු ඊළඟට නඩුව කල් යන දිනය පමණක් දැනගෙන ආපහු එනවා.

මා මේ තරුණ තරුණියන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් සමගද නිතර නිතර කථාකලා. සමහර වෙලාවට මෙම නීතීඥයින්ගේ ගාස්තු පවා ගෙව්වේ මගේ මගිනුයි. මට පෙනී ගියා මේ නීතිඥ මහතුන් නිතර නිතර නඩු කල්යෑම්වලට ඉතාමත්ව පුරුදුව සිටි බව. ඔවුන් ඒ ගැන කිසිම අතෘප්තිමත් භාවයක් පෙන්නුම් කළේ නෑ. මා ප්‍රශ්න කල විට ලංකාවේ ඒක මෙහෙම තමයි යන්න පමණයි බොහෝ දෙනෙකු කියා සිටියේ. සමහර නීතීඥයින් මේ තත්වය ගැන අසතුටට පත්වී සිටින බව ප්‍රකාශ කලත් ඔවුන් කීවේ මේ ගැන කරන්නට දෙයක් නැතැයි කියාය.

මා නිතර නිතර දුටු එක් දෙයක් නම් යම් නඩුවක් කථා කල විට නීතිඥවරු නැගිට 'මම පෙනී සිටිනවා' කියමින් පුටුවලින් නැගී ගන්නවා. එහෙත් ඔවුන් විනිශ්චාසනය ළඟටවත් ඒමට පෙරත් නඩුවේ ඊළඟ දිනය තෝල්කයා ප්‍රකාශයට පත්කරනවා. ඊට පසු නීතිඥවරු ආපහු ඇවිත් පුටුවල ඉඳගන්නවා.

මේ තරුණ තරුණියන් වැඩිදෙනෙකුට උසාවියේ මොකද වෙන්නේ කියන එකවත් තේරෙන්නේ නෑ. කවුරුන්වත් සිද්ධවෙන දෙයෙහි තේරුමක් ගැන කියා දෙන්නෙත් නෑ. මා ගිය බොහෝ උසාවි බොහෝ අපිරිසිදු තත්වයේ පැවතුණ අතර ඒවාට එන ජනතාවට පහසුවක් ඇතිව ඉඳීමට ඉඩ කඩක්වත් නෑ. මේ පුද්ගලයන් පිළිබඳව කිසියම්ම හෝ සැලකිල්ලක් හෝ ආචාරශීලී භාවයක් කවුරුවත් පෙන්වන්නෙ වත් නෑ. මේ නඩු දිග්ගැස්සීම ගැන නඩුවලට භාජනය වෙලා සිටින මේ සියලු දෙනා ඉන්නේ ඉමහත් අසතුටකින්. ඒ ගැන ඔවුන්ට කරන්න දෙයක් නෑ. මා මහාධිකරණ ගණනාවකටත් ගියා. ඒවායේත් නිතරම නඩු කල් යනවා. මා ගිය එක නඩුවක් වත් අහන්න පටන් ගත්තේ නෑ. මේ නඩු රජයේ නිළධාරීන්ට විරුද්ධව ඔවුන් විසින් කරන ලදැයි කියන වදහිංසා



පිළිබඳ නඩු. මේවායේ පැමිණිලි පක්ෂයේ අයට සහයෝගය දැක්වීමටයි මම ගියේ. මේ සෑම කෙනෙක්ම අධිකරණයට යන්නේ බයෙන්. ඔවුන්ට විරුද්ධව ඉන්න පොලිස් නිලධාරීන් ඉතාම බලවත් අය බව ඔවුන් දන්නවා. තමුන්ගේ සාක්කි දීලා ඉවරයක් කරල දාන්න ඔවුන් හැම දෙනාම ඉන්නෙ ඉතාම ආසාවකින් හා නොඉවසිල්ලකින්. එහෙත් නොයෙක් හේතු උඩ නඩු කල්තබනවා. සමහර විට විත්තිකරුවන්ගේ නොපැමිණීම, විත්තියට අදාළ යම් ලේඛන පැමිණිලි පක්ෂය දී නැතැයි කීම, වෙනත් නඩු පැවතීම, විනිසුරුතුමා අධිකරණයට නොපැමිණීම ආදී නොයෙක් හේතු මත නැවත නැවත නඩු කල්යනවා මම දැක්කා."

මෙම ඔස්ට්‍රේලියානු ශිෂ්‍යාව තමා දුටු ඉහත සඳහන් සිද්ධීන් ගැන විමතියකට පත්වූවත් අධිකරණ පිළිබඳව අත්දැකීමක් ඇති ලංකාවේ කවුරුන් වූවත් මෙම සිද්ධීන්වල කිසිදු විශේෂතාවක් දකින්නේ නැත. අධිකරණ රටාවේ ක්‍රියාකාරීත්වය මෙසේ සිදුවන බව ඔවුන් දන්නාවා පමණක් නොව මේ පිළිබඳව කිසියම් වෙනසක් සිදුවේ යැයි යන බලාපොරොත්තු ද විරලය.

මේ සිද්ධි මාලාවට දෛනිකව මූණ දෙන කණ්ඩායම වන්නේ රටේ නීතිඥවරුන්ය. නඩු ඉක්මනින් අවසන් කරගැනීම සඳහා ප්‍රයත්න දැරීම සාර්ථක ප්‍රතිපල දිය හැකි ක්‍රියාවක් නොවන බවට සියලුම නීතිඥයන් අතර සාමාන්‍ය පිළිගැනීමක් පවතින්නේය යන්න අතිශෝක්තියක් නොවේ. නඩු කල්යෑමට හේතුවන දහසක් කරුණු ඔවුහු හොඳින් දනිති. සමහර විට නඩු පමාවට හේතුවන්නේ නීතිඥයින්ගේම අයෝග්‍ය ඉල්ලීම් යැයි මතයක් නිතර නිතර ප්‍රකාශ වන නමුත් මෙය කොතරම් සත්‍ය දැයි සොයා බැලීමක් කෙරී නැත. ඇත්තෙන්ම ලුණු දියට පුරුදුවන ධීවරයා මෙන් උසාවියේ පමාවට ද නීතිඥයින් පුරුදුව ඇති බව පෙනේ. එය වෙනස් නොකළ හැකි බවට පෙන්නුම් කරන යථාර්තය ඔවුන් මත පටවන ලද අත්දැකීමක් මිස ඔවුන් විසින්ම නිර්මාණය කරගෙන ඇති එකක් යැයි කීම සාධාරණ නොවන බව පෙනේ.

එපමණක් නොව විශේෂයෙන්ම අද පවතින සමාජ තත්වයන් තුළදී පමාව පිළිබඳව අසතුටක් නීතිඥයන් තුළ තිබේ

නම් එය පුදුමයක් නොවේ. අද කවුරුත් සමාජයේ අන් සියලු අංශයන්හි දී වැඩි වේගවත් භාවයක් දකිති. එමෙන් ම සියල්ලෝම තමන්ගේ වැඩ වැඩි වේගවත් භාවයෙන් කර ගැනීමට ආසාවක් හා පුරුද්දක් ඇති කරගෙන සිටිති. බැංකුවකට ගොස් යම් මූල්‍ය කටයුත්තක් කිරීම පිළිබඳව වූවත්, වෛද්‍ය කටයුතු සඳහා විවිධ පරීක්ෂණ ආදිය කර ගැනීම ගැන වූවත්, විවිධාකාර වෙනත් ගනුදෙනු ගැන වූවත්, අද පවතින ජන විඥානය වන්නේ ඉතා ඉක්මනින් දේවල් කර ගැනීම බුද්ධිගෝචර භාවයේ කොටසක් ලෙසය. ප්‍රවාහනයේ ඇතිවී ඇති විශාල වෙනස්කම් ද, සංනිවේදනයේ ඇතිවී ඇති විශාල වෙනස්කම්ද, සමාජ ජීවිතයේ සෑම අංශයක් කෙරෙහිම විද්‍යාවේ බලපෑමේ බලපෑම නිසා ඇතිවී ඇති වෙනස්කම්ද, නිසා කාලය පිළිබඳව මානසික තත්වය සියලු දෙනා අතරින්ම බොහෝ දුරට වෙනස්වී ඇත. පමාව මෝඩකමක් හා අකාර්යක්ෂමභාවයේ ලක්ෂණයක් ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබයි. නීතිඥයෝ ද රටක බුද්ධිමත් කණ්ඩායම් අතරට වැටෙන අන් සියල්ලන් මෙන්ම මානසික තත්වය ඇත්තෝය. මෙම නිසාම තමන්ගේම දෛනික ජීවිතය පිළිබඳව කිසියම් කල කිරීමක් ඔවුන් තුළ පවතී නම් එය පුදුමයක් නොවේ.

නඩු පමාව පිළිබඳව පවතින කලකිරීම හැර ලංකාවේ යුක්තිය පසිඳලීම ගැන විශාල කලකිරීමකට පත්වීමට නීතිඥයින් පෙළඹවීමට තවත් බොහෝ හේතු ඇත. මෙයින් එක් ප්‍රධාන හේතුවක් නම් රට තුළ ප්‍රචණ්ඩත්වය වැඩිවී යෑම අතරම නඩුවල පාර්ශ්වකරුවන්ගේ මානසික තත්වයම බොහෝ දුරට වෙනස් වී යෑමය. නඩු මගින් තමන් මුහුණ දෙන ප්‍රශ්න විසඳා ගැනීමට වඩා වෙනත් ආකාරවලින් ප්‍රශ්න විසඳාගත යුතුය යන මානසික තත්වයක්ද අද විශාල වශයෙන් ප්‍රචලිතව ඇත. ඉතා සුළු සිවිල් ගැටලු ආදිය නිසා මෙන්ම සුළු මතභේද නිසා විශාල අපරාධ සිදුවන තත්වයක් දූන් අපරාධ සංඛ්‍යා ලේඛන තුළින් පෙන්නුම් කරයි. අර්බුදවලට පත් පුද්ගලයන්ට නීතිඥයින් මගින් සපයන සහනයට වඩා මැරවරයන් හෝ නීතිය නොතකා කටයුතු කරන සමහර අයට සිදුකළ හැකි බව පිළිබඳව ජන විඥානයක් ඇතිවීම නිසා ප්‍රශ්න විසඳා ගැනීම පිළිබඳව ජනතාව



අතර ප්‍රායෝගිය ඥානය වෙනස් වීමට පටන්ගෙන ඇත. නඩු හබ මාර්ගයෙන් ප්‍රශ්න විසඳා ගැනීම අයෝග්‍ය හා නුවණක්කාර නොවන ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් නොවන බවට ජන විඥානය තුළ වෙනසක් ඇතිවූ විට, නිත්‍යානුකූල නොවන විසඳුම් සෙවීමට ජනයා අතර ඇති අකමැත්ත අඩුවී යයි. එම අඩුවී යෑමට භාජනය වන එක් ප්‍රධාන වෘත්තියක් නම් නීති වෘත්තියයි.

මෙය සිවිල් අංශයේ දී නඩු කීමට වඩා විවිධාකාර බේරුම්කාර ක්‍රියා මාර්ග කෙරෙහි යොමුවීම් කෙරෙහි තුඩු දේ. බේරුම්කාර ක්‍රියා මාර්ගයන් යහපත් ප්‍රතිපල ගෙන දීමට නම් ආරවුල්වලට පත්වන පාර්ශ්වයන් එකි නෙකාට සමාන ශක්තියකින් සිටිය යුතුය. වැඩි ශක්තිමතෙකු හා සාපේක්ෂව දුර්වලයෙකු අතර ඇතිවන සම්මතයන් වැඩි බලවතාගේ වාසියට සිදුවීම වැලැක්විය නොහැකිය. තමන්ගේ බෙලහීනකම තේරුම්ගන්නා සාපේක්ෂව දුර්වල පාර්ශ්වය තමන්ට සාධාරණව හිමිවිය යුතු අයිතීන් ගැන වැඩි විශ්වාසයක් තබාගැනීම අතහැර දමයි. පාඩුවක් ලබාගෙන හෝ තමන්ගේ හා තමන්ට සමීප අයගේ ආරක්ෂාව සලසා ගෙන ජීවත්වීම වඩා හොඳය යන අදහස දුර්වල පාර්ශ්වය තුළ ස්වාභාවිකවම ඇතිවේ. මේ තත්වය සාපේක්ෂව වැඩි ශක්තියක් ඇති පක්ෂය ද හොඳින් දනී. මේ නිසා ශක්තිමත් පාර්ශ්වය බේරුම්කාර ක්‍රියා මාර්ගයනට මැදිහත්වන්නේ උපහාසාත්මක මානසික තත්වයකින් යුතුවය. "බුලි (Bully)" යන ඉංග්‍රිසි වචනයෙන් කියවෙන්නේ මෙසේ බල පුළුවන්කාරකම් පෙන්නා වෙනත් අය යටත් කොට තමන්ගේ වාසිය සදාගන්නා මානසික තත්වයයි. මේ තත්වය තුළ දුර්වල පාර්ශ්වයට උපදෙස් දෙන නීතිඥයෙකු ඔහුගේ යුතුකම් ඉටුකරන්නේ කෙසේද? නීතිය තුළ වැඩි වාසි ලැබිය යුත්තේ කවුද, නීතිය මගින් අදාළ ප්‍රශ්නය විසඳිය යුතු වන්නේ කාගේ වාසියටද, නීතිය හා යුක්තිය අනුව එලඹිය යුතුවන බේරුමක්, සමථයක් අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සිදුවිය යුත්තේ කෙසේද, ආදිය පිළිබඳව නිසි වෘත්තියමය අවවාදයක් තම සේවාදායකයාට ලබාදීමට නීතිඥයෙකුට නොහැකි වන තත්වයක් ඉහතකී සමාජ රාමුව තුළ දී ඇතිවිය හැකිය. නිසි නීතිමය අවවාදය

දීම ප්‍රායෝගික නොවන ක්‍රියාවක් පමණක් නොව තමන්ගේ සේවාදායකයා අනතුරට ඇද දැමීමට හේතුවන ක්‍රියාවක් ලෙසද සලකා බැලීමට ඔහුට සිදුවේ. හොඳ නීති උපදේශයක් දීම අවසන් විය හැක්කේ තමන්ගේ සේවාදායකයාගේ ජීවිතයට හානියක් වීමෙන් හෝ වෙන ආකාරයක විශාල හානියකට තම සේවාදායකයා හෝ ඔහුගේ හිතවතුන් ඇද දැමීමෙන් විය හැකියැයි සිතීම යතාර්ථවාදීව කල්පනා කරන නීතිවේදියෙකු මුහුණ දෙන ආචාර ධර්මානුකූල ප්‍රශ්නයක් බවට පත්ව ඇත. එය අද පොදුවේ බොහෝ දෙනෙකු මුහුණ දෙන ප්‍රශ්නයකි. නඩු අතහැරදමා හෝ ජීවිතය ආරක්ෂාකර ගැනීම වඩාත් සුදුසු යැයි පෙනෙන තත්වයක් ඇත්තෙන්ම ප්‍රායෝගිකව පවතිද්දී, නීතිමය වශයෙන් යථාර්ථවාදී වන තත්වය තුළ පමණක් ක්‍රියා නොකිරීමට, නීතිඥයෙකු පෙළඹුණ හොත් එය ස්වාභාවික මානුෂික ප්‍රතික්‍රියාවකි. එහෙත් මේ තත්වය පොදුවේ දුර්වලයන් හා ශක්තිමත් වූවන් අතර ඇතිවන ආරවුල් පිළිබඳව පැතුරුණු කල නිසි ලෙස නීති ක්‍රියාත්මක වීමක් වත්, යුක්තිය පසිඳලීමක් වත්, සාධාරණය ඉටුවීමක් පිළිබඳවත්, විශ්වාසයක් පවත්වාගෙන යා නොහැකි තත්වයක් සමස්ත සමාජය තුළම පැතිරී යයි. මෙම තත්වය තුළ සමාජයේ වැඩි බලවතුන් සමඟ සම්බන්ධතා වැඩිකර ගැනීමටත්, සමාජයේ දුර්වල වූවන් පිළිබඳව සානුකම්පිත වූවත් දුරස්ථ හැඟීමක් ඇතිකර ගැනීමටත් සමස්ත නීති වෘත්තිය තුළම ක්‍රියා කාරීත්වයන් ඇතිවීම නොවැළැක්විය හැකිය.

නඩුවල පාර්ශ්ව කරුවන් විවිධාකාර ඝාතනවලට ලක්වීම අද විරල සිද්ධියක් නොවේ. සාක්ෂිකරුවන් මෙම තර්ජන නිසා පසුබැසීම ද සාමාන්‍ය සිද්ධියකි. සාක්ෂිකරුවන් බියවද්දා යටපත් කිරීම මෙන්ම විවිධාකාර දීමනා මගින් පසු බැස්සීමද සාමාන්‍ය සිද්ධියකි. මෙවැනි තත්වයන් නීතිඥ වෘත්තියේම ක්‍රියාකාරිත්වය සඳහාම බලපෑම වැළැක්විය නොහැකිය. බොහෝ විට නීතිඥයෝම විවිධ තර්ජනවලට මුහුණ දෙති. සමහරු එම තර්ජන පිළිබඳ පැමිණිලි කරන අතර එසේ පැමිණිලි කිරීමෙන් ද වැඩක් නැතිය යන මතයක් ද බොහෝ සේ පැතිරී පවතී. එවැනි තත්වයක් තුළ



වර්ධනය වන මානසික තත්වය නම් එවැනි තර්ජනවලට පාත්‍ර නොවන ආකාරවලටම තමන්ගේ වෘත්තිය හැසිරීම හැඩගසා ගැනීමය. මේ අනුව ගැටලු සහගත තත්වයන්ට මුහුණ දිය හැකි නඩුවලින් ඈත්ව සිටීම ප්‍රායෝගිය හා නුවණක්කාර ක්‍රියා කාරීත්වයක්ය යන මානසික තත්වය ඇතිවේ. මෙය නිර්භීතව තමන්ගේ වෘත්තිය කටයුතුවල නියැලිය යුතු බවට පවතින වෘත්තිය සම්ප්‍රදායට විරුද්ධ වූවත්, පවතින සමාජ යථාර්ථය යටතේ තම වෘත්තියට අවංකභාවය, ඍජුභාවය හා පූර්ණත්වය අයෝග්‍ය සමාජ පැවැත්මක් ලෙස සම්මත වීමට පටන් ගනී.

මේ තත්වයන් වඩාත්ම ගැඹුරින් බලපවත්වන්නේ අපරාධ නඩු සම්බන්ධයෙනි. බරපතළ අපරාධයක් පිළිබඳව නඩු තීන්දුවක් දීමට සැරසෙමින් සිටි විනිශ්චයකාර වරයකුගේ ඝාතනය සිදුවූ අකාරය පිළිබඳවත් අධිරකණයක් ඉදිරියේදී තමන්ට වූ වදහිංසාව පිළිබඳව සාක්ෂි දීමට සැරසෙමින් සිටි සාක්ෂිකාරයෙකු මරා දැමූ ආකාරයත් රට පුරා විශාල ප්‍රසිද්ධියට පත්වූ සිද්ධීන්ය. විනිශ්චකාරවරයාගේ මරණය මත්ද්‍රව්‍ය පිළිබඳව ජාවාරම් කරන්නෙකුගේ මෙහෙයවීම යටතේ සිදුවූ බවට ඔප්පුවී ඇති අතර ඉහත සඳහන් සාක්ෂිකරුගේ මරණය මෙහෙය වීම පිළිබඳව චෝදනා ලැබ සිටින්නේ පොලිස් නිලධාරීන්ය. අපරාධ නඩු තුළදී අපරාධවලට චෝදනා ලැබූවන්ගෙන් මෙන්ම රාජ්‍ය තන්ත්‍රයේ සමහර නිලධාරීන්ගේ ද බලපෑම් අතරට පැමිණිලිකරුවෝ සහ සාක්ෂිකරුවෝ මැදිවෙති. අපරාධ නඩුවල පැමිණිලිකරුවකු හෝ සාක්ෂිකරුවකු වීම විශාල අවදානමක් සහිත ක්‍රියාවක් බවට දැන් පත්වී ඇත. මෙවැනි තත්වයන් යටතේ බල පුළුවන්කාරකම් ඇත්තන්ගේ කෙලින් හෝ වක්‍ර බලපෑම්වලට නීති වෘත්තියේම යෙදෙන්නෝ ද හසුවෙති. වෘත්තියමය ඍජු භාවයකින් යුතුව කටයුතු කිරීමද අවදානම් සහිත තත්වයක් බවට පත්වේ. ලංකාවේ බරපතළ අපරාධ පිළිබඳ නඩුවලින් සාර්ථකව ඔප්පුවන නඩුවල ප්‍රමාණය නිල වශයෙන් ගණන් බලා තිබේන්නේ 4% වශයෙනි. මෙයට ප්‍රධාන හේතුව සාක්ෂිකරුන්ගේ පසුබැම් බව නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධරීන් විසින් කර ඇති ප්‍රකාශනවලින්

පෙනේ. මෙවැනි තත්වයක් තුළ සමාජයේ දුර්වල කොටස්වලට අයත් කණ්ඩායම් එනම් රටේ වැඩි ජනාතාවක් අයිති කණ්ඩායම් සඳහා වෘත්තියමය යුතුකම් ඉටු කිරීම සාර්ථකව කල නොහැකි තත්වයකට පත්ව ඇත.

මේ සියල්ල පසු පස ඇත්තේ රට තුළ නීතියටත්, නීතිය ක්‍රියාත්මක කර ගැනීමටත් මතු වී ඇති ඇති විශාල ගැටලුය. විශාල හා බරපතළ නීති කැඩීම් සිදුවන අතර ඒ පිළිබඳව නඩු ක්‍රියා මාර්ග මගින් ප්‍රතිපල ලබාගත නොහැකි තත්වයක් අද විශාල වශයෙන් පවතී. මෙම තත්වයේ බලපෑම හා අනිටු ප්‍රතිපල නීති වෘත්තිය කෙරෙහි බලපෑම ද එසේම විශාල වශයෙන් පවතී.

මේ තත්වය තුළ නීති අධ්‍යාපනය සම්බන්ධයෙන් විශාල ගැටලු පැණ නගී. සෑම වර්ෂයක් පුරාම විශාල සංඛ්‍යාවක් අපේක්ෂකයෝ නීති සුදුසුකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් වෙති. ඔවුන්ගේ බලාපොරොත්තුව රටේ නීති ක්ෂේත්‍රය තුළ වෘත්තිමය වශයෙන් ක්‍රියාත්මකවීම යැයි සිතිය හැකිය. එහෙත් රටේ නීතිය ඉහත සඳහන් ආකාරයක විශාල පසුබෑමකට යටත්ව තිබිය දී මෙම ශිෂ්‍යයන්ගේ බලාපොරොත්තු ඉටු වීමේ පසුබිමක් තිබේ දැයි ප්‍රශ්න කිරීම අසාධාරණ නොවේ. කාලයාගේ ඇවෑමෙන් මානසිකව අධෛර්යට පත් වෘත්තිය සම්ප්‍රදායන් නොතකා හෝ තමන්ගේ ලාභ ප්‍රයෝජනය පමණක් අත්පත් කරගැනීමේ ඉඩ කඩ පමණක් ඔවුන්ට ඉතිරිව තිබේ යැයි ප්‍රකාශ කිරීම අකාරුණික යැයි බාහිර වශයෙන් පෙනිය හැකි ප්‍රකාශයක් වූවත් වර්තමාන තත්වය යටතේ යතාර්ථවාදීව වෙන ආකාරයකට සිතීමට අපහසුය.

# හරස් ප්‍රශ්න ඇසීම හා හරක් ප්‍රශ්න ඇසීම

හරස් ප්‍රශ්න ඇසීම සාධාරණ නඩු විභාගයක දි අවශ්‍ය වන එක් මූලික අංගයකි. එහෙත් එය ලංකාවේ වැඩවසම් සංස්කෘතික බලපෑම් නිසා බොහෝ විට විකෘති ආකාරයකින් යොදාගන්නවා දකිත හැකිය. හරස් ප්‍රශ්න ඇසීම සාධාරණ මෙන්ම නඩු විභාගයක දී අත්‍යවශ්‍ය අංගයක් ලෙස වර්ධනය වූයේ පෙර පැවති බොහෝ පසුගාමී හා මර්දනකාරි පුරුදුවලට එරෙහිව නිසි විනිශ්චයක් සඳහා බුද්ධිගෝචර භාවයේ ඇති වැදගත්කම ඉස්මත්තට ගෙන ඒම මගිනි.

සාධාරණ විනිශ්චය යන සංකල්පයම ඇතිවූයේ නිකම්ම නඩුවක් යැයි දෙයක් පැවැත්වූ පමණින්ම සාධාරණයක් ඉටු නොවන නිසාය. අතීතයේ දී එක් එක් රටවල්වල නොයෙක් ආකාරයේ අත්තනෝමතික ක්‍රියා මාර්ග මගින් නඩුවක් යැයි කියා යම් ක්‍රියා මාර්ගයක් අනුගමනය කොට තීන්දු දීමේ ක්‍රම පැවතිණ. එවැනි ක්‍රම වඩාත්ම බලපෑවේ අපරාධ පිළිබඳ චෝදනා මතය.

අතීතයේ බොහෝ රටවල අපරාධ නඩු පිළිබඳ කැපීපෙනෙන අංගයක් නම් නඩුවේ ප්‍රධාන අරමුණ වූයේ පුද්ගලයකුගේ සාපරාධී බව හෝ නිර්දෝෂී බව දැනගැනීම නොව සමාජයට යම් පාඩමක් ඉගැන්වීම බවය. උදාහරණයක් වශයෙන් මිනී මැරුම හෝ ස්ත්‍රී දූෂණය, රජය හෝ සමාජය විසින් නොපිළිගන්නා බව විදහාපෑම සඳහා යම් අපරාධයක් සිදුවූ පසු කවරකු හෝ අල්ලා ඉතා බරපතළ

දඬුවමකට භාජනය කරනු ලබයි. දඬුවම බරපතළ වනවා පමණක් නොව එය ඉතා හැකිතරම් ප්‍රසිද්ධියේ කිරීමටද විශාල උත්සාහයක් ගනී. මෙසේ බරපතළ දඬුවම් විඳින්නන් දුක අනාගතයේ දී එවැනි ක්‍රියාවල්වලින් වැලකී සිටිම පිළිබඳව මානසිකත්වයක් ගොඩනැගීම එවැනි ක්‍රියා මාර්ගවල අරමුණ විය. බිය වැද්දීම අපරාධ නැති කිරීමේ ක්‍රමයය යන දර්ශනය මත පිහිටා එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලදි.

පුද්ගලයන් විසින් තවත් පුද්ගලයන්ට විරුද්ධව කරන මිනී මැරුම් හා ස්ත්‍රී දූෂණ වැනි අපරාධවලට වඩා බරපතළ අපරාධ ලෙස සලකන ලද්දේ සමාජයේ වැඩි බලයක් දරන අයට විරුද්ධව අඩු බලයක් ඇත්තන් විසින් කරනු ලබන ක්‍රියාවන්ය. මේවා බොහෝ විට දේපල පිළිබඳ ප්‍රශ්න වටා හැඩ ගැසී තිබිණි. ඉඩම් හිමියන්ට හෝ විවිධ රදල කණ්ඩායම්වලට අයත් වූවන්ට හෝ ඉහළ පූජක ගණයට අයත් වූවන්ට කරනු ලබන හානිවලට විරුද්ධව නියම වුණු දඬුවම් මහා පරිමාන ඒවා පමණක් නොව ඒවා ප්‍රසිද්ධ කිරීමද විශාල පරිමාණයෙන්ම කෙරිණි.

මේ අනුව බලන කල නඩු ඇසීම් යනුවෙන් බොහෝ දුරට කරන ලද්දේ අපරාධ යැයි සැලකුණු ක්‍රියා සම්බන්ධයෙන් කිසියම් විශාල ප්‍රචාරයක් ගෙනයෑම සඳහා යම් ආකාර නාට්‍යයක් රඟ දැක්වීමකි. ඊට අදාළව කටයුතු කල බලධාරීන්, පුද්ගලයන්ගේ සාපරාධී බව හා නිර්දෝෂී බව පිළිබඳ උනන්දුවක් දැක්වූවෝ නොවෙත්. ඇත්තෙන්ම නඩුවේ කටයුතු ඉටුකල ඉහළ නිලධාරීන් තුළ විශාල හැඩි දැඩි භාවයක් හා ජනතාව බිය ගැන්වෙන ආකාරයට හැසිරීමේ ගති පැවතුම් තිබීම ද අවශ්‍ය විය. අපරාධ යැයි සලකනු ලබන ක්‍රියා කලහොත් එසේ කරන උදවියට විරුද්ධව ඉතා ප්‍රචණ්ඩව කටයුතු කරනු ලබන බව සමාජය තුළ ඒත්තු ගැන්වීම මෙම ක්‍රියාවන්ගේ අරමුණ විය.

සාපරාධී බව හා නිර්දෝෂී බව පිළිබඳව ඔප්පු කිරීම් වඩා ඉස්මත්තට පැමිණියේ තර්ක බුද්ධිය පිළිබඳව විශ්වාසය හා තාර්කික වශයෙන් බුද්ධිගෝචර නොවන ක්‍රියාවන් කිරීම සමාජය විසින් හෙළාදැකිය යුතුය යන සංකල්ප වර්ධන වීමත් සමගය. එය සමහර



ශිෂ්ටාචාරයන් තුළ ඉතාම මුල් කාලයන්හි දී වර්ධනය වී පසු කාලයන්හි දී නැතිවී ගොස් ඇති බවද සමහර අත්දැකීම්වලින් පෙනේ. ක්‍රිස්තු පූර්ව 2000 පමණ කාලයේ දී "මිසපොතේමියාවේ" පැවතුණා යැයි කියන "හමුරාබි නීතියෙහි" ද, ක්‍රිස්තු පූර්ව 259 යන කාලයේ දී ඉන්දියාවේ "අශෝක අධිරාජ්‍යයා" ගේ "ධර්ම චක්‍රය පදනම් කරගත් නීති ක්‍රමයන්" තුළද සාධාරණත්වය පිළිබඳ අදහස් ගැබ්ව තිබුණි. එහෙත් පසු කාලවලදී මේවා යටපත් කරමින් වැඩවසම් යුගයට ඔබින ආකාරයේ බල පුළුවන් කාරයන් හා ඔවුන්ගේ දේපල ආරක්‍ෂා කරන විදියේ නීති ක්‍රම ඇති විය. එම නීතික්‍රම තුළ බුද්ධිගෝචර භාවය පිළිබඳව සැලකිල්ලක් පැවතුණේ නැත. යුරෝපයේ පුනර්ජීවන යුගයත් බුද්ධිය පදනම්ව විද්‍යාව හා තාක්‍ෂණය දියුණු වීම සමඟ සමාජයේ සියලු අංගයන්හි දීම බුද්ධිගෝචර භාවයට මුල්තැන දිය යුතුය යන අදහස වර්ධනය විය. යුක්තිය පසිඳලීම පිළිබඳව ද අපරාධය හා දඬුවම පිළිබඳව ද ඉහත සඳහන් බුද්ධිගෝචර භාවය වර්ධනය විය යුතු බවට එකල දර්ශනවාදීහු හා නීතිවේදීන් තර්ක කලහ. ඔවුන් අතර ඉතාලියානු නීතිඥවරයකුවූ "සෙසාරේ බෙකාරියා" (1738-1794) වැදගත් තැනක් ගනී. බුද්ධිමය වශයෙන් අපරාධ නඩු ඇසීම පිළිබඳව ඔහු විසින් ඉදිරිපත් කරන ලද මතයන් ඉතා කෙටි කාලයක් තුළ යුරෝපය පුරා වැඩි සම්මතයකට පත් විය. පාපෝච්චාරණ මත නඩු තීන්දු පදනම් නොවිය යුතු බවත්, අපරාධ පිළිබඳව වඩාත් වැදගත් වන්නේ විශාල දඬුවම් පැමිණවීම නොව සෑම අපරාධයක්ම පරීක්‍ෂණ කිරීමට හා යුක්තිය ඉදිරියට පැමිණවීමට අපරාධ පරීක්‍ෂණ ක්‍රමයට ඇති ශක්තිය තුළ බවත්, ඔහු ප්‍රකාශ කළේය. යුරෝපයේ අපරාධ නීතියේ දර්ශනය මේ අනුව සකස්වුණු අතර යටත් විජිත සමයේ දී බ්‍රිතාන්‍යයන් විසින් යටත් විජිතයනට හඳුන්වා දුන් අපරාධ නඩු විධි විධාන හා සාක්ෂි නීතිය පිළිබඳ මූලධර්ම තුළ බෙකාරියා හා වෙනත් නීතිය පිළිබඳ දාර්ශනිකයන් ඉදිරිපත් කල මූලධර්ම ගැබ්ව ඇත්තේය.

නඩු ඇසීමේ ක්‍රියාදාමයේ දී අපක්‍ෂපාතී පුද්ගලයකු විසින් නඩුව ඇසීම හා තීන්දු දීම කලයුතු බව පිළිබඳව දර්ශනය බොහෝ

කාලයක් තුළ වැඩි දියුණු වූවකි. නඩුවක් බොරු රඟපෑමක් නොව සැබෑ කරුණු තාර්කිකව ඔප්පු කිරීම පිළිබඳ දැඩි තරඟකාරී ගවේශනයක් බවටත් හැරුණේ ඉහත කී බුද්ධිමය සම්ප්‍රදායන් නිසාය.

එසේ බුද්ධිගෝචරව නඩුවකට විෂය වන කරුණු පිළිබඳව තාර්කික වූ නිගමන කරා ගමන් කිරීම සඳහා දියුණු කරගන්නා ලද එක් ක්‍රියා මාර්ගයක් වූයේ සාක්ෂිකාරයන් ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට වර්ධනය කරගත් ඉඩකඩ මගිනි. මෙය විශේෂයෙන්ම වැදගත් වූයේ වැඩවසම් සමාජය තුළ බලය දැරූ පුද්ගලයිනට ඔවුන් විසින් කරනු ලබන චෝදනා නිසි ඔප්පු කිරීමකින් තොරව, චූදිතයන් මරණීය දන්ඩනයට හෝ හිරගෙවලට යැවීමට තිබූ හැකියාව නිසාය. එවැනි බලවතුන්ගේ ප්‍රකාශ ප්‍රශ්න කිරීමට හෝ වැරදි බව පෙන්වා දීමට අවස්ථාවක් ඊට පෙර සමාජය තුළ නොතිබිණි. එසේ ඒක පාර්ශ්වීයව කරන ප්‍රකාශ පිළිගැනීම බුද්ධිගෝචර නොවන හෙයින් අධිකරණයක් විසින් කිසියම්ම හෝ ප්‍රකාශයක් මත විශ්වාසය තැබීමට පෙර ඒ පිළිබඳව සත්‍යතාව විනිශ්චය කිරීම සඳහා ප්‍රශ්න කිරීමේ අයිතිය වර්ධනය විය.

හරස් ප්‍රශ්න ඇසීම අධිකරණයකට බුද්ධිගෝචරව සාක්ෂි කරුවන්ගේ ප්‍රකාශ සලකා බැලීමට ආධාර වන ක්‍රියාදාමයකි. එහි අරමුණ සාක්ෂි ප්‍රකාශයන්ගේ අසත්‍යයක් ඇතොත් ඒවා හෙළිදරව් කිරීමය. ප්‍රකාශයක සත්‍ය අසත්‍යභාවය මැන ගැනීමට හේතුවන විවිධ මූලධර්ම සාක්ෂි නීතිය තුළ සටහන් කර ඇත. ඒ සියලු මූලධර්මවලින් කියවෙන්නේ සාක්ෂිකරුවකුගේ ප්‍රකාශයක් පිළිබඳව සැකයක් ඇති කිරීමට පවතින සාධාරණ හේතු ප්‍රකාශකයාගෙන්ම ප්‍රශ්න කිරීම තුළින් හෙළිදරව් කිරීමට විරුද්ධ පාර්ශ්විකයාට ඇති අයිතියය.

හරස් ප්‍රශ්නවල අරමුණ සාක්ෂිකාරයන් බිය වැද්දීම හෝ අඩු අධ්‍යාපනයක් ඇති පුද්ගලයන් මං මුළා කිරීම නොවේ. සාක්ෂිකාරයින් වනාහී විනිශ්චයක් කිරිමේ දී අත්‍යාවශ්‍ය වන පුද්ගලයින්ය. සාක්ෂිකාරයින්ට ආරක්ෂාව දීම රජයක ප්‍රධාන



යුතුකමක් වන්නේ මේ නිසාය. අධිකරණය තුළදී යහපත් මානසික තත්වයකින් උත්තර දීමට සාක්ෂිකරුවනට ඉඩකඩ තිබිය යුතුය. මෙම යහපත් මානසික තත්වය පිළිබඳව සලකා බැලීමේ දී අදාළ අධිරකණය පවතින රටේ හා ප්‍රදේශයේ ජීවත්වන්නන්ගේ අධ්‍යාපන මට්ටම් පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතුය. වැඩි අධ්‍යාපනයක් ලබා ඇති අයෙකුට අඩු අධ්‍යාපනයක් ලැබූ අයෙකු මුළාවට පත්වන සේ ප්‍රශ්න නැගීමට පුළුවන. එමෙන් ම අධිකරණ වැනි ස්ථානවලට නුපුරුදු පමණක් නොව ප්‍රසිද්ධ සමාජ කටයුතුවලට සහභාගි වීමට පුරුද්දක් නැති පුද්ගලයන් විවෘත අධිකරණයක් ඉදිරියට පැමිණෙන්නේ කිසියම් බියකින් හා ව්‍යාකූලත්වයකින් යුතුවය. බොහෝ විට අධිකරණයේ සිදුවන සමස්ත ක්‍රියාදාමය පිළිබඳ ඔවුහු නොදනිති. අඩු අධ්‍යාපනයක් ඇති පුද්ගලයකු තමන්ට එරෙහිව තදින් කථා කරන හා තමන්ගේ බුද්ධිය පිළිබඳව සැකයක් මතුකරන වැඩි අධ්‍යාපනයක් ලද්දෙකු ඉදිරියේ පසුබෑමට ඇති ඉඩ කඩ බොහෝය. විශේෂයෙන්ම වඩා ගැමි සමාජයකට පුරුදුවූවෝ නාගරික පරිසරයේ සිදුවන දේ පිළිබඳව එතරම් නොදනිති. එම නිසා ඔවුන් ව්‍යාකූල කොට, බොරු කියන්නන් ලෙස හෝ විශ්වාසය නොතැබිය හැක්කන් ලෙස හෝ හුවා දැක්වීම වචන හරඹයේ නිපුනතාවක් ඇති කරගත් අයෙකුට එතරම් අමාරු කාර්යයක් නොවේ. එවැනි වැඩිපුර ගැමි ජනතාවක් ඉන්නා ශ්‍රී ලංකාව වැනි රටවල දී සමාජ තත්වය හා අධ්‍යාපනයේ අඩු පහසුකම් ඇති සාක්ෂිකරුවන්ට ඔවුන්ගේ ප්‍රකාශ පැහැදිලිව කිරීමට අවස්ථාව තිබිය යුතුය. හරස් ප්‍රශ්න ඇසීම කොපමණ තදින් කලත් එය සාක්ෂිකාරයාට භීතියක් ඇති නොවන සේත්, ඔහු ව්‍යාකූලත්වයට පත්කිරීමෙන් වාසියක් ලබා ගැනීම සඳහාත් සිදු නොකල යුතුය. හරස් ප්‍රශ්න ඇසීම අධිකරණයේ බුද්ධිගෝචර භාවය වඩාත් මැනවින් පෙන්නුම් කරනවා මිස වචන හරඹය මගින් අඩු අධ්‍යාපනය හා සමාජ අත්දැකීම් ඇති පුද්ගලයන් පසු බැස්සවීම හෝ ව්‍යාකූල කිරීම සඳහා සිදු නොකල යුතුය. හරස් ප්‍රශ්න ඇසීම හරකුන්ට තළා කඳු නැග්ග වීම වැනි වැඩක් නොවේ. එය බුද්ධිගෝචරව, ආචාර ශීලීව, සත්‍ය සෙවීම සඳහා ගන්නා ප්‍රයත්නයකි. සංස්කෘතික වෙනස්කම් පිළිබඳව සංවේදීව හා සමාජ තරාතිරම් නොතකා

සියල්ලන්ටම එක හා සමාන ආචාරශීලී භාවයකින් යුතුව, හරස් ප්‍රශ්න ඇසීම නොකෙරෙන්නේ නම්, මෙයද සාක්ෂි දීම සඳහා අධිකරණවලට පැමිණීමට සාමාන්‍ය ජනතාව මැලිවීමට හේතුවක් වේ. 'නීතිඥයින්ගේ දක්ෂකම ඇත්ත බොරුවකර පෙන්වීම යැයි හෝ බොරුව ඇත්ත කර පෙන්වීම යැයි යන සාමාන්‍ය ජනකතාව අතර ඇති මතය තවදුරටත් ස්ථිර කිරීම එවැනි අවිචාරමත් හරස් ප්‍රශ්න ඇසීම්වලට ඉඩදීම මගින් සිදුවේ. එය අධිකරණයේ ගෞරවයටත්, යුක්තිය පසිඳලීම පිළිබඳ මහජන විශ්වසාය වැඩි දියුණු කිරීමටත් හේතු නොවේ.

# රජයේ නිලධාරීන් විසින් ලේඛන විකෘති කිරීම බොරු දිව්රුම් පෙත්සම් දීම හා අධිකරණයට වාර්තා නොකිරීම

මෙම ලිපියෙන් සලකා බලනු ලබන්නේ නිසි ලෙස රජයට අයිති ලේඛන පත්වාගෙන යෑම සම්බන්ධවත්, අව්‍යාජ ආකාරයකින් අධිකරණයක් ඉදිරියේ සත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට රජයේ නිලධාරීන්ට ඇති වගකීම සම්බන්ධවත් හා අධිකරණයට වාර්තා කිරීම සම්බන්ධව පොලිස් නිලධාරින්ගේ වගකීම් පිළිබඳවත්ය. මේවා රටක් තුළ නීතිය නිසි ලෙස ක්‍රියාකරවීමටත් රටවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාකර ගැනීමටත් අත්‍යාවශ්‍ය වන කොන්දේසි වේ.

## රාජකාරියට අදාළ ලේඛන

රාජකාරී කිරීමේ අත්‍යවශ්‍ය අංගයක් වන්නේ රාජකාරීයට අදාළ ලේඛන නිසි ලෙස පවත්වාගෙන යෑමය. රජයේ සේවය කරන ඕනෑම නිලධාරියෙකු මෙන්ම පාලනයේ යෙදෙන සියලුම විධායකයින්ද කරන්නේ ඔවුන්ගේ පුද්ගලික ව්‍යාපාර කටයුත්තක් නොව නිල වශයෙන්ම රජය විසින් ඔවුන් මත පැවරූ ක්‍රියාදාමයකි. රජයකට නිසි ලෙස ඊට අදාළ සියලුම කාර්යයන් කිරීමට නම් එම සියලුම කාර්යයන් පිළිබඳව නිසි වාර්තා පවත්වාගෙන යෑමට හැකියාව තිබිය යුතුය. රාජ්‍යයක කෙරෙන සියලුම කටයුතු කෙරෙන

ආකාරය පිළිබඳව බලාගත හැකි වන්නේ මෙම ලේඛන තුළිනි. මෙම ලේඛන අදාළ සම්බන්ධකම් හෝ ගනුදෙනුවල යෙදෙන්නන්ට පමණක් නොව ඒ ඒ රාජ්‍ය අංශයේ වැඩ කටයුතු පිළිබඳව අත්‍යාවශ්‍ය වේ. එමෙන් ම අනාගයේ දී රජයේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳව නිසි අවබෝධයක් ඇති කරගත හැක්කේ ද මේ ලේඛන මගිනි.

රජයක වගකීම හා විනිවිදභාවය පෙන්නුම් කරන එක් ප්‍රධානම සාධකයක් නම් රජය මගින් ඒ ඒ අදාළ කාරණා සම්බන්ධයෙන් පවත්වාගෙන යන ලේඛනයන්ය. එම ලේඛන අව්‍යාජ නම් ඒ තුළින් එම ලේඛනවලට අදාළ සිදුවීම් පිළිබඳව සැබෑ අවබෝධයක් ඇතිකර ගත හැකිය. ලේඛනවල ව්‍යාජත්වයක් පැවතුණ හොත් එයින් පෙනෙන්නේ අදාළ ක්‍රියාවලියෙහි කිසියම් වරදක් පවතින බවය. මෙයින් හැඟවෙන්නේ වගකීම පැහැර හැරීමක් ඇතුවා මෙන්ම එම පැහැර හැරීම එළිදරව් වීම වැලැක්වීම සඳහා ද කටයුතු කර ඇති බවය. රාජ්‍ය තන්ත්‍රයට සම්බන්ධ නිලධාරීන් ඔවුන්ගේ නිලයෙන් පහකිරීමට පමණක් නොව අපරාධ නඩු විධිවිධාන යටතේ චෝදනා ලැබීමටද එවැනි කටයුතු සෑහේ.

ලේඛන දැනුවත්ව විකෘති කිරීම පමණක් නොව ලේඛනවලට අස්ථාන ගතවීමට ඉඩදීමද, ලේඛන හෝ එහි කොටස් අතුරුදහන් කිරීමට ඉඩදීමද, ලේඛන කියවීමට නොහැකිවන සේ ආපදාවට පත්වීමට ඉඩදීමද ලේඛන විනාශවී යාමට ඉඩදීමද, යන සියලුම කරුණුද බරපතළ රාජකාරී පැහැර හැරීම් වේ. එසේ කිරීමට අදාළ නිලධාරීන් මෙන්ම ඔවුන්ගේ ඉහළ නිලධාරීන්ද වගකිව යුතුවේ. එවැනි ක්‍රියා මගින් ඔවුන් විසින් සිදු කරන්නේ ඔවුන්ගේ භාරකාරත්වය පිළිබඳ වගකීම පැහැර හැරීමය. රජයේ නිලධාරියෙකු ඔහු යටතේ පවතින ලේඛන පිළිබඳ භාරකාරයා වේ.

විශේෂයෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය බලන කල එහි සමස්ත ක්‍රියාදාමය රැඳෙන්නේ නිසි ලෙස ලේඛන පවත්වාගෙන යාමත්, ලේඛන ආරක්ෂා කිරීමත්, අදාළ අවස්ථාවන්හි දී එම ලේඛන අධිකරණයට ඉදිරිපත් කිරීමත් යන කරුණු මතය. එමෙන් ම



අධිකරණයට ඉදිරිපත් කරන ලේඛනද, අධිකරණයක් තුළදීම වාර්තාවන සාක්ෂි සටහන්ද, ආරක්ෂා කිරීම අධිකරණයකට ඇති විශාල රාජකාරියකි. මෙසේ අදාළ ලේඛන පවත්වාගෙන යෑම සාධාරණ ලෙස යුක්තිය පසිඳලීම සඳහා පමණක් නොව සමාජයේ ස්ථාවර භාවය සඳහාද අතිශයින් වැදගත්වේ.

## පොලිස් ලේඛන

යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ වගකීම සහිත එක් රාජ්‍ය අංශක් නම් පොලිසියයි. පොලිසියක් ලේඛන පවත්වාගත යුතු ආකාරය පොලිසියට අදාළ දෙපාර්තමේන්තු නියෝග සංග්‍රහයේ ඉතා දීර්ඝව දක්වා ඇත. එමෙන් ම අපරාධ නඩු විධි විධානය යටතේද මේ පිළිබඳව නීති ඇත. පොලිසියේ ප්‍රධාන වගකීමක් වන්නේ තම රාජකාරියට අදාළ පොත පත පවත්වාගෙන යෑමයි. ඒ පොත පත අතරට පැමිණිලි ලියාගන්නා ලේඛන, කටඋත්තර ලියා ගන්නා ලේඛන, දෛනික වැඩකටයුතු සටහන්කර ගන්නා ලේඛන, රාජකාරී ගමන් සඳහා වාහන පාවිච්චිය පිළිබඳ ලේඛන, අත්අඩංගුවට ගත් පුද්ගලයන් රඳවා ගැනීම පිළිබඳ ලේඛන, පොලිස් ස්ථානයක් තුළ ඒ ඒ නිලධාරීන්ට පවරනු ලබන රාජකාරීන් පිළිබඳ ලේඛන, පොලිසිය තුළ ආයුධ තබාගැනීම හා පාවිච්චි කිරීම ආදී විශාල ලේඛන, ප්‍රමාණයක් ඇත. මේ ලේඛනවල ප්‍රධාන භාරකාරයා අදාළ පොලිස් ස්ථානාධිපතිවරයාය. ඒ ඒ කාර්යභාර නිලධාරීන් ද අදාළ ලේඛන පවත්වාගෙන යෑමට වගකිව යුත්තෝ වෙති. අධීක්ෂණ කටයුතු භාර සහකාර පොලිස් නිලධාරීන්ගේ සිට ඉන් ඉහළ නිලධාරීන්ගේ ද යුතුකම වශයෙන් මෙම ලේඛන පවත්වාගෙන යාම ය.

පොලිසියේ පවත්වාගෙන යන මෙම ලේඛන අධිකරණයක සාධාරණ විනිශ්චයක් පැවැත්වීම සඳහා ඉතාමත්ම වැදගත්වේ. සාක්ෂිකරුවන් අධිකරණයට සාක්ෂි දෙන අවස්ථාවේදී මෙන්ම පොලීස් පරීක්ෂණ පිළිබඳව පරීක්ෂණ නිලධාරීන් සාක්ෂිදෙන අවස්ථාවේදී ද මෙම ලේඛන පිළිබඳව ප්‍රශ්න කිරීම් සිදුවේ.

අධිකරණය ඉදිරියේ දෙන සාක්ෂිවල සත්‍ය අසත්‍යතාව නිගමනය කර ගැනීමේ එක් ප්‍රධාන සාධකයක් වන්නේ පොලිසිය මගින් පවත්වාගෙන යනු ලබන ලේඛනයන්ය. මෙම ලේඛනවල විකෘති කිරීමක් සිදුවුව හොත් එය අධිකරණයක් මගින් පැමිනෙන නිගමනයක් විකෘති කිරීමට හේතු විය හැකිය. එසේත් නැත්නම් අධිකරණයට නිසි ආකාරයකින් නිගමනයකට පැමිණීමට බාධාවක් බවට එම විකෘති කිරීම් හෝ පැහැර හැරීම් හේතුවනු ඇත.

මේ අනුව බලන කල අධිකරණයට අවශ්‍ය ලේඛන පවත්වා ගෙනයාමේ දී හා ඒවා අධිකරණයට ඉදිරිපත් කිරීමේ දී විශාල වශයෙන් විකෘති කිරීම් පවතින බව පෙනේ. මේ බව ලේසියෙන් ඔප්පු කිරීමට එක් උදාහරණයක් නම් ශ්‍රෙෂ්ඨාධිරකරණයට ඉදිරිපත් කරන ලද මානව හිමිකම් කඩකිරීම් පිළිබඳ නඩු විශාල ගණනකදී පොලිසිය විසින් ඉදිරිපත් කර ඇති ලේඛනයන්ය. තමන්ගේ ආරක්ෂාව සඳහා කරුණු අධිකරණයට ඉදිරිපත් කිරීම පිණිස මෙම ලේඛන වගඋත්තරකරුවන් වශයෙන් අධිකරණය ඉදිරියේ පෙනීසිටින පොලිස් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබයි. බොහෝ විට යම් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම් මෙන්ම අත්අඩංගුවට ගත් ආකාරය පිළිබඳවද, ඔවුන් රඳවා සිටි කාලයන් පිළිබඳව ද, එම කාලවලදී එම සැකකරුවන්ගේ ශාරීරික තත්වයන් පිළිබඳවද, අත්අඩංගුවට ගැනීමට හේතුවූ කරුණු පිළිබඳවද, අත්අඩංගුවේ දී සැකකරුවන් හා සාක්ෂිකරුවන් දෙන ලද ප්‍රකාශ සම්බන්ධයෙන්ද, විකෘති කිරීම් පවතින බව ශ්‍රෙෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් ලෙබන පරීක්ෂා කිරීමේ දී පෙනීයයි. අධිකරණය විසින් පෙත්සම්කරුවන්ට හා වගඋත්තරාකර පොලිස් නිලධාරීන්ට විරුද්ධව දෙන ලද තීන්දුවලින් පෙනියන්නේ මේ ලේඛනවල සත්‍යතාව අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බවය.

එහෙත් මෙසේ රාජකාරියට අදාළ ලේඛන විකෘති කිරීම පමණක් නොව, ඒවා අධිකරණයට ඉදිරිපත් කිරීම පිළිබඳවද, කිසියම් ආකාරයකින් හෝ මෙම වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ට විරුද්ධව අධිකරණය විසින් වත්, පොලිසියේම ඉහළ නිළධාරීන් විසින් වත්, ක්‍රියාකරණ බවක් පෙනෙන්නට නැත. මෙසේ පොලිස් නිලධාරීන් විසින් තමන් පවත්වාගෙන යන ලේඛන විකෘති කිරීම් හුදෙක් සිවිල් නඩුවකදී දෙපාර්ශ්වය විසින් කෙරෙන විකෘති කිරීම් ගණයෙහිලා සැලකිය නොහැකිය. මන්දයත් මේ සියලු ලේඛනයක්ම රජයට අයිතිවන අතර එම ලේඛන විකෘති කිරීම රාජකාරිය පැහැර හැරීමක් පමණක් නොව රජයේ නිලධාරියකු තමන්ගේ භාරකාරත්වය පිළිබඳ වගකීම් පැහැර හැරීමක්ද වේ. මෙය අතිශයින් බරපතළ කරුණකි. ලේඛන විකෘති කිරීමට වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ට ඉඩහැර තිබීම ඔවුන් රජයේ නිලධාරීන් වශයෙන් පවත්වාගෙන යායුතු විශ්වසනීය භාවය පිළිබඳව බරපතළ ප්‍රශ්න මතුකරයි.



## පොලිසිය විසින් ලේඛන විකෘති කිරීම ශ්‍රෙෂ්ඨාධිකරණයේ හෙළා දැකීමට ලක්වීම

පොලිසිය විසින් ලේඛන විකෘති කිරීම කොතෙක් දුරට කෙරෙන්නේද යන්න **කුලසිරි කුමාර කල්දේරා එදිරිව සීදුව පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සෝමසිරි ලියනගේ හා තවත් අය** යන නඩුවේ දී **(එස්. සී. එෆ්. ආර්. අංක 343/99)** යන නඩුවේදී එදිස්සූරිය විනිශ්චකාර තුමා කල පහත සඳහන් ප්‍රකාශනයෙන් පෙනේ. 'මා තවදුරටත් එකතු කල යුත්තේ අපරාධ පරීක්ෂණ ලේඛන හා විමර්ශන සටහන් ලේඛන යනාදිය දඬුවම් ලැබීමේ භීතියකින් තොරව හා නීතියට කිසියම් ආකාරයක සැලකීමකින් තොරව වෙනස්කර ඇති ආකාරය යමෙක් තුළ සැකයක් ඇති කරන්නේ අධීක්ෂණයේ යෙදෙන සහකාර පොලිස් අධිකාරීන් හා පොලිස් අධිකාරීන් ඔවුන්ගේ යුතුකම් පැහැර හැර ඇත්ද හෝ එසේ නැත්නම් මෙම ක්‍රියාවලට අනුබල දක්වනවාද යන්න ගැනය.

මා දැනට දින ගණනකට පෙර ප්‍රකාශයට පත්කල නඩු තීන්දුවකදීත් මා දුටුවේ අපරාධ පරීක්ෂණ ලේඛන වෙනස් කර තිබූ බවය. එම නිසා පෙනීයන්නේ එය හුදෙකලා සිද්ධියක් නොවන

බවය. මේ අනුව පෙනීයන්නේ පොලිස් බලකාය වැරදි කරන නිලධාරීන්ගෙන් පිරී පවතින බවය. ප්‍රශ්නය වන්නේ පස්වන වගඋත්තරකරු වන පොලිස්පතිවරයා මේ ගැන කරන්නේ කුමක්ද යන්නය මගේ අදහසට අනුව පොලිසිය විසින් වාර්තාකර ඇති ප්‍රකාශයක් හෝ සටහන්වල සහතික කොපියක් එහි මුල් ලේඛනය සමඟ නොසසඳා අධිකරණයක් විසින් පිළිනොගත යුතු බවය. මේ රටේ සාමාන්‍ය වැසියන් ආරක්ෂා කල යුතු වන පොලිසිය නීතිය කඩන්නන් බවට පත්වී තිබීම විලාප නැගිය යුතු කරුණකි. අපට "ජුවෙනෙල්" සමඟ ඇසීමට සිදුවී ඇත්තේ "කුවිස් කස්ටෝඩි එට් ඉප් සෝස් කස්ටෝඩි එස්?" "මුරපල්ලන් මුරකරන්නේ කවුරුන්ද?" කියාය."

## බොරු දිව්රුම් පෙත්සම් අධිකරණයට ඉදිරිපත් කිරීම

මීටත් වඩා බරපතළ කරුණක් වන්නේ රාජ්‍ය නිලධාරීන් විසින් අධිකරණයට බොරු දිව්රුම් පෙත්සම් ඉදිරිපත් කිරීමය. එසේ දිව්රුම් පෙත්සම් ඉදිරිපත් කරන්නේද ලංකා ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කරනු ලබන මානව හිමිකම් සම්බන්ධයෙනි. රාජ්‍ය නිලධාරීන්ගේ එක් යුතුකමක් වන්නේ ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමය. ඔවුන් අතින් යම් වන වැරදි මගින් ව්‍යවස්ථාවේ අඩංගු යම් කරුණු උල්ලංඝනය කළ පසු එය වසාගැනීම සඳහා බොරු දිව්රුම් පෙත්සම් ඉදිරිපත් කරන කල්හි රාජ්‍ය නිලධාරින්ගේ වගකීම පිළිබඳව ඉතා බරපතළ ගැටලු මතුවේ. එම ගැටලු වඩාත් උග්‍රවන්නේ මෙම දිව්රුම් පෙත්සම් අධිකරණයකට ඉදිරිපත් කරන කල්හිය. අධිකරණයත් රාජ්‍ය නිලධාරීනුත් අතර පවතින සම්බන්ධය පිළිබඳව විශාල පරස්පර විරෝධයක් මෙයින් පැනනැගේ.

විශාල නඩු ප්‍රමාණයකදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම දිව්රුම් පෙත්සම් ප්‍රතික්ෂේප කොට ඇත. එහෙත් රජයේ නිලධාරීන් විසින් අධිකරණයට බොරු දිව්රුම් පෙත්සම් ඉදිරිපත් කිරීම පිළිබඳ මෙම ප්‍රශ්නය අධිකරණය තුළදීවත්, පොලිසිය ඇතුළු රජයේ



දෙපාර්තමේන්තු තුළවත්, සාකච්ඡාවකට ලක්වී ඇති බවක්වත්, ඉහත සඳහන් කරුණ පිළිබඳව කිසිවෙකුට විරුද්ධව දඬුවම් කර ඇති බවක්වත් පෙනෙන්නට නැත.

ලේඛන පවත්වාගෙන යෑම පිළිබඳව මෙන්ම රජයේ නිලධාරීන්ගේ දිව්රුම් පෙත්සම් ඉදිරිපත් කිරීමේ ක්‍රියා කලාපය නිවැරදි කිරීම පිළිබඳ රාජ්‍ය තන්ත්‍රය තුළ අවශ්‍ය වන විනය පවත්වාගෙන යෑම රජය පිළිබඳව මහජන විශ්වාසය පවත්වාගෙන යෑම සඳහා අත්‍යාවශ්‍ය වේ.

## පොලිස් නිලධාරීන් අධිකරණයට වාර්තා නොකිරීම නිසා අධිකරණයේ කටයුතුවලට බාධා වීම

රට පුරා අධිකරණවල කටයුතු විශාල ප්‍රමාණයේ බාධා වීමට හා පමාවීමට හේතු මොනවාදැයි සොයා බැලීමට 2004 වර්ෂයේදී රජයේ සොලිසිටර් ජනරල් වරයා ඇතුළු හය දෙනෙකුගෙන් සමන්විත කොමිටියක් රජය විසින් පත්කරන ලදි. මෙම කමිටුව විසින් කාලයක් තුළ විවිධ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා තමන්ගේ වාර්තාව නිකුත් කරන ලදි. එසේ සාකච්ඡා කල අය අතර හිටපු පොලිස්පතිවරයාද එක් අයෙකු වූ අතර තවත් ඉහළ පොලිස් නිලාධාරීන් සමගද සාකච්ඡා කරන ලදි.

මෙම කොමිටියේ අවසාන වාර්තාවේ අධිකරණයේ කටයුතුවල පමාවට එක් ප්‍රධාන කරුණක් ලෙස දක්වා ඇත්තේ අධිකරණ කටයුතු සඳහා අධිකරණවලට වාර්තා කල යුතු පොලිස් නිලධාරීන් බොහෝ විට නිසි ලෙස ඒ සඳහා වාර්තා නොකිරීම එක් විශේෂ හේතුවක් බවය. මේ අනුව එම කොමිටිය විසින් කරන ලද එක් නිර්දේශයක් නම් මෙම නිලධාරීන් අධිකරණයට ගෙන්වා ගැනීමට බල කෙරෙන සේ නීති සංශෝධනය කල යුතු බවය.

කොමිටිය තවදුරටත් පොලිසියේ හොඳ පළපුරුදු වැඩිදියුණු කරගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.

අ. උසාවියට වාර්තා කිරීම අනිවාර්ය කිරීම: පොලිස් නිලධාරීන් විසින් අයෝග්‍ය පදනම් ඉදිරිපත් කරමින් නිවාඩු ලබාගැනීම හා උසාවියට පැමිණීමෙන් වැළකීම බහුලව සිදුවීමෙන් මෑත අතීතයේදී උසාවිවල නඩු කටයුතු අනවශ්‍ය ලෙස කඩාකප්පල්වන බව පෙනී ගොස් ඇති හෙයින්, අනිවාර්ය පදනමක් මත පොලිස් නිලධාරීන් උසාවියට පැමිණවීම සඳහා පරිපාලන පියවර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව කොමිටිය පිළිගන්නා ලදි. මේ කරුණු ගැන කොමිටිය විසින් නිර්දේශ කරන්නේ අධිකරණ අමාත්‍යාංශය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට (JSC) හා විනිශ්චකාරවරුන් පුහුණු කිරීමේ ආයතනයට, අයෝග්‍ය පදනම් මත අධිකරණයට වාර්තා නොකිරීම පැහැර හරින පොලිස් නිලධාරීන්ට විරුද්ධව, ඉක්මන් හා යෝග්‍ය පියවර ගන්නා ලෙසට අධිකරණ නිලධාරීන්ට අධ්‍යාපනය ලබාදෙන ලෙස උපදේශ දිය යුතු බවය.”

අධිකරණයට වාර්තා කිරීම වනාහී සියලුම රට වැසියන්ගේත් සියලුම රජයේ නිලධාරීන්ගේත් පරම යුතු කමකි. රජයක අගමැති හෝ ජනාධිපතිවරයා වුවද අධිකරණයකට කැඳවනු ලැබුව හොත් එසේ පැමිණීමට අන්සියලු කරුණුවලට වඩා මුල් තැනක් දියයුතුය. අධිකරණයේ අණට මුල්තැන දීම අධිකරණ කටයුතු පවත්වාගෙන යෑමට හැකි එකම ආකාරය වනවා පමණක් නොව අධිකරණ කාර්යයේ බැරෑරුම් කම හා වටිනාකම පිළිගැනීම ඒ මගින් කෙරෙහි. රජයේ නිලධාරියෙකු විසින් වෙනත් මොනම හෝ රාජකාරියක් අධිකරණයට වාර්තා කිරීමට වඩා වැඩියෙන් වැදගත් යැයි සිතන තත්වක් පවතී නම් මෙය රාජ්‍ය තන්ත්‍රය තුළ අධිකරණය අඩුවෙන් තක්සේරුකර සැලකීම හා පිළිබඳ විශාල ප්‍රශ්නයක් ඇති බව පෙන්නුම් කරයි.

අධිකරණයේ නියෝග අනුව අදාළ දිනවලදී අධිකරණයට වාර්තා නොකරන නිලධාරීන් විශාල ප්‍රමාණයක් සිටීමම ලංකාවේ පොලිස් ක්‍රමය තුළ ඇති විශාල විකෘති වීමක් පෙන්නුම් කරයි.



පොලිස් නිලධාරීන් වනාහී නීතිය රැකිය යුතු නිලධාරීන්ය. එම නිලධාරීන් අධිකරණයටවත් නිසි ලෙස වාර්තා නොකරයි නම් කුමන ආකාරයකින් ඔවුන් නීතිය රකිනවාද යන්න පිළිබඳව ප්‍රශ්න ඇතිවීම ස්වාභාවිකය.

රජයේ නිලධාරීන් විසින් ලේඛන විකෘති කිරීම, බොරු දිව්රුම් පෙත්සම් දීම, හා අධිකරණ නියෝග අනුව අධිකරණය වෙත නොපැමිණීම යන කරුණු සියල්ලම පෙන්නුම් කරන්නේ ලංකාවේ අධිකරණය ක්‍රමයත් පොලිස්ක්‍රමයත් අතර ඇති විශාල නොගැලපීමයකි. යුක්තිය පසිඳලීමේ මූලික ආයතන දෙකක් අතර මෙපමණ විශාල නොගැලපීමක් පවතින විට එය විසඳීම පොලිසියේ මෙන්ම අධිකරණයේද ඉහළ තනතුරු දරන්නන්ගේ ප්‍රධාන වගකීමක් පමණක් නොව රජයේ ද වගකීමකි. මෙවැනි වගකීම් පැහැර හැර තිබෙන තත්වයක් තුළ යුක්තිය පසිඳලීමත්, නීතියේ ආධිපතිත්වයත් නිසි ලෙස රැක්කෙන්නේ කෙසේද යන්න අවසාන වශයෙන් විසඳිය යුත්තේ රටේ ජනතාව විසින්මය.

# පුරුදු උණා කරදිය වතුර සාපය

දැන් ශ්‍රී ලාංකික ජනතාවට සාමාන්‍ය ජීවිතය පිළිබඳ අදහසක් හෝ මතකයක් පවතින්නේ නැත. සාමාන්‍ය ජීවිතය වශයෙන් සැලකූ සියල්ල සමාජය තුළින් අතුරුදහන් වී ඇති අතර ඊට හාත්පසින්ම වෙන් වූ බොහෝ දුරට ආරක්ෂාවෙන් තොර බව මුලින් මතුවන සමාජ රටාවක් දැන් ඔවුන් බලාපොරොත්තු වන දේ බවට පත් වී ඇත. ගෙදරින් එළියට යන කුඩා පාසල් දරුවාට දෙන අවවාදත්, ගෙදරින් වැඩට යන පියෙකු හෝ මවක තමන් තුළම හිතේ තබා ගන්නා දේත් බොහෝ දුරට රැඳී පවතින්නේ ආරක්ෂාව පිළිබඳව ඔවුන් තුළ පවතින්නා වූ දැඩි අවිශ්වාසය මත ය. ඒත් සමගම සමාජයේ අන් සෑම දෙයක් පිළිබඳව ද කිසියම් බුද්ධිමය ආකාරයකින් වන බලාපොරොත්තු පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් සමාජ ජීවිතයේ සෑම අංශයකම දක්නට ලැබේ.

දූෂණයෙන් තොර කුමන ආකාරයක කටයුත්තක් හෝ සමාජය තුළ කරගත නොහැකිය. මේ පිළිබඳව කා තුළත් පවතින්නේ විශාල ව්‍යාකූලත්වයකි. සෑම අංශයක් පාසාම දූෂණය කොරතම් විසිරී පවතී ද යත්, එසේ දූෂණයට භාජනය නොවූ දෙයක් පිළිබඳව සිතා ගැනීම පවා අමාරු තත්ත්වයකට පත්වෙමින් පවතී. යුද්ධයක් සඳහා ආයුධ හෝ ගුවන් යානා ගැනීම සම්බන්ධව වුවත්, රජයේ නිලධාරීන්ගේ වාහන පිළිබඳව වුවත්, වෙන මොනයම් හෝ කාරණාවක් ගැන වුවත්, දූෂණයෙන් තොර

නිසියාකාරයකට යම් ක්‍රියාවක් කෙරෙහිය යන්න පිළිබඳ විශ්වාසය ජනතාව තුළ දැන් නැත. කුඩා දරුවකු පාසලට දමා ගැනීම පිළිබඳ ප්‍රශ්නය පවා අද ලාංකිකයාට සිතීමට සිදුවී ඇත්තේ එම දූෂණයේ සෙවණැල්ල ඔස්සේ ය. අන් සියලුම ආකාරවලින් ගත්තත් රට තුළ බුද්ධිගෝචර වන්නා වූ කිසියම් හෝ පුරුද්දක් ඉතිරිව නැත. අද ජීවත්වන තරුණයෙකු ස්වාධීනව බයකින් තොරව පාරේ ඇවිදින දේශපාලනඥයකු දැක නැත. හතළිස් පනස් ගණන්වල කාලවලදී ගමේ නොයෙක් තැන්වල ඇවිදිමින් නිදහසේ හැසිරුණු දේශපාලනඥයන් මෙන්ම බස් රථයකින් හෝ පා පැදියකින් එහා මෙහා යන මන්ත්‍රීවරුන් මෙන්ම, ඇමැතිවරුන් පවා දක්නට තිබුණ නමුත්, අද එවැන්නකු දැකගත නොහැක. එයට ප්‍රධානම හේතුව වන්නේ එසේ එහා මෙහා යාමට තරම්වත් දේශපාලනඥයකුට සුරක්ෂිතභාවයක් කොහොමටවත් නොපවතින නිසා ය. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ එකිනෙකා අතර ගැවසී දේශපාලන කටයුතුවල නියැලෙන පුද්ගලයින්ගේ ස්වාභාවික ක්‍රියාකලාපය පිළිබඳව කිසිම අදහසක් දැන් ජීවත්වන ජනතාව තුළ ඇත්තේ ම නැත.

පාර්ලිමේන්තු වාද විවාද ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ඉතා වැදගත් අංගයක් පමණක් නොව බොහෝ දුරට ජන ජීවිතය තුළ විශාල උනන්දුවක් හා විනෝදයක් පවා ඇති කළ හැකි අංගයක් වන්නේ ය. හතළිස් පනස් ගණන්වල පාර්ලිමේන්තු විවාද පිළිබඳව මතකයන් එදා සිටි කා අතරත් පැවතියේය. ඒවා ජනතාව අතරට ගියේ පුවත්පත්වලින්, ගුවන් විදුලියෙන් වැනි අදට වඩා අඩු ශක්තියක් තිබූ මාධ්‍ය තුළිනි. එවැනි සීමිත මාධ්‍ය මගින් වුවද ජනතාව අතරට නොයෙක් අදහස් පැතිර ගියේය. පාර්ලිමේන්තුව අසල නොයෙක් ප්‍රශ්න පිළිබඳව කරන උද්ඝෝෂණද මෙමා මාධ්‍ය මගින් ජන විඥානයට ඇතුළුවිය. පාර්ලිමේන්තුවක් තුළ ප්‍රශ්න නගන ආකාරයත් එම ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරයත් ඔවුහු අසාදූන ගත්හ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව තුළ නව නීතින් ආදිය විවාද කොට සම්මත කර ගන්නා ආකාරයද මහජන මතකයට ඇතුළු විය. එහෙත් අද වැඩි දියුණු ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය



තිබුණත් උනන්දු සහගතව ප්‍රජාතන්ත්‍රවදාය ක්‍රියාත්මක වන ආකාරයක් දැන ගැනීමට අවස්ථාවක් ජනතාවට ලැබෙන්නේ නැත. වෙනදාට වඩා අද පාර්ලිමේන්තු කටයුතු ආදිය දැක ගැනීමට ජනතාවට හැකිය. එහෙත් ඔවුනට දැකීමට නැත්තේ හරයාත්මක ආකාරයෙන් රටේ ප්‍රශ්න ගැන කථාකරන කථිකයන් හා රට මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව විසඳීම් ලබාගැනීම සඳහා බුද්ධිගෝචර මූලෝපායන් ඉදිරිපත් කරන පරිණත නායකයන්ය. මේ නිසාම මෙම විවාද දැක බලාගැනීම පිළිබඳව උනන්දු සහගත ආසාවක් වත් ප්‍රබෝධජනක බලාපොරොත්තුවක් වත් ඇත්තේ නැත.

අද තවත් ජනතාවට නුපුරුදු දෙයක් ඇත. එනම් ඉතා දක්ෂ ආකාරයකින් අපරාධ පරීක්ෂණයක් කොට එය සාර්ථකව අවසානයට ගෙන එන අපරාධ පරීක්‍ෂණ පිළිබඳ කථාය. හතළිස් පනස් ගණන් කාලවල දී අපරාධ පරීක්‍ෂණ පිළිබඳව විශාල උනන්දුවක් ජනතාව අතර තිබුණි. ඇඩ්ලින් විතාරණ නඩුව හා බණ්ඩාරනායක මිනි මැරුම් නඩුව ආදී විවිධාකාර විශාල නඩු ප්‍රමාණයක දී පොලිස් නිලධාරීන් විසින් ඉතා දක්ෂ ආකාරයකින් කරුණු රැස්කර ඒ කරුණු මත නඩු පවරා නඩු විභාග පවත්වාගෙන ගිය ආකාරය පිළිබඳව ජනතාව තුළ ඉතාමත් පැහැදිලි මතකයක් ඇත. එහෙත් අද නිතරම අසන්නට ලැබෙන්නේ විශාල අපරාධත්, ඒ අපරාධ ඉදිරියේ නිසියාකාර පරීක්ෂණයක් පවත්වා ගැනීමට බැරි තත්වයකට පත්වුණු පොලිසියකුත් පිළිබඳව ය. ඒ අනුව අපරාධ පිළිබඳව සාමාන්‍ය සමාජයක් තුළ සිදුවන දක්‍ෂ පරීක්ෂණ දැක බලා ගැනීමේ පුළුවන්කම දැන් ජනතාවට අහිමි වී අතුරුදහන් වී ගොස් ඇත.

අතීතයේදී අත්අඩංගුවට ගත් පුද්ගලයන්ගෙන් කටඋත්තර ගැනීම හා ඉන් පසුව ඔවුන් නඩු මාර්ගයකට පැමිණවීමත්, උසාවි තුළට ගෙනයාමත්, ඉන්පසු නඩු ඇතිවන ආකාරයත්, පිළිබඳ මතකයකුත් ජනතාව තුළ ඇත. එහෙත් අද ඒ වෙනුවට බොහෝ දුරට පවතින්නේ අත්අඩංගුවට ගෙන ඇති අය අතුරුදහන් වේවිද යන බය ය. අත්අඩංගුවට ගැනීමක් සිදුවන සෑම විටකම ඊට අදාළ පවුල් හා වෙනත් පුද්ගලයන් පසු වන්නේ ඉතාමත්

භීතියකිනි. ඔවුහු එසේ අත්අඩංගුවට පත්වූවන් ස්වාභාවික ආකාරයකින් නැවත පැමිණේ ද, නැතහොත් කුමන හෝ විපතක් සිදුවේද යන්න පිළිබඳව කනස්සල්ලට පත්වෙති.

ඉහත සඳහන් අත්දැකීම් වටා සමාජය දෙස බලන කල ඉස්මතුව පෙනෙන්නේ සාමාන්‍ය ජීවිතය පිළිබඳව මතකය ජනතාව තුළින් ගිලිහී ගොස් ඇති බවය. මෙහිදී ධීවර ජීවිතයට පුරුදුවීම නිසා ගොඩබිම ජීවිතයේ දී අත්දකින සාමාන්‍ය පැවැත්ම නැතුව යෑම පිළිබඳව ධීරයන්ගේ අත්දැකීම් කියැවෙන කවියක් මතක් වේ.

කුර සොදිනා මඩකලපුව සමීපය
පුරුදු උනා කරදිය වතුර සාපය
අප විඳිනා දුක දනිතොත් දෙමාපිය
වතුර නොනා ඇස් දෙක දන්නත් බැරිය

මෙහි "පුරුදු උනා කරදිය වතුර සාපය" යන්නෙන් ජන කවියා කතා කරන්නේ, මිරිදියේ මිහිරත්, ගොඩබිමේ ජීවිතයේ දී අත්දකින දේත්, නුපුරුදු වුණු ධීවරයන් පිළිබඳවය. ධීවරයෝ අතීතයේදී ඔරු, තෙප්පම් ආදියෙන් මහ මුහුදට ගොස් දවසේ වැඩි කාලයක් මුහුදේම ගත කරති. කරදිය සාපයට පුරුදු වෙන ඔවුන්ට ගොඩබිමේ ස්වාභාවික ජීවිතය නුපුරුදු දෙයක් බවට පත්වේ. එම නිසාම කරදියෙහි ආශ්‍රය ශාපයක් ලෙස සලකති. අද ලාංකිකයන්ගේ ජීවිතවලට ද සිදු වී ඇත්තේ බොහෝ දුරට මෙවැනිම දෙයකි. ගොඩබිමට නුපුරුදුව, මිරිදියට නුපුරුදුව, කරදියට පුරුදුවුණු ධීවරයා මෙන් අද සාමාන්‍ය ස්වාභාවික ජීවිතයට තිබූ පල පුරුදු අහිමිවුණු ලාංකිකයෝ අනාරක්ෂිත භාවයෙන් යුතු ජීවිත ගෙවති. කුමන දෙයක් පිළිබඳව වුවත් බුද්ධිගෝචර ආකාරයකින් බලාපොරොත්තු තබාගත නොහැකි තත්වයක පසුවෙති. අවිනිශ්චිත මානසික තත්වයකින් යුතුව ජීවත්වීම සමාන්‍ය පුරුද්දක් බවට පත්වේ. මෙම මානසික විපර්යාසයට තුඩු දෙන සමාජ අස්ථාවරත්වය තුළ බොහෝ කල් ජීවත්වීම නිසා ජනතාව තුළ ඇතිවිය හැකි වෙනස මොන



අකාරවල මහා ගැටලුවලට ලාංකීය සමාජය ඇද දමා විද යන්න පවා සිතීමට අමාරු ය. "පුරුදු උනා කරදිය වතුර සාපය" යන කවියෙන් කියවෙන මානසික තත්වයට සමානම මානසික තත්වයක පසුවන ලාංකිකයිනට එම සාපයෙන් අත්මිදිය හැකි වන්නේ කුමන ආකාරයකින් ද යන්න සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ගවේෂණයකට සුදුසු මාතෘකාවකි.

# නීතියේ රජකම මගින් පාලකයන්ගේ අනුවණකම් ජයගැනීම

"නීතිය රජුය" යන සංකල්පය මත, "නීතියේ ආධිපතිත්වය" මත ගොඩනැගෙන සමාජය පදනම් වී ඇත. මෙහි රජු යනුවෙන් අදහස් කරන්නේ අධිපතියා, පාලකයා, ඉහළම බලධාරියා ආදී වචනවලින් කියවෙන අර්ථයමය. වැඩවසම් සමාජයෙහි රජු යනුවෙන් අදහස් කළේ රටේ සියලුම බලය දැරූ තැනැත්තාය. රජුගේ අණට කීකරු වීමට සියල්ලෝ බැඳී සිටියහ. එසේ පැවති රාජ සංකල්පය නීතිය රජුය යන මූලධර්මයෙන් මැකී ගියේය. නීතිය සියල්ලටම වඩා ඉහළින් පිහිටන බවත් එයට රටේ පුරවැසියන් මෙන්ම රටේ පාලකයන්ද යටත් බවත් මෙයින් කියවේ.

නීතිය රජු වීමට නම් සමාජීය ජීවිතයේ සියලුම අංශයන් පිළිබඳව නීති තිබිය යුතුය. පාලනය කිරීම යනු පවතින නීතිය රැකීමත්, නිතියේ අඩුපාඩුකම් ඇති තැන එම අඩුපාඩු නැතිවන සේ නීතිය තවදුරටත් වැඩි දියුණු කිරීමත්, එම සියලුම නීතින් ක්‍රියාත්මක කිරීමත් අඩංගුවේ. රජයේ එක් අංශයක් විසින් එනම් ව්‍යවස්ථාදායකය විසින් නීති සම්පාදනය කරන අතර විධායකය නීති ක්‍රියාත්මක කරයි.

නීතිය රජකමින් පලවා හැරීමෙන් අදහස් කරන්නේ නීතියෙන් තොරව පාලනය කිරීමකි. නීතියෙන් තොරව පාලනය කිරීම නීතිය නොතකා හැරීම මගින් හෝ නීතියට මුළුමනින්ම පටහැනිවත්

කලහැකිය. නීතිය අතහැර දමන පාලකයා තමන්ගේ හිතුමනාපය තමන්ගේ ක්‍රියා කලාපයෙහි පිළිබිඹු කරයි. නිසි ලෙස නිර්මාණය කොට කාටත් පොදුවේ පැවතිය යුතු නීතිය වෙනුවට පාලකයා තමන් පුද්ගලිකව හිතන දේ ක්‍රියාත්මක කිරීම මගින් රට පාලනය කිරීමට උත්සාහ කිරීමෙන් නීතියට හිමි රජකම පාලකයා තමා වෙත පවරාගනී.

රජවරුනට තමුන්ට කැමති ආකාරයෙන් රටවල් පාලනය කිරීමට ඇති අයිතිය නැති කරමින්, "නීතිය රජකමේ තිබිය යුතුය" යන සංකල්පය විකාශනය වූයේ විශාල කාලයක් ඔස්සේය. මෙම විශාල පරිණාමයට බලපෑ මූලික හේතුව වුයේ එවැනි හිතවක්කාර පාලනයන් තුළින් ඇතිවූ අනිසි පල විපාකයන්ය. හිතුවක්කාර පාලනය මත බොහෝ විට සමාජයේ කැරළි කෝලාහල ඇතිවන තත්වයන් බොහෝ රටවල ඇතිවේ. තවත් රටවල විශාල ආර්ථික ගැටලු හා දුර්භික්ෂ ඇති විය. එමෙන් ම සමාජය තුළ අවිධිමත් බව පැතිරීම ද සිදුවිය. ටික දෙනෙකු අසීමිත ලෙස ධනය හා සම්පත් අත්පත්කර ගැනීමද රටේ වැඩි ජනතාවක් අවිනිශ්චිත මෙන්ම ආර්ථික වශයෙන් දුබල තත්වයන් තුළ ජීවත් වීමද එවැනි පාලනයන් යටතේම සිදුවිය.

"හිතුවක්කාර පාලනය මෝඩ පාලනයක්ය" යන සංකල්පය බොහෝ රටවල පැලපදියම් වූයේ ඒ ආකාරයටය. යම් පුද්ගයකු හෝ පුද්ගලයන් කණ්ඩායමකට රටක් තුළ පවතින ප්‍රශ්න ඔවුන්ගේ හිතුමනාපයට අනුව විසඳීමට තරම් නුවණක් තිබිය නොහැකි බව මනුෂ්‍යයෝ තමන්ගේ අත්දැකීම් මතින් ඉගෙන ගත්හ. පාලකයන්ගේ අනුවණකම් මගින් මුළු සමාජයටම විපත් සිදුවන ආකාරය පිළිබඳ පොදු මතද වර්ධනය වූයේ එවැනි අත්දැකීම් මතය. පාලකයන් වනාහී නීතින් නිර්මාණය කරන්නන් නොව නීතින් ක්‍රියාත්මක කරන්නන් පමණක්ය යන සංකල්පය වර්ධනය වූයේ එවැනි අනුවණකම් හා මෝඩකම්වලින් වන මහා සමාජ ව්‍යසනයන් නැතිකර ගැනීමට පොදුවේ සමාජය තුළ ඇතිවූ එකඟතාව මගිනි. නීති නිර්මාණය එක් පුද්ගලයකු අතින් නොකෙරෙන අතර එය සමාජය පුරා කෙරෙන සාකච්ඡා මාර්ගයෙන් සිදුකිරීමත්, ඒ මගින්



යම් යම් කරුණු සම්බන්ධයෙන් සමාජයේ ඇති පොදු මතය ප්‍රකාශයට පත්කිරීමත් සිදුවිය. ඕනෑම පාලකයෙකු තුළ මෙන්ම ඕනෑම මිනිසෙකු තුළ පවතින මෝඩකම් හා අනුවණකම් පොදු නීති නිර්මාණය මගින් නැති කරගෙන, එම නීතියට යටත්ව ජීවත්වීම මගින් වැඩිමනත් බුද්ධිමත් වන්නාවූ පාලන ක්‍රමයන් ගොඩනැගීමට ගත් ප්‍රයත්නයේ ඉතිහාසය, නිතියේ ආධිපත්‍යය සඳහා වූ ඉතිහාසය හෝ නීතියේ රජකම පිළිබඳ ඉතිහාසය වශයෙන් සඳහන් කල හැක.

නිදහස් ලංකාවේ පටන් ගැන්ම සිදුවූයේ නීතියේ රජකම පිළිගත් රටක් හැටියටය. පාලකයන් පත්කර ගැනීමම සිදුවූයේ නීතියෙන් නිර්ණය කරන ලද පිළිවෙතකට අනුවය. එනම් සර්වජන ඡන්දය මගිනි. ඡන්දය පවත්වන ආකාරයද නීතියෙන්ම ඉදිරිපත් කෙරිණි. සාධාරණ මැතිවරණයක් සඳහා පිලිපැදිය යුතු නීති රෙගුලාසි, ඡන්ද ඉල්ලන්නන් විසින් පිලිපැදිය යුතු නීතින් මෙන්ම ඡන්ද දායකයන් විසින්ද, ඡන්ද දැමීම සංවිධානය කරන්නාවූ බලධාරින් විසින්ද පිළිපැදිය යුතුවූ සියලුම නීති ලිඛිතව පැවතුණා පමණක් නොව ඒ පිළිබඳව මහජනයා දැනුවත් කිරීමක්ද කරන ලදි.

එවැනි ඡන්දයක් මගින් පත්වන ආණ්ඩුවෙහි නායකත්වය එනම් අගමැති හා කැබිනට් මණ්ඩලය කටයුතු කල යුතු ආකාරය පිළිබඳව ද නීති පැවතියේය. "අගමැති රජයය" යන සංකල්පයක් ඇතිවූයේ නැත. අගමැතිවරයාගේ මූලික කටයුත්ත වූයේ පවතින නීතිමය රාමුව ඔස්සේ රටේ පොදු යහපතට ආධාර වන්නාවූ ක්‍රියා මාර්ගයන් ගැනීමත්, එවැනි ක්‍රියා මාර්ගයන් ගැනීමේදී අවශ්‍ය වන්නාවූ අලුත් නීතිමය පියවර ඇතිකර ගැනීම සඳහා කලයුතු සියලුම කටයුතු කොට එවැනි නීති පාර්ලිමේන්තුවෙන් සම්මත කරවා ගැනීමත්, මේ සියලු නීතින් නිසි නිලධාරී තන්ත්‍රයන් තුළින් ක්‍රියාත්මක කරවා ගැනීමත්ය.

මෙම කටයුතු කිරිමේදී අගමැතිවරයා හා ඔහුගේ කැබිනට් මණ්ඩලයට ප්‍රශ්න විසඳීම සඳහා නිර්මාණශීලීව කටයුතු කිරීමට සියලුම ඉඩකඩ තිබුණ නමුත් ඒ සියලුම නිර්මාණශීලී ක්‍රියා නීතිය

මත පමණක් පිහිටා කලයුතුය, යන මූලික සිද්ධාන්තය ස්ථාවරව පැවැතියේය. මෙහිදී පාලකයාගේ නිර්මාණශීලීත්වය හා දක්ෂතාව හා නීතියේ අධිපතිත්වය අතර ගැටීමක් පැවතුණේ නැත. නිර්මාණශීලීත්වය අනුවණකම් හා මෝඩකම් අතර ඇති පරතරය නැති කිරීම පමණක් නීතියට මුල්තැනදීම මගින් සිදුවිය. මෙයින් පිළිගැනුණේ කොපමණ නිර්මාණශීලී නායකයෙකු තුළ වුවද අනුවණකම් හා මෝඩකම් පවතින බවය. පුද්ගලයකුගේ දක්ෂකම මත රජය පාලනය කිරීම නුසුදුසු ක්‍රියාවක් මෙන්ම එක් එක් පුද්ගලයන් තනිව ගත් කල පාලනය පිළිබඳ කටයුතුවලදී එවැනි එක් එක් පුද්ගලයන් පිළිබඳව අවිශ්වාසයක් පවත්වාගෙන යායුතු බව මූලික පිලිගැනිමක් ද මේ මුල් කාලය තුළ පැවතියේය. නීතිය පිළිබඳව විශ්වාසය තිබීමත්, පාලනයේ හෝ පරිපාලනයේ යෙදෙන වෙන් වෙන් පුද්ගලයන් පිළිබඳව අවිශ්වාසයක් පවත්වාගෙන යාමත් හොඳ පාලනයක් ඇතිකරවා ගැනීම සඳහා තිබිය යුතු නුවණක්කාර ක්‍රියා පිළිවෙත බව එම මුල් යුගයේ පාලන ක්‍රමය තුළ පැවැත්තේය.

පසු කාලීනව සිදුවූ වර්ධනයන්ගේ ප්‍රධානම ලක්ෂණය වී ඇත්තේ නීතියට අඩු තැනක් දීමත් එක් එක් පාලකයන්ගේ හිතු මනාපයට වැඩිපුර තැනක් ලබාගැනීමත්ය. මේ අනුව නීතිය රජකමින් අයින් කරදමා එක් එක් පාලකයෝ තමන්ගේ රජකම ස්ථාවර කරගත්හ. මෙයින් සිදුවූයේ පාලකයන්ගේ අනුවණකම් හා මෝඩකම් සීමා කිරීමට හා පාලනය කිරීමට නීතියට තිබූ ඉඩකඩ නැතිකර දැමීමය. රට වැසියෝ පාලකයන්ගේ මෝඩකම් හා අනුවණකම්වල ගොදුරු බවට පත්වූහ. නීතියට රජකම් නැතිවූ විට ඇතිවන සියලුම ගැටලු රට තුළ වර්ධනය විය. අනුවණ පාලකයෝ තමන්ගේ හා තමන්ට සමීප කණ්ඩායම්වල ආර්ථිකවාසින් ළඟාකර ගැනීමට කරන උත්සාහයන් මගින් රට තුළ දූෂණය සඳහා ඇති ඉඩ කඩ පළල් විය. රට තුළ සමාජ විෂමතාව වැඩි විය. නීතිය රජකමින් ඉවත්වෙත්ම රටෙහි පාලන තන්ත්‍රය පිළිබඳ විශ්වාසය ද බොහෝ දුරට අඩු වීමට පටන් ගත්තේය. පාලකයන්ගේ මෝඩකම් පිළිබඳව උපහාසාත්ම හැඟීමක් රට පුරා පැතිර ගියේය. පාලකයන් පත්කර ගැනීම පිළිබඳව නීතිමය



රාමුව ද වෙනස්වී හිතුවක්කාර ක්‍රමයක් ඒ තුළින් ද කෙරෙන බවට මහජන දැනුවත් භාවය වැඩිවී රජයක ඇති සාධාරණීයභාවය පිළිබඳව අවිශ්වාසයන් ද රට තුළ පැතිර ගියේය. මේ සියල්ල තත්කාලීන ලාංකිය සමාජය පිළිබඳව වටහා ගැනීමට හේතුවන සාධකයෝය.

# ජෙරාඩ් පෙරේරා වදහිංසා නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුව

ජෙරාඩ් මර්වින් පෙරේරා යන පෙත්සම්කරු විසින් තම නීතිඥ ඩබ්ලිව්. ආර්. සංජීව මහතා මගින් වත්තල පොලිසියේ ස්ථානාධිපති සේන සුරවීර (පොලිස් පරීක්ෂක), කෝසල නවරත්න උප පොලිස් පරීක්ෂක, සුරේෂ් ගුණරත්න නොහොත් සුරාජ් ගුණසේන, උප පොලිස් පරීක්ෂක, වීරසිංහ උප පොලිස් පරීක්ෂක රේනුක, උප පොලිස් පරීක්ෂක, නලින් ජයසිංහ පොලිස් කොස්තාපල්, පෙරේරා පොලිස් කොස්තාපල්, පොලිස්පති හා නීතිපති වගඋත්තර කරුවන් කොට ඔවුන්ට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සම්ක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලදි. එම පෙත්සම ප්‍රනාන්දු විනිසුරුතුමා, එදිස්සූරිය විනිශ්චයකාර තුමා හා විග්නේශ්වරන් විනිශ්චයකාරතුමා ඉදිරියේ විවාද කොට 2003 04 04 වන දින මාක් ප්‍රනාන්දු විනිසුරුතුමා විසින් තීන්දුව ප්‍රකාශ කරන ලදි. පෙත්සම්කරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ ඩී එස් විජේසිංහ, 1-7 දක්වා වගඋත්තර කරුවන් වෙනුවෙන් ඩී. ඩී. පී. දසනායක සමඟ ප්‍රින්ස් පෙරේරා, නීතිපති වෙනුවෙන් රජයේ අධිනීතිඥ පී. ඒ. කේ. රණසිංහ යන නීතිඥවරු පෙනී සිටියහ. එම නඩුතීන්දුව පහත සඳහන් වේ.

## නඩු තීන්දුව

### ප්‍රනාන්දු, විනිසුරුතුමාඃ

පෙත්සම්කරු සීමාසහිත කොළඹ ඩොක්යාඩ් සමාගමේ සේවය කරන සුපවේදීයෙකි. ඔහු පැමිණිලිකර සිටින්නේ 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන් විසින් 13(1) වගන්තිය යටතේ ඔහු සතු මූලික අයිතිවාසිකම් 03.06.2002 දින, ඔහු නීති විරෝධීව අත්අඩංගුවට ගැනීමේ හේතු වෙන්ද, 11 වන වගන්තිය යටතේ ඇති අයිතිවාසිකම් පොලිස් අත්අඩංගුවේදී වදහිංසා කිරීමෙන්ද, 13(2) වගන්තිය යටතේ වන අයිතිවාසිකම් 2002.06.03 දක්වා නීතිවිරෝධී ලෙස රඳවා තබාගැනීමෙන්ද, ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවය. 1 සිට 7 දක්වා වගඋත්තරකරුවෝ වත්තල පොලිස් ස්ථානයට අයත් පොලිස් නිලධාරින් වෙති. 1 වන වගඋත්තරකරු පොලිසියේ ස්ථානාධිපති වෙයි. දෙවන වගඋත්තරකරු පොලිස් ස්ථානයේ අපරාධ අංශය භාර නිලධාරියාය. 3 සිට 5 දක්වා වගඋත්තරකරුවෝ උපපොලිස් පරීක්ෂකවරුය. 6 සිට 7 දක්වා වගඋත්තරකරුවෝ කොස්තාපල්වරුය. 8 වන වගඋත්තරකරු පොලිස්පතිය.

### පෙත්සම්කරු විසින් කියා සිටිනු ලබන කථාව

පෙත්සම්කරුගේ බිරිඳගේ දිවුරුම් පෙත්සම අනුව 2002.06.03 උදේ 11.45 ට පමණ ඇය ගෙදර සිට ඇයගේ පෙර පැසැලට යන දරුවා නැවත ගෙන ඒම සඳහා තමන්ගේ 3 හැවිරිදි දරුවා ද සමඟ ගිය අවස්ථාවේදී ඒ අසල පොලිස් ජීප් රථයක් නවතා තිබෙනවා දක ඇත. එක් පොලිස් භටයෙක් විසින් ඇගේ ස්වාමිපුරුෂයා කොහේදැයි අසන ලදි. ඔහු වැඩට ගොස් ගෙදර පැමිණ නැතැයි ඇය උත්තර දුන්නාය. එවිට එක් පොලිස් නිලධාරියෙක් පෙත්සම්කරු සොයාගෙන නැති බවත්, ඔහුගේ බිරිඳ පමණක් සොයාගෙන ඇති බවත්, ඔහුගේ ජංගම දුරකථනයෙන් පවසනවා ඇයට ඇසුනු අතර, ඔහු කල යුත්තේ කුමක් දැයි විමසනවාද ඇයට ඇසිණ.



පෙත්සම්කරුගේ බිරිඳ ඇයගේ කුඩා දියණිය ගෙන ඒමට යාමට උත්සාහ කල අතර නිලධාරින් විසින් ඇය නවත්වා, ඇය හා ඇගේ දරුවා ජීප් රථය තුළට දමා ගත්හ. ඔහුගේ දරුවකු ලෙඩවී ඇති නිසා වහා ගෙදර එන ලෙස කියන ලෙසත් බල කලහ. එහෙත් ඇයට එසේ කිරීමට බැරිවිය. තමන්ට දරුවා රැ ගෙන ඒමට යෑමට ඉඩ දෙන ලෙස ඇය නිලධාරින්ගෙන් ඇයද සිටියාය. එහෙත් ඔවුහු එයට ඉඩ නුදුන්හ. ඇය පෙත්සම්කරු පැමිණෙන තුරු නතරවී සිටීමට බස් නැවතුම් පළ වෙත රැගෙන ගියහ.

හවස 12.45 පමණ පෙත්සම්කරු බස්රථයෙන් බිමට බැස්සේය. 'උඹ තමා අපි සොයන මිනිහා' කියමින් නිලධාරිහූ ඔහු පොලිස් ජීප් රථය තුළට ඇදගෙන ගියහ. එහෙත් ඔහු අත්අඩංගුවට ගැනීමට කිසිදු හේතුවක් දැන්වූයේ නැත. අතර මගදී ඔවුහු බිරිඳ හා දරුවා පෙර පාසැල අසල බැස්සවූහ.

2002.06.19 දාතම දීර්ඝ දිවුරුම් පෙත්සම් පෙත්සම්කරුගේ බිරිඳ හා සහෝදරයා විසින් අත්සන් කොට ඇත. ඔවුන් පවසන පරිදි 2002.06.04 වන දින උදේ 10.00 ට පමන, පෙත්සම්කරුගේ බිරිඳත්, ඔහුගේ සහෝදරයාත් තවත් මිතුරන් හා නෑදෑයිනුත් වත්තල පොලිස් ස්ථානයට ගියහ. බිරිඳ ප්‍රකාශකර ඇත්තේපෙත්සම්කරු අත්අඩංගුවට ගැනීමට පැමිණි නිලධාරින් කිහිප දෙනෙකු ඇය දුටු බවය.

ඇය තවදුරටත් කියා සිටියේ පෙත්සම්කරු ඉතා වේදනාවෙන් සිටනවාත්, ඔහුගේ ඇඟ ඉදිමී තිබෙනවාත්, ඇවිදීමට හා අත් සෙලවීමට නොහැකිව සිටිනවාත් ඇය දුටු බවය. පොලිස් නිලධාරින් ඇයට කියා සිටියේ වැරදි තොරතුරක් මත පෙත්සම්කරු අත්අඩංගුවට ගත් බවය. මේ සියල්ල පෙත්සම්කරුගේ සහෝදරයා විසින් තහවුරු කරන ලදි.

පෙත්සම්කරුගේ බිරිඳ හා ඔහුගේ සහෝදරයා තවදුරටත් ප්‍රකාශකළේ පෙත්සම්කරු ඔහු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහුට සිදුවූ දේ ඔවුන්ට ප්‍රකාශ කල බවය. ඔහුගේ දෑස් බැන්ද බවත්,

පසුව ඔහුගේ අත් එකට බැන්ද බවත් හා ඔහු යට ලීයක එල්ලූ බවත් පසුව 1 සිට 7 වගඋත්තරකරුවන් හා තවත් නිලධාරියෙකු ඔහුට යකඩ හා ලී පොලුවලින් ඔහුගේ වේදනාව සහ කෑගැසීම් නොතකා පැයක් පමණ පහර දුන් බවත්ය. පසුව ඔහු පොළාව මත මුනින් අතට පෙරලා තිබූ බවත්, ඔහුගේ අත් දැල්වූ ගිනිකූරු මගින් පිච්චූ බවත් ඔහුගෙන් කිසිදු කටඋත්තරයක් සටහන් කර නොගත් බවත්ය. එදින පසුව ඔහු 1 වන වගඋත්තරකරු වෙත ගෙනා බවත් එහිදී ඔවුන් අතින් වැරැද්දක්වූ බව හා පසුදින උදේ ඔහු මුදාහරින බවත් ඔහුට දැන්වූ බවත්ය.

2002.06.04 දින උදේ 11.30 ට පමණ පෙත්සම්කරු පොලිස් අත්අඩංගුවෙන් මුදාහැරිය බව පිලිගන්නා ලදි. පෙත්සම්කරු පසුවූ තත්වය නිසා ඔහුගේ බිරිඳ හා සහෝදරයා ඔහු ගම්පහ ආයුර්වේද රෝහල වෙත ගෙන ගිය අතර එහි වෛද්‍යවරයාගේ අවවාදය වූයේ හැකි ඉක්මනින් හොඳ රෝහලකින් ඔහුට ප්‍රතිකාර ලබාදෙන ලෙසය. ඒ අනුව ඔහු කොළඹ නවලෝක රෝහලට ඇතුළු කරන ලදි. එහි ඔහු යම් කාලයක් දැඩි සත්කාර ඒකකයේ සිටියේය. 2002.06.14 වැනි දින ඔහුගේ තත්වය බැරෑරුම් වූ බවත්, ඔහුගේ ජීවිතය අනතුරේ තිබෙන බවත් වෛද්‍යවරු ඔහුගේ බිරිඳට දැනුම් දුන්හ.

පෙත්සම්කරු 2002.06.25 දින දක්වා රුපියල් 704,788 ක නවලෝක රෝහල් බිල්පත් (වෘත්තීය ගෙවීම් සඳහා ඒ දක්වා ගෙවිය යුතුවූ තැන්පතුව වශයෙන් රුපියල් 182, 723 ඇතුළුව) ඉදිරිපත් කොට ඇත. ඔහු 2002.07.13 දිනදී මුදා හරින ලද අතර වහාම කොළඹ මහ රෝහලට ඇතුළත් කරනු ලැබ 2002.07.17 වන දිනදී එයින් එළියට පැමිණියේය.

2002.06.17 දිනැති පෙත්සම්ක් පෙත්සම්කරුගේ නීතිඥ මහතා විසින් පෙත්සම්කරු වෙනුවෙන් 2002.06.19 වන දිනදී ගොනු කරන ලද අතර ඒ සමඟ නීතිඥවරයාගේ හා පෙත්සම්කරුගේ බිරිඳගේ දිව්රුම් ප්‍රකාශන්ද ඇතුළත් කොට ඇත. එම දිව්රුම් ප්‍රකාශ දෙකම 2002.06.19 දිනැතිය. පෙත්සම්කරුගේ සොහොයුරාගේ සහ තවත් කිහිපදෙනෙකුගේ දිව්රුම් ප්‍රකාශ ඉන්පසුව ඉතා ඉක්මනින් ගොනුකර



ඇත. පෙත්සම අධිකරණයට ඉදිරිපත් කොට එය ඉදිරියට ගෙනයාමට අධිකරණය විසින් අවසරය 2002.06.26 වන දින නිකුත් කෙරිණි.

පෙත්සම්කරු ඔහුට හැකිවූ විටකදී දිව්රුම් පෙත්සම්ක් ඉදිරිපත් කළේ නැත. එය 2002.12.05 දින පෙත්සම්කරු විසින් ප්‍රමාද වී වගඋත්තර කරුවන් විසින් ද ඔවුන්ගේ උත්තර 2002.10.11 දිනදී ගොනුකිරීමෙන් පසුව ගොනු කරන ලදි. කෙසේ වෙතත් එම දිව්රුම් පෙත්සමට පිළිතුරු සැපයීමට අවස්ථාවක් වගඋත්තරකරුවන්ට නොතිබුණු හෙයින් වගඋත්තරකරුවන් විසින් ඔවුන්ගේ දිව්රුම්කරුවන් මගින් ඉදිරිපත් කොට ඇති නව තොරතුරුවලට උත්තර දීමට හැර එය මත කටයුතු නොකරමි.

**වෛද්‍ය සාක්ෂි**

කොළඹ අධිකරන වෛද්‍ය නිලධාරිවරයා (ජේ.එම්.ඕ.) විසින් 2002.07.16 දිනදී පෙත්සම්කරු පරීක්ෂා කරන ලදි. ඔහුගේ වාර්තාවේ වදහිංසා පිළිබඳව ඉතිහාසය, පෙත්සමට මූලික වශයෙන් සමානව සටහන් කොට ඇත. නවලෝක රෝහලේ කරන ලද පරීක්ෂණ අනුව වෛද්‍යවරයා විසින් නිගමනය කර ඇත්තේ පෙත්සම්කරුගේ ශරීරය පහරදීමට ලක්වීම නිසාත ශරීරයේ පේශීන් තැලීමෙන් එම පේශීන්ගෙන් අහිතකර ද්‍රව්‍ය රුධිරයට එක්වීමෙන් බොහෝදුරට ඇතිවන රැබ්ඩොමයෝසීස් (RHABDOMYOLYSIS) තත්වය ඇතිවීමත් එම නිසා පෙත්සම්කරු තීව්‍ර වකුගඩු අක්‍රීය වීමකට (ACUTE RENAL FAILURE) ලක්වීමත් එම නිසා වකුගඩු අක්‍රීයවීම නිසා බහිශ්‍රාවීය ක්‍රියාවලිය කෘත්‍රිමව සිදුකිරීම හීමෝඩයලිසිස් ක්‍රමය (HAEMODIALYSIS) මගින් රුධිරය පිරිසිදු කිරීමටත් සිදුව ඇති බවයි. එමෙන්ම පෙත්සම්කරුගේ ශරීරයේ අල්නර් (ULNAR) සහ මීඩියන් (MEDIAN) නැමති අත්වල ඇති විශාල ස්නායු දෙකේ ඇක්සෝනල් (AXONAL) නැමති සියුම් නාලිකා අක්‍රීයවීමක් ඇතිවී ඇති බවයි. එමෙන්ම පෙත්සම්කරුගේ ශරීරයේ බෙල්ලේ සිට විහිද යන 8 වන ස්නායුව හා පපුව ප්‍රදේශයේ සිට විහිද යන්නාවූ 1 වන ස්නායුව ($8^{TH}$ CERVICAL AND $1^{ST}$ THORACIC VERTEBRAE) ව්‍යාප්තව ඇති ප්‍රදේශවල දැනීම් ඇතිවීම අක්‍රීය වී ඇති බවත්ය.

නවලෝක රෝහලින් එම වෛද්‍ය වාර්තා කැඳවා තිබිණි. අධිකරණ වෛද්‍යවරයාට අනුව පෙත්සම්කරු පිළිබඳව ක්‍රමානුකූලව පරීක්ෂණයක් කිරීමේදී හෙලිදරව් වූයේ දෙවුර මාංශ පේශීන් මුළුමනින්ම බල රහිතවීමත්, අත් දෙකෙහිම භාවිතය උරහිස ළඟින් අක්‍රීයවීයාමත් සිදුවී ඇති බවත්, තවදුරටත් ඔහුගේ ඇඟිලි සෙලවීමට ඔහුට හැකිවී තිබූ නමුත් යමක් අතින් ග්‍රහනය කර ගැනීමේ හැකියාව පරීක්ෂණකරන අවස්ථාවේදී නොතිබුණු බවත්ය. වැලමිට ප්‍රදේශයේ සංවේදීභාවය නැතිවී තිබිණ.

පෙත්සම්කරු විසින් පවසන ලද රෝග ඉතිහාසයට සමහර තුවාල අනුකූල වන බව ඔහු සටහන් කොට ඇත. දකුණු අතේ පිටුපස කළුපාට පැල්ලම් දෙක පත්තු කරන ලද ගිනිකූරු මගින් පිළිස්සීම පිළිබඳව කථාවට අනුකූල වේ. දකුණු හා වම් මැණික්කටු ළඟ පැල්ලම් දෙකක් ඇති අතර එය කඹයකින් එල්ලීම ගැන සඳහනට අනුකූල වේ. වම් දණ හිසේ පහළ කකුලේ ඉදිරිපස ඇති දුර්වර්ණ සලකුණ යකඩ පොල්ලකින් පහර දීමට අනුකූල වේ. ගාත්‍රා දෙකේම ඉහළ කොටස දුර්වල වීම ඉහළ එල්ලීමට අනුකූල වේ. ඔහුගේ මතයට අනුව එවැනි එල්ලීමක් මගින් ඉන්ද්‍රිය මාංස හා කංචරාවට හානි සිදුවිය හැකි අතර ඉහළ බාහුවේ දුර්වල වීමක් හා හානි සිදුවීමක් විය හැකිය. මාංශපේශින් තැලීම මගින් ශෛලවලින් අහිතකර ද්‍රව්‍ය රුධිරයට එක්වීම මගින් ඇතිවන රැබ්ඩොමයෝසීස් (RHABDOMYOLYSIS) තත්වය සිදුවිය හැකි අතර ඒ මගින් තීව්‍ර වකුගඩු අක්‍රියවීම සිදුවිය හැකිය. එහෙත් ඔහුගේ පරීක්ෂණය කරන අවස්ථාව වන විට සැලකිල්ලට ගත යුතු ප්‍රමාණයක තැලීම් තිබුණේ නැත. පෙත්සම්කරු වකුගඩු අක්‍රියවීමෙන් මුළුමනින් සුවවී සිටියේය.

## 2, 4 සහ 5 වන වගඋත්තරකරුවන්ගේ කථාව

මෙම වගඋත්තරකරුවෝ පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීම හා වදහිංසා පැමිණවීම ගැන තමන්ට සම්බන්ධකමක් තිබූ බවක් ප්‍රතික්ෂේප කරති. ඔවුහු තොරතුරු පොත් (අයි. බී) සටහන් ඉදිරිපත් කලහ. ඒවා අනුව අදාල සියලු කාලයන් තුළ ඔවුහු වත්තල පොලිස් ස්ථායෙන් පිට සිටියහ. පෙත්සම්කරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදීත්, ඔහු පොලිස් ස්ථානයට ගෙනා අවස්ථාවේදීත්, ඔහුට වද දුන්නාය කියා ප්‍රකාශ කරනු ලබන්නාවූ ඊළඟ පැය 2 හෝ 3 න යන අවස්ථාවන්හීදීත්ය. මෙම අයි.බී. වාර්තා අවසාන නිගමන ලෙස පිළිගත නොහැකිවුවත් පෙත්සම්කරු විසින් 1 සිට 7 දක්වා වගඋත්තරකරුවන් තමන්ට වදහිංසා කල නිලධාරින් බව හඳුනා ගැනීමේ ඇති එක් අඩු පාඩුවක් නම් ඔහුට වදදුන් මුළු කාලය තුළ ඔහුගේ ඇස් බැඳ තිබීමය. ඒ හැර ඔහු සිටි තත්වය අනුව, ඔහු වදහිංසාවට ලක්වීමෙන් පසු පොලිසිය තුළ සිටිනවා දුටු පුද්ගලයින් වැරදීමෙන් ඇතුළු කලා විය හැකිය. මේ තත්වය තුළ, පෙත්සම්කරු ඔවුනගේ මැදිහත්වීම වැඩි බර සාක්ෂි මත ඔප්පු කර නැත. එහෙත් එසේ කල බවට බරපතලව සැකකිරීමට තත්වයක් ඇති අතර අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට සාධාරණ හේතුවක් ඇත. ඔවුන් මෙම නඩු විභාගයෙන් නිදහස් කරමි.



## 1, 3, 6 සහ 7 වගඋත්තරකරුවන්ගේ කථාව

පළමුවන වගඋත්තරකරු විසින් පෙත්සම්කරු තමන්ගේ නියෝග මත අත්අඩංගුවට ගත් බව පිළිගත්තේය. ඔහු පෙත්සම්කරු පොලිස් ස්ථානයට ගෙනෙන අවස්ථාවේදී හෝ පෙත්සම්කරුට වදහිංසා කරනු ලැබුවායයි දෝෂාරෝපනය කරනු ලැබන ඉදිරි පැය ගණනේදී පොලිස් ස්ථානයෙන් පිටත සිටි බවක් ප්‍රකාශ කළේ නැත. පොලිස් ස්ථානාධිපතිවරයා වශයෙන් ඔහු යටතේ සිටි අය අධීක්ෂණ කිරීමේ හා පාලනය කිරීමේ සමස්ථ වගකීම ඔහු වෙත පැවරී තිබුණේය. එමෙන්ම පෙත්සම්කරු මුදා හැරීමේ බලයත් තිබුණේ ඔහු අතය. පෙත්සම්කරුගේ අත්අඩංගුවට ගැනීම හා/හෝ රඳවා ගැනීම නීතිවිරෝධී නම් හා පොලිස් ස්ථානය තුළ කිසියම් වදහිංසාවක් සිදුවූවා නම් ඔහු එයට වගකිව යුතුය.

අනිත් වගඋත්තරකරුවන් තුන් දෙනා විසින් ඉදිරිපත් කරන ලද අයි.බී. වාර්තා සටහන්වලට අනුව උපපොලිස් පරීක්ෂක සුරේෂ්

(3 වන වගඋත්තරකරු), උප පොලිස් පරීක්ෂක හේරත්, කොස්තාපල් නලින් (6 වන වගඋත්තරකරු), කොස්තාපල් පෙරේරා (7 වන වගඋත්තරකරු), කොස්තාපල් අමිල හා ග්‍රාමාරක්ෂකභටයකු වූ විනීත යන පොලිස් කණ්ඩායම, 1 වන වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපති වරයාගෙන් ලැබුණ අණක් මත, පුද්ගලික වාහනයකින්, මීට පෙරදින සිදුවූ මිනීමැරීම විභාග කිරීමට නොව, අපරාධ වැලැක්වීමේ කටයුත්තක් සඳහා, පොලිස් ස්ථානයෙන් පිටව ගියහ. ඔවුහු රිවෝල්වරයක් හා ස්වයංක්‍රීය ටී 56 ගිනි අවි දෙකක් යන ආයුධ අතැතිව ආයුධ සන්නද්ධව සිටියහ.

මේ වගඋත්තරකරුවන් ඉදිරිපත් කර ඇති දිවුරුම් පෙත්සම් සෑහීමකට පත්විය හැකි ප්‍රමාණයට වඩා ඉතා අඩුය. ඔවුහු පෙත්සම්කරු රාත්‍රියක් පොලිස් ස්ථානය තුළ රඳවා ගත් බව හා 4 වැනිදා උදේ මුදාහැරිය බව හා ඔහු අත්අඩංගුවට ගත්තේ වැරදි තොරතුරක් මතය, ඇතුළු පෙත්සමේ සඳහන් සියලුම ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කලහ. නැත්නම් නොදන්නා බව ප්‍රකාශ කලහ. ඔවුන් එක් එක් තැනැත්තා එකිනෙකට බොහෝ දුර සමාන, පැහැදිලිව පෙනීයන ලෙස වැරදි හා මගහැරීම් අතින්ද සමාන භාෂාවකින් මෙසේ ප්‍රතිඥා දී ඇත.

1. '2002.06.03 දින මම සේවයට වාර්තා කෙළෙමි. 2002.06.03 දින වත්තල ප්‍රදේශයේ ත්‍රිත්ව මිනීමැරීමක් සිදුවිය. මාත්, නලින් පෙරේරා, අමිල හා විනීත යන අයගෙන් සමන්විත පොලිස් කංඩායමක් විසින් මේ අපරාධය විමර්ශනය කළෙමු. එසේ අපි අපරාධය විමර්ශනය කරමින් සිටියදී අපට ලැබුණු තොරතුරක් අනුව ජෙරාඩ් නැමැති පුද්ගලයෙක් මෙම ත්‍රිත්ව මිනීමැරුම කර ඇති බව අපට දැන ගන්නට ලැබිණ. මෙම තොරතුරට අනුව මම මගේ යටත් නිලධාරින් සමඟ ජෙරාඩ් අත්අඩංගුවට ගැනීමට පියවර ගතිමි. ඒ අනුව මා සහ තවත් පොලිස් නිලධාරින් ජෙරාඩ්ගේ නිවෙසට ගියෙමු. තොරතුරු මත ජෙරාඩ්ගේ බිරිඳගෙන් ප්‍රශ්න කෙළෙමු. එසේ ප්‍රශ්න කරන කාලය තුළදී ඔහු ගෙදර නොසිටින බවට ඇය දැනුම් දුන්නාය. දවල් 12.00 ට පමණ මා සහ මගේ අනිකුත් නිලධාරින් මුදලිගේ ජෙරාඩ් පෙරේරාට ඔහු අත්අඩංගුවට ගැනීමට හේතු කියා දී අත්අඩංගුවට ගතිමු. (එනම් ත්‍රිත්ව මිනීමැරීම සිදුකිරීම පිළිබඳව)
2. ඉන්පසු ඇම්. ජෙරාඩ් පෙරේරාට ජීප් රථයට ගොඩවීමට අණ කෙළෙමි. ඔහුට කල අණ අනුව ඔහු ජීප් රථයට ගොඩ වුණේය. ඉන්පසුව වත්තල පොලිස් ස්ථානය වෙත ආපසු පැමිණෙන අතර අපි මාබෝල හෝටලය අසල තේ කෝප්පයක් පානය කිරීම සඳහා නතර කෙළෙමු. 6 වන වගඋත්තරකරු හෝටලයට යෑම සඳහා ජීප් රථයේ පස්සා දොර හැරිය විට.
3. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 23(2) වගන්තිය යටතේ අවම බලය පාවිච්චි කිරීමට මට සිදුවිය. ඉන්පසුව ඔහු පොලිස් ජීප් රථයට දමා ගෙන වත්තල පොලිස් ස්ථානයට ගෙන ආවෙමු.
4. ඉන්පසු මම ඔහුගෙන් ජෙරාඩ් පෙරේරා විසින් කරන ලද ත්‍රිත්ව මිනීමැරීම ගැන ප්‍රශ්න කළෙමි. එසේ ප්‍රශ්න කරන අතර උප පොලිස් පරීක්ෂක හේරත්ට ප්‍රකාශය සටහන් කරගන්නා ලෙස අණ කෙළෙමි. ඉන්පසු ජෙරාඩ් නැමැත්තා විසින් 2002.06.04 උදේ 2.15 ට පමණ වත්තල පොලිස් ස්ථානයට ප්‍රකාශයක් කරන ලදි.
5. මෙම විමර්ශනය තුළදී මෙන්ම ජෙරාඩ්ගේ ප්‍රකාශය අනුවද මෙම ත්‍රිත්ව මිනීමැරුම සම්බන්ධයෙන් ජෙරාඩ්ගේ සම්බන්ධයක් නොමැති බව මට සොයාගත හැකි විය.
6. ඉන්පසු මම 2002.06.04 දින උදේ 11.30 පමණ මෙය ගැන වත්තල පොලිස් ස්ථානයයේ ස්ථානාධිපතිට වාර්තා කෙළෙමි.

මෙම පැමිණිල්ලට අදාල සම්පූරණ කාලය තුළ මම උපරිම සද්භාවයෙන් මාගේ යුතුකම් ඉටු කළෙමි. ජෙරාඩ් පෙරේරා මුදා

හැරීමෙන් පසු මම 'ඒ' වාර්තාවක් වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ උගත් මහේස්ත්‍රාත්තුමා වෙත 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කරුනු වාර්තා කෙළෙමි. (අදාල ලේඛනය 3 ආර්. බී වශයෙන් සටහන් කොට මීට අමුණා ඇත) ඇත්තෙන්ම 'ඒ' වාර්තාව අමුණා නොතිබිණ.

මෙම වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය වන්නේ ඔවුන් පෙත්සම්කරු අත්අඩංගුවට ගත් බව ඔවුන් තිදෙනාම පෙත්සම්කරුට අවම බලය පෑ බවත්ය, එහෙත් එම අවම බලයෙහි ස්වභාවය හා ප්‍රමාණය විස්තර කිරීමට ඔවුහු අසමත් වෙති. ඔවුහු පෙත්සම්කරු වත්තල පොලිස් ස්ථානයට ගෙනා අවස්ථාවේ සිට පෙත්සම්කරු ගෙන් කටඋත්තරයක් ගත්තේයයි කියන වෙලාව වන පසුදින උදේ 2.15 කාලය දක්වා මුළු කාලය තුළම පොලිස් ස්ථානය තුළ අඛන්ඩව සිටියහ. ඒ නිසා එම කාලය තුළ මෙම පෙත්සම්කරු වදහිංසාවට ලක්කලා නම් ඔවුහු එවිට පොලිස් ස්ථානය තුළ සිටියහ. ඔවුන් හඳුනා ගැනීම හා ඔවුන්ගේ සහභාගීවීම පෙත්සම්කරුගේ හෝ ඔහු වෙනුවෙන් වෙනත් අයගේ ප්‍රකාශනයන්ට පරිබාහිරව ඔවුන්ගේම පිළිගැනීම්වලින්ම ඔප්පුවී ඇත.

1, 3, 6 හා 7 වගඋත්තරකරුවන් කියා සිටියේ පෙත්සම්කරු ඔහුගේ පෙත්සමෙහි ඔහුට පහර දුන් ආකාරය හා ඔහුට සිදුවූ තුවාල ගැන සෑහීමකට පත්විය හැකි විස්තරයක් නොකරන ලද බවය. ඉතාමත් අදාල බවකින් යුතුව ඔවුන් තවදුරටත් කියා සිටියේ, 'දෝෂාරෝපණය කර ඇති පහරදීම සිදුවී අති අකාරය පිළිබඳව පෙත්සම්කරු දී ඇති විස්තරය අනුව එවැනි දෙයක් සිදුවූවා නම් පෙත්සම්කැරට තවදුරටත් ජීවත්වීමට නොහැකි වනු ඇත යන්නය.

ඉතා තදින් සන්නද්ධවූ පොලිස් නිලධාරීන් 6 දෙනෙකුගේ ග්‍රහනයෙන්, ඔහු පැනයාමට උත්සාහ කලා යයි කියමින්, අයි.බී. සටහන් මගින් පෙත්සම්කරුට තුවාල සිදුවූ ආකාරය විස්තර කිරීමට උත්සාහයක් ගෙන තිබුණත්, පැනයාමට කරන ලදැයි කියන උත්සාහය ගැන අයි.බී. සටහන් මට පිළිගත නොහැකිය.



අවසාන වශයෙන් තවත් නිසි පැහැදිලි කිරීමක් නොකල අඩුපාඩු ඔවුන්ගේ දිවුරුම් පෙත්සම්වල තිබුණේය. පෙත්සම්කරුගේ කටඋත්තරය ලියාගත් වේලාව වශයෙන් 2002.06.04 දින උදෑසන 2.15 වශයෙන් ඔවුන් කියා සිටියත් අදාල අයි.බී. සටහන්වල කටඋත්තර ගත්තායයි කියන වේලාව ලෙස සටහන්ව ඇත්තේ 2002.06.03 දිනය වේ. ඒ අතර පෙත්සම්කරු තමන් කිසිදු කටඋත්තරයක් දුන් බව ප්‍රතික්ෂේප කොට ඇත.

## මූලික විරෝධතා

1 සිට 7 දක්වා වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥ මහතා මූලික විරෝධතාවන් ගණනක් ඉදිරිපත් කළේය.

ඔහු ප්‍රථමයෙන් කියා සිටියේ පෙත්සම දිවිරුම් පෙත්සම්ක් මගින් රුකුල්දීමක් සිදුකර නැති බවය. මන්ද යත්, දිවුරුම් පෙත්සම ඉදිරිපත් කල නීතිඥවරයාට කිසිම කරුණක් ගැන දැනීමක් පුද්ගලිකව නොතිබූ නිසාය. එම නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති 44(3) හා දිවිරුම් අඥාපනතේ 4(1)(ඒ) වගන්තියට පටහැනි නිසා ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය.

ඔහුට පෙන්වා දුන්නේ අත්අඩංගුව ගැනීම හා රඳවා තබා ගැනීම මෙන්ම ඔහු අත්අඩංගුවේ සිටිනු ලැබීම නිසාවෙන් ඇතිවූ තුවාල ගැන පුද්ගලික දැනීමක් ඇයට තිබූ නිසා පෙත්සම්කරුගේ බිරිඳගේ දිවුරුම් ප්‍රකාශය ප්‍රමාණවත් වන බවය. ඒ කෙසේ වුවත්, මූලික අයිතිවාසිකම් කඩවීමක් පිළිබඳ දෝෂාරෝපනයකදී වින්දිතයෙකු විසින් දෙන ලද විශ්වාස කළ හැකි කරුණු ඔහුට දිවිරුම් පෙත්සම්ක් ඉදිරිපත් නොකළ හැකි තත්වයක සිටියදී නඩුව ඉදිරියට ගෙන යෑමට අවසර දීම සඳහා සෑහේ යයි පිළිගත හැකිය.

උගත් නීතිඥවරයා, ක්ෂණයකින් දෙවැනි විරෝධතාව වෙත යොමු විය. පෙත්සම ගොනු කරනු ලැබ තිබුණේ (ඔහුට අනුව) 2002.06.17 වන දිනදී, වන අතර බිරිඳගේ දිවිරුම් පෙත්සම ඉදිරිපත්

කර තිබුණේ 2002.06.19 වන දිනය. මෙම වෙනස ඔහුගේ දේශනය අනුව අව්‍යාජ භාවය පිළිබඳව සැකයක් පහළ කළේය. පෙත්සමේ යතුරු ලියන කල තිබූ දිනය 2002.06.17 වුවත් එය බිරිඳගේ දිව්රුම් පෙත්සමත් සමග ලිපි ගොනු භාර ගෙන තිබුණේ 2002.06.19 දින බව නඩු වාර්තාවෙන් සනාථ විය. එවිට උගත් නීතිඥවරයා තුන්වන විරෝධතාවක් වෙත යොමුවිය.

එනම් 2002.06.14 වැනි දින සම්ප්‍රදායික නොවන ඉල්ලුම්පතක්, ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති 44(4) යටතේ බිරිඳගේ උපදෙස් මත තුන්වන පාර්ශ්වයක් විසින් 2002.06.14 දින කලින් ඉදිරිපත් කර තිබූ නිසා ඉල්ලුම්පත පවත්වාගෙන යා නොහැකි බවය. සාම්ප්‍රදායික නොවන ඉල්ලුම්පතක් ඉදිරිපත් කර තිබීම, 126 වැනි වගන්තිය යටතේ පෙත්සම්කරුගේ අයිතිවාසිකම් භාවිතයට බාධකයක් නොවේ. විශේෂයෙන්ම එම සාම්ප්‍රදායික නොවන පෙත්සම මත කිසිම පියවරක් ගෙන නැති අවස්ථාවයකදී.

අවසාන වශයෙන් උගත් නීතිඥවරයා කියා සිටියේ තුන්වන වගඋත්තරකරුගේ නම වශයෙන් ඉදිරිපත් කොට ඇත්තේ 'සුරේෂ් ගුණරත්න' යන අයෙකු බවත් එම නමින් නිලධාරියෙකු වත්තල පොලිසියේ නොමැති බවත්ය. එම නිසා වැරදි පුද්ගලයෙකු වගඋත්තරකාර පාර්ශ්වයක් බවට පත්කොට ඇත. එම නිසා පෙත්සම පවත්වාගෙන යා නොහැකිය. නඩු වාර්තාවෙන් පෙනී යන්නේ 'සුරේෂ් ගුණරත්න' යන අයට නිකුත්කල දැන්වීමට අනුව උප පොලිස් පරීක්ෂක සුරාජ් ගුණසේන තමන් 3 වන වගඋත්තරකරු ලෙස හඳුන්වා දෙමින් දිව්රුම් පෙත්සම්ක් ඉදිරිපත් කොට ඇත. එම නිසා එම සටහන් හා පෙත්සම යන දෙකෙහිම සඳහන් වන්නේ එකම සුරේෂ් බවත්, එමගින් කිසිවෙකු නොමග ගොස් නැති බවත් ඉතා පැහැදිලිය. එසේ වුවත් 3 වන වගඋත්තරකරුගේ හඳුනාගැනීම ගැන තවදුරටත් විවාදයක් වැලැක්වීම සඳහා මම ඉල්ලුම්පතේ සිරස්තලය මෙසේ සංශෝධනය කරමි. 'සුරේෂ් ගුණරත්න නොහොත් සුරාජ් ගුණසේන (උප පොලිස් පරීක්ෂක, පොලිස් ස්ථානය, වත්තල)'. මොනම තත්වයක් යටතේ වුවත්, එක වගඋත්තරකරුවෙකු පිළිබඳ විස්තරය වැරදි සහගත වීම, සාමාන්‍යයෙන් වෙනත් ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් ඉල්ලුම්පතක් නීතිවිරෝධී නොකරන බවත් මට තවදුරටත් කිව හැකිය.



## අත්අඩංගුවට ගැනීම හා රඳවා ගැනීම

1, 3, 6 සහ 7 වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීමට පාදක වූයේ ඔත්තුකාරයෙකු විසින් 'ජෙරාඩ්' නැමැත්තෙකු මිනීමැරුමක් කර ඇතැයි කියා පෑමය. ඔත්තුකරු පිළිබඳ කිසිදු විස්තරයක්වත්, විශ්වසනීයත්වය පිළිබඳ ඔහුගේ අතීතය ගැන්වත්, ලැබුණු තොරතුරුවල ස්වභාවය පිළිබඳවවත්, කිසිදු දිව්රුම් පෙත්සම්ක් මගින් ඉදිරිපත් කර තිබුණේ නැත.

ඔත්තුකරු සාමාන්‍යයෙන් විශ්වාස කටයුතු අයෙකු වූ අවස්ථාවකදී වුවත්, 'ජෙරාඩ් යන අයෙකු මිනීමැරුම කලා යයි කියන හුදු ප්‍රකාශයක් මත පමණක් එම ජෙරාඩ් යයි සිතන ඕනෑම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සාධාරණ නැත'. ප්‍රදේශයේ සිටින ජෙරාඩ් යන නම දරණ සියල්ලන් ගෙන් ප්‍රශ්න කිරීම සාධාරණදැයි මම සැකකරමි. තවදුරටත් පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් සද්භාවයෙන් කටයුතු කලා නම් ඔවුහු ඔහුගේ කටඋත්තරය වහාම වාර්තා කරගෙන ඔහු එක්කෝ මහේස්ත්‍රාත් වරයෙකු වෙත ඉදිරිපත් කිරීමට හෝ මුදවා හැරීමට තිබුණි. ප්‍රකාශයක් සටහන් කිරීම ඔවුන් පැහැර හැර තිබූ බැවින් (නැත්නම් අයි.බී.වාර්තා නිවැරදි නම් ඔහුගෙන් කටඋත්තරයක් ගැනීමට පැය 10 ක කාලයක් දක්වා පමාවීම මගින්) ප්‍රබලව යෝජනා වන්නේ ඔවුන් පුද්ගලික වශයෙන්වත් ඔහු වරදක් කර ඇති බව විශ්වාස නොකල බවත්, යම් කරුණක් ඉස්මතු වේයයි හුදු බලාපොරොත්තුවකින් පමණක් කටයුතු කල බවත්ය. පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීමට හේතුවක් පෙත්සම්කරුට නොදීමද සිදුවීමට බොහෝදුරට ඉඩ ඇත.

මේ අනුව මම 3, 6, 7 යන වගඋත්තරකරුවන් 1 වන වගඋත්තරකරුගේ නියෝගය මත කරන ලද පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීම 13(1) වගන්තිය උල්ලංඝනය කිරීමක් බව තීන්දු කරමි.

වගඋත්තරකරුවන්ට පොලිස් ස්ථානය තුළ රඳවා ගැනීමටවත්, මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියට පමා නොවී ඉදිරිපත් නොකර සිටීමටවත් බලයක් නොතිබිණ. සාධාරණ කාලයක් තුළ එසේ ඉදිරිපත් කරනු ලැබීමට ඔහුට අයිතයක් තිබිණි. එසේ ඉදිරිපත් කිරීම සඳහා ගත යුතුව තිබූ උපරිම කාලය පැය 24 කි. ඇත්තෙන්ම ඔහුගෙන් ප්‍රකාශයක් ගැනීමට උවමනාවක් තිබුණා නම් ඒ සඳහා පැය එකක් හෝ දෙකකට වැඩි කාලයක පමාකිරීමක් සාධාරණීකරණය කිරීමට බැරිය. සවස 3.00 වන විට එක්කෝ වගඋත්තරකරු නිදහස් කොට හෝ නැත්නම් ළඟම මාහේස්ත්‍රාත්වරයෙකු කරා ගෙන යමින් තිබිය යුතු විය. වහා මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීම සිදුකලයුතු බව තරයේ කියා පෑමට බොහෝ හේතු ඇත. පොලිස් ස්ථාන තුළ නොකඩවා රඳවා ගැනීම වැරදි සැලකිලිවලට භාජනය කරනු ලැබීමට මෙන්ම වැරදි සැලකිලි ගැන බොරු දෝෂාරෝපණ ඉදිරිපත් කිරීමටද අවස්ථාවක් වේ. සවස තෙක් රඳවා ගැනීම දික් කිරීම බොහෝ විට ඉබේම රාත්‍රී කාලය පුරාම රඳවා ගැනීමකට හැරේ.

මේ හැර මෙම නඩුවේදී ඉස්මතුව පෙනුණේ පෙත්සම්කරු වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යව සිටි බවය. ඔහු පසුදින උදේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කලත් නැතත් ඔහුව වහාම රෝහලක් කරා ගෙනයා යුතුව තිබිණි. වැඩිදුර රඳවා තබාගැනීමට අවශ්‍යතාවක් තිබුණා නම් මෙම නඩුව රෝහලක් තුළ රඳවා ගැනීම නිත්‍ය වශයෙන්ම සාධාරණීකරණයවන එක් නඩුවකි.

පෙත්සම්කරු මුදවා හැරීම නොකර සිටීම ගැන වගකීම ප්‍රධානව පැවරෙන්නේ පොලිස් ස්ථානාධිපතිවූ 1 වන වගඋත්තරකරුට වුවත් 3, 6 හා 7 වන වගඋත්තරකරුවන්ගේ දිවුරුම් පෙත්සම් අනුව ඔවුන් සියල්ලන්, පෙත්සම්කරුගෙන් 'ප්‍රශ්න කිරීම' 3 වැනිදා සවස 1.00 සිට-4 වැනිදා උදේ 2.15 දක්වා හේතු විරහිතව හා අනවශ්‍යව දිග්ගස්සා ඇත. ඔවුහු පෙත්සම්කරුට විරුද්ධව සාක්ෂියක් නොමැති බව 1 වන වගඋත්තරකරුට ප්‍රකාශ කළේ උදේ 11.30 ටය. මේ අනුව මම 1, 3, 6 හා 7 වගඋත්තරකරුවන් නීතිවිරෝධී ලෙස පෙත්සම්කරු



රඳවා ගැනීමෙන් 13(2) වගන්තිය උල්ලංඝනය කල බවට තීන්දු කරමි.

### වදහිංසාව

3, 6, 7 වගඋත්තරකරුවන් ඔවුන් පෙත්සම්කරු අත්අඩංගුවට ගත් බවත් ඔවුන් තිදෙනාම ඔහුට 'අවම බලය' පාවිච්චි කල බවත් පිළිගත්හ. පෙත්සම්කරුගේ බිරිඳ හා සහෝදරයා පසු දින උදේ 10.00 ට ඔහු සිටි තත්වය විස්තර කොට ඇත. වෛද්‍ය වාර්තාව එම තත්වය කොපමණ බරපතළව තිබේද යන්න සනාථකොට ඇත. පෙත්සම්කරු තිව්‍ර වකුගඩු අක්‍රීයතාවයකට (acute renal failure) ලක්ව ඇත. එමෙන්ම පෙත්සම්කරු බාල්කයක එල්ලා සිදුකල පහරදීම නිසාවෙන් පෙත්සම්කරුගේ ශරීරයේ බෙල්ලේ සිට විහිද යන 8 වන ස්නායුව හා පපුව ප්‍රදේශයේ සිට විහිද යන්නාවූ 1 වන ස්නායුව (8th cervical and 1st thoracic vertebrae) ව්‍යාප්තව ඇති ප්‍රදේශවල දැනීම් ඇතිවීම අක්‍රීය වී ඇත. එය සිදුව ඇත්තේ පෙත්සම්කරුගේ ශරීරයේ අල්නර් (ulnar) සහ මීඩීන් (medin) නැමති, අත්වල ඇති විශාල ස්නායු දෙකේ ඇක්සෝනල් (axonal) නැමති සියුම් නාලිකා අක්‍රීයවීමක් සිදුව තිබෙන නිසාය. එම නිසාවෙන් පෙත්සම්කරුගේ උරහිස් දෙකෙහිම සංධීන්හි පේශීන්ගේ බලය මුළුමනින්ම නැතිවී ඇති අතර එම නිසා අත්වල, ඇඟිලිවලින් යමක් අල්ලා ග්‍රහණයකර ගැනීමට නොහැකි තත්යක් ඇතිවී ඇත.

පොලිස් අත්අඩංගුවේ සිටියදී පෙත්සම්කරුට ඔහුගේ ජීවිතය අන්තරායට ලක්වන සේ උග්‍ර වදහිංසාවට භාජනය කර ඇති බව වැළැක්විය නොහැකි ප්‍රබල නිගමනය වේ. ඔහු වදහිංසාවට පත්කොට ඇති බවට කිසිදු සැකයක් නැත. වදහිංසාවට පත්කළේ කෙසේද යන්න කිසිසේත්ම වැදගත් නැත. පෙත්සම්කරු ඉකිමනින් මුදා නොහැරීම හෝ අඩුම වශයෙන් ඔහුට ඉක්මනින් වෛද්‍ය ආධාර ලබා නොදීමද කෲර හා අමානුෂික වේ.

මේ අනුව 3, 6, 7 වගඋත්තරකරුවන්, 1 වන වගඋත්තරකැරගේ දැනීම හා කැමැත්ත ඇතිව පෙත්සම්කරු වදහිංසාවට හා කෲර හා

අමානුෂික සැලකිල්ලට භාජනය කර 11 වැනි වගන්තිය උල්ලංඝනය කර ඇති බවට මම තීන්දු කරමි.

## 8 වන වගඋත්තරකරුගේ වගකීම

2002.06.14 දින හෝ ඊට ආසන්න දිනක පැමිනිලිකරු 8 වන වගඋත්තරකරු වන පොලිස්පතිවරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කල බව පෙත්සමේ ප්‍රකාශ කොට ඇත. එවැනි පැමිණිල්ලක් ලැබුණු බව ප්‍රතික්ෂේප කරමින් හෝ ඔහු විසින් ගන්නා ලද ක්‍රියා විස්තර කරමින් ඔහු දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කොට නැත. පොලිස් ස්ථාන තුළදී සිදුවන වදහිංසා සහ කෲර, අමුනුෂික හා අවමන්සහගත සැලකිලි පිලිබඳ ලැබෙන පැමිණිලිවල අඩුවක් පෙනෙන්නට නැත. 4(ඩී) වගන්තිය මගින් වදහිංසාවෙන් නිදහස්වීම ඇතුළු මූලික අයිතිවාසිකම්වලට ගරුකිරීමට, අත්පත්කරදීමට හා වැඩි දියුණු කිරීමට පවරා ඇති වගකීම ආණ්ඩුවේ සියලුම අංශයන්ට පවරා ඇති අතර, පොලිසියේ ප්‍රධානියාට එම වගකීම්වලින් බැහැර කරවනු ලැබූ අයෙකු ලෙස තමා සලකා කටයුතු කල නොහැක. අඩුම වශයෙන් ඔහු කලින් නොදන්වා පොලිස් ස්ථානවලට කරන පැමිණීම් හා සම්මුක සාකච්ඡා කිරීම් මගින් අත්අඩංගුවේ රඳවා සිටින්නන්ගේ තත්වය හා ඔවුන් ලබන සැලකිල්ල ගැන වාර්තා ඉදිරිපත් කිරීමට බලය පැවරූ විශේෂ පොලිස් නිලධාරින් පත්කිරීම මගින් හා/හෝ මානව හිමිකම් නිලධාරින් හෝ නියෝජිතයන් හා/හෝ ප්‍රදේශීය ප්‍රජා නායකයින්ගේ පැමිණීම් සැලසුම්කල යුතුය. 11 වන වගන්තිය උල්ලංඝනය කිරීම වළක්වාලීම සඳහා සැලසුම් කල සාර්ථක විය හැකි උපදේශාත්මක අණකිරීම් දීමට බොහෝ කාලයක් තුළ පැහැරහැරීමෙන් හා කෙසේ වුවත් සිදුවන උල්ලංඝනයන් ගැන නිසි පරීක්ෂණ පැවැත්වීමට හා විනය හා අපරාධ ක්‍රියාපටිපාටින් ගැනීමට වග බලා නොගැනීමෙන් වරදට අනුබල දීම හා වරද ඉවසා සිටීම (නොඑසේ නම් අනුමැතිය හා එසේ කිරීමට බලය පැවරීම), කෙරී ඇතැයි සාධාරණව නිගමනය කළ හැකිය.



එසේ වුවත් පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥවාරයා 8 වන වගඋත්තරකරුගේ වගකීම පිළිබඳ ප්‍රශ්නය ලුහු බැන්දේ නැත.

## නියෝගය

මේ අනුව 11 වැනි වගන්තිය, 13(1) වගන්තිය හා 13(2) වගන්තිය යටතේ පෙත්සම්කරුට හිමි මූලික අයිතීන් 1, 3, 6 හා 7 වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට ප්‍රකාශනයක් සිදු කරමි. තවදුරටත්, (වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් හැර) රුපියල් 800,000 මුදලක් වන්දි හා නඩු වියදම් ලෙස ප්‍රදානය කරන අතර, එය 2003.06.30 වැනිදාට පෙර ගෙවිය යුතුය. පුද්ගලිකව රුපියල් 70,000 ක් පළවන වගඋත්තරකරු විසින්ද, රුපියල් 40,000 ක් 3 වන වගඋත්තරකරු විසින්ද, රුපියල් 20,000 ක් 6 වන වගඋත්තරකරු විසින්ද, රුපියල් 20,000 ක් 7 වන වගඋත්තරකරු විසින්ද, රජය විසින් රුපියල් 650,000ක් ද ගෙවිය යුතු බවට නියෝග කරමි.

පෙත්සම්කරු ඔහුගෙන් නවලෝක රෝහලට අයවිය යුතුවූ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටියේය. 1, 3, 6, 7 වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනීසිටි උගත් නීතිඥවරයා කියා සිටියේ නවලෝක වියදම් ඉතා වැඩි බවත්, පෙත්සම්කරුට රජයේ රෝහලක ප්‍රතිකාර සෙවිය හැකිව තිබූ බවත්ය. සාක්ෂිවලට අනුව පෙනීයන්නේ මුලින් පෙත්සම්කරුගේ බිරිඳ හා ඔහුගේ සහෝදරයා නවලෝක රෝහලට මුල් අවස්ථාවේ කඩිනමින් ගමන් නොකල බවත්, වික්‍රමාරච්චි ආයූර්වේද රෝහලට යෑමෙන් සැහීමකට පත් වූ බවත්, එහිදී ලැබුණු වෛද්‍ය උපදෙස් මත ඔවුහු ඔහු නවලෝක රෝහලට රැගෙනා බවත්ය. රජයේ රෝහල්වල ප්‍රතිකාර කොපමණ හොඳ වුවත්, සැලකිල්ල හා බලාගැනීම වඩා හොඳය යන විශ්වාසය මත, හා සමහරවිට පමාව, තදබදය, වැඩ වර්ජන, යන්ත්‍ර හා බෙහෙත්වල අඩුකම යන කරුණු මත බොහෝ ශ්‍රී ලංකිකයෝ ප්‍රතිකාර සඳහා පුද්ගලික රෝහල් තෝරා ගනිති. රට වැසියන්ට රජයේ හා පුද්ගලික

රෝහල් අතර තොරා ගැනීමක් කිරීමට අයිතියක් ඇත. පෙත්සම්කරුගේ බිරිඳ පුද්ගලික රෝහලක් තෝරාගැනීම අතාර්කික නැත. ඔහුගේ ජීවිතය බේරාගැනීම හැර ඇය වෙනත් මතයක් මගින් මෙහෙයවී නැතැයි සිතිය හැකිය. ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් සියලුම දෙනාට 'ඉහළම ප්‍රමිතියේ ශාරීරික හා මානසික සෞඛ්‍ය අත්පත්කර ගැනීමට' ඇති අයිතිය පිළිගෙන ඇත.

පෙත්සම්කරු හෝ පෙත්සම්කරු වෙනුවෙන් නවලෝක රෝහලට දැනටම ගෙවා ඇති මුදලත් 2002.06.25 සිට 2002.07.17 යන ඉතිරි කාලයට ගෙවිය යුතු මුදලත් රජය විසින් ගෙවිය යුතු බවට මම නියෝග කරමි. අද සිට සති දෙකක් ඇතුළත පෙත්සම්කරු විසින් බිල්පත් හා ලැබීම්පත් ඇතුළුව ප්‍රකාශයක් මින් සති දෙකක කාලය ඇතුළත ඉදිරිපත් කල යුතුය. පෙත්සම්කරු ඉල්ලන ප්‍රමාණය ගැන මත භේදයක් ඇත්නම්, රෙජිස්ට්‍රාර් වරයා විසින් මෙම විනිසුරු මඩුල්ල වෙත, තවදුරටත් මේ කරුනු ගැන නියෝග ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර,**

එදිස්සූරිය, විනිසුරු. මම එකඟවෙමි. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

විග්නේෂ්වරන්, විනිසුරු. මම එකඟවෙමි. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර

පරිවර්තනය
**ආසියානු මානව හිමිකම් කොමිෂමේ විධායක අධ්‍යක්ෂ**
**නීතිඥ බැසිල් ප්‍රනාන්දු**